

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2003 නොවැම්බර් මස 14 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 100.00 යි. තැපැල් ගාස්තුව : රු. 31.50 යි.

[සභතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 12 වන දින]

එල්. ඩී.–ඕ. 54/2002

බුද්ධිමය දේපළ පිළිබඳ නීතිය සඳහා හා ලියාපදිංචි කිරීම පාලනය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස කාර්යක්ෂම කාර්ය පටිපාටියක් සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; රේගු ආඥාපනත (235 වන අධිකාරය) සහ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

කුඩුඩු නාමය.

1. මේ පනත, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

පරිපාලනය

අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම සහ ඔහුගේ බලතල.

2. (1) බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් හෝ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ක්‍රියා කිරීම සඳහා හෝ (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ පාලනය කිරීමේ බලය සහ මේ පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි කාර්මික යැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු සහ වෙනත් යම් කාරණා ලියාපදිංචි කිරීම සහ පරිපාලනය කිරීම ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස පත් කරනු ලබන හෝ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි නිරත සියලු තැනැත්තන් පාලනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලය ;

(ආ) ප්‍රදර්ශන, තරහ, සම්මන්ත්‍රණ සහ ප්‍රකාශන සංවිධානය කිරීමෙන් සහ මේ පනතේ II වන කොටස යටතේ ප්‍රකාශන අයිතිය හා ඒ හා සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ පරිපාලනය කිරීම සඳහා සංවිධාන හෝ සංගම් පිහිටුවීම සහ ඒවායේ මනා ක්‍රියාකාරිත්වය

2—H 018508–10,000 (2003/05)

ප්‍රවර්ධනය කිරීමෙන් හා ඒවාට ධෛර්ය දීමෙන් ප්‍රකාශන අයිතිය හා ඒ හා සම්බන්ධ අයිතිවාසිකම් ඇතුළත්ව බුද්ධිමය දේපළ විෂයය පිළිබඳව ජාතික දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම හා දිරිමත් කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම,

අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා බුද්ධිමය දේපළ විෂයය සම්බන්ධයෙන් ආණ්ඩුවේ පොදු ප්‍රතිපත්තියට අනුව සහ එම ප්‍රතිපත්තියට අදාළව අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අනුව ක්‍රියා කළ යුතු ය.

අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්.

3. (1) බුද්ධිමය දේපළ අධ්‍යක්ෂවරයා ලෙස හෝ එලෙස ක්‍රියා කිරීමට යෝග්‍ය හා සුදුසු තැනැත්තකු හෝ තැනැත්තන්, හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වශයෙන් ක්‍රියා කිරීමට යෝග්‍ය හා සුදුසු වෙනත් යම් තැනැත්තන් සංඛ්‍යාවක් මේ පනතේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ සහ පරිපාලනය කිරීමේ කාර්ය සඳහා කලින් කල පත් කරනු ලැබිය හැකි ය.

(2) එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂවරයාට හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්ට ප්‍රකාශිතව පවරන ලද නොහොත් නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීම, කාර්යයක් ඉටුකිරීම හා කර්තව්‍යයන් කිරීම කරනු ලැබිය හැකි අතර, මේ පනත මගින් හෝ ඒ යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටුකිරීම හෝ කර්තව්‍යයක් කිරීම ද අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධිකාරය හා පාලනය යටතේ කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ පරිපාලනය සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය යුතු ය.

කාර්යාලය සහ ලේඛන පවත්වාගෙන යාම.

4. (1) (මෙහි මින් මතු "කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාලයක් පිහිටුවිය යුතු ය. ඒ කාර්යාලය කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු හා පනතින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තිබෙන එකම කාර්යාලය විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ තබා ගැනීමට හා පවත්වා ගෙන යාමට නියමිත සියලුම ලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ කාර්යාලයෙහි තබා ගැනීම හා පවත්වා ගෙන යාම කළ යුතු ය. තව ද කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු හා පනතින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක් ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි නීත්‍යානුකූල ලෙස පිළිගනු ලබන එකම ලේඛනය ඒ ලේඛනය විය යුතු ය.

II වන කොටස

I වන පරිච්ඡේදය

ප්‍රකාශන අයිතිය

5. මේ කොටසේ කාර්ය සඳහා – අර්ථ නිරූපණය.

"ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති" යන්නෙන්, චලනය වීමේ හැඟීමක් ඇතිකරවන සමගාමී ශබ්ද ඇතිව හෝ නොමැතිව එකිනෙකට සම්බන්ධ ප්‍රතිරූප මාලාවකින් සංයුක්ත වන හා දර්ශනය කරවීමේ හැකියාව තිබෙන සහ සමගාමී ශබ්ද සහිත වන විට ශ්‍රවනය කිරීමට සැලැස්වීමේ හැකියාව තිබෙන කෘතියක් අදහස් වේ ;

"කර්තෘ" යන්නෙන්, කෘතියක් නිර්මාණය කළ කායික තැනැත්තා අදහස් වේ ;

"විකාශනය" යන්නෙන්, මහජනයා වෙත යම් කෘතියක්, රූගුමක් හෝ පටිගත කිරීමක් හෝ තැටිගත කළ හඬක් වන්දිකා ඔස්සේ සම්ප්‍රේෂණය කිරීම ඇතුළුව, කම්බි විරහිතව සම්ප්‍රේෂණය කිරීම මගින් සංනිවේදනය කිරීම අදහස් වේ ;

'සාමූහික කෘති" යන්නෙන්, කායික පුද්ගලයන්ගේ හෝ නෛතික අස්තිත්වයක කාර්යාරම්භය මත සහ විධානය යටතේ කායික පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් නිර්මාණය කරන ලද්දා වූ ද දායකත්වය ලබා දුන් කායික පුද්ගලයන්ගේ අනන්‍යතාව පෙන්නුම් කරනු

නොලබන බව සහ පළමු කී පුද්ගලයා හෝ අස්ථිත්වය විසින් ඔහුගේ හෝ එහි නාමයෙන් හෙළිදක්වනු ලබන්නේ ය යන අවබෝධය ඇතිව කරන ලද්දා වූ ද කෘතියක් අදහස් වේ ;

"මහජනයාට සංනිවේදනය" යන්නෙන්, යම් කෘතියක, රංගනයක හෝ ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක ප්‍රතිබිම්බ හෝ ශබ්ද හෝ ඒ දෙකම මහජන සාමාජිකයන් විසින් තනි තනිව තෝරා ගන්නා ස්ථානයක දී හෝ වේලාවක දී විඳිනය කළ හැකි වන ආකාරයකින් යම් කෘතියක්, රංගනයක් හෝ ශාබ්දික පටිගත කිරීමක් හෝ තැටිගත කිරීමක් ඉදිරිපත් කිරීම ද ඇතුළුව කම්බි මඟින් හෝ රහිතව මහජනයා වෙත සම්ප්‍රේෂණය කිරීම අදහස් වේ ;

"පරිගණකය" යන්නෙන්, තොරතුරු සැකසුම් කිරීමේ හැකියාව තිබෙන ඉලෙක්ට්‍රොනික හෝ ඒ හා සමාන උපකරණයක් අදහස් වේ ;

"පරිගණක වැඩසටහන" යන්නෙන් පරිගණකයකට කියවිය හැකි මාධ්‍යයකට සංයුක්ත කළ විට, කිසියම් කාර්යයක් ඉටු කිරීමට හෝ ප්‍රතිඵලයක් ලබා දීමට පරිගණකයක් මඟින් සලස්වා ගත හැකි, වචනයෙන්, සංකේත මඟින්, සැලසුම් වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රකාශ වන, උපදෙස් මාලාවක් අදහස් වේ ;

"ආර්ථික අයිතිවාසිකම්" යන්නෙන්, 9 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් අදහස් වේ ;

"ජනප්‍රවාද ප්‍රකාශනය" යන්නෙන්, ප්‍රජාවක සංස්කෘතික හා සමාජ අනන්‍යතාව ද එහි ප්‍රමිති හා වටිනාකම් ද ප්‍රමාණවත්ව ප්‍රකාශ කිරීමක් ලෙස, ජන කොට්ඨාසයක් තුළින් උත්පාදනය වන හා ඔවුන්ප්‍රදාය මත පදනම් වූ හා ජන කොට්ඨාසයක අපේක්ෂාවන් පිළිඹිබු වන, පහත දැක්වෙන අංශ ද ඇතුළුව, අනුකරණය හෝ වෙනත් ආකාරයකින් මුඛ පරම්පරාවෙන් විකාශනය වන සාමූහික හෝ ඒකා පුද්ගල නිර්මාණයක් අදහස් වේ –

(අ) ජන කථා, ජන කවි සහ ජන තේරවිළි ;

(ආ) ජන ගී සහ ජන වාද්‍ය සංගීතය ;

(ඇ) ජන නැටුම් හා ජන නාට්‍ය ;

(ඈ) ජන කලා නිර්මාණ, විශේෂයෙන්ම චිත්‍ර, පිටාරු, කැටයම්, මූර්ති, කුඹල් නිර්මාණ, ටෙරා කොටා නිර්මාණ, විවිධ වර්ණවල කුඩා ගල්, වීදුරු හෝ මැණික් කැබලි එකට ඇල්ලීමෙන් සාදන චිත්‍ර, ලී කැටයම්, ලෝහ භාණ්ඩ, ස්වර්ණාභරණ, හස්ත කර්මාන්ත, ඇඳුම් පැළඳුම් සහ ස්වදේශීය රෙදිපිළි ;

"උල්ලංඝනය" යන්නෙන්, මේ කොටස යටතේ ආරක්ෂිත කවර හෝ අයිතිවාසිකමක් කඩ කිරීම අදහස් වේ ;

"සදාචාර අයිතිවාසිකම්" යන්නෙන්, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් අදහස් වේ ;

"රංගන ශිල්පීන්" යන්නෙන්, ගායකයන්, වාදන ශිල්පීන් සහ ශාස්ත්‍රීය හෝ කලාත්මක කෘති හෝ ජනප්‍රවාද ප්‍රකාශනය කරන, ගායනා කරන, ඉදිරිපත් කරන, කථනය කරන, නිරූපණය කරන හෝ අන්‍යාකාරයකින් රඟදක්වන වෙනත් තැනැත්තන් අදහස් වේ ;

"ඡායාරූපගත කෘතිය" යන්නෙන්, ප්‍රතිබිම්බයක් නිෂ්පාදනය වන හෝ ප්‍රතිබිම්බයක් නිෂ්පාදනය කරගත හැකි යම් මාධ්‍යයක් මතට ආලෝකය හෝ කිරණ (රසායනික හෝ ඉලෙක්ට්‍රොනික හෝ අන්‍යාකාර) කවර තාක්ෂණයක් අනුව පතිත කරවීමෙන් සිදු කරන වාර්තාගත කිරීමක් අදහස් වේ ; ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියකින් උපුටාගත් නිශ්චල රූපයක් "ඡායාරූපගත කෘතියක්" ලෙස නොව අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියේ කොටසක් ලෙස සැලකිය යුතු ය ;

"නිෂ්පාදකයා" ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක හෝ ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක නිෂ්පාදකයා යන්නෙන්, එම ශ්‍රව්‍ය දෘෂ්‍ය කෘතිය හෝ ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම, නිර්මාණය කිරීමේ කාර්යාරම්භය සහ වගකීම භාරගත් කායික පුද්ගලයා හෝ නෛතික අස්ථිත්වය අදහස් වේ ;

"මහජන ප්‍රදර්ශනය" යන්නෙන්, කෘතියක මුල් පිටපත හෝ අනුපිටපතක්-

(අ) සෘජුවම ;

(ආ) ඡායාපටයක්, සර්පණයක්, රූපවාහිනී ප්‍රතිබිම්බයක් හෝ අන්‍යාකරයකින් තිරයක් මත ;

(ඇ) වෙනත් යම් උපක්‍රමයක් හෝ ක්‍රියාවලියක් මගින් ; හෝ

(ඈ) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් සම්බන්ධයෙන් වන විට, තනි ප්‍රතිබිම්බ අනුක්‍රමිකව පවුලක සාමාන්‍ය වක්‍රයෙන් හා පවුලේ සමීපතම සමාජ හිතමිත්‍රාදීන්ගෙන් පිටස්තර තැනැත්තන් සිටින හෝ ඔවුන්ට පැමිණ සිටිය හැකි වන්නා වූ ස්ථානයක හෝ ස්ථානවල දී ; ඔවුන් එකම ස්ථානයක සහ එකම වේලාවක හෝ වෙනත් ස්ථානයක හෝ වෙනස් වේලාවක සිටින්නේ ද නැතහොත් සිටිය හැකි ද යන වග නොසලකා, "මහජනයා වෙත සන්නිවේදනය" යන යෙදුමෙහි අර්ථ කථනයේ අර්ථානුකූලව මහජනයා වෙත සංනිවේදනයකින් තොරව ප්‍රදර්ශනය කළ හැකි පරිදි

පෙන්වීම අදහස් වේ ;

"මහජනයාට බැහැර දීම" යන්නෙන්, කෘතියක මුල් පිටපත හෝ අනුපිටපතක් හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක මුල් පිටපතෙහි හෝ අනුපිටපතක සන්තකය මහජන පුස්තකාලය හෝ ලේඛනාගාරය වැනි, මහජනයාට සේවය ලබාගත හැකි ආයතනයක් විසින්, ලාභ නුපදවන කාර්යයක් සඳහා යොදා ගැනීම පිණිස සීමිත කාලසීමාවකට පවරා දීම අදහස් වේ ;

"ප්‍රසිද්ධ රහදැක්වීම" යන්නෙන්, -

(අ) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් නොවන කෘතියක් සම්බන්ධයෙන් වන විට, සෘජුවම හෝ යම් උපක්‍රමයක් හෝ ක්‍රියාවලියක් මගින් ගායනය, වාදනය, රංගනය, රහපෑම හෝ ඒ කෘතිය ප්‍රසිද්ධියේ අන්‍යාකාරව රහදැක්වීමක් අදහස් වේ ;

(ආ) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් සම්බන්ධයෙන් වන විට, අනුක්‍රමික ප්‍රතිබිම්බ ප්‍රදර්ශනය හෝ ඊට සමගාමීව ප්‍රසිද්ධියේ සවන් දිය නැකි ප්‍රතිබිම්බ ප්‍රදර්ශනය සමග ශබ්ද නැංවීම අදහස් වේ ; තව ද

(ඇ) ශාබ්දික පටිගත කිරීමක් හෝ නැටිගත කිරීමක් සම්බන්ධයෙන් වන විට, පවුලක සාමාන්‍ය වක්‍රයෙන් හෝ පවුලේ යම්පතම් සමාජ හිතමිත්‍රාදීන්ගෙන් බාහිර නැනැත්තන් සිටින හෝ සිටිය හැකි වන්නා වූ ස්ථානයක හෝ ස්ථානවල දී, ඔවුන් එකම ස්ථානයක එකම වේලාවක දී සිටින්නේ ද නැතහොත් සිටිය හැකි ද යන වග එකිනෙකට වෙනස් ස්ථානවල දී හෝ වේලාවන්හි දී සිටින්නේ ද නැතහොත් සිටිය හැකි ද යන වග නොසලකා සහ එම ඉදිරිපත් කිරීම "මහජනයා වෙත සංනිවේදනය" යන්නෙහි අර්ථකථනයේ අර්ථානුකූලව මහජනයා වෙත සංනිවේදනය කරනු ලැබීමකින් තොරව ප්‍රත්‍යක්ෂ කරගත හැකි ඉදිරිපත් කිරීමක් අදහස් වේ ;

"පළ කරන ලද" යන්නෙන්-

(අ) මහජනයා වෙත අලෙවි කිරීම සඳහා, කුලියට දීම සඳහා, මහජනයාට බැහැර දීම සඳහා හෝ පිටපත්වල අයිතිය හෝ සන්තකය පවරා දීම සඳහා සාධාරණ පිටපත් සංඛ්‍යාවක් සපයා තිබෙන්නා වූ ; හෝ

(ආ) ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මගින් මහජනයා වෙත සපයා තිබෙන අවස්ථාවක :

එසේ වුව ද, කෘතියක් මහජනයා වෙත සැපයීම එම කෘතියේ ප්‍රකාශන අයිතිය හිමි වෙනත් නැනැත්තාගේ එකඟත්වය ඇතිව සිදු කර තිබෙන්නා වූ ද ශාබ්දික පටිගත කිරීමක් හෝ නැටිගත කිරීමක් සම්බන්ධයෙන් වන විට, එම නැටිගත හෝ ශාබ්දික පටිගත කිරීමෙහි නිෂ්පාදකවරයාගේ හෝ ඔහුගේ හිමිකමට

අනුප්‍රාප්තිකයාගේ එකඟත්වය ඇතිව සිදු කර තිබෙන්නා වූ ද,

කෘතියක් හෝ ශාබ්දික පටිගත කිරීමක් හෝ තැටිගත කිරීමක් අදහස් වේ.

"කුලියට දීම" යන්නෙන්, කෘතියක් හෝ ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක මුල් පිටපත හෝ අනු පිටපතක සන්තකය, ලාභ ඉපදවීමේ කාර්යය සඳහා සීමිත කාල සීමාවකට පවරාදීම අදහස් වේ ;

"ප්‍රතිනිෂ්පාදනය" යන්නෙන්, යම් කෘතියක හෝ ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක පිටපත් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් ද්‍රව්‍යමය ස්වරූපයකින් සෑදීම අදහස් වන අතර ඊට කෘතියක් හෝ ශාබ්දික පටිගත කිරීමක් හෝ තැටිගත කිරීමක් ඉලෙක්ට්‍රොනික ස්වභාවයෙන් ස්ථිරව හෝ තාවකාලිකව ගබඩා කර තැබීම ද ඇතුළත් වේ ;

" ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම" යන්නෙන්, ශබ්ද තහවුරු කරන ආකාරයක හෝ එම ශබ්ද ගැබ්වී තිබෙන මාධ්‍යය කවරක් වුව ද එය නොතකා යම් රැහුමක හඬ හෝ වෙනත් හඬ විශේෂයෙන් ම සවන් දීම සඳහා ම තහවුරු කිරීම අදහස් වේ. මෙයට ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක සංයෝජන කර තිබෙන ශබ්ද හා ප්‍රතිබිම්බ එක්ව තහවුරු කිරීමක් ඇතුළත් නොවේ ;

" කෘතිය" යන්නෙන්, 6 වන වගන්තියේ සඳහන් වන යම් ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක් අදහස් වේ ;

"ව්‍යවහාරික කලා කෘති" යන්නෙන්, ලැබෙන ප්‍රයෝජ්‍යතාවාදී කර්තව්‍ය සඳහා සිදු කෙරෙන කලා නිර්මාණයක් හෝ අතින් තැනුව ද නැතහොත් කාර්මික මට්ටමින් නිෂ්පාදනය කරනු ලැබුව ද ප්‍රයෝජනවත් භාණ්ඩයක ගැබ්කර තිබෙන කලා නිර්මාණයක් අදහස් වේ ;

"හවුල් කර්තෘත්ව කෘති" යන්නෙන්, කර්තෘත් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු හෝ සහභාගි දායකත්වයෙන් නිර්මාණය කරන ලද සහ "සාමූහික කෘතියක්" ලෙස සැලකීමට අවශ්‍ය සුදුසුකම් නොමැති කෘතියක් අදහස් වේ.

ආරක්ෂිත කෘති.

6. (1) (මෙහි මින් මතු "කෘතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂයෙන් පහත සඳහන් නිර්මාණ ඇතුළත් වන ශාස්ත්‍රීය, කලා සහ විද්‍යාත්මක පරාසයකට ඇතුළත් පහත සඳහන් මුල් බුද්ධිමය නිර්මාණ, ශාස්ත්‍රීය, කලාත්මක, සහ විද්‍යාත්මක නිර්මාණ වශයෙන් ආරක්ෂා කරනු ලැබිය යුතු ය :—

(අ) පොත්, පත්‍රිකා, ලිපි, පරිගණක වැඩසටහන් හා වෙනත් ලියවිලි ;

(ආ) කථා, දේශන, ඇමතීම්, අනුශාසනා සහ වෙනත් වාචික කෘති ;

(ඇ) නාටකීය හෝ ගීත නාටකීය කෘති, අභිරූපණ, නෘත්‍යවිද්‍යාත්මක කෘති සහ වේදිකා සඳහා වන නිෂ්පාදන වශයෙන් නිෂ්පාදිත වෙනත් කෘති ;

(ඈ) (ඇ) ඡේදයේ නිශ්චිතව සඳහන් කෘති, වේදිකාගත කිරීම සඳහා නිෂ්පාදනය කිරීම සහ එවැනි නිෂ්පාදන සඳහා යෝග්‍ය ජනප්‍රවාද ප්‍රකාශන වේදිකාගත කිරීම සඳහා නිෂ්පාදනය කිරීම ;

(ඉ) සංගීතය සමග ගයන වවන ඇතුළත් හෝ නොවන සංගීතමය කෘති ;

(ඊ) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති ;

(උ) ගෘහනිර්මාණ ශිල්පීය කෘති ;

(ඌ) චිත්‍ර, පින්තාරු කිරීම්, මූර්ති, කැටයම්, ලිතෝ මුද්‍රණ, විචිත්‍ර ගෙත්තම් සහ වෙනත් ලලිත කලාත්මක කෘති ;

(එ) ඡායාරූප ශිල්පීය කෘති ;

(ඒ) ව්‍යවහාරික කලා කෘති ;

(ඔ) භූගෝල විද්‍යාව හා භූලක්ෂණ විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පීය හෝ විද්‍යාව හා සම්බන්ධ සිතියම්, පිඹුරු, කටු සටහන් සහ ත්‍රිමාණ කෘති.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කෘති හුදෙක් ඒවා නිර්මාණය කරනු ලැබීමේ කාරණය පමණක් සලකා සහ ඒවායේ ප්‍රකාශන ක්‍රමය හෝ ආකාරය මෙන්ම අන්තර්ගතය, ගුණාත්මකභාවය සහ කාර්යය නොසලකා ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

ව්‍යුත්පන්න කෘති.

7. (1) පහත දැක්වෙන නිර්මාණ ද කෘතීන් ලෙස ආරක්ෂා කරනු ලැබිය යුතු ය :—

(අ) කෘතිවල පරිවර්තන, අනුවර්තන, එකලස් කිරීම් හා වෙනත් විපර්යාසයන් සහ විකිරණයන් ;

(ආ) අන්තර්ගත කරුණු තෝරා ගැනීම, සම්බන්ධීකරණය හෝ එකලස් කර ඇති ආකාරය හේතුවෙන් මුල් නිර්මාණ බවට පත්වන කෘතීන්හි යාන්ත්‍රිකව කියවනු ලැබිය හැකි හෝ වෙනත් ස්වරූපයක වූ එකතු සහ හුදෙක් දත්ත එකතු (දත්ත පදනම්).

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් කෘතියක් ආරක්ෂා කිරීම, ඒ කෘතිය නිර්මාණය කිරීමෙහිලා සංයුක්ත කරගන්නා ලද හෝ උපයෝගී කරගන්නා ලද පෙර පැවති කෘතියක යම් ආරක්ෂාවකට හානියක් නොවන ආකාරයෙන් විය යුතු ය.

අනාරක්ෂිත කෘති.

8. 6 වන හා 7 වන වගන්තිවල කවර විධිවිධානයක් තිබුණ ද –

(අ) කෘතියක, ප්‍රකාශකර, විස්තර කර, පැහැදිලි කර, නිරූපණය කර හෝ ගැබ්කර තිබුණ ද යම් අදහසක්, ක්‍රියාවලියක්, ක්‍රියා පිළිවෙලක්, ක්‍රියා කරවීමේ ක්‍රමයක්, සංකල්පයක්, ප්‍රතිපත්තියක්, නව සොයා ගැනීමක් හෝ හුදෙක් දත්ත ;

(ආ) ව්‍යවස්ථාදායක, පරිපාලනමය හෝ නීතිමය ස්වභාවයක වන යම් නිල පාඨ හෝ ඒවායේ නිල පරිවර්තන ;

(ඇ) ප්‍රසිද්ධ කරනු ලබන, විකාශනය කරනු ලබන හෝ වෙනත් යම් ආකාරවලින් පොදුවේ නිවේදනය කරනු ලබන දෛනික ප්‍රවෘත්ති,

කෙෙහි මේ කොටස යටතේ ආරක්ෂාව ව්‍යාප්ත නොවිය යුතු ය.

ආර්ථික අයිතිවාසිකම්.

9. (1) 11 වන වගන්තියේ සිට 13 වන වගන්තිය දක්වා වගන්තිවල විධිවිධානවලට යටත්ව, ප්‍රකාශන අයිතිය හිමි වෙනත් තැනැත්තෙකුට, ඒ කෘතිය සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියා කිරීමට හෝ ඒ ක්‍රියා කිරීම සඳහා බලය පැවරීමට පරම අයිතිවාසිකමක් තිබිය යුතු ය :—

(අ) කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීම ;

(ආ) කෘතිය පරිවර්තනය කිරීම ;

(ඇ) කෘතිය අනුවර්තනය කිරීම, සකස් කිරීම හෝ එහි වෙනත් විපර්යාසයන් සිදුකිරීම ;

(ඈ) විකිණීමෙන්, කුලියට දීමෙන්, අපනයනය කිරීමෙන් හෝ අන්‍යාකාරයෙන් කෘතියේ මුල් පිටපත හෝ එක් එක් අනුපිටපත් මහජනයා අතර බෙදා හැරීම ;

(ඉ) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක, ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක ගැබ් වී නිබෙන කෘතියක, පරිගණක වැඩසටහනක, දත්ත පදනමක හෝ ස්වර සටහනක ස්වරූපයෙන් වූ සංගීත කෘතියක මුල් පිටපත හෝ අනු පිටපතක් එහි මුල් පිටපතේ හෝ අනු පිටපතේ අයිතිය නොසලකා කුලියට දීම ;

(ඊ) (ආනයනය කළ පිටපත්, ප්‍රකාශන අයිතිය හිමි කරුවකුගේ අවසරය ඇතිව සකස් කර තිබෙන අවස්ථාවක වුව ද) කෘතියෙහි පිටපත් ආනයනය කිරීම ;

(උ) කෘතියේ මුල් පිටපත හෝ අනු පිටපතක් මහජනයා සඳහා ප්‍රදර්ශනය කිරීම ;

(ඌ) කෘතිය ප්‍රසිද්ධ රහ දැක්වීම,

(එ) කෘතිය විකාශනය කිරීම ; සහ

(ඒ) කෘතිය වෙනත් ආකාරයකින් මහජනයා සඳහා සංනිවේදනය කිරීම.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සම්පූර්ණ කෘතියට හා එහි යැලකිය යුතු කොටසකට යන දෙකටම අදාළ විය යුතු ය.

(3) කුලියට දීමේ අත්‍යවශ්‍ය විෂය වස්තුව හුදෙක් පරිගණක වැඩසටහනම නොවන අවස්ථාවක, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට අනුකූලව කුලියට දීමේ අයිතිවාසිකම්, පරිගණක වැඩසටහනකට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද, කෘතියකින් නීත්‍යනුකූලව යකස් කරන ලද පිටපතක හෝ කෘතියක අයිතිකරු විසින් හෝ එම අයිතිකරු විසින් තත් කාර්යයක් සඳහා බලය දෙනු ලැබූ යම් නැනැත්තකු විසින් ප්‍රකාශන අයිතිය හිමිකරුගේ බලය නොමැතිව හෝ ඒ පිටපත විකිණීමට හෝ එය අන්‍යාකාරයකින් බැහැර කරනු ලැබීමට හිමිකම් නිබිය යුතු ය.

සදවාර අයිතිවාසිකම්.

10. (1) කෘතියක කර්තෘවරයකුට, ඔහුගේ ආර්ථික අයිතිවාසිකම්වලින් ස්වාධීනව සහ ඔහු තවදුරටත් ඒ අයිතිවාසිකම්වල හිමිකරු නොවන අවස්ථාවක වුව ද, මෙහි පහත දැක්වෙන අයිතිවාසිකම් නිබිය යුතු ය :—

(අ) කෘතියේ පිටපත්වල සහ ප්‍රායෝගිකව හැකිතාක් දුරට මහුගේ කෘතිය පොදු ප්‍රයෝජනය සඳහා ගනු ලැබූ විටක, මහුගේ නම ප්‍රකටව පෙනෙන පරිදි දක්වනු ලැබීම ;

(ආ) මහුගේ කෘතියක් වශයෙන් මහුගේ නම පිටපත්වල සහ පොදු ප්‍රයෝජනයක් සඳහා යොදාගැනීමක් හා සම්බන්ධව සඳහන් කරනු නොලැබීමට සහ ආරූඪ නාමයක් පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ;

(ඇ) මහුගේ ගරුත්වයට හා කීර්තිනාමයට හානිකර විය හැකි පරිදි මහුගේ කෘතිය හා සම්බන්ධ යම් විකෘති කිරීමකට, අංග ඡේදනයකට හෝ විකරණයකට හෝ නීනාකාරක ක්‍රියාවකට විරෝධය පෑම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කිසි අයිතිවාසිකමක් කෘතියේ කර්තෘගේ ජීවිත කාලය තුළ සම්ප්‍රේෂ්‍ය නොවිය යුතු ය; එසේ වුව ද, එවැනි යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමේ අයිතිය කර්තෘවරයාගේ මරණින් පසුව, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කවර හෝ සදාචාර අයිතිවාසිකමක් අත්හැර දැමීම, එම අත්හැර දැමීම ලියවිල්ලකින් වන්නේ නම් සහ අත්හළ අයිතිවාසිකම් හෝ අයිතිවාසිකම් සහ අත්හැර දැමීමට අදාළ අවස්ථාගත කරුණු පැහැදිලිව හා නිශ්චිතව එහි සඳහන් වන්නේ නම්, එම කෘතියේ කර්තෘවරයා විසින් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වන අයිතිවාසිකම් කිසිවක් අතහැර දැමීමක දී, එම අයිතිවාසිකම අත්හැර දමනු ලබන්නේ යම් විකරණයකට හෝ වෙනත් යම් ක්‍රියාවකට අදාළව ද ඒ විකරණයේ හෝ ක්‍රියාවේ ප්‍රමාණය හා ස්වභාවය නිශ්චිතව සඳහන් කර ඇත්නම්, එම කර්තෘගේ මරණින් පසුව එම සදාචාර අයිතිවාසිකම් පැවරී ඇති කායික තැනැත්තකුට හෝ නෛතික අස්ථිත්වයකට එකී අයිතිවාසිකම අත්හැර දමනු ලැබීමට අයිතියක් නිබිය යුතු ය.

සාධාරණ භාවිතය.

11. (1) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව නිබුණ ද, විවේචනය, දැඳහස් දැක්වීම, ප්‍රවෘත්ති වාර්තාකරණය, ඉගැන්වීම, (පන්ති කාමරයේ කාර්ය සඳහා වැඩි සංඛ්‍යාවක් පිටපත් සැපයීම ඇතුළුව) ශිෂ්‍යත්වි හෝ පර්යේෂණ කටයුතු සඳහා පිටපත් ප්‍රතිනිෂ්පාදනය හෝ ඒ වගන්තියේ නිශ්චිතව සඳහන් වෙන යම් ක්‍රමයකින්, යම් කෘතියක් සාධාරණ භාවිතය සඳහා ගැනීම, ප්‍රකාශන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නොවන්නේ ය:

(2) යම් විශේෂිත කාරණයක දී යම් කෘතියකින් ගන්නා භාවිතය සාධාරණ භාවිතයක් ද යන වග නිශ්චය කිරීමේ දී, පහත දැක්වෙන කරුණු සලකා බැලිය යුතු ය :—

(අ) එම භාවිතය වාණිජ ස්වභාවයක ද යන වග හෝ ලාභ නුපදවන අධ්‍යාපනික කාර්යයක් සඳහා ද යන වග ද ඇතුළුව එම අරමුණ සහ එහි ස්වභාවය ;

(ආ) ප්‍රකාශන අයිතිය සහිත කෘතියේ ස්වභාවය ;

(ඇ) ප්‍රකාශන අයිතිය සහිත සම්පූර්ණ කෘතියට සාපේක්ෂව ප්‍රයෝජනයට ගෙන තිබෙන කොටසේ ප්‍රමාණය සහ එහි සාරාංශාත්මකභාවය ;

(ඈ) ප්‍රකාශන අයිතිය සහිත කෘතියේ විභව වෙළෙඳපොළ කෙරෙහි හෝ එහි වටිනාකම කෙරෙහි එකී භාවිතයට ගැනීමෙන් ඇතිවිය හැකි බලපෑම.

(3) සාධාරණ භාවිතයට ගැනීමේ ක්‍රියාවලට 12 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන අවස්ථාගත ක්‍රියාවන් ද ඇතුළත් වේ.

සාධාරණ භාවිතය පිදුකරන ක්‍රියා.

12. (1) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද සහ මෙම වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පළ කරන ලද කෘතියක නැති පිටපතක්, ප්‍රකාශන අයිතිය හිමිකරුවකු විසින් බලය දීමකින් තොරව, පෞද්ගලිකව ප්‍රතිනිෂ්පාදනය කිරීමට, එම ප්‍රතිනිෂ්පාදනය සාධික පුද්ගලයකු විසින් ඔහුගේ පරම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නීත්‍යනුකූල පිටපතකින් කරනු ලබන අවස්ථාවක, අවසර තිබිය යුතු ය.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අවසරය –

(අ) ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදිකිරීමක ස්වභාවයේ වන ගෘහනිර්මාණ කෘතියක් ප්‍රතිනිෂ්පාදනය ;

(ආ) පොතක හෝ ස්වර සටහන් ස්වභාවයේ වූ සංගීතමය කෘතියක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ප්‍රතිකෘත ශිල්පීය ස්වභාවයේ ප්‍රතිනිෂ්පාදනය ;

(ඇ) දත්ත පදනමක් සම්පූර්ණයෙන් හෝ ඉන් සැලකිය යුතු කොටසක් ප්‍රතිනිෂ්පාදනය ;

(ඈ) (7) වන උපවගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි හැර, පරිගණක වැඩසටහනක් ප්‍රතිනිෂ්පාදනය ;

(ඉ) ප්‍රතිනිෂ්පාදනය කිරීමක්, කෘතියක සාමාන්‍ය ප්‍රතිලාභ උත්පාදන සමග ඝට්ටනය වන හෝ කෘතියේ ප්‍රකාශන අයිතිය හිමිකරුගේ නීත්‍යනුකූල

සම්බන්ධතාවලට අන්‍යාකාරයෙන් අසාධාරණ ලෙස අගතිදායක විය හැකි අවස්ථාවක දී එය ප්‍රතිනිෂ්පාදනය,

කෙරෙහි ව්‍යාප්ත නොකළ යුතු ය.

(3) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කුමක් සඳහන් ව තිබුණ ද ප්‍රසිද්ධ කළ කෘතියක් හෝ කෘතියකින් කොටසක්, ප්‍රකාශන අයිතිය හිමිකරුවකු විසින් හෝ අවසර දෙනු ලැබීමකින් තොරව උපුටා දක්වනු ලැබීමට අවසර තිබිය යුතු ය :

එසේ වුව ද එසේ අවසර ඇත්තේ එම ප්‍රතිනිෂ්පාදනය, සාධාරණ ක්‍රියාමාර්ගවලට ගැලපෙන්නේ නම් සහ අදාළ කාර්යය අනුව යුක්තියහගත ප්‍රමාණය ඉක්මවා නොයන්නේ නම් පමණකි. එවැනි උපුටා දැක්වීමක් සමග එම කෘතියේ ප්‍රභවය සහ එම උපුටාගත් කොටස අයත් කෘතියේ එහි කර්තෘවරයාගේ නම සඳහන් වන්නේ නම්, ඔහුගේ නම ද සඳහන් විය යුතු ය.

(4) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද කෘතියක ප්‍රකාශන අයිතිය හිමිකරුවකුගේ බලය දීමකින් තොරව, මෙහි පහත දැක්වෙන ක්‍රියා සඳහා අවසරය තිබිය යුතු ය :—

(අ) ප්‍රසිද්ධ කළ කෘතියක කෙටි කොටසක් නිදර්ශන වශයෙන් හෝ ලියවිලි වශයෙන් හෝ ශබ්ද හෝ දෘශ්‍ය පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් වශයෙන් ඉගැන්වීමේ කටයුතු සඳහා ප්‍රතිනිෂ්පාදනය කිරීම්; එසේ වුව ද, එම ප්‍රතිනිෂ්පාදන, සාධාරණ ක්‍රියාමාර්ගවලට ගැලපිය යුතු අතර, අදාළ කාර්යය අනුව යුක්තියහගත ප්‍රමාණයන් ඉක්මවා නොයා යුතු ය ;

(ආ) ප්‍රසිද්ධ කළ ලිපි, වෙනත් කෙටි කෘති හෝ කෘතිවල කෙටි උද්ධෘත ප්‍රතිකෘත ශිල්පීය ප්‍රතිනිෂ්පාදන පැවැත්වෙන ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රව වාණිජමය ලාභ පිණිස නොවන අධ්‍යාපන ආයතනවල මුහුණට මුහුණ ලා සිදු කෙරෙන ඉගැන්වීමේ කටයුතු සඳහා, තත් කාර්යය අනුව යුක්ති සහගත ප්‍රමාණයට සිදුකරන, එම ප්‍රතිනිෂ්පාදන ක්‍රියාව, වෙන්කොට සැලකිය හැකි සිද්ධියක්

විය යුතු අතර, නැවත නැවතත් කරනු ලබන්නේ නම් එය එකිනෙකට වෙනස් හා සම්බන්ධ නොවන අවස්ථාවල විය යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ පිළියෙල කරනු ලබන සෑම පිටපත්වලම, ප්‍රායෝගිකව හැකිතාක් දුරට, ප්‍රතිනිෂ්පාදිත කෘතියේ ප්‍රභවය සහ එහි කර්තෘගේ නම සඳහන් විය යුතු ය.

(5) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද, ස්වකීය කටයුතු සෘජුවම හෝ වක්‍රව වාණිජමය ප්‍රතිලාභයක් සඳහා නොවන යම් පුස්තකාලයක් හෝ ලේඛනාගාරයක් විසින්, කෘතියක හෝ ප්‍රකාශන අයිතිය හිමිකරුගේ බලය දීමකින් තොරව, එම කෘතියක එක පිටපතක්, —

(අ) එම ප්‍රතිනිෂ්පාදිත කෘතිය, ප්‍රසිද්ධ කළ ලිපියක, වෙනත් කෙටි කෘතියක හෝ කෘතියක කෙටි උද්ධෘතයක් වන්නා වූ සහ එම ප්‍රතිනිෂ්පාදනයේ අරමුණ කායික පුද්ගලයකුගේ ඉල්ලීම සපුරාලීම වන්නා වූ අවස්ථාවක :

එසේ වුව ද –

(i) එම පිටපත, අධ්‍යයනය, ශිෂ්‍යත්වයක් හෝ පෞද්ගලික පර්යේෂණ කටයුතු සඳහා ම පමණක් ප්‍රයෝජනයට ගන්නා බවට එම පුස්තකාලය හෝ ලේඛනාගාරය සෑහීමකට පත් වන්නේ නම් ;

(ii) එම ප්‍රතිනිෂ්පාදන ක්‍රියාව වෙන්කොට සැලකිය හැකි සිදුවීමක් වන්නේ නම් සහ නැවතත් සිදු කෙරුනහොත් එය එකිනෙකට වෙනස් වූ සහ සම්බන්ධයක් නොමැති අවස්ථාවල සිදු කරන්නේ නම් ;

(ආ) එම පිටපත ගනු ලබන්නේ සංරක්ෂණය පිණිස වන සහ අවශ්‍ය වුවහොත් පිටපතක් ප්‍රතියෝජනය කිරීම පිණිස හෝ වෙනත් ඒ හා සමාන පුස්තකාලයක හෝ ලේඛනාගාරයක නිත්‍ය එකතුවකින් නැති වූ, විනාශ වූ හෝ පාවිච්චියට ගත නොහැකි පිටපතක් ප්‍රතියෝජනය කිරීම සඳහා වන අවස්ථාවක ;

එසේ ම එවැනි පිටපතක් සාමාන්‍ය සාධාරණ තත්ත්වයන් යටතේ ලබාගත නොහැකි නම් ; සහ

එසේ ම තවදුරටත්, වෙනස් කොට සැලකිය හැකි ප්‍රතිකෘත ශිල්පීය ප්‍රතිනිෂ්පාදන කාර්යය වෙන්කොට සැලකිය හැකි සිදුවීමක් වන්නේ නම් සහ එය නැවත නැවතත් කරනු ලබන අවස්ථාවක එය කරනු ලබන්නේ එකිනෙකට වෙනස් සහ සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී නම්,

ප්‍රතිකෘත ශිල්පීය ප්‍රතිනිෂ්පාදනයක් වශයෙන් ලබාගත හැකි ය.

(6) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ඌ) සහ (ඒ) ඡේදවල කවර විධිවිධානයක් තිබුණ ද, ප්‍රකාශන අයිතිය හිමි කරුවකු විසින් බලය දීමකින් තොරව සහ ප්‍රායෝගිකව හැකිතාක් දුරට කෘතියේ ප්‍රභවය සහ කර්තෘගේ නම සඳහන් කිරීමේ බැඳීමට යටත්ව, මෙහි පහත දැක්වෙන ක්‍රියාවලට, එනම් :—

(අ) කාලීන, ආර්ථික, දේශපාලන හෝ ආගමික මාතෘකාවක් මත පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක පළ කරන ලද ලිපියක්, විකාශනය කිරීමෙන් හෝ වෙනත් සංනිවේදන ක්‍රමයකින් මහජනයා වෙත ඉදිරිපත් කිරීම, පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ ඒ ආකාරයේම වූ විකාශනය කළ සංනිවේදනයකට අදාළවන්නා වූ කෘතියක් ප්‍රතිනිෂ්පාදනය කිරීම, තවද එම ප්‍රතිනිෂ්පාදනය කිරීම, විකාශනය කිරීම හෝ මහජනයා වෙත වෙනත් ආකාරයකින් සංනිවේදනය කිරීම එහි ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් එම පිටපත් මත ප්‍රකාශිතව රඳවා තබා ගෙන ඇති හෝ එම කෘතිය විකාශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් මහජනයා වෙත සංනිවේදනය කිරීම රඳවා තබා ගෙන ඇති අවස්ථාවකට එම අවසරය අදාළ නොවිය යුතු ය ;

(ආ) කාලීන සිද්ධි වාර්තා කිරීමේ කාර්යය සඳහා ඒ සිද්ධිය වාර්තා කිරීමේ යෙදී සිටිය දී දකින්නට හෝ අසන්නට ලැබුණු කෘතියකින් උපුටාගත් කෙටි කොටස්, අදාළ කාර්යය අනුව සාධාරණීය වන

ප්‍රමාණයට ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ මහජනයා වෙත විකාශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් සංනිවේදනය කිරීම. ;

(ඇ) දේශපාලන කථාවක්, දේශනයක්, ඇමතීමක්, අනුශාසනාවක් හෝ ප්‍රසිද්ධියේ කරනු ලබන ඒ හා සමාන ස්වභාවයේ වෙනත් කෘතියක් හෝ නඩු කටයුත්තක දී කරන ලද දේශනයක්, කාලීන තොරතුරු සැපයීමේ කාර්යය සඳහා සාධාරණීය වනතාක් දුරට, පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක ප්‍රතිනිෂ්පාදනය කිරීම, මහජනයා වෙත විකාශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් සංනිවේදනය කිරීම.

(7) (අ) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේදවල කුමක් සඳහන්ව තිබුණ ද පරිගණක වැඩසටහන් ප්‍රතිනිෂ්පාදනය කිරීම සඳහා අනුවර්තනය කිරීම, එම පරිගණක වැඩසටහනේ පිටපතක නීත්‍යානුකූල අයිතිකරු විසින් එම පරිගණක වැඩසටහනේ එක් පිටපතක් ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ අනුවර්තනය කිරීම –

(i) එම පරිගණක වැඩසටහන් ලබාගෙන ඇත්තේ යම් කාර්යයක් සහ ප්‍රමාණයක් සඳහා ද ඒ සඳහා පරිගණකයක් මගින් එම පරිගණක වැඩසටහන් ප්‍රයෝජනයට ගැනීමේ කාර්යය සහ ප්‍රමාණය සඳහා ;

(ii) ලේඛනාරක්ෂක කාර්ය සඳහා සහ පරිගණක වැඩසටහනේ එම නීත්‍යානුකූලව අයත් පිටපත නැති වුවහොත්, හානියට පත් වුවහොත් හෝ ප්‍රයෝජනයට ගත නොහැකි වුවහොත් හෝ ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වුවහොත් එය ප්‍රතියෝජනය කිරීමේ කාර්යය සඳහා,

අවශ්‍ය වන්නේ නම්, එම පිටපත හෝ අනුවර්තනය එහි ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් බලය දීමකින් තොරව ලබා ගැනීමට අවසර තිබිය යුතු ය.

(ආ) පරිගණක වැඩසටහනක කිසි පිටපතක් හෝ අනුවර්තනයක්, (අ) ඡේදය සඳහන් කාර්ය සඳහා හැර

වෙනත් කාර්යයක් සඳහා යොදා නොගත යුතු අතර, එම පරිගණක වැඩසටහනේ පිටපතක් තවදුරටත් සන්තකයේ තබාගැනීම නීත්‍යානුකූල නොවන බවට පත් වූ විට, එවැනි යම් පිටපතක් හෝ අනුවර්තනයක් විනාශ කරනු ලැබිය යුතු ය.

(8) 9 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඊ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද කායික තැනැත්තකු විසින් තමාගේ පෞද්ගලික කාර්යයන් සඳහා යම් කෘතියක, පිටපතක් ආනයනය කිරීම සඳහා, ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් බලය දීමකින් තොරව, අවසර දෙනු ලැබිය යුතු ය.

(9) 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (උ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද, කෘතිවල මුල් පිටපත් හෝ අනු පිටපත් මහජනයා සඳහා ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් බලය දීමකින් තොරව අවසර දෙනු ලැබිය යුතු ය :

එසේ වුවද, එම ප්‍රදර්ශනය කිරීම, ඡේයාපටියක්, සර්පණයක් හෝ රූපවාහිනී ප්‍රතිබිම්බයක් මගින් හෝ අන්‍යාකාරයකින් තිරයක් මත හෝ වෙනත් යම් උපක්‍රමයක් හෝ ක්‍රියාවලියක් මගින් නොවන ආකාරයකින් සිදු කරනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත් එම කෘතිය ප්‍රසිද්ධ කරනු ලැබ හෝ මුල් පිටපත හෝ ප්‍රදර්ශනය කරන පිටපත විකුණනු ලැබ, බැහැර දෙනු ලැබ හෝ කර්තෘවරයා විසින් හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් අන්‍යාකාරයකින් වෙනත් තැනැත්තකුට පවරා දෙනු ලැබ තිබිය යුතු ය.

(10) මේ කොටසේ කුමක් සඳහන්ව ඇත ද, මෙහි පහත දැක්වෙන කටයුතු, එනම් :—

(අ) කෘතියක්, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ කාර්ය සඳහා ආණ්ඩුව විසින් හෝ ලාභ නුපදවන අධ්‍යාපන ආයතනයක් විසින් පත්තිකාමරයේ හෝ අධ්‍යාපනය සඳහා වෙන් වූ ඒ හා සමාන ස්ථානයක රහපෑම හෝ ප්‍රදර්ශනය කිරීම,

ප්‍රකාශන අයිතිය කඩ කිරීමක් නොවන්නේ ය :

එසේ වුව ද, ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක රහපෑම හෝ තනි තනි ප්‍රතිබිම්බ ප්‍රදර්ශනය කිරීම නීත්‍යනුකූලව සාදන ලද පිටපතක් යොදාගෙන සිදු කරන අවස්ථාවක නැතහොත් ඒ රහපෑමට වගකිව යුතු තැනැත්තාට එම පිටපත නීත්‍යනුකූලව සාදන ලද්දක් නොවන බව දැන නොසිටි බව හෝ විශ්වාස කිරීමට හේතු නොතිබිය යුතු ය.

(ආ) (i) ප්‍රේෂණය දැකීමට හෝ ඊට සවන් දීමට සෘජු අය කිරීමක් කරනු ලබන්නේ නම් ; හෝ

(ii) එසේ ලැබෙන ප්‍රේෂණය තවදුරටත් මහජනයා වෙත ප්‍රේෂණය කරනු ලබන්නේ නම් මිස,

පෞද්ගලික නිවාසවල සාමාන්‍යයෙන් භාවිත කරන ස්වභාවයේ තනි උපකරණයක් මත පොදු ප්‍රතිග්‍රහණයක් වශයෙන් සම්ප්‍රේෂණය කරගන්නා යම් කෘතියක ප්‍රදර්ශනය කිරීමක් හෝ රහපෑමක් සංනිවේදනය කිරීම,

ප්‍රකාශන අයිතිය කඩ කිරීමක් නොවිය යුතු ය.

ප්‍රකාශන අයිතිය බලපවත්නා කාලය.

13. (1) (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම්, කර්තෘවරයාගේ ජීවිත කාලය තුළ සහ මරණය සිදු වූ දිනයේ සිට අවුරුදු හැත්තෑවක කාලයක් තුළ ආරක්ෂා වන්නේ ය.

(2) හවුල් කර්තෘත්ව කෘතියක් සම්බන්ධයෙන් වනවිට එම කෘතියේ ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම්, අවසන් වශයෙන් ජීවත්ව සිටින කර්තෘවරයාගේ ජීවිත කාලය තුළ සහ අවසන් වශයෙන් ජීවත්ව සිටින කර්තෘවරයාගේ මරණය සිදු වූ දිනයේ සිට අවුරුදු හැත්තෑවක වැඩිපුර කාලයක් තුළ ආරක්ෂා වන්නේ ය.

(3) ව්‍යවහාරික කලා කෘතියක් නොවන සාමූහික කෘතියක් සම්බන්ධයෙන් වන විට සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් සම්බන්ධයෙන් වන විට, ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම්, එම කෘතිය පළමුවෙන්ම පළකරනු ලැබූ දින සිට හෝ එසේ පළ කර නොමැති නම්, එම කෘතිය නිර්මාණය කරනු ලැබූ දින සිට අවුරුදු හැත්තෑවක කාලයක් තුළ ආරක්ෂා වන්නේ ය.

(4) නිර්නාමිකව හෝ ආරූඪ නාමයක් යටතේ හෝ ප්‍රසිද්ධ කරන ලද කෘතියක් සම්බන්ධයෙන් වන විට, ආර්ථික සහ සාදාවාරාත්මක අයිතිවාසිකම්, එම කෘතිය මුලින්ම ප්‍රසිද්ධ කරන ලද දිනයේ සිට අවුරුදු හැත්තෑවක කාලයක් තුළ ආරක්ෂා වන්නේ ය :

එසේ වුව ද එකී කාලසීමාව ඉකුත් වීමට පෙර කර්තෘවරයාගේ අනන්‍යතාව අනාවරණය වුවහොත් හෝ කර්තෘගේ අනන්‍යතාව පිළිබඳව තවදුරටත් සැකයක් නොමැති අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) ව්‍යවහාරික කලා කෘතියක් සම්බන්ධයෙන් වන විට, ආර්ථික හා සදාචාරාත්මක අයිතිවාසිකම් කෘතිය නිර්මාණය කළ දින සිට අවුරුදු විසිපහක කාලයක් තුළ ආරක්ෂා වන්නේ ය.

(6) ඉහත සඳහන් උපවගන්තිවල විධිවිධාන යටතේ වූ සෑම කාලසීමාවක්ම, එය අන්‍යාකාරයෙන් අවසන් වන ලිත් වර්ෂයේ අවසානය දක්වා ව්‍යාප්ත විය යුතු ය.

ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිය.

14. (1) මේ වගන්තියේ (2), (3), (4) සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු වන්නේ එම කෘතිය නිර්මාණය කළ කර්තෘවරයා ය.

(2) හවුල් කර්තෘත්ව කෘති සම්බන්ධයෙන් වන විට, එම හවුල් කර්තෘවරයන් ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරුවන් විය යුතු ය. එසේ වුව ද හවුල් කර්තෘත්ව කෘතියක් වෙන වෙන ම භාවිතයට ගත හැකි කොටස්වලින් සමන්විත වන්නේ නම් සහ ඒ එක් එක් කොටසේ කර්තෘ හඳුනාගත හැකි වන්නේ නම්, එක් එක් කොටස නිර්මාණය කළ කර්තෘවරයා ඒ ඒ කොටසේ ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතු ය.

(3) සාමූහික කෘතියක් සම්බන්ධයෙන් වන විට ඒ කෘතිය නිර්මාණය කර ඇත්තේ යම් කායික පුද්ගලයකුගේ හෝ නෛතික අස්ථිත්වයක ක්‍රියාරම්භය මත හෝ මග පෙන්වීම යටතේ ද ඒ පුද්ගලයා, ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතු ය.

(4) කායික තැනැත්තකු හෝ නෛතික අස්ථිත්වයක් විසින් සේවයේ නියුක්ත කර සිටින කර්තෘවරයකු විසින් එම සේවා

නියුක්තියේ යෙදී සිටියදී නිර්මාණය කරනු ලැබූ කෘතියක් සම්බන්ධයෙන් වන විට, ගිවිසුමකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබුණහොත් මිස, සේවායෝජකයා, ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතු ය. එම කෘතිය කර්තෘ ලවා කොමිස් මුදලක් ප්‍රකාර කරවාගත් නිර්මාණයක් වන්නේ නම්, ගිවිසුමකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබුණහොත් මිස, එම කෘතිය නිර්මාණය සඳහා බලය පැවරූ තැනැත්තා එම කෘතියේ ආර්ථික අයිතිවාසිකම්වල අයිතිකරු විය යුතු ය.

(5) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් සම්බන්ධයෙන් වන විට, ගිවිසුමක අන්‍යාකාර විධිවිධාන සලසා ඇත්නම් මිස, එම කෘතියේ නිෂ්පාදකවරයා, එහි ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතු ය. එසේ වුව ද ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියේ සම කර්තෘවරුන් සහ එම ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතිය නිර්මාණයේ දී ඇතුළත් කර ගන්නා ලද හෝ අනුවර්තනය කරන ලද පූර්ව කෘතියක කර්තෘවරුන් විසින් පිළිවෙලින් ඒ කෘතිය නිර්මාණය කිරීමෙහි ලා සිදු කර තිබෙන මවුන්ගේ දායකත්වයේ ප්‍රමාණයට හෝ පූර්ව කෘතියේ ප්‍රමාණයට, එකී දායකත්ව හා මුල් කෘති ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියෙන් වෙන්ව ආර්ථික අයිතිවාසිකම් ක්‍රියාවල සීමාවට යටත්ව, ආර්ථික අයිතිවාසිකම් පවත්වාගෙන යා යුතු ය.

කර්තෘත්වයේ පූර්ව නිගමනය හා කර්තෘ නියෝජනය කිරීම.

15. (1) කෘතියක කර්තෘ ලෙස, සාමාන්‍ය ආකාරයට කෘතියෙහි නම සඳහන් වන කායික තැනැත්තා, ප්‍රතිවිරුද්ධ ඔප්පු කිරීමක් නොමැතිවිට දී එම කෘතියේ කර්තෘ බවට පූර්ව නිගමනය කළ යුතු ය. එසේ සඳහන් වන නම ආරූඪ නාමයක් වුව ද එම ආරූඪ නාමයෙන් කර්තෘගේ අනන්‍යභාවය පිළිබඳව සැකයක් ඇති නොවන අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක නම සඳහන්වන කායික තැනැත්තා හෝ නෛතික අස්ථිත්වය ප්‍රතිවිරුද්ධ ඔප්පු කිරීමක් නොමැති විට දී ඒ තැනැත්තා හෝ අස්ථිත්වය ඒ කෘතියේ නිෂ්පාදකවරයා බවට පූර්ව නිගමනය කළ යුතු ය.

කර්තෘගේ අයිතිවාසිකම් පාවාදීම සහ බලපත්‍ර.

16. (1) ප්‍රකාශන අයිතිය හිමිකරු 9 වන වගන්තියේ දක්වා ඇති–

(අ) ආර්ථික අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියා කිහිපයක් හෝ සියල්ල කිරීම සඳහා බලපත්‍රයක් කායික පුද්ගලයකුට හෝ නීතිමය අස්ථිත්වයකට ප්‍රදානය කරනු ලැබිය හැකි ය;

(ආ) ආර්ථික අයිතිවාසිකම් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් පාවාදීම හෝ පැවරීම කරනු ලැබිය හැකි ය.

(2) යම් ආර්ථික අයිතිවාසිකමක් පාවාදීමක් හෝ පවරාදීමක් නැතහොත් ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් බලය දෙනු ලැබීමට යටත්ව යම් ක්‍රියාවක් කිරීම සඳහා දෙන බලපත්‍රයක් පාවාදෙන්නා සහ පාවාදෙනු ලබන්නා, පැවරුම්කරු සහ පැවරුම්ලාභියා හෝ බලපත්‍රදායී සහ බලපත්‍රලාභී විසින් අත්සන් කළ ලියවිල්ලක් මගින් විය යුතු ය.

(3) යම් ආර්ථික අයිතිවාසිකමක් මුළුමණින් හෝ ඉන් කොටසක් පාවාදීමක් හෝ පවරා දීමක් හෝ ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් බලය දෙනු ලැබීමට යටත්ව යම් ක්‍රියාවක් කිරීම සඳහා දෙන බලපත්‍රයකට, එහි ප්‍රකාශිතව සඳහන් නොවන වෙනත් යම් අයිතිවාසිකම් පාවාදීමක් හෝ පවරා දීමක් හෝ අයිතිවාසිකම් සඳහා බලපත්‍රයක් දීමක් හෝ ඇතුළත් නොවිය යුතු සහ එසේ ඇතුළත් වූ ලෙස නොසැලකිය යුතු ය.

II වන පරිච්ඡේදය

සම්බන්ධිත අයිතිවාසිකම්

ඉදිරිපත් කරන්නන්ගේ, ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් නිෂ්පාදනයන්ගේ සහ විකාශන සංවිධානයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම

ඉදිරිපත් කරන්නාගේ අවසරය අවශ්‍ය ක්‍රියා.

17. (1) 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මෙහි පහත සඳහන් යම් ක්‍රියාවක් කිරීමට හෝ යම් ක්‍රියාවක් සඳහා බලය දීමට, ඉදිරිපත් කරන්නකුට පරම අයිතිවාසිකමක් තිබිය යුතු :—

(අ) තමාගේ ඉදිරිපත් කිරීම හෝ එහි සැලකිය යුතු කොටසක් විකාශනය කිරීම හෝ අන් යම් ආකාරයකින් සංනිවේදනය කිරීම-

(i) 21 වන වගන්තියේ නියමයන්ට යටතේ ස්ථාවර කර තිබෙන මාධ්‍යයක් නොවන වෙනත් යම් මාධ්‍යයක් උපයෝගී කර ගෙන සිදු කරනු ලබන්නා වූ ; හෝ

(ii) එම ඉදිරිපත් කිරීම හෝ එහි සැලකිය යුතු කොටසක් හෝ ප්‍රථම වරට විකාශනය කරන සංවිධානය විසින් කරනු ලබන හෝ බලය දෙන ලද නැවත විකාශනයක් වන්නා වූ,

අවස්ථාවක හැර, මුහුණෙන් ඉදිරිපත් කිරීම මහජනයා වෙත විකාශනය හෝ අන් ආකාරයකින් සංනිවේදනය කිරීම ;

(ආ) මාධ්‍යයක ස්ථාවර කර නොමැති ඔහුගේ ඉදිරිපත් කිරීම හෝ එහි සැලකිය යුතු කොටසක් හෝ එසේ ස්ථාවර කිරීම ;

(ඇ) මාධ්‍යයක ස්ථාවර කර තිබෙන ඔහුගේ ඉදිරිපත් කිරීම හෝ එහි සැලකිය යුතු කොටසක් හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීම.

(2) තමාගේ ඉදිරිපත් කිරීම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක ස්ථාවර කිරීමට, ඉදිරිපත් කරන්නකු විසින් බලය දුන් විට ඉන් ඉදිරියට (1) වන උපවගන්තියේ විධිවිධානවලට වැඩිදුර බලපෑමක් නොමැති විය යුතු ය.

(3) ඉදිරිපත් කරන්නකු විසින් තමන්ගේ රහ දැක්වීම සම්බන්ධයෙන් තමන්ට වැඩි වාසිදායක නියමයන් හා කොන්දේසි මත ගිවිසුම්වලට ඇතුළත්වීමේ අයිතිවාසිකම්, ඉදිරිපත් කරන්නන්ට අභිමිකරන බවට මේ වගන්තියේ අන්තර්ගත කිසිවක් අර්ථකථනය නොකළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අයිතිවාසිකම්, ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබූ මොහොතේ සිට එම ඉදිරිපත් කිරීම සිදු වූ වර්ෂයට පසුව එළඹෙන පණස්වන ලිත් වර්ෂයේ අවසානය දක්වා ආරක්ෂා විය යුතු ය.

ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම නිෂ්පාදකයන්ගේ අයිතිවාසිකම්.

18. (1) ශාබ්දික පටිගත කිරීමක හෝ නැටිගත කිරීමක නිෂ්පාදකයකුට, 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් කවර හෝ ක්‍රියාවක් කිරීමට හෝ ඒ ක්‍රියාවක් සඳහා බලය දීමට තමන්ට සීමා වූ අයිතිවාසිකමක් තිබිය යුතු ය :-

(අ) ශාබ්දික පටිගත කිරීමක් හෝ නැටිගත කිරීමක් සෘජුවම හෝ ඉන් සැලකිය යුතු කොටසක් හෝ සෘජුවම හෝ වක්‍රව ප්‍රතිනිෂ්පාදනය කිරීම ;

(ආ) ඒ ශාබ්දික පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ පිටපත් හෝ ඉන් සැලකිය යුතු කොටසක පිටපත් හෝ එහි නිෂ්පාදකයන්ගේ බලය දීම යටතේ ආනයනය කරන්නේ නම්, ඒ පිටපත් එසේ ආනයනය කිරීම ;

(ඇ) ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම හෝ ඉන් සැලකිය යුතු කොටසක් හෝ අනුවර්තනය හෝ වෙනත් විපර්යාසයක් සිදු කිරීම ;

(ඈ) කුලියට දෙන පිටපතේ අයිතිය නොතකා ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක හෝ ඉන් සැලකිය යුතු කොටසක හෝ පිටපතක් කුලියට දීම ;

(ඉ) ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක හෝ ඉන් සැලකිය යුතු කොටසක මුල් පිටපත හෝ අනුපිටපත්, විකිණීම හෝ විකිණීම සඳහා අර්පණය කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අයිතිවාසිකම්, එම ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම පළ කිරීම, එය පළ කරනු ලැබූ වර්ෂයේ සිට පණස්වන ලිත් වර්ෂයේ අවසානය දක්වා, එම ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම පළ කර නොමැති නම්, එය මාධ්‍යයක ස්ථාවර කරනු ලැබූ දිනයේ සිට එය මාධ්‍යයක ස්ථාවර කරනු ලැබූ වර්ෂයට පසුව සිට එළඹෙන පණස්වන ලිත් වර්ෂයේ අවසානය දක්වා ආරක්ෂා කළ යුතු ය.

ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් පාවිච්චි කිරීම උදෙසා සාධාරණ පාරිශ්‍රමිකයක් ගෙවීම.

19. (1) වාණිජ කාර්ය සඳහා පළ කරන ලද ශාබ්දික පටිගත කිරීමක් හෝ තැටිගත කිරීමක් හෝ එවැනි ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක ප්‍රතිනිෂ්පාදනයක් මහජනයා වෙත කෙලින්ම විකාශනය කිරීම සඳහා හෝ අන්‍යාකාරයකින් සංනිවේදනය සඳහා ප්‍රයෝජනයට ගත්තොත් හෝ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළහොත් එය ප්‍රයෝජනයට ගත් තැනැත්තා විසින් එය ඉදිරිපත් කරන්නාට හෝ ඉදිරිපත් කරන්නන්ට සහ ඒ ශාබ්දික පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ නිෂ්පාදනයට එක් සාධාරණීය පාරිශ්‍රමික ගෙවීමක් කළ යුතු ය.

(2) ඉදිරිපත් කරන්නන් සහ නිෂ්පාදක අතර අන්‍යාකාර එකඟවීමක් ඇත්නම් මිස (1) වන උපවගන්තිය යටතේ නිෂ්පාදකවරයාට ලැබෙන මුදල් ප්‍රමාණයෙන් දෙකෙන් කොටසක් නිෂ්පාදක විසින් යම් ඉදිරිපත් කරන්නකුට ගෙවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාධාරණීය පාරිශ්‍රමිකයක් සඳහා අයිතිවාසිකම, එම ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම පළ කරනු ලැබූ දින සිට එය පළ කරනු ලැබූ අවුරුද්දෙන් පසුව එළඹෙන පණස්වන ලිත් වර්ෂයේ අවසානය දක්වා හෝ එම ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම පළකර නොමැති නම්, එම ශාබ්දික පටිගත කිරීම හෝ තැටිගත කිරීම මාධ්‍යයක ස්ථාවර කරනු ලැබූ දින සිට එම වර්ෂයෙන් පසුව එළඹෙන පණස්වන ලිත් වර්ෂයේ අවසානය දක්වා පැවතිය යුතු ය.

විකාශන සංවිධානයේ අයිතිවාසිකම්.

20. (1) 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් කවර හෝ ක්‍රියාවක් කිරීමට හෝ ඒ ක්‍රියාව සඳහා බලය දීමට, විකාශන සංවිධානයකට පරම අයිතිවාසිකම් තිබිය යුතු ය :—

(අ) ඒ විකාශනය හෝ ඉන් සැලකිය යුතු කොටසක් නැවත විකාශනය කිරීම ;

(ආ) එහි විකාශනය හෝ ඉන් සැලකිය යුතු කොටසක් මහජනයා වෙත සංනිවේදනය කිරීම ;

(ඇ) එහි විකාශනය හෝ ඉන් සැලකිය යුතු කොටසක් මාධ්‍යයක ස්ථාවර කිරීම ;

(ඈ) මාධ්‍යයක ස්ථාවර කරනු ලැබූ එහි විකාශනයක් හෝ ඉන් සැලකිය යුතු කොටසක් ප්‍රතිනිෂ්පාදනය කිරීම.

(2) මේ වගන්තිය යටතේ අයිතිවාසිකම, අදාළ විකාශනය සිදු කරනු ලැබූ මොහොතේ සිට එම විකාශනය සිදු වූ වර්ෂයෙන් පසුව එළඹෙන පනස් වන ලිත් වර්ෂයේ අවසානය දක්වා ආරක්ෂා කළ යුතු ය.

ආරක්ෂාව පිළිබඳ සීමා.

21. 17, 18, 19 සහ 20 වන වගන්තිවල සඳහන් ක්‍රියා පහත දැක්වෙන ක්‍රියාවකට සම්බන්ධ වන අවස්ථාවක, ඒ වගන්ති අදාළ නොවිය යුතු ය :—

(අ) කායික පුද්ගලයකු විසින් ඔහුගේ ම පෞද්ගලික කාර්යයක් සඳහා යොදා ගැනීම ;

(ආ) කාලීන තොරතුරු සැපයීමේ කාර්යය සඳහා යුක්ති සහගත ප්‍රමාණයට කාලීන සිද්ධි පිළිබඳව වාර්තා කිරීම සඳහා උපුටාගත් කෙටි කොටස් යොදා ගැනීම ;

(ඇ) මුහුණට මුහුණ ලා ඉගැන්වීමේ ක්‍රියාකාරකම්වල කාර්ය සඳහා හෝ විද්‍යා පර්යේෂණ සඳහා හෝ පමණක් ම යොදා ගැනීම ;

(ඈ) ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් බලය දීමකින් තොරව ප්‍රකාශන අයිතිය පිළිබඳ විධිවිධාන යටතේ යම් කෘතියක් ප්‍රයෝජනයට ගත හැකි අවස්ථා.

අයිතිවාසිකම් බලාත්මක කිරීම සහ ආරාවුල් නිරාකරණය.

22. (1) මේ කොටස යටතේ ආරක්ෂිත කවර හෝ අයිතිවාසිකමක් උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය කිරීමට සූදානම් වන කවර හෝ තැනැත්තකුට ඉන්ජංෂන් තහනමක් මගින් එසේ කිරීමේ තහනමක් කරනු ලැබිය හැකි අතර අලාභ ගෙවීමකට ද යටත් වන්නේ ය. සුදුසු යයි අධිකරණය සලකන වෙනත් යම් ප්‍රතිකර්ම අධිකරණයක් මගින් ඉල්ලා සිටීමට ඒ අයිතිවාසිකම්වල අයිතිකරුට හිමිකම් ඇත්තේ ය.

(2) (අ) (i) මේ කොටස යටතේ ආරක්ෂිත යම් අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනයක් කරගෙන යාමේ ක්‍රියාවක් නොකඩව කරගෙන යාම තහනම් කිරීම සඳහා යම් ඉන්ජංෂන් තහනමක් ප්‍රදානය කිරීම සඳහා ;

(ii) යම් කෘතියක හෝ ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක පිටපත් සෑදීම, විකිණීම, කුලියට දීම, හෝ ආනයනය, මේ කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකමක හිමිකරුවකු විසින් බලය දෙනු ලැබීමට යටත් වන අවස්ථාවක, එසේ එම හිමිකරු විසින් බලය දෙනු ලැබීමකින් තොරව සාදන, විකුණන හෝ කුලියට දෙන ලද බවට හෝ ආනයනය කර තිබෙන බවට සැක කරනු ලබන කෘති පිටපත් හෝ ශාබ්දික පටිගත කිරීම්වල හෝ තැටිගත කිරීම්වල පිටපත් රජය සන්තක කරන ලෙස මෙන්ම ඒවායේ ඇදුරුම්, එම පිටපත් සෑදීම සඳහා පාවිච්චි කළ හැකි මෙවලම් හා ඒ පිටපත් ගැන සඳහන් ලේඛන, ගිණුම් හෝ ව්‍යාපාරික ලිපි ලේඛන රජය සන්තක කරන ලෙස ආඥා කිරීම සඳහා ;

අධිකරණයට බලය හා අධිකරණ බලය ඇත්තේ ය.

(ආ) ඊට අමතරව උල්ලංඝනය කිරීමේ ක්‍රියාව හේතුකොටගෙන දරන්නට සිදු වූ පාඩු සඳහා අලාභ මෙන්ම, උල්ලංඝනය කිරීමේ හේතුවෙන් දරන්නට වූ වියදම් ද, නීති ගාස්තු ද, ඇතුළුව එම උල්ලංඝනය නි ෂා සිදු වූ වියදම් ගෙවන ලෙස එම උල්ලංඝනය කළ තැනැත්තාට ආඥා කිරීමට අධිකරණයට බලය ඇත්තේ ය. වෙනත් කරුණු අතර, අදාළ ද්‍රව්‍යමය වැදගත්කම, අයිතිවාසිකම හිමිකරුට විඳින්නට සිදු වූ සදාචාරාත්මක හානිය මෙන්ම එම උල්ලංඝනයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි උල්ලංඝනකරුගේ ලාභ ද සැලකිල්ලට ගෙන අලාභ ප්‍රමාණය නියම කළ යුතු ය. තමන් උල්ලංඝන ක්‍රියාවක යෙදී සිටින බව උල්ලංඝනකරු දැන නොසිටි හෝ දැන ගැනීමට යුක්තිසහගත හේතුවක් නොතිබුණු අවස්ථාවක, අධිකරණය විසින් එම අලාභය, උල්ලංඝනයේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි ලාභවලට හෝ පූර්වයෙන් තහවුරු කළ අලාභවලට සීමා කළ හැකි ය ;

(ඇ) මේ කොටස යටතේ ආරක්ෂිත යම් අයිතිවාසිකමක් උල්ලංඝනය කරමින් සාදන පිටපත් පවත්නා අවස්ථාවක, අයිතිවාසිකම්වල හිමිකරු අන්‍යාකාර ඉල්ලීමක් කළහොත් මිස ඒ පිටපත් සහ ඒවායේ ඇසුරුම් විනාශ කරන ලෙස හෝ වාණිජමය ක්‍රියා මාර්ගවලින් බාහිර ක්‍රමයකින් ඒ පිටපත් සම්බන්ධයෙන්, අයිතිවාසිකම්වල හිමිකරුට හානියක් සිදුවීම වැළැක්වෙන යම් ආකාරයකින්, යුක්තිසහගත වනතාක්දුරට වෙනත් යම් ආකාරයකට බැහැර කරන ලෙස හෝ ආඥා කිරීමට අධිකරණයට බලය ඇත්තේ ය. තුන්වන පාර්ශ්වයක් විසින් සද්භාවයෙන් අත්කරගෙන තිබෙන පිටපත් සම්බන්ධයෙන් සහ ඒවායේ ඇසුරුම් සම්බන්ධයෙන් මේ විධිවිධාන අදාළ නොවිය යුතු ය ;

(ඈ) උල්ලංඝන ක්‍රියා සිදුකිරීම හෝ කරගෙන යාම සඳහා මෙවලම් පාවිච්චි කිරීමේ අන්තරායක් පවතින විට ඒවා විනාශ කිරීම යුක්තිසහගත වන්නේ නම් එසේ යුක්තිසහගත වන තාක් දුරට ඒවා විනාශ කරන

ලෙස හෝ වාණිජ ක්‍රියාමාර්ගවලින් පරිබාහිර එම අයිතිවාසිකම් හිමිකරුට ඒවා හාරදීම ඇතුළුව, තවදුරටත් උල්ලංඝනය සිදුවීමේ අවදානම අවම කරගත හැකි වෙනත් යම් ආකාරයකට බැහැර කරන ලෙස හෝ අධිකරණය විසින් ආඥා කළ යුතු ය ;

(ඉ) උල්ලංඝනීය ක්‍රියා තවදුරටත් කරනු ලැබිය හැකි වීමේ අන්තරායක් පවතින අවස්ථාවක, අධිකරණය විසින් එම ක්‍රියා සිදුකිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි ආඥා කළ යුතු ය ;

(ඊ) උල්ලංඝනය කිරීම සහ ඊට ප්‍රතිකර්ම පිළිබඳව මේ පනතේ XXXV පරිච්ඡේදයේ විධිවිධාන, මේ කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම්වලට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය ;

(උ) මේ කොටස යටතේ ආරක්ෂිත කවර හෝ අයිතිවාසිකම් උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, පනතේ XXXVIII සහ XLI වන පරිච්ඡේදවල විධිවිධාන සලසා තිබෙන කවර හෝ දණ්ඩනයකට යටත් වන්නේ ය.

(3) (අ) මේ කොටස යටතේ තමාගේ අයිතිවාසිකම් කිසිවක් උල්ලංඝනය කරනු ලැබීම හෝ ඒවා කෙරෙහි වෙනත් ආකාරයක බලපෑමක් සිදුවීම නියා අතෘප්තියට පත් තැනැත්තකු විසින් නියමිත ආකෘතියෙහි නියමිත ආකාරයට කරනු ලැබූ ඉල්ලීමක් මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසු යයි කල්පනා කරන පරීක්ෂණයකින් පසුව, ඒ ඉල්ලීමට අදාළව තීරණයක් කිරීම අවශ්‍ය හෝ අවස්ථාවෝචිත යම් ප්‍රශ්නයක් පිළිබඳව තීරණයක් දැන්වීම සුදුසු යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තීරණය කරනු ලැබීමට පෙර, ඉල්ලීම කරන තැනැත්තාට සහ ඉල්ලීම කරන ලද තැනැත්තාට, ඒ තීරණය කරනු ලැබීමට පෙර, ඒ සම්බන්ධයෙන් තම නිහඬතාව දැක්වීමට සහ තම අදහස් ඉදිරිපත් කිරීමට සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු ය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය ක්‍රියාත්මක වීම අත්හිටුවන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබුවහොත් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ

තීරණයෙන් අතෘප්ත යම් තැනැත්තකු විසින් අධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර, එම කාරණා අධිකරණය විසින් තීරණය කරනු ලබන තෙක් ඒ තීරණය බලාත්මකව පැවතිය යුතු ය.

තාක්ෂණික උපක්‍රම සම්බන්ධ අපයෝජනවලට එරෙහි පියවර, ප්‍රතිකර්ම හා තහංචි.

23. (1) මෙහි පහත සඳහන් ක්‍රියා, නීති විරෝධී ක්‍රියා ලෙස සැලකිය යුතු අතර, 22 වන වගන්තිය අදාළ කර ගැනීමේ දී ප්‍රකාශන අයිතිය හිමිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සමග සමාග්‍රහණය කරනු ලැබිය යුතු ය :—

(i) කෘතියක ප්‍රතිනිෂ්පාදනය වැළැක්වීම හෝ පරිසීමා කිරීම හෝ සාදන පිටපත්වල තත්වයට හානි කිරීම පිණිස (දෙවනුව කී උපක්‍රමය හෝ උපකරණ මෙහි මින් මතු "පිටපත් ආරක්ෂා කිරීමේ හෝ පිටපත් කළමනාකරණය කිරීමේ උපක්‍රමය හෝ උපකරණය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.) අරමුණු කර තිබෙන යම් උපක්‍රමයක් හෝ උපකරණයක් මහහැර යාම පිණිස විශේෂයෙන් සැලසුම් කළ හෝ යොදා ගන්නා යම් උපක්‍රමයක් හෝ උපකරණයක් විකිණීම හෝ කුලියට දීම පිණිස නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම ;

(ii) මහජනයා වෙත විකාශනය කරනු ලබන හෝ චන්ද්‍රිකා මාධ්‍යයෙන් ප්‍රතිග්‍රහණය ද ඇතුළුව අන්‍යාකාරයකින් සංනිවේදනය කරනු ලබන සංඥා වැඩ සටහනක් ලබා ගැනීමට හිමිකම නොමැති තැනැත්තන්ට එය ලබාගැනීමට හැකියාව ලබා දීමට හෝ සහාය වීමට නැඹුරු කර ගත හැකි යම් උපක්‍රමයක් හෝ උපකරණයක් විකිණීම හෝ කුලියට දීම සඳහා නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම.

(2) 22 වන වගන්තිය අදාළ කර ගැනීමේ දී, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් නීති විරෝධී උපක්‍රමයක් හෝ උපකරණයක්, කෘතිවල පිටපත් උල්ලංඝනය කිරීමක් බවට සමාග්‍රහණය කරනු ලැබිය යුතු ය.

(3) කෘතියක ප්‍රකාශන අයිතිය හිමිකරුවකුට පහත සඳහන් අවස්ථාවල දී, එනම්–

(අ) පිටපත් ආරක්ෂා කිරීමේ හෝ පිටපත් කළමනාකරණය කිරීමේ උපක්‍රමයක් හෝ උපකරණයක් සමග ඒකාබද්ධ

කර කෘතියේ අවසරලත් පිටපත් ඉලෙක්ට්‍රොනික ස්වරූපයකින් විකිණීම හෝ කුලියට දීම සඳහා සාදනු ලැබ සහ විකිණීමට ඉදිරිපත් කරනු ලැබ ඇති සහ එකී උපක්‍රමය හෝ උපකරණය මගහැර යාම සඳහා විශේෂයෙන් සැලසුම් කළ හෝ යොදාගන්නා උපක්‍රමයක් හෝ උපකරණයක් විකිණීම හෝ කුලියට දීම සඳහා සාදනු ලැබ හෝ ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක ;

(ආ) මහජනයා වෙත විකාශනය කරනු ලබන හෝ වන්ද්‍රිකා මාධ්‍යය ද ඇතුළුව අන්‍යාකාරයකින් සංනිවේදනය කරනු ලබන ශ්‍රව්‍ය වැඩ සටහනකට හෘතිය ඇතුළත් කිරීම සඳහා අවසර දෙනු ලැබ ඒ වැඩසටහන ලබාගැනීමට හිමිකම් නොමැති තැනැත්තන්ට එය ලබා ගැනීමට හැකියාව ලබා දෙන හෝ සහාය වන උපක්‍රමයක් හෝ උපකරණයක්, විකිණීම හෝ කුලියට දීම සඳහා සාදනු ලබන හෝ ආනයනය කරනු ලබන අවස්ථාවක,

උල්ලංඝනය සම්බන්ධයෙන් 22 වන වගන්තියෙන් විධිවිධාන සලසා තිබෙන අලාභ සඳහා හිමිකම් තිබිය යුතු ය.

ජනප්‍රවාද ප්‍රකාශනය ආරක්ෂා කිරීම සහ වන්දි.

24. (1) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ජනප්‍රවාද ප්‍රකාශන–

(අ) ප්‍රතිනිෂ්පාදනය කරනු ලැබීම ;

(ආ) ඉදිරිපත් කිරීම, විකාශනය කිරීම, කේබල් මගින් හෝ වෙනත් ක්‍රමයකින් විසුරුවා හැරීම මගින් මහජනයා වෙත සංනිවේදනය කිරීම ;

(ඇ) එම ප්‍රකාශනය වාණිජ කාර්යයක් සඳහා හෝ සාම්ප්‍රදායික හෝ ව්‍යවහාරගත සන්දර්භයෙන් බාහිරව හෝ කරනු ලබන අවස්ථාවල දී, අනුවර්තනය, පරිවර්තනය හෝ වෙනත් ආකාරයක විපර්යාස කිරීම,

වැළැක්වෙන පරිදි ආරක්ෂා කරනු ලැබේ.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ එහි සඳහන් ක්‍රියා—

(අ) කායික පුද්ගලයකු විසින් මුළුමණින්ම ඔහුගේ පෞද්ගලික කාර්ය සඳහා ප්‍රයෝජනයට ගැනීම හා සම්බන්ධව වන අවස්ථාවක ;

(ආ) කාලීන තොරතුරු සැපයීමේ කාර්ය සඳහා පාවිච්චි කිරීමට කාලීන සිද්ධි වාර්තා කිරීම පිණිස සාධාරණීය වන ප්‍රමාණයට කෙටි උපුටා ගත් කොටස් යොදා ගන්නා අවස්ථාවක ;

(ඇ) මුහුණට මුහුණ ලා ඉගැන්වීමේ කාර්යයන් සඳහා හෝ විද්‍යාත්මක පර්යේෂණ සඳහා හෝ පමණක්ම යොදාගැනීම සම්බන්ධයෙන් වන අවස්ථාවක ;

(ඈ) කෘතියක්, එහි ප්‍රකාශන අයිතිය හිමිකරුවකුගේ අවසරය දීමකින් තොරව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි 11 වන හා 12 වන වගන්තිවල සඳහන් අවස්ථාවක,

වන විට ඒ උපවගන්තිය මගින් පැවරෙන අයිතිවාසිකම්වලට අදාළ නොවිය යුතු ය.

(3) සියලු මුද්‍රිත ප්‍රකාශනවල දී සහ මහජනයා වෙත සංනිවේදනය කෙරෙන යම් හඳුනාගත හැකි ජනප්‍රවාද ප්‍රකාශනයක, උපයෝගී කරගෙන තිබෙන ප්‍රකාශනයේ මූලාරම්භය කවර ජන කොට්ඨාසයකින්, නැතහොත් කවර ස්ථානයකින් ව්‍යුත්පන්න වූයේ ද යන වග නියි ආකාරයෙන් සහ සාධාරණ පරිචයන්ට අනුකූල වන පරිදි දැක්වීමෙන් එහි ප්‍රභවය පෙන්නුම් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා සඳහා නියමිත ශාස්තුවක් ගෙවීමට යටත්ව, බලය දීමේ අයිතිවාසිකම අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු නිසි බලධරයකු වෙත භාර විය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ මේ සම්බන්ධයෙන් අයකරනු ලබන මුදල් සංස්කෘතික සංවර්ධන කාර්ය සඳහා ප්‍රයෝජනයට ගත යුතු ය.

(6) (4) වන උපවගන්තියේ සඳහන් නිසි බලධරයාගේ අවසරය නොමැතිව, මේ වගන්තියෙන් අවසර නොමැති ආකාරයකට ජනප්‍රවාද ප්‍රකාශනයක් ප්‍රයෝජනයට ගන්නා කවර හෝ තැනැත්තෙක් මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන අතර, අලාභ ගෙවීමට අදාළ අවස්ථාගත තත්ත්වය යටතේ ප්‍රදානය කිරීම යෝග්‍ය යයි අධිකරණය සලකන ඉන්ජන්ෂන් නහනම්වලට සහ වෙනත් යම් ප්‍රතිකර්මයට ද ඒ තැනැත්තා යටත් වන්නේ ය.

සංගමයක් ලියපදිංචි කිරීම, සංගම් විසින් අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදීම, අයිතිවාසිකම් කෙරෙහි පාලනය සහ වාර්තාව ඉදිරිපත් කිරීම.

25. (1) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව, කිසි තැනැත්තකු හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ මේ කොටස යටතේ ආරක්ෂිත යම් අයිතිවාසිකමක් වෙනුවෙන්, මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ හෝ ඒ විධිවිධානවලට අනුකූලව හැර, බලපත්‍ර නිකුත් කිරීමේ හෝ ප්‍රදානය කිරීමේ ව්‍යාපාරය ආරම්භ කිරීම හෝ කරගෙන යාම හෝ නොකළ යුතු ය :

එසේ වුවද, ඒ අයිතිවාසිකමක අයිතිකරු විසින්, ඔහුගේම අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඔහුගේ පෞද්ගලික නාත්වයෙන් බලපත්‍රදීම සඳහා ඒ අයිතිකරුවකුට තවදුරටත් අයිතිය නිබිය යුතු ය. ඒ අයිතිකරු මේ වගන්තිය යටතේ ලියාපදිංචි සංගමයක සාමාජිකයකු නම්, එම බලපත්‍ර ප්‍රදානය කිරීම ඒ සංගමයේ සාමාජිකයකු වශයෙන් පවත්නා ඔහුගේ බැඳීම්වලට අනුකූල විය යුතු ය.

(ආ) නියම කරනු ලැබිය හැකි කොන්දේසි සපුරාලන යම් සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසින්, (අ) ඡේදයේ නිශ්චය කොට දැක්වෙන ව්‍යාපාර කරගෙන යාම සඳහා සහ සංගමය ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම් හිමිකරුවන්ගේ ස්වාර්ථ සම්බන්ධතා ද විශේෂයෙන් මහජනයාගේ ස්වාර්ථ සම්බන්ධතා සහ පහසුව ද අදාළ අයිතිවාසිකම් වෙනුවෙන් බලපත්‍ර ඉල්ලා සිටීමට ඉඩ තිබෙන කණ්ඩායම්වල හා ඉල්ලුම්කරුගේ හැකියාව සහ ව්‍යාප්තිය ප්‍රවණතාවය ද සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චය කොට දැක්වෙන ව්‍යාපාර පටන්ගැන්ම හෝ පවත්වාගෙන යාම සඳහා අවසර දෙනු

ලැබිය හැකි අතර නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, ඒ පුද්ගල හෝ පුද්ගල මණ්ඩලය, සාමූහික සංගමයක් ලෙස ලියාපදිංචි කළ හැකි ය :

එසේ වුවද එකම පන්තියේ අයිතිවාසිකම් වෙනුවෙන් ව්‍යාපාරය කරගෙන යාමට, සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි සංගම් එකකට වඩා ලියාපදිංචි නොකළ යුතු ය.

(ඇ) අදාළ අයිතිවාසිකම් හිමිකරුවන්ගේ ස්වාර්ථ සම්බන්ධතාවලට හානිකර ආකාරයෙන් සංගමයක් පවත්වාගෙන යන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සැහීමට පත් වුවහොත්, අවශ්‍ය විය හැකි පරිදි යම් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, ඒ සංගමයේ ලියාපදිංචිය සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දැක්වෙන පරිදි ව්‍යාපාරය පවත්වාගෙන යාමේ අවසරය අවලංගු කිරීම හෝ අත්හිටුවීම කළ හැකි ය.

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නියමයක් මගින්, ඒ සංගමයේ ලියාපදිංචිය සහ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ අවසරය, පරීක්ෂණය පවත්වන තෙක්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරන එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට, මේ උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අවලංගු කිරීම හෝ අත්හිටුවීම සිදුකළ හැකි ය.

(ඊ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සංගමයක ලියාපදිංචිය අත්හිටුවීම සිදු කළ විට ඔහු විසින් ඉන්පසු සංගමයේ කර්තව්‍ය කරගෙන යාම සඳහා පරිපාලකයකු පත් කළ යුතු ය.

(2) (අ) නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව–

(i) සංගමයක් විසින්, අයිතිවාසිකම් හිමියකුගෙන්, මේ කොටස යටතේ යම්

අයිතියක් ක්‍රියාවේ යෙදවීමේ අනන්‍ය බලය පැවරීමක්, බලපත්‍ර නිකුත් කිරීම මගින් හෝ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම මගින් හෝ ඒ දෙකම මගින් අයිතිවාසිකම් හිමියකුගෙන් භාරගත හැකි ය ;

(ii) අයිතිවාසිකම් හිමිකරුවකු සහ සංගමය අතර යම් ගිවිසුමක් යටතේ, සංගමය සතු අයිතිවාසිකම්වලට අගතියක් නොමැතිව, එවැනි බලය පැවරීමක් ඉවත් කර ගැනීමට අයිතිවාසිකම් හිමියකුට අයිතිය තිබිය යුතු ය.

(ආ) සංගමය විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාවේ යොදන අයිතිවාසිකම් යම් විදේශ රටක දී ක්‍රියාවේ යෙදවීම ඒ විදේශීය සංගමයට හෝ සංවිධානයට භාර දීම, පිණිස හෝ ඒ විදේශීය සංගමය හෝ සංවිධානය විදේශීය රටක ක්‍රියාවේ යෙදන අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ ක්‍රියාවේ යෙදීම පිණිස සහ මේ කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම්වලට අනුරූප අයිතිවාසිකම් ක්‍රියාවේ යොදන කවර හෝ විදේශීය සංගමයක් හෝ සංවිධානයක් සමඟ සංගමයක් විසින් ගිවිසුම්වලට එළඹීම නීත්‍යනුකූල වන්නේ ය :

එසේ වුවද එවැනි සංගමයක් හෝ සංවිධානයක් විසින් බලපත්‍රයේ නියමයන් පිළිබඳව මේ කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම් සම්බන්ධව එවැනි විදේශ රටක දී අයකරන ගාස්තු බෙදීම පිළිබඳ නියමයන් සම්බන්ධයෙන් යම් විශේෂ සැලකිලි හෝ වෙනස්කම් දැක්වීමට අවසර නොදිය යුතු ය.

(ඇ) නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, සංගමයක් විසින් –

(i) මේ කොටස යටතේ ආරක්ෂිත යම් අයිතිවාසිකම් සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කළ හැකි ය ;

(ii) ඒ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කළ හැකි ය ;

(iii) ස්වකීය වියදම් සඳහා මුදලක් අඩුකර ගැනීමෙන් පසු එම ගාස්තු, එම අයිතිවාසිකම් හිමිකරුවන් අතර බෙදහැරිය හැකි ය ;

(iv) (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වෙනත් යම් කාර්යය සිදු කළ හැකි ය.

(3) (අ) සෑම සංගමයක් ම, මේ කොටස යටතේ අයිතිවාසිකම් හිමිකරුවන්ගේ සාමූහික පාලනයට යටත් වන අතර නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට ඔවුන්ගේ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමේ දී –

(i) ගාස්තු අයකිරීමේ හා බෙදාහැරීමේ සංගමයේ ක්‍රියා පිළියෙල සඳහා එම අයිතිවාසිකම් හිමිකරුවන්ගේ අනුමතිය ලබාගත යුතු ය ;

(ii) ගාස්තු වශයෙන් අයකර ගත්නා මුදල් ප්‍රමාණයත්, ඒ අයිතිවාසිකම් හිමිකරුවන් අතර බෙදහැරීම නොවන කාර්යයක් සඳහා යොදා ගැනීමේ දී ඒ සඳහා ඔවුන්ගේ අනුමතය ලබා ගත යුතු ය ; තවද

(iii) එම අයිතිවාසිකම් හිමිකරුවන්ගේ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදීමට අදාළව සංගමයේ සියලු ක්‍රියාකාරකම් පිළිබඳව එම අයිතිවාසිකම් හිමිකරුවන්ට, සම්පූර්ණ හා සවිස්තර තොරතුරු නිතිපතා සැපයිය යුතු ය.

(ආ) අයිතිවාසිකම් හිමිකරුවන් අතර බෙදාහරින සියලු ගාස්තු හැකිතාක් දුරට, ඔවුන්ගේ කෘති නියම වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබූ අනුපාතයට අනුව බෙදාහැරිය යුතු ය.

(4) (අ) නියම කරනු ලැබිය හැකි වාර වාර්තා, සෑම සමිතියක්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) සමිතියක් විසින් ක්‍රියාවේ යොදනු ලබන අධිනිවාසිකම් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු, මේ කොටසේ විධිවිධානවලට අනුකූලව යොදා ගනු ලබන බවට හෝ බෙදාහරිනු ලබන බවට සෑහීමට පත්වීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කවර හෝ සමිතියකින් යම් රජෝර්තු හෝ වාර්තා කැඳවනු ලැබිය හැකි ය.

අදළ වන ප්‍රමාණය.

26. (1) ශාස්ත්‍රීය, කලාත්මක සහ විද්‍යාත්මක කෘති ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන :—

(අ) ශ්‍රී ලංකා ජාතිකයන් වන හෝ ඇබ්බැහි පදිංචිය ශ්‍රී ලංකාවෙහි වන කර්තෘවරුන්ගේ කෘතිවලට ; සහ

(ආ) ශ්‍රී ලංකාවෙහි ප්‍රථමයෙන් පළ කරන ලද කෘතිවලට සහ කර්තෘවරයාගේ ජාතිකත්වය හෝ පදිංචිය කුමක් වුව ද වෙනත් රටක ප්‍රථමයෙන් පළ කරන ලද සහ එසේ පළ කරනු ලැබූ දින සිට දවස් තිහක් ඇතුළත ශ්‍රී ලංකාවෙහි ද පළ කරන ලද කෘතිවලට,

අදළ විය යුතු ය.

(2) ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන යම් අන්තර් ජාතික සම්මුතියක් හෝ වෙනත් අන්තර් ජාතික ගිවිසුමක් ප්‍රකාර සහ ඒ සම්මුතියකට හෝ ගිවිසුමකට අනුකූලව ශ්‍රී ලංකාවේ ආරක්ෂිත කෘතිවලට ද මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඉදිරිපත්කරන්නන් ආරක්ෂා කිරීම.

27. (1) ඉදිරිපත්කරන්නන් ආරක්ෂා කිරීම සඳහා මේ කොටසේ විධිවිධාන පහත සඳහන් ඉදිරිපත්කරන්නන්ට අදාළ විය යුතු ය :—

(අ) ශ්‍රී ලාංකික ජාතිකයන් වන ඉදිරිපත්කරන්නන්ට ;

(ආ) ශ්‍රී ලංකාවේ ජාතිකයන් නොවන එහෙත් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම :—

(i) ශ්‍රී ලංකාවේ දේශසීමා ඇතුළත සිදු කරනු ලබන ; හෝ

(ii) මේ කොටස යටතේ ආරක්ෂිත ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම්වලට සංයුක්ත කර නිබෙන ; හෝ

(iii) ශාබ්දික පටිගත කිරීමක් හෝ නැටිගත කිරීමක් ඔගින් තහවුරු කර නොමැති එහෙත් මේ කොටස යටතේ ආරක්ෂා කරනු ලැබීමට සුදුසුකම් ලබන විකාශනවල ඇතුළත්ව තිබෙන,

ඉදිරිපත් කරන්නන්ට.

(2) ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම් ආරක්ෂා කිරීම පිළිබඳව මේ කොටසේ විධිවිධාන පහත සඳහන් ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම්වලට අදාළ වේ :—

(අ) නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවේ ජාතිකයන් වන ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම් ;

(ආ) ප්‍රථමයෙන් ම ශ්‍රී ලංකාවේ දී තහවුරු කරන ලද ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම් ; සහ

(ඇ) ප්‍රථමයෙන් ම ශ්‍රී ලංකාවේ දී ප්‍රසිද්ධ කරන ලද ශාබ්දික පටිගත කිරීම් හෝ නැටිගත කිරීම්.

(3) විකාශන ආරක්ෂා කිරීම පිළිබඳව මේ කොටසේ විධිවිධාන පහත සඳහන් විකාශනවලට අදාළ වේ :—

(අ) විකාශන සංවිධානවල ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන විකාශන සංවිධානවල විකාශන ; සහ

(ආ) ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන සම්ප්‍රේෂණාගාර මගින් සම්ප්‍රේෂණය කරන විකාශන.

(4) ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන අන්තර්ජාතික සම්මුතියක් හෝ වෙනත් අන්තර්ජාතික ගිවිසුමක් ප්‍රකාර හෝ ඒ සම්මුතියකට හෝ ගිවිසුමකට අනුකූලව ආරක්ෂිත රහ දක්වන්නාන්ට, ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් නිෂ්පාදකයන්ට සහ විකාශන සංවිධානවලට ඇතුළුව මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

III වන කොටස

III වන පරිච්ඡේදය

කාර්මික සැලසුම්

මේ කොටසේ විෂය පථය සහ අර්ථකථනය

28. මේ කොටස යටතේ කාර්මික සැලසුම්වල ආරක්ෂාව සඳහා සලසා තිබෙන විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ, විශේෂයෙන් මේ පනතේ II වන කොටස යටතේ, සලසා තිබෙන ආරක්ෂාවට අමතරව විය යුතු අතර එහි බලහීන කිරීමක් ලෙස නොවිය යුතු ය. ආරක්ෂාව සඳහා කොන්දේසි.

29. මේ කොටස යටතේ සලසා ඇති ආරක්ෂාව – මේ කොටසෙහි විෂය පථය.

(අ) නව කාර්මික සැලසුම්වලට සමාණක් අදාළ විය යුතු ය.

(ආ) යම් ගර්හනීය සැලසුමකින් සමන්විත වන්නා වූ හෝ සදාචාරයට මහජන පාමයට හෝ මහජන සම්බන්ධතාවලට පටහැනි වන්නා වූ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ඒ කාරණය යොමුකරනු ලැබ තිබෙන යම් අධිකරණයක මතය අනුව යම් ජන කොට්ඨාසයක ආගමික හෝ වාර්ගික හැඟීම් පෑරවීමට ඉඩ ඇති කාර්මික සැලසුමකට අදාළ නොවිය යුතු ය.

30. මේ කොටසෙහි කාර්ය සඳහා, කාර්මික හෝ හස්ත කර්මාන්ත නිෂ්පාදනයකට විශේෂ පෙනුමක් ගෙන දෙන සහ කාර්මික හෝ හස්ත කර්මාන්ත නිෂ්පාදනයකට මෝස්තරයක් ලෙස උපයෝගි කර ගත් හැකි යම් රේඛා පිළිබඳ හෝ වර්ණ පිළිබඳ ත්‍රිමාන ආකෘතියක් පිළිබඳ හෝ යම් රේඛා හෝ වර්ණ ආශ්‍රිත වුව හෝ නොවුව ද කාර්මික සැලසුමක් ලෙස සැලකිය යුතු ය : කාර්මික සැලසුම් යන්නෙහි අර්ථ කථනය.

එසේ වුව ද, හුදෙක් තාක්ෂණික ප්‍රතිඵල ලබා ගැනීමෙහි ලා උපයෝගී වන කාර්මික සැලසුමක ඇති කිසිවක් මේ කොටස යටතේ ආරක්ෂා නොකළ යුතු ය.

නවතාව යන්නෙහි අර්ථකථනය.

31. (1) මේ කොටසේ කාර්ය සඳහා, අලුත් කාර්මික සැලසුමක් යන්නෙන් ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ දිනයට පෙර හෝ ඒ සම්බන්ධයෙන් යථා පරිදි හිමිකම් දැක්වූ ප්‍රමුඛත්ව දිනයට පෙර හෝ විස්තරයක මාර්ගයෙන්, භාවිතයෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් ලෝකයේ කිසිම ස්ථානයක දී කවර වූ හෝ යම් වේලාවක දී මහජනයා වෙත ඉදිරිපත් කරනු නොලැබූ කාර්මික සැලසුමක් අදහස් වේ.

(2) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පෙරාතුව වූ මාස හයක කාල සීමාව ඇතුළත යම් කාර්මික සැලසුමක් නිලමය හෝ නිල වශයෙන් සම්මත අන්තර්ජාතික ප්‍රදර්ශනයක ප්‍රදර්ශනය කර තිබීම පමණක් හේතුකොටගෙන එය මහජනයා වෙත ඉදිරිපත් කරනු ලැබූ ලෙස නොසැලකිය යුතු ය.

(3) හුදෙක් කාර්මික සැලසුමක් පෙර පැවති කාර්මික සැලසුමකට සුළු වශයෙන් වෙනස්වීම පමණක් හේතුකොටගෙන හෝ එය පෙර පැවති කාර්මික සැලසුම් හා සම්බන්ධ නිෂ්පාදනයකට වෙනස් වූ නිෂ්පාදනයක් හා සම්බන්ධ වීම පමණක් හේතුකොටගෙන ඒ කාර්මික සැලසුම අලුත් කාර්මික සැලසුමක් ලෙස නොසැලකිය යුතු ය.

IV වන පරිච්ඡේදය

කාර්මික සැලසුමක් ආරක්ෂා කිරීමට ඇති අයිතිවාසිකම

කාර්මික සැලසුමක හිමිකම සහ එය ආරක්ෂා කර ගැනීමට ඇති අයිතිවාසිකම.

32. (1) කාර්මික සැලසුමක ආරක්ෂාව ලබා ගැනීමේ අයිතිවාසිකම ඒ කාර්මික සැලසුමේ හිමියාට අයිතිය.

(2) 34 වන වගන්තියේ විධිවිධානයන්ට යටත්ව, කාර්මික සැලසුමක හිමියා වන්නේ, ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා හෝ ඔහුගේ අයිතියට අනුප්‍රාප්තිකයා ය.

(3) තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩිදෙනකු විසින් කාර්මික සැලසුමක් හවුලේ නිර්මාණය කරනු ලැබ ඇති අවස්ථාවක, ආරක්ෂාව ලැබීමේ අයිතිවාසිකම ඔවුන්ට හවුලේ අයිති විය යුතු ය :

එසේ වුවද, නුදෙක් කාර්මික සැලසුමක් නිර්මාණය කිරීමෙහිලා පමණක් සහාය වී ඇති එහෙත් නිර්මාණාත්මක ස්වභාවයකින් යුක්ත කිසිවක් කර නොමැති තැනැත්තකු ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා ලෙස හෝ සම නිර්මාතෘවරයා ලෙස හෝ නොසැලකිය යුතු ය.

(4) 33 වන හා 34 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ප්‍රථමයෙන්ම ඉදිරිපත් කළ තැනැත්තා හෝ තම ඉල්ලුම් පත්‍රය සඳහා මුල්ම ප්‍රමුඛත්වයට ප්‍රථමයෙන්ම යථාපරිදි හිමිකම් දක්වන තැනැත්තා ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා ලෙස සැලකිය යුතු ය.

කාර්මික සැලසුම.

33. (1) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට විෂය වූ හෝ ලියාපදිංචි කරනු ලැබූ හෝ කාර්මික සැලසුමක අත්‍යවශ්‍ය මූලිකාංග ආරක්ෂාව ලැබීමේ අයිතිවාසිකම වෙනත් තැනැත්තකුට අයත් කාර්මික සැලසුමකින් ව්‍යුත්පන්න කරගෙන ඇති අවස්ථාවක, ඒ ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචිය තමා වෙත පවරා දෙන ලෙස, ඒ වෙනත් තැනැත්තා විසින් ලියවිල්ලක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) පාවා දෙන ලෙස කරන ඉල්ලීම නියමිත ගාස්තුව සහ ඉල්ලුම්කරුගේ ඉල්ලීම තහවුරු කිරීම සඳහා සාක්ෂි ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ලියාපදිංචි කිරීම ඒ වනවිටත් කරනු ලැබ තිබෙන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රය 44 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම පළ කරනු ලැබීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එම පාවා දෙන ලෙස කරන ඉල්ලීමේ පිටපතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී කාර්මික සැලසුම ලියාපදිංචි කරන ලෙස ඉල්ලුම්කරුට හෝ කාර්මික සැලසුමේ ලියාපදිංචි අයිතිකරුට අප්‍රමාදව යැවිය යුතු අතර, එම නිවේදනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත, ඔහු විසින් ඔහුගේ ඉල්ලීම තහවුරු කරන සාක්ෂි සහ නියමිත ගාස්තුව ද, සමග නියමිත ආකාරයෙන් වූ හරස් ප්‍රකාශයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් හරස් ප්‍රකාශයක් ඉල්ලුම්කරු විසින් හෝ ලියාපදිංචි අයිතිකරු විසින් හෝ ඉදිරිපත්

කරනු ලැබුවහොත්, ඉල්ලුම්පත්‍රය හෝ ලියාපදිංචිය පාවා දෙනු ලැබිය යුතු ද යන වග සහ අදාළ වන අවස්ථාවල දී ලේඛනය නිවැරදි කළ යුතු ද යන වග, පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් පසුව. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හැකිතාක් ඉක්මණින් තීරණය කරනු ලැබිය යුතු ය. (3) වන උපවගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි යම් හරස් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මාස තුනක කාලසීමාව ඇතුළත ඉල්ලුම්කරු විසින් හෝ ලියාපදිංචි අයිතිකරු විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම් පත්‍රයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලැබිය යුතු ය.

(5) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ගොනු කරනු ලැබ ඇති අවස්ථාවක, ආරක්ෂාව ලැබීමේ අයිතිවාසිකම හිමි තැනැත්තා විසින් ඒ ඉල්ලුම් පත්‍රය ගොනු කිරීම ගැන කැමැත්ත දෙනු ලැබුවහොත්, ඒ කැමැත්ත ඒ ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබූ දිනයේ සිට බලාත්මකව පවතින ලෙස, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

සේවා නියුක්තයකු විසින් නිර්මාණය කරන ලද කාර්මික සැලසුමක් සේවා යෝජකට උපවිය යුතු බව.

34. (1) යම් සේවානියුක්ති ගිවිසුමක හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමක හෝ පටහැනිව යම් විධිවිධානයක් නොමැති විටෙක, ඒ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීමේ දී නිර්මාණය කරනු ලබන කාර්මික සැලසුමක හිමිකම, අවස්ථාවෝචිත පරිදි, සේවායෝජකට හෝ ඒ වැඩය භාර දුන් තැනැත්තාට හෝ උපවිත වෙතැයි සැලකිය යුතු ය :

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි, සේවානියුක්ති ගිවිසුමට හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමට හෝ ඇතුළත් වූ අවස්ථාවේ දී, පාර්ශ්වකරුවන්ට කල්තියා සාධාරණව දැනගැනීමට හැකි වූ ආර්ථික වටිනාකමට වැඩි ආර්ථික වටිනාකමක් කාර්මික සැලසුම අත්කර ගන්නා වූ අවස්ථාවක, පාර්ශ්වකරුවන් අතර පාරිශ්‍රමිකයන් පිළිබඳ එකඟත්වයක් නොමැති නම්, නිර්මාතෘවරයා විසින් අධිකරණය වෙත කරන ඉල්ලීමක් මත අධිකරණය විසින් නියම කරනු ලබන සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට නිර්මාතෘවරයාට හිමිකම් නිබිය යුතු ය.

(2) යම් සේවා නියුක්තයකුට ඔහුගේ සේවා නියුක්ති ගිවිසුමෙන් නිර්මාණාත්මක කාර්යයක යෙදීමට නියම කර නොමැති විටෙක,

ඒ සේවා නියුක්තයා විසින් උපයෝගී කරගනු ලැබීම සඳහා සේවායෝජකයා විසින් ඔහුට සපයන ලද දත්ත උපක්‍රම උපයෝගී කොට ගෙන, ඔහුගේ සේවායෝජකගේ කාර්ය ක්ෂේත්‍රයෙහි දී ඔහු විසින් කාර්මික සැලසුමක් නිර්මාණය කරනු ලබන අවස්ථාවක, සේවා නියුක්ති ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති නම්, ඒ කාර්මික සැලසුමෙහි හිමිකම සේවායෝජකයාට උපචිත වෙතැයි සැලකිය යුතු ය :

එසේ වුවද, සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට සේවා නියුක්තයා හිමිකම ලැබිය යුතු අතර පාරිශ්‍රමිකය පිළිබඳව පාර්ශ්වකරුවන් අතර එකඟත්වයක් නොමැති විටෙක, සේවානියුක්තයා විසින් අධිකරණය වෙත කරන ඉල්ලීමක් මත, ඔහුගේ පඩිනඩි, කාර්මික සැලසුමෙහි ආර්ථික වටිනාකම සහ එයින් සේවායෝජක ලබන යම් ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන, අධිකරණය විසින් ඒ පාරිශ්‍රමිකය නියම කළ හැකි ය.

(3) කාර්මික සැලසුමක නිර්මාතෘවරයා වෙත (1) වන සහ (2) වන උපවගන්තිවලින් පවරා ඇති අයිතිවාසිකම් ගිවිසුමක් මගින් සීමා නොකළ යුතු ය.

කාර්මික සැලසුමක නිර්මාතෘවරයා නම් කරනු ලැබීම.

35. (1) යම් කාර්මික සැලසුමක නිර්මාතෘවරයා විසින් ඒ නිර්මාතෘවරයා වශයෙන් ලියාපදිංචියෙහි මහුගේ නම යෙදීම අත්හැරීමට එකඟ බව ඔහු විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබ, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ප්‍රකාශයකින් දක්වනු ලැබුවහොත් හැර, ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා එහි නිර්මාතෘවරයා වශයෙන් ලියාපදිංචියෙහි නම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යම් ගිවිසුමක නියමයන් මගින් වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ විකරණය කිරීම නොකළ යුතු ය.

V වන පරිච්ඡේදය

ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍යතා කරුණු සහ ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය

ඉල්ලුම් පත්‍රයකට අවශ්‍ය කරුණු.

36. (1) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘතියෙහි ලා අධ්‍යක්ෂ ජනරාල්වරයා

වෙත නියමිත ගාස්තුව ද සමග ඉදිරිපත් කළ යුතු ය. තව ද, එහි පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය :—

(අ) කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ;

(ආ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය හා විස්තරය සහ ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්, ලිපි භාරදීම සඳහා ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනයක් ;

(ඇ) කාර්මික සැලසුම අඩංගු භාණ්ඩයෙහි ආදර්ශයක් සහ කාර්මික සැලසුම වර්ණයෙන් වන අවස්ථාවක, එහි ඡායාරූප හෝ ප්‍රස්තාරික නිරූපණයක වර්ණයෙන් වූ පිටපත් සහ සැලසුමෙහි චිත්‍ර සහ අනුරේඛන ;

(ඈ) කාර්මික සැලසුම භාවිත කරනු ලබන්නේ කුමන වර්ගයක නිෂ්පාදිත සඳහා ද යන්න පිළිබඳ සංඥාවක් හා වර්ගීකරණය සඳහා නියෝග මගින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක ඒ නිෂ්පාදිත ඇතුළත් කෙරෙන පන්තිය හෝ පන්ති පිළිබඳ සංඥාවක් ;

(ඉ) තම උපරිම දැනුම අනුව කාර්මික සැලසුම අලුත් කාර්මික සැලසුමක් බවට ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශයක්.

(2) කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා විසින් තමාගේ නම හා ලිපිනය සඳහන් කරමින් සහ තමා ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා බවට ලියාපදිංචියෙහි සඳහන් කරන ලෙස ඉල්ලීමක් ද කරමින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ හැකි ය.

(3) ඉල්ලුම්කරු කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා නොවන අවස්ථාවක, ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරුට ඇති අයිතිවාසිකම යුක්තිසහගත බව පෙන්වන ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉල්ලුම්කරු කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා නොවන සෑම කාරණයක දී ම (3) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශයේ පිටපතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිර්මාතෘවරයාට ලැබීමට සැලැස්විය යුතු ය. ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බැලීමේ ද, නියමිත ගාස්තුව ගෙවා එහි පිටපතක් ලබා ගැනීමේ ද අයිතිවාසිකම ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයාට තිබිය යුතු ය.

(5) ඉල්ලුම් පත්‍රය අනුයෝජිතයකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් ඒ අනුයෝජිතයාට ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් ඒ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රමුඛත්ව අයිතිවාසිකම්.

37. සම්මුති රටක දී කලින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ඇති ප්‍රමුඛත්වය තමන්ට ලබා ගැනීමට අපේක්ෂා කරන, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන්නකු විසින්, කලින් ගොනු කරන ලද ඉල්ලුම් පත්‍රයේ දිනයෙහි සිට මාස හයක් ඇතුළත, කලින් වූ ඉල්ලුම් පත්‍රයෙහි දිනය හා අංකය ද, ඉල්ලුම්කරුගේ නම සහ ඔහු විසින් හෝ කලින් හිමිකරු විසින් හෝ ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබූ රට ද දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් තම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය. තව ද, ශ්‍රී ලංකාවේ දී පසුව ගොනු කළ ඉල්ලුම් පත්‍රයෙහි දින සිට මාස තුනක් වූ කාල සීමාවක් ඇතුළත, කලින් වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද රටෙහි නිසි බලධරයා විසින් නිවැරදි බවට සහතික කරන ලද ඒ කලින් වූ ඉල්ලුම් පත්‍රයෙහි පිටපතක් ඒ ඉල්ලුම්කරන්නා විසින් සැපයිය යුතු ය.

ඉල්ලුම් පත්‍ර ගාස්තු.

38. කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක්, නියමිත ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවා ඇතහොත් මිස, භාර නොගත යුතු ය.

ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කිරීම.

39. (1) ඉල්ලුම්කරු 36 වන වගන්තියේ, 37 වන වගන්තියේ (අදාළ වන අවස්ථාවක) සහ 38 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර ඇත්දැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කළ යුතු ය.

(2) ඉල්ලුම්කරු, 36 වන සහ 37 වන වගන්තිවල විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය :

එසේ වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රයෙහි ඇති යම් දෝෂයක් ගැන ප්‍රථමයෙන් ඉල්ලුම්කරු වෙත නිවේදනය කළ යුතු අතර, ඒ නිවේදනය ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ඒ දෝෂය නිදොස් කිරීම සඳහා අවස්ථාවක් ඉල්ලුම්කරුට සලසා දිය යුතු ය.

(3) ඉල්ලුම්කරු 37 වන වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන්, හිමිකම් පෑ ප්‍රමුඛත්වය පිළිබඳව යම් සඳහන් කිරීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නොකළ යුතු ය.

(4) ඉල්ලුම්කරු 37 වන වගන්තියට අනුකූලව ක්‍රියා කර ඇති අවස්ථාවක දී, කාර්මික සැලසුම ලියපදිංචි කිරීම සම්බන්ධයෙන්, හිමිකම් පෑ ප්‍රමුඛත්වය පිළිබඳව සටහනක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(5) කාර්මික සැලසුමක් ලියපදිංචි කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක දී, එය ප්‍රතික්ෂේප කිරීමට හේතු මහු විසින් සඳහන් කළ යුතු අතර තීරණයට හේතු දන්වන ලෙස ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, නියමිත ගාස්තු ගෙවූ විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ කළ යුතු ය.

ලියාපදිංචි කිරීම.

40. (1) ඉල්ලුම්කරු 36 වන හා 38 වන වගන්තිවල විධිවිධාන අනුව ක්‍රියාකර ඇතිවිට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 29 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කාර්මික සැලසුම් පරීක්ෂා කළ යුතු ය.

(2) කාර්මික සැලසුම 29 වන වගන්තිය යටතේ ලියාපදිංචි කළ නොහැකි අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බව ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු ද සඳහන් කර, ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(3) පුද්ගලයකුගේ කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම්පතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රතික්ෂේප කළ අවස්ථාවක මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නිවේදනයේ දින සිට එක් මාසයක කාලය ඇතුළත ඉල්ලුම්කරු විසින්, එම ප්‍රතික්ෂේප කිරීමේ කාරණය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් මහුගේ කරුණු සැලකළ හැකි ය.

(4) (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි එම කරුණු සැලකිරීම කරනු ලැබූ විට, අධ්‍යක්ෂජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට කරුණු කියා සිටීමට අවස්ථාවක් නියම කර, එම දිනය හා වේලාව ඉල්ලුම්කරුට දැනුම් දිය හැකි ය. එම කරුණුවලට සවන්දීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම හෝ එය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.

(5) (අ) (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්ති වල විධිවිධානවල කුමක් සඳහන් වුව ද ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කර තිබෙන කාර්මික සැලසුමක අත්‍යවශ්‍ය මූලිකාංග ඒ වන විටත් ලියාපදිංචි කර තිබෙන කාර්මික සැලසුමකින් ව්‍යුත්පන්නව ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සොයා දැනගතහොත්, ඒ බවට මනු ඉල්ලුම්කරු වෙත දැනුම්දීමක් කර ඒ කාර්මික සැලසුම එසේ ව්‍යුත්පන්න කරගෙන නොමැති බව පෙන්නුම් කරන ලෙස, එසේ සඳහන් කරන ලද කාර්මික සැලසුමේ ලියාපදිංචි අයිතිකරුට පිටපතක් සහිතව, ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය ;

(ආ) එම දැන්වීමේ දින සිට මාස තුනක් ඇතුළත, ඉල්ලුම්කරු විසින්, නියමිත ගාස්තුව ද සහිතව, ඔහුගේ ලිඛිත කරුණු සැලකිරීම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ; සඳහන් කරන ලද කාර්මික සැලසුමේ ලියාපදිංචි අයිතිකරු විසින් ද ඒ කාලසීමාව ඇතුළත ඔහුගේ නිරීක්ෂණ, ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ ලිඛිත කරුණු සැලකිරීම් සහ නිරීක්ෂණ කිසිවක් වෙතොත් ඒවා ලැබුණු විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ කිරීම අවශ්‍ය යයි සලකන්නේ නම් පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් පසුව, එම කාර්මික සැලසුම ලියාපදිංචි කළ යුතු ද නැද්ද යන වග අප්‍රමාදව තීරණය කරනු ලැබිය යුතු ය;

(ඈ) (5) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නියමිත පරිදි සිය ලිඛිත කරුණු සැලකීම ඉදිරිපත් කිරීම ඉල්ලුම්කරු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හේතු ප්‍රකාශකර ප්‍රතික්ෂේප කළ යුතු අතර ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් නියමිත ගාස්තුව ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබූ විට අධ්‍යක්ෂවරයාගේ තීරණයට හේතු මනු විසින් ලියවිල්ලක් මගින් ඉල්ලුම්කරුට දැනුම්දිය යුතු ය.

(6) කාර්මික සැලසුම ලියාපදිංචි කළ හැකි බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය පළකිරීම සඳහා නියමිත ගාස්තුව එක් මාසයක කාලසීමාවක් ඇතුළත ගෙවන ලෙස ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(7) ඉල්ලුම් පත්‍රය පළකිරීම සඳහා ගාස්තුව, නියමිත කාලසීමාව ඇතුළත ගෙවනු නොලැබූ අවස්ථාවක, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(8) (අ) පළකිරීම සඳහා වූ ගාස්තුව නියමිත කාලසීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත්, ඉල්ලුම් පත්‍රයේ දිනය, ඉල්ලුම් පත්‍රයේ අංකය, ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය සහ ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම් ශ්‍රී ලංකාව තුළ ඔහුට ලියුම් භාර දිය හැකි තැපැල් ලිපිනයක්, ඉල්ලා සිටින ප්‍රමුඛතාව, කාර්මික සැලසුමෙහි විස්තරයක් සහ කාර්මික සැලසුමෙහි වර්ගය හා පන්තිය දැක්වෙන ඉල්ලුම් පත්‍රය පළ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කළ යුතු ය.

(ආ) නියමිත ගාස්තුව සහ පළකිරීම පිළිබඳව (6) වන, (7) වන උපවගන්තිවල සහ (8) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් ඔහුගේ අභිමතය පරිදි (8) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධානයට අනුකූලව සහ ඔහු විසින් දක්වනු ලැබූ ආකාරයට අනුව ඉල්ලුම් පත්‍රය පළ කරන ලෙස ඉල්ලුම්කරුට නියම කළ හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා නියම කළ පරිදි දැන්වීමේ දින සිට මාස දෙකක කාලයක් ඇතුළත ඉල්ලුම් පත්‍රය පළ කිරීම ඉල්ලුම්කරු විසින් පැහැර හරිනු ලැබූ හෝ නොසලකා හරිනු ලැබූ විටක, ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(9) 29 වන වගන්තියේ සඳහන් හේතු එකක් හෝ වැඩි ගණනක් නිසා, කාර්මික සැලසුම ලියාපදිංචි කළ නොහැකි යයි යම් තැනැත්තකු විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ඒ සැලසුම ලියාපදිංචි කිරීම පිළිබඳ නියමිත ආකෘතියෙහි

වූ තම විරෝධය දැක්වෙන දැන්වීමක් එම විරෝධයට හේතු ද එම හේතු සනාථ කිරීම සඳහා සාක්ෂි ද නියමිත ගාස්තුව ද සමග, එකී ඉල්ලුම් පත්‍රය පළ කරන ලද දින සිට මාස දෙකක් ඇතුළත දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දෙනු ලැබිය හැකි ය.

(10) විරෝධය දක්වන බවට දැන්වීම, (9) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව තුළ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නොලැබුණු අවස්ථාවක, ඒ කාර්මික සැලසුම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(11) නියමිත ආකෘතියෙහි වූ විරෝධය දක්වන දැන්වීමක් නියමිත ගාස්තුව ද සමග, (9) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව තුළ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු අවස්ථාවක, ඒ විරෝධයට හේතුවල පිටපතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත භාර කර, ඒ හේතු පිළිබඳ ඉල්ලුම්කරුගේ නිරීක්ෂණ ඔහුගේ ඉල්ලුම් පත්‍රය සනාථ කිරීම සඳහා සාක්ෂි ද සමග, එක් මාසයක කාලසීමාවක් ඇතුළත ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය.

(12) ඉල්ලුම්කරුගේ නිරීක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණුවිට, සියලුම අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් විභාගයක් කිරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන්නේ නම්, පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් පසුව ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කළ හැකි ද නොහැකි ද යන්න ඔහු විසින් හැකිහාක් ඉක්මණින් තීරණය කළ යුතු ය. කාර්මික සැලසුම ලියාපදිංචි කළ හැකි යයි ඔහු තීරණය කළහොත්, ඒ අනුව—

(අ) ඔහුගේ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් නොවුවහොත්, එසේ ඔහුගේ තීරණයට එරෙහිව අභියාචනයක් කළ හැකි කාලසීමාව ඉකුත් වූ විට;

(ආ) ඔහුගේ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් වුවහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ අභියාචනය නිෂ්ප්‍රභ වූ විට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සැලසුම ලියාපදිංචි කළ යුතු ය.

(13) මේ වගන්තිය යටතේ යම් ක්‍රියාවක් කළ යුතුව ඇත්තේ හෝ යම් ගාස්තුවක් ගෙවිය යුතුව ඇත්තේ යම නියමිත කාලසීමාවක් තුළ ද ඒ නියමිත කාලසීමාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යුක්තිසහගත කාලයකින් දීර්ඝ කළ හැකි ය.

ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම.

41. කාර්මික සැලසුමක් ලියාපදිංචි කරනු ලැබූ විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එහි ලියාපදිංචි හිමියාට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු අතර, ලියාපදිංචි හිමියා ඉල්ලා සිටියහොත්, ඒ සහතිකය අන්තිමට ශ්‍රී ලංකාවේ සටහන් කරනු ලැබූ ඔහුගේ තැපැල් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. ඔහු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් භාරදීම සඳහා අන්තිමට සටහන් කරනු ලැබූ ඔහුගේ තැපැල් ලිපිනයට ඒ සහතිකය රෙජිස්ට්‍රාර්වරයා විසින් යැවිය යුතු ය.

කාර්මික සැලසුම් ලේඛනය.

42. (1) "කාර්මික සැලසුම් ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තබා ගෙන, පවත්වා ගෙන යා යුතු අතර, ලියාපදිංචි කිරීමේ අනුපිළිවෙල අනුව, සියලුම ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් සහ සටහන් කොට තැබීමට මේ කොටසින් බලය දී හෝ විධාන කර තිබෙන්නා වූ හෝ කලින් කල නියම කරනු ලබන්නා වූ ද කාර්මික සැලසුම්වලට අදාළ වන්නා වූ ද වෙනත් විස්තර එහි සටහන් කරනු ලැබිය යුතු ය.

(2) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීමට කාර්මික සැලසුම් නිරූපණයක් ඇතුළත් විය යුතු අතර, එහි අංකය ද, ලියාපදිංචි හිමියාගේ නම සහ ලිපිනය ද ලියාපදිංචි හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් භාරදීම සඳහා තැපැල් ලිපිනයක් ද ඉල්ලුම් කරනු ලැබූ සහ ලියාපදිංචි කරනු ලැබූ දින ද, ප්‍රමුඛත්වය සඳහා විටිමත් ලෙස හිමිකම් පාෑණු ලැබිණි නම්, ඒ බව පෙන්නුම් කිරීමක් ද, ප්‍රමුඛත්වය සඳහා හිමිකම් පෑම ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ අංකය, දිනය සහ ඒ ඉල්ලීම් ඉදිරිපත් කළ රට ද, 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (දෑ) ඡේදයේ සඳහන් නිෂ්පාදනවල වර්ග සහ පන්ති ද, තමා කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා බව ලියාපදිංචි කිරීමේ සඳහන් කරන ලෙස ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබ තිබුණහොත්, කාර්මික සැලසුමේ නිර්මාතෘවරයාගේ නම සහ ලිපිනය ද ලියාපදිංචි කිරීමේ සටහන් කළ යුතු ය.

ලේඛනය පරීක්ෂා කිරීම සහ පහසික පිටපත් ලබා ගැනීම.

43. යම් තැනැත්තකුට ලේඛනය පරීක්ෂා කළහැකි අතර, නියමිත ගාස්තුව ගෙවීමෙන් එහි සහතික උද්ධෘත ලබාගත හැකි ය.

ලියාපදිංචි කාර්මික සැලසුම් පළකිරීම.

44. ලියාපදිංචි කිරීමේ අනුපිළිවෙල අනුව, සියලුම ලියාපදිංචි කාර්මික සැලසුම්, නියමිත ආකෘතියක ලා ගැසට් පත්‍රයේ පළ

කරනු ලැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලස්වනු ලැබිය යුතු ය. තව ද, එසේ පළ කරනු ලබන එක් එක් කාර්මික සැලසුම් සම්බන්ධයෙන්, නියම කරනු ලැබූ ප්‍රතිපත්ති පිළිබඳ සඳහනක් ද ඒ සමඟ පළ කරනු ලැබිය යුතු ය.

VI වන පරිච්ඡේදය

කාර්මික සැලසුමක ලියාපදිංචිය පවත්නා කාලය

ලියාපදිංචිය පවත්නා කාලය.

45. මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඊට හානියක් නොමැතිව, කාර්මික සැලසුමක ලියාපදිංචිය, එසේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු දිනයේ සිට අවුරුදු පහකට පසු අවසාන විය යුතු ය.

අලුත් කිරීම.

46. (1) කාර්මික සැලසුමක ලියාපදිංචිය ඒ හා සම්බන්ධව ඉල්ලුම් කළ විට සහ නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, එකක් අවුරුදු පහක් වූ අනුගාමී කාලසීමා දෙකකට අලුත් කරනු ලැබිය හැකි ය.

(2) අලුත් කිරීමේ ගාස්තුව ලියාපදිංචි කාලසීමාව අවසාන වන දිනට ඉහතින්ම වූ මාස හය ඇතුළත ගෙවිය යුතු ය :

එසේ වුවද, නියම කරනු ලබන අධි ගාස්තුවක් ගෙවන ලද විට, ඒ ලියාපදිංචි කාලසීමාව අවසාන වන දිනෙන් පසු ගාස්තුව ගෙවීම පිණිස මාස හයක සහන කාලසීමාවක් සඳහා ඉඩ දෙනු ලැබිය යුතු ය.

(3) කාර්මික සැලසුම් ලියාපදිංචිය පිළිබඳ සියලුම අලුත් කිරීම් වල ලැයිස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේඛනයේ සටහන් කළ යුතු අතර, ඒවා නියමිත ආකෘතියෙහි ලා ගැසට් පත්‍රයේ පළ කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(4) අලුත් කිරීමේ ගාස්තුව ඒ කාලසීමාව ඇතුළත දී හෝ (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් වන දීර්ඝ කරනු ලබන කාලසීමා ඇතුළත දී හෝ ගෙවනු නොලැබූ අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාර්මික සැලසුමේ අදාළ ලියාපදිංචිය ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

VII වන පරිච්ඡේදය

කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්

කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්.

47. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාට ඒ කාර්මික සැලැස්ම සම්බන්ධයෙන් පහත දැක්වෙන අනන්‍ය අයිතිවාසිකම් තිබිය යුතු ය :-

(අ) නිෂ්පාදිතයක් තැනීමේ දී ඒ කාර්මික සැලසුම නැවත යෙදීමට සහ අඩංගු කිරීමට ;

(ආ) ඒ කාර්මික සැලසුම අඩංගු නිෂ්පාදිතයක්, ආනයනය කිරීමට, විකිණීම සඳහා ඉදිරිපත් කිරීමට, විකිණීමට හෝ පාවිච්චි කිරීමට ;

(ඇ) ඒ කාර්මික සැලසුම අඩංගු නිෂ්පාදිතයක් විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ, විකිණීමේ හෝ පාවිච්චි කිරීමේ කාර්යය සඳහා රැස්කර තබා ගැනීමට ;

(ඈ) කාර්මික සැලසුමේ ලියාපදිංචිය පාවාදීමට හෝ අත්සතු කිරීමට ;

(ඉ) අවසර ගිවිසුම් නිමකිරීම.

(2) කාර්මික සැලසුමේ ලියාපදිංචි හිමියාගේ කැමැත්ත නොමැතිව, කිසිම තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු ය.

(3) බලය නොලැබූ යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා කරනු ලැබුවහොත්, නැවත සැදූ ලියාපදිංචි කාර්මික සැලසුම, ලියාපදිංචි කාර්මික සැලසුමට වඩා සුළු වශයෙන් වෙනස් වීමේ හෝ නැවත සැදූ ලියාපදිංචි කාර්මික සැලසුම, ලියාපදිංචි කාර්මික සැලසුම අඩංගු වූ නිෂ්පාදිතයට වෙනස් වූ නිෂ්පාදන වර්ගයක අඩංගු වීමේ හෝ හේතුව නිසා ම පමණක් ඒ ක්‍රියා නීත්‍යානුකූල නොවිය යුතු ය.

ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම් සීමා කිරීම.

48. (1) 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කාර්මික හෝ වාණිජ කාර්ය සඳහා කරනු ලැබූ ක්‍රියාවලට පමණක් ව්‍යාප්ත විය යුතු ය.

(2) ලියාපදිංචි කාර්මික සැලසුම අඩංගු නිෂ්පාදිතයක් නීත්‍යානුකූලව නිෂ්පාදනය කරනු ලැබීමෙන්, ආනයනය කරනු ලැබීමෙන්, විකිණීමට ඉදිරිපත් කරනු ලැබීමෙන්, විකුණනු ලැබීමෙන්, පාවිච්චි කරනු ලැබීමෙන් හෝ ශ්‍රී ලංකාවේ රැස්කර තබනු ලැබීමෙන් පසු, තෘතීය පාර්ශ්වකරුවන් විසින් එකී ලියාපදිංචි කාර්මික සැලසුම අඩංගු නිෂ්පාදිතය සම්බන්ධයෙන් ඒ විධිවිධානවල සඳහන් යම් ක්‍රියාවක් කරනු ලැබීම 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන මගින් වළක්වනු නොලැබිය යුතු ය.

VIII වන පරිච්ඡේදය

කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර පාවාදීම සහ අන්සතු කිරීම සහ එවා ලියාපදිංචි කිරීම

ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කිරීම්, පාවාදීම සහ අන්සතු කිරීම.

49. (1) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ කාර්මික සැලසුමක ලියාපදිංචිය හෝ පාවාදීම හෝ අන්සතු කිරීම කරනු ලැබිය හැකි අතර, එකී පාවාදීම හෝ අන්සතු කිරීම ලිඛිතව විය යුතු අතර ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කර තිබිය යුතු ය.

(2) පාවාදීමක් හෝ අන්සතු කිරීමක් හෝ නිසා කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට හෝ කාර්මික සැලසුමක් පිළිබඳ ලියාපදිංචියකට හිමිකම ලබන යම් තැනැත්තකු විසින් පාවාදීම හෝ අන්සතු කිරීම ලේඛනයේ සටහන් කරන ලෙස නියමිත ආකාරයෙන් නියමිත ගාස්තුව සමග අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි කිසිම පාවාදීමක් හෝ අන්සතු කිරීමක් නියමිත ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවා ඇතහොත් මිස ලේඛනයේ සටහන් කරනු නොලැබිය යුතු ය.

(4) එවැනි කිසිම පාවාදීමක් හෝ අන්සතු කිරීමක් ලේඛනයේ එසේ සටහන් කරනු ලැබුවහොත් මිස, තෘතීය පාර්ශ්වකරුවන් විෂයයෙහි බල නොපැවැත්විය යුතු ය.

ඉල්ලුම් පත්‍ර පිළිබඳ හවුල් හිමිකම සහ ලියාපදිංචි කිරීම.

50. පාර්ශ්වකරුවන් අතර යම් පටහැනි එකඟවීමක් නොමැති විටක, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ කාර්මික සැලසුමක් පිළිබඳ ලියාපදිංචියක හවුල්

හිමියන් විසින් වෙන් වෙන් වශයෙන්, ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචිය පිළිබඳ ඔවුන්ගේ අයිතිවාසිකම් පාවාදීම හෝ අත්‍යතු කිරීම ද කාර්මික සැලසුම් පාවිච්චි කිරීමට 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් තමන්ටම හිමි වූ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකි නමුත් ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර ගැනීම ද, ලියාපදිංචිය අත්හැරීම ද කාර්මික සැලසුමක බලපත්‍ර ගිවිසුම් අවසන් කිරීම ද හවුලේ පමණක් කරනු ලැබිය හැකි ය.

IX වන පරිච්ඡේදය

කාර්මික සැලසුම්වල බලපත්‍ර ගිවිසුම්

අර්ථ නිරූපණය.

51. මේ කොටසේ කාර්ය සඳහා බලපත්‍ර ගිවිසුමක්, යන්නෙන්, 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් හෝ සියලුම ක්‍රියා හෝ කිරීම සඳහා කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියකු ("බලපත්‍රදායී") විසින් වෙනත් තැනැත්තකුට හෝ ව්‍යවසායකට ("බලපත්‍රලාභී") අවසරයක් ප්‍රදානය කරනු ලබන්නේ යම් ගිවිසුමක් මත ද, ඒ ගිවිසුම අදහස් වේ.

බලයලත් ගිවිසුමේ ආකෘතිය හා ඒ ගැන සටහන් කිරීම.

52. (1) බලපත්‍ර ගිවිසුම්වල, ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් විය යුතු ය.

(2) ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් මගින් ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වකරුවන් ඉල්ලා සිටින විට ලේඛනයේ සටහන් කරනු ලැබීමට අවශ්‍ය ගිවිසුමට අදාළ විස්තර, නියමිත ගාස්තුව ගෙවන ලද විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේඛනයේ සටහන් කළ යුතු ය :

එසේ වුවද, එකී ගිවිසුමට අදාළ වන්නා වූ වෙනත් යම් විස්තර හෙළිදරව් කිරීමට හෝ සටහන් කරනු ලැබීමට හෝ පාර්ශ්වකරුවන්ට නියම කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රලාභී සතු අයිතිවාසිකම්.

53. බලපත්‍ර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට,–

(අ) අළුත් කිරීම් ඇත්තේ නම් එම කාලයත් ඇතුළුව කාර්මික සැලසුමේ ලියාපදිංචිය වලංගු කාලසීමාව තුළ, 47 වන

වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් සියලුම ක්‍රියා හෝ යම් ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකාව ඇතුළත කිරීමට බලපත්‍රලාභියාට හිමිකම තිබිය යුතු ය ;

(ආ) බලපත්‍ර ගිවිසුම යටතේ වූ තමාගේ අයිතිවාසිකම් පවාදීමට හෝ අත්සතු කිරීමට හෝ තෘතීය පාර්ශ්වකරුවන්ට අතුරු අවසර දීම ප්‍රදනය කිරීමට හෝ බලපත්‍රලාභියාට හිමිකම නොතිබිය යුතු ය.

බලපත්‍රදායීගේ අයිතිවාසිකම්.

54. (1) බලයලත් ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට, බලපත්‍රදායි විසින් එකම කාර්මික සැලසුමක් සම්බන්ධයෙන්, තෘතීය පාර්ශ්වකරුවන්ට තවත් අවසර දීම් ප්‍රදනය කිරීම හෝ 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් හෝ සියලුම ක්‍රියා ඔහු වෙනුවෙන් කරවනු ලැබීම හෝ සිදුකළ හැකි ය.

(2) බලපත්‍රය අනන්‍ය අවසරයක් බවට බලපත්‍ර ගිවිසුමේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ ගිවිසුමේ අන්‍යාකාරව ප්‍රකාශිත විධිවිධාන සලසා ඇත්නම් මිස, බලපත්‍රදායි විසින් එම කාර්මික සැලසුම සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වයන්ට වැඩිදුර බලපත්‍ර දීම නොකළ යුතු ය. නැතහොත් ඔහු විසින් 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් කිරීම හෝ කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

බලයලත් ගිවිසුම්වල නිර්බල වගන්ති.

55. කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියා වෙත මේ කොටසින් පවරා ඇති අයිතිවාසිකම් වලින් ව්‍යුත්පන්න නොවූ හෝ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නොවන්නා වූ හෝ සීමාකිරීම් බලපත්‍ර ගිවිසුමක යම් වගන්තියකින් හෝ කොන්දේසියකින් කාර්මික හෝ වාණිජ ක්ෂේත්‍රයෙහි ලා, බලපත්‍රලාභී වෙත පනවනු ලබන තාක් දුරට, ඒ බලපත්‍ර ගිවිසුමේ ඒ වගන්තිය හෝ කොන්දේසිය බලරහිත සහ ශූන්‍ය විය යුතු ය :

එසේ වුව ද,

(අ) කාර්මික සැලසුම පාවිච්චි කිරීමේ විෂය පථය, ප්‍රමාණය හෝ කාලය සම්බන්ධයෙන් වූ සීමාකිරීම් හෝ කාර්මික සැලසුම පාවිච්චි කරනු ලැබිය හැකි භූගෝලීය ප්‍රදේශය පිළිබඳ සීමා කිරීම් හෝ කාර්මික සැලසුම පාවිච්චි

කරනු ලැබිය හැක්කේ යම් නිෂ්පාදිත සම්බන්ධයෙන් ද, ඒ නිෂ්පාදිතවල තත්ත්වය හෝ ප්‍රමාණය පිළිබඳ සීමාකිරීම් ; සහ

(ආ) කාර්මික සැලසුමේ ලියාපදිංචිය පිළිබඳ වලංගුභාවයට හානි කර විය හැකි සියලුම ක්‍රියාවලින් වැළකී සිටින ලෙස බලපත්‍රලාභී වෙත පනවන ලද බැඳීම්,

එකී සීමා කිරීම්වලට ඇතුළත් වන ලෙස නොයැලකිය යුතු ය.

ලියාපදිංචිය බලරහිත කිරීම, බලපත්‍ර ගිවිසුම්වලට බලපාන ආකාරය.

56. බලපත්‍ර ගිවිසුමේ කාලය ඉකුත් වීමට පෙර, එහි ලියාපදිංචිය බලරහිත සහ ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, බලපත්‍ර ගිවිසුම යටතේ බලපත්‍රදායිට තවදුරටත් යම් ගෙවීමක් කරන ලෙස බලපත්‍රලාභීට නියම කරනු නොලැබිය යුතු අතර, ඒ වන විට කර ඇති ගෙවීම් ප්‍රතිපූරණය කරනු ලැබීමට ද හිමිකම නිබිය යුතු ය :

එසේ වුව ද සියලු අවස්ථානුගත කරුණු සලකා බැලීමෙන් පසු සහ විශේෂයෙන් ම බලපත්‍රලාභීගේ අවසරය නිසා සිද්ධිදයක ලෙස ලාභයක් ලබා තිබේ නම්, එවැනි යම් ආපසු ගෙවීමක් කිරීම සාධාරණීය නොවන බව බලපත්‍රදායි විසින් ඔප්පු කරනු ලැබිය හැකි ප්‍රමාණයට, ඒ ආපසු ගෙවීම කිරීමට බලපත්‍රදායිට නියම නොකළ යුතු ය. නැතහොත් එසේ ඔප්පු කළ හැකි ප්‍රමාණයට, කොටසක් ආපසු ගෙවීම කරන ලෙස බලපත්‍රදායිට නියම කළ යුතු ය.

බලයලත් ගිවිසුමක් ඉකුත්වීම, අවසාන වීම හෝ නිර්බල වීම.

57. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් –

(1) සටහන් කරනු ලැබූ බලපත්‍ර ගිවිසුමක කාලය ඉකුත් වී ඇති බවට හෝ අවසාන කර ඇති බවට මහු සැහීමට පත් වුවහොත්, එහි පාර්ශ්වකරුවන් විසින් හෝ මවුන් වෙනුවෙන් අත්සන් කරන ලද, තත් කාර්යය සඳහා වූ ලියවිල්ලකින් ඉල්ලා සිටින ලද කල්හි, ඒ කරුණ ලේඛනයෙහි සටහන් කළ යුතු ය ;

(2) මේ කොටසේ යම් විධිවිධානයක් යටතේ බලපත්‍ර ගිවිසුමක කාලය ඉකුත්වීම, ඒ ගිවිසුම අවසානවීම හෝ නිර්බල වීම ලේඛනයේ සටහන් කළ යුතු ය.

විදේශයක දී ගෙවීම් ඇතුළත් වන බලයලත් ගිවිසුම්.

58. (1) (අ) විදේශයක දී හිමිකම් පාන ගෙවීම් කිරීම් අවශ්‍ය කරන යම් බලපත්‍ර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක් ; හෝ

(ආ) ඒ බලපත්‍ර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන, ඒ බලපත්‍ර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම,

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යයි විශ්වාස කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, ඒ කරුණ පිළිබඳ තීරණයකට එළඹීමට අත්‍යවශ්‍ය වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම්දීමක් අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී බලපත්‍ර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන අදාළ වෙනස්කිරීම වලට යටත්ව පවරාදීම්වලට සහ අන්‍යතු කිරීමට අදාළ විය යුතු ය.

(4) මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වෙනස් කිරීම්වලට යටත්ව බලපත්‍රවලට අදාළ විය යුතු ය.

X වන පරිච්ඡේදය

කාර්මික සැලසුම්වල ලියාපදිංචිය අත්හැරීම සහ එහි බලරහිත බව

ලියාපදිංචිය අත්හැරීම.

59. (1) කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබූ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද, ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින් ලියාපදිංචිය අත්හරිනු ලැබිය හැකි ය.

(2) එකී ප්‍රකාශය ලැබුණු කල්හි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ප්‍රකාශය ලේඛනයේ සටහන් කළ යුතු අතර, ඒ සටහන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට ද සැලැස්විය යුතු ය.

(3) එකී ප්‍රකාශය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබුණු දින සිට, ඒ අත්හැරීම බලපැවැත්විය යුතු ය.

(4) කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් වූ බලපත්‍ර ගිවිසුමක් ලේඛනයේ සටහන් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ බලපත්‍ර ගිවිසුමේ පටහැනි විධිවිධානයක් නොමැති විටක, සටහන් කරනු ලැබ ඇති බලපත්‍රලාභියා විසින් හෝ අතුරු බලපත්‍රලාභියා විසින් කැමැත්ත දිය යුතු බවට වූ නියමය අනවශ්‍ය බව ප්‍රකාශිතව ම බලපත්‍ර ගිවිසුමේ සඳහන් කර තිබේ නම් හැර, සටහන් කරනු ලැබ ඇති සෑම බලපත්‍රලාභියකු හෝ අතුරු බලපත්‍රලාභියකු ම විසින් හෝ එකී අත්හැරීමට කැමැත්ත දෙමින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ලැබුණු විට මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී අත්හැරීම පිළිගැනීම හෝ සටහන් කිරීම හෝ නොකළ යුතු ය.

ලියාපදිංචියේ බලරහිත බව.

60. (1) නීත්‍යානුකූල සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළුව යම් කිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ කාර්මික සැලසුමේ ලියාපදිංචි හිමියා ද, සටහන් කරනු ලැබූ සෑම පාවාදීම්ලාභියකු, සෑම බලපත්‍රලාභියකු හෝ අතුරු බලපත්‍රලාභියකු ම ද පාර්ශ්වකරුවන් ලෙස සඳහන් කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, අධිකරණය විසින් පහත දැක්වෙන එක් හේතුවක් නිසා හෝ ඊට වැඩි හේතු ගණනක් නිසා හෝ කාර්මික සැලසුමේ ලියාපදිංචිය බලරහිත සහ ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය :—

(අ) 29 වන, 30 වන හා 31 වන වගන්තිවල විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම :

එසේ වුවද, 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් නිර්බලතා වේ හේතු, අධිකරණයට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ දිනයේ දී නොපැවතියේ නම්, ඒ හේතු සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය ;

(ආ) පූර්ව ඉල්ලීමක් අනුව, සමානුරූපී කාර්මික සැලසුමක් මීට පෙර ලියාපදිංචි කරනු ලැබ තිබීම හෝ වෙනත් රටක කරනු ලැබූ පූර්ව ලියාපදිංචියක් හේතුකොට ගෙන, තත් කාර්යය සඳහා කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර සමානුරූපී කාර්මික සැලසුමකට කලින් ප්‍රමුඛත්වය දෙනු ලැබීම ;

(ඇ) ලියාපදිංචි කාර්මික සැලසුමේ අත්‍යවශ්‍ය මූලාංග 33 වන වගන්තියේ අර්ථානුකූලව, වෙනත් තැනැත්තකුගේ නිර්මාණයකින් නීත්‍යානුකූල නොවන පරිදි ලබා ගෙන සිටීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචියේ ඇතුළත් කරනු ලැබූ කාර්මික සැලසුම් කීපයකට අදාළ වන්නා වූ සහ එය බලරහිත වීම සඳහා වූ හේතුව ඒ සියලුම කාර්මික සැලසුම්වලට නොව ඉන් කීපයකට පමණක් අදාළ වන්නා වූ අවස්ථාවක දී, බලරහිත කිරීම සඳහා වූ හේතුව අදාළ වන්නේ යම් කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් ද, ඒ කාර්මික සැලසුමට ඒ ලියාපදිංචිය අදාළ වන තාක් දුරට පමණක්, ඒ ලියාපදිංචිය බලරහිත සහ ශූන්‍ය බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

බලරහිත වීමේ දිනය සහ ප්‍රතිඵලය.

61. (1) කාර්මික සැලසුමක ලියාපදිංචිය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ බලරහිත බව ප්‍රකාශ කරමින් අධිකරණය විසින් අවසානාත්මක තීරණයක් කරන ලද විටක, ලියාපදිංචියේ දින සිට, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචිය සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් හෝ බලරහිත සහ ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බලරහිත වීම පිළිබඳ ප්‍රකාශයක් අවසානාත්මක වූ විට, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ප්‍රකාශය ලේඛනයෙහි සටහන් කොට, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලස්විය යුතු ය.

IV වන කොටස

XI වන පරිච්ඡේදය

අර්ථකථනය

නව නිපැයුම් පිළිබඳ අර්ථ කථනය.

62. (1) මේ කොටසේ කාර්ය සඳහා "නව නිපැයුම්" යන්නෙන් තාක්ෂණ විද්‍යා ක්ෂේත්‍රයෙහි නිශ්චිත ගැටළුවක් විසඳීමට ව්‍යවහාරයෙහි ලා උපකාරී වන, නව නිපැයුම්කරුවකුගේ සංකල්පනාවන් අදහස් වේ.

(2) නව නිපැයුමක්, නිෂ්පාදිතයක් හෝ ක්‍රියාවලියක් හෝ විය හැකි ය ; නැතහොත් එය නිෂ්පාදිතයකට හෝ ක්‍රියාවලියකට හෝ අදාළ විය හැකි ය.

(3) මෙහි පහත දැක්වෙන දේ, (1) වන උපවගන්තියේ අර්ථානුකූලව නව නිපැයුම් වුව ද ඒවාට පේටන්ට් බලපත්‍ර ලබාගත නොහැකි විය යුතු ය :—

(අ) අනාවරණය කර ගැනීම්, විද්‍යාත්මක සිද්ධාන්ත හා ගණිත ක්‍රම ;

(ආ) ශාඛ, සතුන් සහ ට්‍රාන්ස්ජෙනික් ක්ෂුද්‍ර ජීවීන් නොවන වෙනත් ක්ෂුද්‍ර ජීවීන් සහ ජීව විද්‍යාත්මක හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් නොවන ශාඛ හා සතුන් නිෂ්පාදනය සඳහා වන අවශ්‍යයෙන් ම ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් :

එසේ වුව ද ක්ෂුද්‍රජීවීන් සම්බන්ධව ප්‍රදානය කරන ලද පේටන්ට් බලපත්‍රයක් මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(ඇ) ව්‍යාපාර කටයුතු කිරීම, හුදු මනෝමය ක්‍රියා කිරීම හෝ ක්‍රීඩා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම, රීති හෝ ක්‍රම ;

(ඈ) ශල්‍යකර්ම මඟින් හෝ චිකිත්සාව මඟින් මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීරයට ප්‍රතිකාර කිරීමේ ක්‍රම සහ මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීර සම්බන්ධයෙන් රෝග විනිශ්චය කිරීමෙහි ලා ව්‍යවහාරික ක්‍රම :

එසේ වුවද එකී යම් ක්‍රමයක් සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගනු ලබන නිෂ්පාදිත සඳහා පේටන්ට් බලපත්‍ර ලබාගත හැකි විය යුතු ය ;

(ඉ) පරමාණු ආවියක, විශේෂ න්‍යෂ්ටික ද්‍රව්‍ය හෝ පරමාණු බලශක්තිය උපයෝගී කර ගැනීමෙහි ලා ප්‍රයෝජනවත් විය හැකි නව නිපැයුමක් ; —

(ඊ) මහජන සාමය, සදාචාරය අරක්ෂා කිරීම, මානව සත්ව හෝ ශාඛ ජීවිත හෝ සෞඛ්‍යය අරක්ෂා කිරීම හෝ

පරිසරයට බරපතල හානි සිදුවීම මහහැර ගැනීම ඇතුළුව ඒ පිණිස යම් නව නිපැයුමක් ශ්‍රී ලංකාව ඇතුළත වාණිජමය උපයෝජනයට ලක්කිරීම වැළැක්වීම අවශ්‍ය වන්නේ ද ඒ නව නිපැයුමක්.

පේටන්ට් බලපත්‍ර ලබා ගත හැකි නව නිපැයුම්.

63. යම් නව නිපැයුමක් අලුත් නම් සහ එහි නව නිපැයුම්කාරී පියවරක් තිබේ නම් සහ කාර්මික වශයෙන් යොදා ගත හැකි නම්, එය පේටන්ට් බලපත්‍ර ලබාගත හැකි නව නිපැයුමක් වේ.

නවකාව.

64. (1) නව නිපැයුමක් පූර්ව කලාවක් මගින් කලින් පෙන්නුම් කර නොමැති නම්, එය නව නිපැයුමක් වේ.

(2) පූර්ව කලාවක්-

(අ) නව නිපැයුමට හිමිකම් දක්වන පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමට පෙර හෝ උචිත අවස්ථාවක දී, ඒ ඉල්ලුම් පත්‍රයේ ප්‍රමුඛත්ව දිනයට පෙර, ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින් ලෝකයේ කවර ස්ථානයක දී වුව ද, ලිඛිත ප්‍රකාශයක් මගින්, වාචික අනාවරණයක් මගින්, භාවිතයෙන් මහජනයාට අනාවරණය කළ සියලු දෙයින් ;

(ආ) මෙහි (අ) ඡේදයේ සඳහන් පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයට වඩා කලින් ගොනු කරනු ලැබූ හෝ උචිත අවස්ථාවක දී, ඒ ඉල්ලුම් පත්‍රයට වඩා කලින් ප්‍රමුඛත්ව දිනයක් ලත් ශ්‍රී ලංකාවේ ගොනු කළ පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයක අඩංගු කරුණු සහ ශ්‍රී ලංකාවෙහි ගොනු කළ පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රය පදනම් කරගෙන ප්‍රදානය කරනු ලබන පේටන්ට් බලපත්‍රයෙහි ඇතුළත් වන ප්‍රමාණයකට, ඒ කරුණුවලින්,

සමන්විත වන්නේ ය.

(3) (2) (අ) වන උපවගන්තිය යටතේ කරනු ලබන අනාවරණයක්-

(අ) ඒ අනාවරණය කිරීම පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුවම වූ අවුරුද්දක් ඇතුළත සිදු වූවක් නම්, සහ ඉල්ලුම්කරු විසින් හෝ ඔහුට කලින් අයිතිකරු විසින් හෝ කරන ලද ක්‍රියා හේතුකොටගෙන හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ සිදුවූවක් නම් ;

(ආ) ඒ අනාවරණය කිරීම පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුව වූ මාස හය ඇතුළත සිදු වූවක් නම් සහ ඉල්ලුම්කරුගේ හෝ ඔහුට කලින් අයිතිකරුගේ අයිතිවාසිකම් අනිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා හෝ ප්‍රතිවිපාකයක් නිසා හෝ සිදුවූවක් නම්,

නොසලකා හැරිය යුතු ය.

නව නිපැයුම්කාරි පියවර.

65. නව නිපැයුමට හිමිකම දක්වන, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අදාළ පූර්ව කලාව ද සැලකිල්ලට ගෙන බලන කල්හි, එම කලාව පිළිබඳ සාමාන්‍ය නිපුණතාවක් ඇති තැනැත්තකුට නව නිපැයුමක තිබෙන නව නිපැයුම්කාරි පියවර පිළිබඳව නොපෙනේ නම් ඒ නිපැයුමේ නව නිපැයුම්කාරි පියවරක් තිබෙන ලෙස සැලකිය යුතු ය.

නව නිපැයුමක් කාර්මික වශයෙන් යොදා ගැනීම.

66. යම් නව නිපැයුමක් කවර හෝ යම් කර්මාන්තයක දී සෑදීම හෝ භාවිත කිරීම හෝ කළ හැකි නම්, එය කාර්මික වශයෙන් යොදා ගත හැකි ලෙස සැලකිය යුතු ය.

XII වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට තිබෙන අයිතිවාසිකම

පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම.

67. (1) 68 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට ඇති අයිතිවාසිකම නව නිපැයුම්කරු සතු විය යුතු ය.

(2) තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් හවුලේ නව නිපැයුමක් කරනු ලැබූ අවස්ථාවක දී, පේටන්ට් බලපත්‍රයක්, ලබාගැනීමට ඇති අයිතිවාසිකම හවුලේ ඔවුන් සතු විය යුතු ය.

(3) තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් ඔවුනොවුන්ගෙන් අන්‍යොන්‍ය වශයෙන් ස්වාධීනව එකම නව නිෂ්පාදනයක් කර ඇත්නම් සහ එසේ කර තිබෙන තාක් දුරට, මුල්ම ගොනු කිරීමේ දිනය සහිත ඉල්ලුම් පත්‍රය යම් තැනැත්තකුගේ ද, නැතහොත් ප්‍රමුඛතාව සඳහා ඉල්ලීමක් කර ඇත්නම් මුල්ම වලංගු ප්‍රමුඛත්ව දිනය සඳහා හිමිකම කියා සිටින්නේ යම්

නැනැත්තකු ද, ඒ නැනැත්තාට, ඒ ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර නොගතහොත්, අත්හැර නොදැමුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු නොලැබුවහොත්, පේටන්ට් බලපත්‍රය සඳහා හිමිකම නිබිය යුතු ය.

පැහැර ගැනීම හේතුවෙන් පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් අධිකරණය විසින් පැවරීම.

68. පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකින් හෝ පේටන්ට් බලපත්‍රයකින්, හිමිකම් පාන ලද නව නිපැයුමක අත්‍යවශ්‍ය මූලාංග වෙනත් නැනැත්තකුට අයත් පේටන්ට් බලපත්‍ර සඳහා අයිතිවාසිකම ඇති නව නිපැයුමකින් නීති විරෝධී ලෙස ව්‍යුත්පන්නව ඇති අවස්ථාවක, ඒ වෙනත් නැනැත්තා විසින් පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය හෝ පේටන්ට් බලපත්‍රය තමා වෙත පවරන ලෙසට ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය :

එසේ වුවද, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ගොනු කිරීමෙන් පසු, පේටන්ට් බලපත්‍රයට අයිතිවාසිකම හිමි නැනැත්තා විසින් එම කැමැත්ත එකී පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය ගොනු කිරීම සම්බන්ධයෙන් දෙනු ලබන අවස්ථාවක, ඒ කැමැත්ත ඒ ඉල්ලුම් පත්‍රය ගොනු කරන ලද දිනයේ සිට සියලු කාර්යයන් සඳහා බලපවත්වන බව සලකනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත්, පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ දින සිට අවුරුදු පහක කාලයක් ගතවීමෙන් පසුව, ඒ පේටන්ට් බලපත්‍රය පාවාදීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් අධිකරණය විසින් භාර නොගත යුතු ය.

සේවා නියුක්තයකු විසින් හෝ පාවාදීමක් අනුව හෝ කරන ලද නව නිපැයුම්.

69. (1) යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ වැඩක් ඉටු කිරීමට සඳහා වූ පාවාදීමේ ගිවිසුමක හෝ පටහැනි විධිවිධානයක් නොමැති විටක, ඒ සේවා නියුක්ති ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද නව නිපැයුමක් සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම, අවස්ථාවෝචිත පරිදි, සේවා යෝජකයාට හෝ ඒ වැඩය භාරදුන් නැනැත්තාට හෝ උපවිත වෙතැයි සැලකිය යුතු ය :

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි සේවා නියුක්ති ගිවිසුමට හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමට හෝ ඇතුළත් වූ අවස්ථාවේ දී, පාර්ශ්වකරුවන්ට කල්තියා සාධාරණව දැන ගැනීමට හැකි වූ ආර්ථික වටිනාකමට වැඩි ආර්ථික වටිනාකමක් ඒ නව නිපැයුමට ඇති වන අවස්ථාවක, පාර්ශ්වකරුවන් අතර

පාරිශ්‍රමිකයක් පිළිබඳ එකඟත්වයක් නොමැති නම්, ඒ වෙනුවෙන් අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් කරනු ලැබිය හැකි සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට නව නිපැයුම්කරුට හිමිකම ලැබිය යුතු ය.

(2) යම් සේවා නියුක්තයකුට ඔහුගේ සේවා නියුක්ති ගිවිසුමෙන් නව නිපැයුම්කාරී කාර්යයක යෙදීමට නියම කර නොමැති විටක, ඒ සේවා නියුක්තයා විසින් උපයෝගී කරගනු ලැබීම සඳහා සේවායෝජක විසින් ඔහුට සපයන ලද දත්ත හෝ උපක්‍රම උපයෝගී කොට ගෙන, ඔහුගේ සේවායෝජකගේ කාර්ය ක්ෂේත්‍රයෙහි දී ඔහු විසින් නව නිපැයුමක් කරනු ලබන අවස්ථාවක, සේවා නියුක්ති ගිවිසුමේ එයට පටහැනි විධිවිධානයක් නොමැති නම්, ඒ නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලැබීමට ඇති අයිතිවාසිකම සේවායෝජකට උපරිත වේයැයි සැලකිය යුතු ය :

එසේ වුවද, සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට සේවානියුක්තයා හිමිකම් ලැබිය යුතු අතර, පාරිශ්‍රමිකය පිළිබඳව පාර්ශ්වකරුවන් අතර එකඟත්වයක් නොමැති විටෙක, ඔහුගේ පඩිනැඩි, නව නිපැයුමේ ආර්ථික වටිනාකම සහ එයින් සේවායෝජකයා ලබන යම් ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන, ඒ වෙනුවෙන් අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් ඒ පාරිශ්‍රමික නියම කළ හැකි ය.

(3) නව නිපැයුම්කරු වෙත (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පවරා ඇති අයිතිවාසිකම් ගිවිසුමක් මගින් සීමා නොකළ යුතු ය.

නව නිපැයුම්කරු නම් කරනු ලැබීම.

70. (1) නව නිපැයුම්කරු විසින් ඒ නව නිපැයුම්කරු වශයෙන් පේටන්ට් බලපත්‍රයෙහි තමා නම් කරනු ලැබීම අතහැර දැමීමට ගත් තීරණය ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබ, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත ප්‍රකාශයකින් දන්වනු ලැබුවහොත් හැර, ඒ නව නිපැයුම්කරු ඒ නව නිපැයුම්කරු වශයෙන් පේටන්ට් බලපත්‍රයේ නම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යම් ගිවිසුමක නියමයන් මගින් විඛරණය කරනු නොලැබිය යුතු ය.

XIII වන පරිච්ඡේදය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු සහ පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු.

71. (1) (අ) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘතියෙහි ලා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද එහි පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය :—

(i) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලෙස ඉල්ලීමක් ;

(ii) පේටන්ට් බලපත්‍රය පිළිබඳ විස්තරය ; ;

(iii) හිමිකම්පෑමක් හෝ හිමිකම්පෑම් ;

(iv) නියම කරනු ලැබූ අවස්ථාවක දී, චිත්‍රයක් හෝ චිත්‍ර ;

(v) උද්ධෘතයක් ;

(vi) නව ඉල්ලුම් පත්‍රයෙන් හිමිකම් කියා සිටින නව නිපැයුම හා සම්බන්ධව ම හෝ අවශ්‍යයෙන් ම හා ඒ සමාන නව නිපැයුමක් සම්බන්ධව ඉල්ලුම්කරුවකු විසින් විදේශයක දී පේටන්ට් බලපත්‍රයක් සඳහා ගොනු කර තිබෙන (මෙහි මින් මතු "විදේශීය ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ඉල්ලුම් පත්‍රයක් තිබේ නම් එහි දිනය හා අංකය ;

(vii) ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමට ප්‍රථමයෙන්, ඒ ඉල්ලුම් පත්‍රයෙන් හිමිකම් කියා සිටින නව නිපැයුම සඳහා හෝ ඊට අවශ්‍යයෙන් ම සමාන නව නිපැයුමක් සඳහා විදේශයක දී පේටන්ට් බලපත්‍රයක්, ඉල්ලුම්කරු විසින් හෝ ඔහුගේ හිමිකමට පූර්වගාමී වන තැනැත්තා විසින් හෝ ලබාගෙන නොමැති බවට ප්‍රකාශයක්.

(ආ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (vii) වන උප ඡේදයේ සඳහන් ප්‍රකාශය අසත්‍ය බව තීරණය වුවහොත්, සම්බන්ධතාවක් ඇති යම් පාර්ශ්වයක් විසින් හෝ

අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළුව නිසි බලධරයකු විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින්, ඒ පේටන්ට් බලපත්‍රය ශූන්‍ය හා බලරහිත බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. පේටන්ට් බලපත්‍රයේ ලියාපදිංචි හිමිකරු, පාවාදීම්ලාභීන් සහ බලපත්‍රලාභීන් ඒ ඉල්ලුම් පත්‍රයට පාර්ශ්වකරුවන් කරනු ලැබිය යුතු ය.

(ඇ) ඉල්ලුම්කරුගේ සාමාන්‍ය පදිංචිය ස්ථානය හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවෙන් පිටත වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ පදිංචි අනුයෝජිතයකු විසින් ඔහු නියෝජනය කරනු ලැබිය යුතු අතර, ඒ අනුයෝජිතයාගේ නම සහ ලිපිනය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතු ය : තව ද ඒ ඉල්ලුම්කරු විසින් ඒ අනුයෝජිතයාට දෙනු ලැබූ ඇටෝර්නි බලපත්‍රයක් ද ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) තම නම සහ ලිපිනය සඳහන් කරමින් සහ තමා නව නිපැයුම්කරු ලෙස ඒ පේටන්ට් බලපත්‍රයේ නම් කරන ලෙස ඉල්ලමින්, නව නිපැයුම්කරු විසින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) පහත දැක්වෙන දේ ඒ ඉල්ලීමෙහි අඩංගු විය යුතු ය :-

(i) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලෙස ඉල්ලන පෙත්සමක් ;

(ii) නව නිපැයුමේ නීත්‍යානුකූල හිමිකම ;

(iii) ඉල්ලුම්කරුගේ, නව නිපැයුම්කරුගේ සහ අනුයෝජිතයකු සිටී නම්, ඔහුගේ නම, ලිපිනය විස්තර සහ ඔවුන් පිළිබඳ වෙනත් නියමිත තොරතුරු.

(ආ) ඉල්ලුම්කරු නව නිපැයුම්කරු නොවන අවස්ථාවක, පේටන්ට් බලපත්‍රය සඳහන් ඉල්ලුම්කරුට ඇති අයිතිවාසිකම යුක්ති සහගත බව පෙන්වන ප්‍රකාශයක් ඉල්ලීම සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (ආ) ඡේදයේ සඳහන් ප්‍රකාශනයෙහි පිටපතක් නව නිපැයුම්කරු වෙත යවනු ලැබිය යුතු අතර, ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බැලීමේ දී, නියමිත ගාස්තුව ගෙවා එහි පිටපතක් ලබා ගැනීමේ ද අයිතිවාසිකම ඒ නව නිපැයුම්කරුට තිබිය යුතු ය.

(3) නව නිපැයුම අගැයීම සහ අදාළ තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය නිපුණත්වයක් ඇති තැනැත්තකු විසින් නව නිපැයුම ක්‍රියාවට නැගීම සඳහා ප්‍රමාණවත් ලෙස පැහැදිළි වූ සහ පූර්ණ වූ ආකාරයකින්, නව නිපැයුම එකී විස්තරයෙන් අනාවරණය විය යුතු අතර, විශේෂයෙන් ම නව නිපැයුම් ක්‍රියාවට නැගීම සඳහා ඉල්ලුම්කරු දන්නා සුදුසුම ක්‍රමය එහි දැක්විය යුතු ය.

(4) හිමිකම්පෑම හෝ හිමිකම්පෑම් පැහැදිළි සහ සංක්ෂිප්ත විය යුතු අතර, ඒ හිමිකම්පෑම හෝ හිමිකම්පෑම් විස්තරයෙන් තහවුරු කළ යුතු ය.

(5) නව නිපැයුම් අවබෝධ කර ගැනීම සඳහා චිත්‍ර අවශ්‍ය කරන විට, ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතු ය.

(6) පේටන්ට් බලපත්‍රයෙන් සලසනු ලබන ආරක්ෂාවේ විෂය පථය සහ ප්‍රමාණය හිමිකම්පෑමක නියමයන් මගින් නිශ්චය කළ යුතු අතර, හිමිකම්පෑම අර්ථකථනය කිරීම සඳහා විස්තරය සහ චිත්‍ර උපයෝගී කර ගත හැකි ය.

(7) උද්ධෘතය ශිල්පීය තොරතුරු සැපයීම සඳහා ප්‍රයෝජන විය යුතු අතර, පේටන්ට් බලපත්‍රයෙන් සලසනු ලබන ආරක්ෂාව පිළිබඳ විෂය පථය සහ ප්‍රමාණය නිශ්චය කිරීමේ හෝ අර්ථකථනය කිරීමේ හෝ කාර්යය සඳහා උද්ධෘතය උපයෝගී කර ගනු නොලැබිය යුතු ය.

(8) ශ්‍රී ලංකාව නාමෝද්දිෂ්ටනය කර පේටන්ට් බලපත්‍රයක් සඳහා පේටන්ට් සහයෝගිතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත දී ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක්, ඒ ඉල්ලුම්කරු විසින් අනුරූප ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ද ඉදිරිපත් කළහොත්, මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද, ඉල්ලුම් පත්‍රයක් ලෙස සැලකිය යුතු ය.

මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "පේටන්ට් සහයෝගිතා ගිවිසුම" යන්නෙන්, වරින්වර සංශෝධිත පරිදි වූ, 1970 ජූනි 19 දින වොෂිංටනයේ දී ඇති කර ගන්නා ලද පේටන්ට් සහයෝගිතා ගිවිසුම අදහස් වේ.

ඉල්ලුම්පත්‍ර ගාස්තුව.

72. අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියමිත ගාස්තුව ගෙවා ඇත්නම් මිස, පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එවූ ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබිය යුතු ය.

සෝදිසි වාර්තාව.

73. (1) සෑම ඉල්ලුම්කරුවකු ම විසින් නියමිත කාලසීමාව ඇතුළත නියම කරනු ලැබිය හැකි පරිදි වූ වාර්තාවකට අනුකූල සෝදිසි වාර්තාවක් සැපයිය යුතු අතර, එය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර නොමැති නම්, එය සමග එහි ඉංග්‍රීසි පරිවර්තනයක් ඉදිරිපත් කළ යුතු ය :

එසේ වුවද, එකී අන්තර්ජාතික වර්ගයේ සෝදිසිය වෙනුවට, ඉල්ලුම් පත්‍රය දේශීය පරීක්ෂකවරයකු වෙත යොමු කරන ලෙස ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර ඒ පරීක්ෂකවරයා විසින් විස්තරය ද, චිත්‍ර කිසිවක් වුවහොත්, ඒවා ද යථාපරිදි සැලකිල්ලට ගෙන, හිමිකම් පෑමක් ඇත්නම් එය පදනම් කොට ගෙන ඒ ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බලා, ලැබෙන පහසුකම් අනුව, අදාළ පූර්ව කලාව හැකිතාක් දුරට අනාවරණය කිරීමට අවශ්‍ය වැයම් දරා, අදාළ පූර්ව කලාව පිළිබඳ වාර්තාවක් නියමිත කාලසීමාව ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය : ඒ සෝදිසියේ කාර්ය සඳහා දේශීය පරීක්ෂකවරයා විසින් තමාට ලැබී ඇති පූර්ව කලාව පිළිබඳ සියලුම ලිපිලේඛන කියවා බැලිය යුතු ය.

(2) ඉල්ලුම්කරුවකු විසින් තම ඉල්ලුම් පත්‍රය දේශීය පරීක්ෂකවරයකු වෙත යොමු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටින විටක, ඔහු විසින් ඒ ඉල්ලුම් පත්‍රය සමග නියමිත ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (අ) ඉල්ලුම්කරු විසින්, මේ පනත යටතේ ගොනුකර තිබෙන ඉල්ලුම් පත්‍රයෙන් හිමිකම් කියා සිටින නව නිපැයුම සම්බන්ධයෙන් හෝ ඊට අවශ්‍යයෙන් ම සමාන නව නිපැයුමක් සම්බන්ධයෙන් ඔහු විසින් පේටන්ට් බලපත්‍රයක් සඳහා විදේශයක ඉදිරිපත් කර තිබෙන යම් විදේශීය ඉල්ලුම් පත්‍රයකට අදාළව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම පිට, මෙහි පහත සඳහන් ලේඛන, ඔහු වෙත සැපයිය යුතු ය :—

(i) ඒ විදේශීය ඉල්ලුම් පත්‍රය සම්බන්ධව සිදු කරන ලද යම් සෝදිසියක හෝ පරීක්ෂණයක ප්‍රතිඵල පිළිබඳව ඉල්ලුම්කරු වෙත ලැබී තිබෙන යම් සංනිවේදනයක පිටපතක් ;

(ii) විදේශීය ඉල්ලුම් පත්‍රයේ පදනම මත ප්‍රදානය කර තිබෙන පේටන්ට් බලපත්‍රයේ පිටපතක් ; සහ

(iii) විදේශීය ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරමින් හෝ විදේශීය ඉල්ලුම් පත්‍රයෙන් ඉල්ලන ලද පේටන්ට් බලපත්‍රය ප්‍රතික්ෂේප කරමින් දෙන ලද යම් අවසාන තීරණයක පිටපතක්.

(ආ) (අ) ඡේදයේ සඳහන් විදේශීය ඉල්ලුම් පත්‍රයේ පදනම මත ප්‍රදානය කරන ලද පේටන්ට් බලපත්‍රය බලරහිත කරන යම් අවසාන තීරණයක පිටපතක්, ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම පිට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යැපයිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "දේශීය පරීක්ෂකවරයා" යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පේටන්ට් බලපත්‍ර සම්බන්ධ ප්‍රශ්න යොමු කරනු ලැබිය හැකි නිපුණතාවක් ඇති යම් තැනැත්තකු අදහස් වේ.

නව නිපැයුම් පිළිබඳ ඒකීයතාවය.

74. ඉල්ලුම් පත්‍රයක් එක් නව නිපැයුමකට පමණක් හෝ තනි, සාමාන්‍ය නව නිපැයුම්කාරී සංකල්පයක් ලෙස සංයුක්ත වන සේ එකට සම්බන්ධ වූ නව නිපැයුම් සමූහයකට හෝ අදාළ විය යුතු ය.

ඉල්ලුම් පත්‍රය සංශෝධනය කිරීම හා විභජනය කිරීම.

75. (1) ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම් පත්‍රය සංශෝධනය කරනු ලැබිය හැකි ය ; එසේ වුව ද, සංශෝධනය, මුල් ඉල්ලුම් පත්‍රයෙන් කරන ලද අනාවරණයේ සීමා නොඉක්මවිය යුතු ය.

(2) (අ) ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම් පත්‍රය, (මෙහි මින් ඉදිරියට "විභජිත ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉල්ලුම් පත්‍ර දෙකකට හෝ ඊට වැඩිගණනකට විභජනය කරනු ලැබිය හැකි ය ; එසේ වුව ද එක් එක් විභජිත ඉල්ලුම් පත්‍ර මුල් ඉල්ලුම් පත්‍රයෙන් කරන ලද අනාවරණයේ සීමා නොඉක්මවිය යුතු ය.

(ආ) එක් එක් විභජිත ඉල්ලුම් පත්‍රය, මුල් ඉල්ලුම් පත්‍රය ගොනු කළ දිනට හෝ අදාළ අවස්ථාවක, මුල් ඉල්ලුම් පත්‍රයේ ප්‍රමුඛත්ව දිනයට හෝ හිමිකම් ලැබිය යුතු ය.

(3) ඉල්ලුම් පත්‍රයකට හෝ විභජිත ඉල්ලුම් පත්‍රයකට කරන සංශෝධනය නියමිත ගාස්තුවකට යටත් විය යුතු ය.

ප්‍රමුඛත්වය පිළිබඳ අයිතිවාසිකම්.

76. (1) ඉල්ලුම්කරු විසින් හෝ ඔහුගේ හිමිකමේ පූර්වගාමියකු විසින් සම්මුතියට පාර්ශ්වකරුවකු වූ යම් රාජ්‍යයක දී හෝ ඒ

රාජ්‍යය වෙනුවෙන්, කලින් ඉදිරිපත් කරන ලද ජාතික, ප්‍රාදේශීය හෝ අන්තර් ජාතික ඉල්ලුම් පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා එකී සම්මුතිය අනුව, ප්‍රමුඛත්වයට හිමිකම් පෑමක් දැක්වෙන ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රයට අඩංගු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රයට අඩංගු වන අවස්ථාවක, කලින් ඉල්ලුම් පත්‍රය ගොනු කරන ලද කාර්යාලය විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයකු විසින් නිවැරදි බවට සහතික කරන ලද, ඒ ඉල්ලුම් පත්‍රයේ පිටපතක්, හෝ කලින් ඉල්ලුම් පත්‍රය පේටන්ට් සහයෝගිතා සන්ධානය යටතේ ගොනු කරන ලද අන්තර් ජාතික ඉල්ලුම් පත්‍රයක් වූ අවස්ථාවක, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ අන්තර් ජාතික කාර්යාංශය විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද නිලධරයකු විසින් නිවැරදි බවට සහතික කරන ලද, ඒ ඉල්ලුම් පත්‍රයේ පිටපතක්, නියමිත කාලය ඇතුළත ඉදිරිපත් කරන ලෙස ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශයේ බලපෑම ඒ උපවගන්තියේ සඳහන් සම්මුතියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ යම් නියමයක් හෝ ඊට අදාළ යම් නියෝග හෝ අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය බලරහිත සහ ශූන්‍ය ලෙස සැලකිය යුතු ය.

ගොනු කිරීමේ දිනය.

77. (1) ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය, ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනය ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සටහන් කළ යුතු ය :

එසේ වුව ද, පහත දැක්වෙන කරුණු ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනයේ දී ඉල්ලුම් පත්‍රයේ අඩංගු වී තිබිය යුතු ය.

(අ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ;

(ආ) නව නිපැයුම්කරුගේ නම සහ ලිපිනය හා ඉල්ලුම්කරු නව නිපැයුම්කරු නොවන අවස්ථාවක, 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ප්‍රකාශය ;

(ඇ) පේටන්ට් බලපත්‍රයේ විස්තරය ;

(ඇ) හිමිකම්පෑම හෝ හිමිකම්පෑම් ;

එසේම තවදුරටත් ඉල්ලුම් පත්‍රය ලැබුණු වේලාවේ දී, නියමිත ගාස්තුව ගෙවා තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කර නොමැති බව ඉල්ලුම් පත්‍රය ලැබුණු වේලාවේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී ගියහොත්, අවශ්‍ය නිවැරදි කිරීම, ඉල්ලීමේ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත ගොනු කරන ලෙස ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් (2) වන උපවගන්තියේ යෙදෙන්නේ ඉල්ලීම අනුව ක්‍රියා කරන ලද අවස්ථාවක, නියමිත නිවැරදි විස්තර ලැබුණු දිනය ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනය ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සටහන් කළ යුතු ය. ඉල්ලුම්කරු විසින් එසේ ක්‍රියා කිරීම පැහැර හරින ලද අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය බලරහිත සහ ශූන්‍ය ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිය යුතු ය.

(4) ඇත්ත වශයෙන්ම, ඉල්ලුම් පත්‍රයට ඇතුළත් නොකරන ලද චිත්‍ර ගැන ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කෙරෙන අවස්ථාවක, අඩු චිත්‍ර සපයන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(5) ඉල්ලුම්කරු විසින් (4) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම අනුව ක්‍රියා කරන ලද අවස්ථාවක, අඩු චිත්‍ර ලැබුණු දිනය, ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනය ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සටහන් කළ යුතු ය : ඉල්ලුම්කරු විසින් එසේ ඒ අනුව ක්‍රියා කරනු නොලැබූ අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය, ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනය ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සටහන් කළ යුතු අතර, එකී චිත්‍ර පිළිබඳව කිසිම සටහනක් නොකළ යුතු ය.

(6) ශ්‍රී ලංකාව නාමෝද්දිෂ්ටනය කර, 71 වන වගන්තියේ, (8) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අන්තර් ජාතික ඉල්ලුම් පත්‍රයක් සමග ගොනුකර තිබෙන, ශීර්ෂය, විස්තරය, රූප සටහන්, උධෘත හා හිමිකම් පෑම්, මේ පනත යටතේ නියමිත පිරිවිතරවලට අනුකූලව කරනු ලැබ ඇති ලෙස සැලකිය යුතු ය.

(7) 71 වන වගන්තියේ (8) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලදුව කාර්යාලය විසින් පිරික්සුම් කර තිබෙන ඉල්ලුම් පත්‍රයක් ගොනු කළ දිනය පේටන්ට් සහයෝගිතා ගිවිසුම යටතේ ඒ ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබූ දිනය ලෙස සැලකිය යුතු ය.

පරීක්ෂා කිරීම.

78. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කළ යුතු අතර, පහත දැක්වෙන දේ සපුරා ඇති බවට ඔහු සෑහීමට පත්විය යුතු ය :-

(අ) අදාළ වන අවස්ථාවක, 71 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නියමයක් ;

(ආ) 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නියමයන් අන්තර්ගත බවට ;

(ඇ) අදාළ වන අවස්ථාවක, 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නියමයන් ;

(ඈ) විස්තරය, හිමිකම්පෑම් හා අදාළ වන අවස්ථාවක, චිත්‍ර නියමිත නියමයන්ට අනුකූල වීම ;

(ඉ) ඉල්ලුම් පත්‍රයෙන් හිමිකම් කියා සිටින නව නිපැයුමේ අත්‍යවශ්‍ය අංග, ශ්‍රී ලංකාවේ දැනටමත් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කර තිබෙන නිපැයුමකින් නීති විරෝධීව ව්‍යුත්පන්න කර ගෙන නොමැති බව ;

(ඊ) ඉල්ලුම් පත්‍රයට උද්ධෘතයක් අඩංගු වීම ;

(උ) 73 වන වගන්තියෙහි සඳහන් සෝදිසි වාර්තාව ඉදිරිපත් කර තිබීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි සපුරා නොමැති බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී ගිය අවස්ථාවක නියමිත නිවැරදි විස්තර ඉල්ලීමේ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය. ඉල්ලුම්කරු විසින් එකී ඉල්ලීමට අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව නිවැරදි විස්තර ඉදිරිපත් නොකළ අවස්ථාවක, නියමිත කාලසීමාව ඇතුළත, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ කල්හි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රයෙහි නිවැරදි කිරීම් ඇතුළත් කළ යුතු අතර, නියමිත කාලසීමාව ඇතුළත නියමිත ගාස්තුව ගෙවනු නොලැබුවහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලුම් පත්‍රයකින් හිමිකම් කියා සිටින නව නිපැයුමක අත්‍යවශ්‍ය අංග ශ්‍රී ලංකාවෙහි දැනටමත් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කර තිබෙන නිපැයුමකින් නීති විරෝධීව ව්‍යුත්පන්න කරගෙන තිබෙන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සොයා දැනගනු ලැබුවහොත්, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(5) (2) වන, (3) වන හා (4) වන උපවගන්ති යටතේ ගන්නා ලද කවර හෝ තීරණයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට ගන්නා ලද යම් තීරණයක්, එය ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින්, ලියවිල්ලක් මගින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම.

79. (1) හිමිකම් පාන නව නිපැයුම් වාණිජ උපයෝජනයට ලක් කිරීම, මහජන සාමය හා සදාචාරය ආරක්ෂා කිරීම, මානව, සත්ව හෝ ශාඛ ජීවිත හෝ සෞඛ්‍යය ආරක්ෂා කිරීම හෝ පරිසරයට බරපතල හානි සිදුවීම මගහැර ගැනීම ඇතුළුව ඒ සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී හැර ඒ නව නිපැයුම් වාණිජ උපයෝජනයට ලක් කිරීම යම් නීතියකින් තහනම් කිරීමේ හේතුව මත පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පේටන්ට් බලපත්‍රයක් නිර්බල කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) ඉල්ලුම්කරුවකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි 78 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නියමයන් සම්පූර්ණ කළ අවස්ථාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කර අප්‍රමාදව-

(අ) 80 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව පවත්වාගෙන යාමට නියමිත පේටන්ට් බලපත්‍ර ලේඛනයෙහි පේටන්ට් බලපත්‍රය සම්බන්ධයෙන් විස්තර සටහන් කළ යුතු ය.

(ආ) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම පිළිබඳ සහතිකයක්, සෝදිසි වාර්තාව ද ඇතුළු පේටන්ට් බලපත්‍ර ලියවිලිවල පිටපතක් ද සමග ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය :

එසේ වුවද ඉල්ලුම්කරු විසින් අන්තර් ජාතික සෝදිසි වාර්තාවක් ඉදිරිපත් නොකර, ඉල්ලුම් පත්‍රය 73 වන වගන්තියේ අතුරු විධානය යටතේ දේශීය පරීක්ෂකවරයකුට යොමු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටි අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැන්වීමක් පළකර, ඒ දැන්වීම පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඉකුත් වීමේ දී, අධිකරණය විසින් අන්‍යාකර විධානයක් කරනු ලැබුවහොත් මිස, ඉල්ලුම්කරුට පේටන්ට් බලපත්‍රයක් නිකුත් කිරීමට ඉඩ තිබෙන බවට මහජනයා වෙත දැනුම් දීමක් කළ යුතු ය.

(3) ඉන්පසුව පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමට අදාළ දැන්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

(4) පේටන්ට් පලපත්‍රය, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉටු කරනු ලැබූ දිනයෙහි ප්‍රදානය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ අතුරු විධානයේ සඳහන් දැන්වීමෙහි ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ඇතුළත් විය යුතු අතර ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන අවස්ථාවක දී නව නිපැයුමෙහි විස්තරයක් සහ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු ශ්‍රී ලංකාවෙහි දී භාර දීම සඳහා නැපැල් ලිපිනයක් ඇතුළත් විය යුතු ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට (2) වන උපවගන්තියේ අතුරු විධානයේ සඳහන් පළකිරීම සඳහා නියමිත ගාස්තුව ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු අතර, එම ඉල්ලීම කරනු ලැබූ දින පිට එක් මාසයක් ඇතුළත එම ඉල්ලීම ඉටුකිරීම ඉල්ලුම්කරු පැහැර හැරියහොත් එම පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර ලේඛන.

80. (මෙහි මින් මතු "පේටන්ට් බලපත්‍ර ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන) ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තබාගෙන පවත්වා ගෙන යා යුතු අතර පේටන්ට් බලපත්‍රයේ අංකය, ප්‍රදානලාභියාගේ නම සහ ලිපිනය සහ ප්‍රදානලාභියා ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම් ලිපි භාරදීම සඳහා ශ්‍රී ලංකාවේ නැපැල් ලිපිනයන්, ඉල්ලුම් පත්‍රයේ දිනය සහ ප්‍රදානය කරනු ලැබූ දිනය, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ පේටන්ට් බලපත්‍රයක හෝ හිමිකම් පිළිබඳව වූ යම් වෙනසක්, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් පාවාදීම හෝ අන්‍යතු කිරීම ප්‍රමුඛත්වය සඳහා වූ යම් වලංගු හිමිකම්පෑමක්, පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පහ සටහන් කරනු ලැබිය යුතු ලෙස හෝ කලින් කල නියම කරනු ලැබිය යුතු ලෙස මේ කොටසින් බලය දෙනු ලබන්නා වූ හෝ විධාන කරනු ලබන්නා වූ වෙනත් යම් කරුණු ද සඳහන් කරමින් සියලුම පේටන්ට් බලපත්‍ර, ඒවා ප්‍රදානය කරනු ලැබූ අනුපිළිවෙල අනුව, ඒ ලේඛනයේ සටහන් කරනු ලැබිය යුතු ය.

ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික කරන ලද පිටපත්.

81. යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුවක් ගෙවා ලේඛනය පරීක්ෂා කරනු ලැබිය හැකි අතර ඒ ලේඛනයෙන් සහතික කරන ලද උධෘත ලබාගත හැකි ය.

ලිපිගොනු පරීක්ෂා කිරීම.

82. (1) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීමෙන් පසු, යම් තැනැත්තකු විසින් (2) වන හා (3) වන උපවගන්තිවලට යටත්ව, යම් පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට අදාළ ලිපිගොනුව පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, නියමිත ගාස්තුව ගෙවා ඒ ලිපිගොනුවලින් සහතික කරන ලද උධෘත ලබාගත හැකි ය.

(2) පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට අදාළ ලිපිගොනුව, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමට පෙර ඉල්ලුම්කරුගේ ලිඛිත අවසරය ඇතිව පමණක්, පරීක්ෂා කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන තොරතුරු ඕනෑම තැනැත්තකුට පෙළිදරව් කරනු ලැබිය හැකි ය :—

(අ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය සහ විස්තරය සහ අනුයෝජිතයකු සිටි නම්, ඔහුගේ නම සහ ලිපිනය ;

(ආ) ඉල්ලුම් පත්‍රයේ අංකය ;

(ඇ) ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනය සහ ප්‍රමුඛත්වය සඳහා හිමිකම්පෑමක් කරනු ලැබේ නම්, ප්‍රමුඛත්ව දිනය, කලින් ඉල්ලුම් පත්‍රයේ අංකය, සහ කලින් ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබුවේ යම් රාජ්‍යයක ද , ඒ රාජ්‍යයේ නම හෝ කලින් ඉල්ලුම් පත්‍රය ප්‍රාදේශීය හෝ අන්තර්ජාතික ඉල්ලුම් පත්‍රයක් වන අවස්ථාවක, එය ඉදිරිපත් කරනු ලැබුබේ යම් රාජ්‍යයක් හෝ රාජ්‍ය සඳහා ද, ඒ රාජ්‍යයේ නම හෝ රාජ්‍යවල නම් සහ ඒ ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබුවේ යම් කාර්යාලයක ද ඒ කාර්යාලය පිළිබඳ සඳහනක් ;

(ඈ) නව නිපැයුමක නීත්‍යානුකූල හිමිකම ;

(ඉ) ඉල්ලුම් පත්‍රය පිළිබඳ අයිතියේ වූ යම් වෙනසක් සහ ඉල්ලුම් පත්‍රයට අදාළ ලිපිගොනුවෙහි දැක්වෙන බලපත්‍ර ගිවිසුමක් පිළිබඳ යම් සඳහනක්.

(3) 79 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ විධිවිධාන අදාළ වන අවස්ථාවක, මෙම වගන්තියේ (1) වන සහ (2) උපවගන්තිවල පේටන්ට් බලපත්‍ර ප්‍රදානය පිළිබඳ සඳහනක් එම අතුරුවිධානයේ සඳහන් දැන්වීම පළකිරීමකට අදාළ වන සඳහනක් ලෙස සැලකිය යුතු ය.

(4) යම් තැනැත්තකු ලියාපදිංචි කිරීමේ කාර්යාලය තුළ හෝ කාර්යාලයේ සේවානියුක්තියේ යෙදී සිටින කාලසීමාව ඇතුළත හෝ ඒ සේවානියුක්තිය අවසාන කිරීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත ඒ තැනැත්තා විසින් පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් නොකළ යුතු අතර, ඔහුට පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ද නොකළ යුතු ය ත තව ද එසේම පේටන්ට් බලපත්‍රයකට අදාළ හෝ යම් අයිතිවාසිකම් යම් ආකාරයකින් ඒ තැනැත්තා විසින් අත්කරගනු ලැබීම හෝ දරනු ලැබීම නොකළ යුතු ය.

XIV වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍ර වලංගු කාලසීමාව

පේටන්ට් බලපත්‍ර වලංගු කාලසීමාව.

83. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය එහි ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය ගොනු කළ දින සිට විසි අවුරුද්දකට පසු අවසන් විය යුතු ය.

(2) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරන ලද දින සිට දෙවන අවුරුද්ද ඉකුත් වූ විට එය බලාත්මකව තබා ගැනීමට පේටන්ට් බලපත්‍රලාභියා අදහස් කරන්නේ නම්, දෙවන අවුරුද්ද සහ පේටන්ට් බලපත්‍ර වලංගු කාලසීමාව ඇතුළත වූ එක් එක් අනුප්‍රාප්තික අවුරුද්ද ඉකුත් වන දිනයට මාස දොළහකට පෙර, නියමිත වාර්ෂික ගාස්තුව ඔහු විසින් ගෙවිය යුතු ය :

එසේ වුවද නියම කරනු ලැබිය හැකි යම් අධිගාස්තුවක් ගෙවනු ලැබූ විට, එසේ කාලය ඉකුත් වූ දිනයෙන් පසු, මාස හයක අනුග්‍රහ කාලසීමාවක් සඳහා ඉඩ දිය යුතු ය :

එසේම තවදුරටත්, නියමිත වාර්ෂික ගාස්තුවල එකතුව සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හෝ පේටන්ට් බලපත්‍රලාභියා විසින් කලින් ගෙවනු ලැබිය හැකි ය.

XV වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍ර හිමියාගේ අයිතිවාසිකම්

පේටන්ට් බලපත්‍ර හිමියාගේ අයිතිවාසිකම්.

84. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, පේටන්ට් බලපත්‍ර හිමියකුට පේටන්ට් බලපත්‍රලත් නව නිපැයුමට අදාළව පහත දැක්වෙන අනන්‍ය අයිතිවාසිකම් තිබිය යුතු ය :—

(අ) පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම් උපයෝජනයට ලක් කිරීම සඳහා උපයෝගී කර ගැනීමට ;

(ආ) පේටන්ට් බලපත්‍ර පාවාදීම හෝ අන්‍යතු කිරීම ;

(ඇ) අවසර ගිවිසුම් අවසන් කිරීම.

(2) පේටන්ට් බලපත්‍ර හිමියාගේ කැමැත්ත නොමැතිව, කිසිම තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් කර්තව්‍ය අතුරින් කිසිවක් නොකළ යුතු ය.

(3) මේ කොටසේ කාර්ය සඳහා, පේටන්ට් බලපත්‍රය ලත් නව නිපැයුමක් "උපයෝජනය කර ගැනීම" යන්න පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් යෙදෙන විට, පහත දැක්වෙන කර්තව්‍ය අතුරින් කිසිවක් ඉන් අදහස් වේ :—

(අ) පේටන්ට් බලපත්‍රය නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබ ඇති විටක—

(i) නිෂ්පාදනය, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම, අපනයනය කිරීම සහ පාවිච්චි කිරීම ;

(ii) ඒ නිෂ්පාදිතය විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ, විකිණීමේ, අපනයනය කිරීමේ හෝ පාවිච්චි කිරීමේ කාර්ය සඳහා රැස්කර තබා ගැනීම ;

(ආ) පේටන්ට් බලපත්‍රය ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබ ඇති විටෙක—

(i) ක්‍රියාවලිය පාවිච්චි කිරීම ;

(ii) ක්‍රියාවලිය මාර්ගයෙන් සෘජුවම ලබාගත් නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් (අ) ඡේදයෙහි සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් කිරීම.

(iii) යම් තැනැත්තකුට එම ක්‍රියාවලිය ප්‍රයෝජනයට ගැනීම සඳහා හෝ ඒ ක්‍රියාවලිය මගින් සෘජුවම ලබාගත් යම් නිෂ්පාදිතයක් ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ ආනයනය කිරීම සඳහා හෝ ඒ තැනැත්තාට බලය දී ඇත්නම් මිස එසේ එම ක්‍රියාවලිය ප්‍රයෝජනයට ගැනීම හෝ එම ක්‍රියාවලිය මගින් සෘජුවම ලබාගත් නිෂ්පාදිතය ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ ආනයනය කිරීම වැළැක්වීම.

උල්ලංඝනය කරන තැනැත්තා ඔප්පු කිරීමේ භාරය දැරිය යුතු බව.

85. (1) පේටන්ට් බලපත්‍රයක විෂය වස්තුව යම් නිෂ්පාදිතයක් ලබා ගැනීමේ ක්‍රියාවලියක් වන අවස්ථාවක,-

(අ) එම පේටන්ට් බලපත්‍රලත් ක්‍රියාවලිය මගින් ලබාගත් නිෂ්පාදිතය නව නිෂ්පාදිතයක් නම් ;

(ආ) එම නිෂ්පාදිතය, පේටන්ට් බලපත්‍රලත් ක්‍රියාවලියක් අනුව සාදන ලද්දක් වීමේ සැලකිය යුතු ඉඩක් පවතින්නේ නම් සහ ඇත්ත වශයෙන් ම උපයෝගී කර ගෙන තිබෙන ක්‍රියාවලිය සාධාරණ ප්‍රයත්න මගින් නිශ්චය කර ගැනීමට පේටන්ට් බලපත්‍ර හිමියා අපොහොසත්ව ඇත්නම්,

සිවිල් නඩුවක දී, උල්ලංඝනීය නිෂ්පාදිතයක් බවට චෝදිත නිෂ්පාදිතය ඒ පේටන්ට් බලපත්‍රලත් ක්‍රියාවලිය මගින් ලබා නොගත් බව තහවුරු කිරීම සඳහා ඔප්පු කිරීමේ භාරය, චෝදිත උල්ලංඝනකරු වෙත පැවතිය යුත්තේ ය.

(2) සාක්ෂි රැස්කිරීමේ දී සහ අගැයීමේ දී තමාගේ හෙළිදරව් නොකළ තොරතුරු ආරක්ෂා කර ගැනීමට චෝදිත උල්ලංඝනකරුට තිබෙන නීත්‍යනුකූල අයිතිය ද සැලකිල්ලට ගත යුතු ය.

පේටන්ට් බලපත්‍ර හිමියාගේ අයිතිවාසිකම් පිළිබඳ සීමාව.

86. (1) (i) 84 වන වගන්තියේ විධිවිධාන, කාර්මික හෝ වාණිජකාර්ය සඳහා කරනු ලබන ක්‍රියාවලට පමණක් ව්‍යාප්ත විය යුතු අතර හුදෙක් විද්‍යාත්මක පර්යේෂණ සඳහා පමණක් කරනු ලබන ක්‍රියාවලට ව්‍යාප්ත නොවිය යුතු ය ;

(ii) 87 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් ඇති තැනැත්තකු විසින් හෝ බලපත්‍ර ලාභියකු විසින් හෝ ප්‍රේටන්ට් බලපත්‍රලත් නව නිපැයුමක් උපයෝජනය කරගනු ලැබීම, 84 වන වගන්තියේ විධිවිධානවලින් නොවැළැක්විය යුතු ය ;

(iii) 84 වන වගන්තියේ විධිවිධාන ශ්‍රී ලංකා දේශීය ජල තීරයට, ගුවන් තීරයට හෝ දේශයට තාවකාලිකව හෝ අහඹුවකින් ඇතුළුවන විදේශීය යාත්‍රාවල, ගුවන් යානාවල, අභ්‍යාවකාශ යානාවල හෝ ගොඩබිම් යානාවල නිෂ්පාදිතයක් තිබීම හෝ පාවිච්චි කිරීම කෙරෙහි ව්‍යාප්ත නොවිය යුතු ය ;

(iv) 84 වන වගන්තියේ විධිවිධාන, පේටන්ට් බලපත්‍ර නිමියා හෝ බලපත්‍රලත් නිෂ්පාදකයන් විසින් හෝ වෙළෙඳපළට ඉදිරිපත් කර තිබෙන දේ සම්බන්ධයෙන් වූ ක්‍රියාවලට ව්‍යාප්ත නොවිය යුතු ය.

(2) (අ) මෙහි මින් ඉදිරියට විධිවිධාන සලස්වා ඇති ආකාරයට පේටන්ට් බලපත්‍රයක් උපයෝජනය කිරීමේ කාර්යය සඳහා, යම් තැනැත්තකු, පුද්ගල මණ්ඩලයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

(ආ) ඒ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, එම ඉල්ලුම්කරු සාධාරණ වාණිජමය නියමයන් හා කොන්දේසි මත අයිතිවාසිකම් දරන්නාගේ අනුමැතිය ලබාගැනීමට උත්සහා දරා ඇති බවට සහ එම උත්සාහය සාධාරණ කාලසීමාවක් ඇතුළත සාර්ථක වී නොමැති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම්, එම උපයෝජනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ඇ) ජාතික හදිසි තත්ත්වයක් පවතින බවට හෝ වෙනත් යම් අතිශය හදිසි අවස්ථාගත කරුණු පවතින බවට සෑහීමකට පත්වීමෙන් පසුව හෝ ජාතික ආරක්ෂාව, පෝෂණය, සෞඛ්‍ය හෝ ජාතික ආර්ථිකයේ වෙනත් අත්‍යවශ්‍ය අංශ සංවර්ධනය යනාදී වාණිජමය නොවන මහජන කාර්යයක් සඳහා හෝ වන අවස්ථාවක, (ආ) ඡේදයේ දැක්වෙන නියමයන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හරිනු ලැබිය හැකි ය ;

(ඈ) පේටන්ට් බලපත්‍රය උපයෝජනය කිරීම, බලපත්‍රයෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයෙහි විෂය පථයට සහ එම කාර්යය පවත්නා කාලයට සීමා විය යුතු ය. එම උපයෝජනය කිරීම ප්‍රධාන වශයෙන් දේශීය වෙළෙඳපළට සැපයීමේ කාර්යය සඳහා විය යුතු ය ;

(ඉ) පේටන්ට් බලපත්‍රයක් උපයෝජනය සඳහා බලපත්‍රයක් දීමට ප්‍රථම, එක් එක් ඉල්ලුම් පත්‍රය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ඒ ඉල්ලුම් පත්‍රයේ කුසලතාව මත සැලකිල්ලට හාජනය කළ යුතු ය;

(ඊ) බලපත්‍රයක් නිකුත් කිරීම හා අනන්‍යව නොවිය යුතු හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි ආර්ථික අගය සහ අදාළ වන අවස්ථාවල දී තරඟකාරිත්ව විරෝධී පරිවයක් නිවැරදි කිරීම පිණිස පියවර ගැනීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, පේටන්ට් බලපත්‍ර හිමියාට ප්‍රමාණවත් පාරිශ්‍රමිකයක් ගෙවීමට යටත්ව විය යුතු ය ;

(උ) එවැනි ඉල්ලුම් පත්‍රයක්, වෙනත් පේටන්ට් බලපත්‍රයක් (පළමු පේටන්ට් බලපත්‍රය) උල්ලංඝනය කිරීමෙන් තොරව උපයෝජනය කළ නොහැකි පේටන්ට් බලපත්‍රයක් (දෙවන පේටන්ට් බලපත්‍රය) උපයෝජනය සඳහා වන අවස්ථාවක, පහත දැක්වෙන කොන්දේසි අදාළ විය යුතු ය :-

(i) දෙවන පේටන්ට් බලපත්‍රයෙන් හිමිකම් කියා ඇති නව නිපැයුම පළමු පේටන්ට්

බලපත්‍රයෙන් හිමිකම් කියන නව නිපැයුමට අදාළව සැලකිය යුතු ආර්ථික වැදගත්කමකින් යුතු තාක්ෂණික වැඩි දියුණුවක් ඇතුළත් විය යුතු ය ;

(ii) පළමු පේටන්ට් බලපත්‍රයේ හිමිකරුට, දෙවන පේටන්ට් බලපත්‍රයෙන් හිමිකම් කියන නව නිපැයුම, සාධාරණ නියමයන් මත උපයෝජනය කිරීම පිණිස හරස් බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය;

(iii) පළමු පේටන්ට් බලපත්‍රය හා සම්බන්ධව බලය දෙන ලද උපයෝජනය, දෙවන පේටන්ට් බලපත්‍රය පැවරීමක් සමඟ හැර, පවරා දෙනු ලැබිය නොහැකි විය යුතු ය.

(ඌ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් පේටන්ට් බලපත්‍රය හිමියාවෙත ලිඛිතව දැනුම් දිය යුතු ය ;

(එ) බලපත්‍රයක හිමිකරුගේ හෝ ප්‍රතිලාභියාගේ ඉල්ලීම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් පසුව, පේටන්ට් බලපත්‍රය උපයෝජනය කිරීම සඳහා දී තිබෙන බලපත්‍රය නිකුත්කර ඇත්තේ යම් නියමයන්ට යටත්ව ද එම නියමයන්, වෙනස් වී තිබෙන අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත ප්‍රමාණයට සංශෝධනය කිරීමෙන් ඔහුගේ තීරණය වෙනස් කළ යුතු ය ;

(ඒ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයට තුඩු දුන් කරුණු පැවතීම අවසන් වී ඇති බවට සහ නැවත ඇතිවීමට ඉඩ නොමැති බවට නැතහොත් බලපත්‍ර ලාභියා බලපත්‍රයේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැර තිබෙන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වුවහොත්, අයිතිකරුගේ ඉල්ලීම මත ස්වේච්ඡාවෙන් නොවන බලපත්‍රය අවසන් කළ හැකි ය ;

(ඔ) (ඒ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුන ද බලපත්‍රය තවදුරටත් අඛණ්ඩව තිබීම, එම බලපත්‍රයේ ප්‍රතිලාභියාගේ නීත්‍යානුකූල සම්බන්ධතා ප්‍රමාණවත්ව ආරක්ෂා කිරීම සඳහා යුක්ති සහගත බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් එම බලපත්‍රය අවසන් නොකළ යුතු ය

(ඕ) පේටන්ට් බලපත්‍රයක් උපයෝජනය කිරීමේ බලපත්‍රයක්, එම පේටන්ට් බලපත්‍රයේ බලපත්‍රලාභියාගේ ව්‍යවසාය හෝ ව්‍යාපාරයක් සමග හෝ උපයෝජන බලපත්‍රය ප්‍රදානය කර ඇත්තේ එම ව්‍යවසායේ හෝ ව්‍යාපාරයේ යම් කොටසක් සම්බන්ධව ද ව්‍යවසායේ හෝ ව්‍යාපාරයේ ඒ කොටස සමග පමණක් පවරනු ලැබිය හැකි විය යුතු ය.

(ක) කිසියම් පේටන්ට් බලපත්‍රයක හිමියා හෝ අවසරලාභියා විසින් ඒ පේටන්ට් බලපත්‍රය උපයෝජනය කරනා ආකාරය තරහකාරීත්ව විරෝධී බවට යම් අධිකරණයක් හෝ පරිපාලන මණ්ඩලයක් විසින් තීරණය කර ඇති සහ මේ වගන්තියට අනුකූලව පේටන්ට් බලපත්‍රයක් උපයෝජනය කිරීම එම ක්‍රියාමාර්ගයට ප්‍රතිකර්මයක් විය හැකි බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, එම පේටන්ට් බලපත්‍රය හිමිකරුගේ බලපත්‍රයකින් තොරව එම පේටන්ට් බලපත්‍රය උපයෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම්, තැනැත්තකුට, පුද්ගල මණ්ඩලයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට බලය දෙනු ලැබිය හැකි ය. ඒ බලපත්‍රයකට මෙහි (ආ), (ඇ) සහ (උ) ඡේදවල හැර මෙහි මීට ඉහතින් ඇති ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යම් තීරණයකින් අතෘප්ත යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ අභියාචනය සම්බන්ධයෙන් 173 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීමේ සහිතව අදාළ වන්නේ ය.

පූර්ව සැදීමකින් හෝ පාවිච්චි කිරීමකින් ව්‍යුත්පන්න අයිතිවාසිකම්.

87. (1) පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය ගොනු කරන ලද වේලාවේ දී හෝ අදාළ වන අවස්ථාවක, පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයෙහි ප්‍රමුඛත්ව දිනයෙහි,-

(අ) ඒ ඉල්ලුම් පත්‍රයෙන් හිමිකම් පාන ලද නව නිපැයුම විෂය කොට ගත් නිෂ්පාදිතය යම් තැනැත්තකු, සද්භාවයෙන් ශ්‍රී ලංකාවේ දී, සාදමින් හෝ ඒ ක්‍රියාවලිය භාවිත කරමින් සිටි අවස්ථාවක ;

(ආ) යම් තැනැත්තකු, සද්භාවයෙන් ශ්‍රී ලංකාවේ දී (අ) ඡේදයෙහි සඳහන් නිෂ්පාදිතය තැනීම පිණිස හෝ ක්‍රියාවලිය භාවිත කිරීම පිණිස අනලස්භාවයෙන් යුතුව කටයුතු පිළියෙල කිරීම කර ඇති අවස්ථාවක,

පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබ නිබුණත්, පේටන්ට් බලපත්‍රය ලත් නව නිපැයුම් උපයෝජනයට ලක් කර ගැනීමේ අයිතිවාසිකම ඔහු සතු විය යුතු ය :

එසේ වුව ද, එකී තැනැත්තා විසින් ප්‍රස්තුත නිෂ්පාදිතය තැනීම හෝ ප්‍රස්තුත ක්‍රියාවලිය භාවිත කිරීම ශ්‍රී ලංකාවේ දී කරනු ලැබ නිබිය යුතු ය :

එසේ ම තවදුරටත් 64 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් අවස්ථා යටතේ නව නිපැයුම් අනාවරණය කරනු ලැබිණි නම්, නව නිපැයුම් පිළිබඳ තම දැනුම ඒ අනාවරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකමක, අනුකූල තැනැත්තාගේ ව්‍යාපාරයෙහි කොටසක් ලෙස හැර, පාවාදීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු ය.

(3) යම් තැනැත්තකුට, යම් නව නිපැයුමක් පනතේ 63, 64, 65 සහ 66 වන වගන්ති යටතේ පේටන්ට් බලපත්‍රයක් නිකුත් කළ නොහැකි නිපැයුමක් වීමේ හේතුව මත එයට පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම පිළිබඳව විරුද්ධවීමට හෝ පනතේ 68 හා 99 වන වගන්ති යටතේ සහන ඉල්ලා සිටීමට හෝ ඇති අයිතිවාසිකම්වලට මේ වගන්තියේ විධිවිධානවලින් බලපෑමක් නොවිය යුතු ය.

XVI වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම්පත් සහ පේටන්ට් බලපත්‍ර පාවාදීම හා අන්සතු කිරීම

පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම්පත් සහ පේටන්ට් බලපත්‍ර පාවාදීම හා අන්සතු කිරීම.

88. (1) පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් පාවාදීම හෝ අන්සතු කිරීම කරනු ලැබිය හැකි අතර ඒ පාවාදීම හෝ අන්සතු කිරීම ලිඛිත විය යුතු අතර ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) පාවාදීම හෝ අන්සතු කිරීම නිසා පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට හෝ පේටන්ට් බලපත්‍රයකට හිමිකම ලබන යම් තැනැත්තකු විසින්, ඒ පාවාදීම හෝ අන්සතු කිරීම ලේඛනයෙහි සටහන් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් නියමිත ආකෘතියෙහි ලා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි කිසිම පාවාදීමක් හෝ අන්සතු කිරීමක් නියමිත ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබ තිබේ නම් මිස ලේඛනයේ සටහන් කරනු නොලැබිය යුතු ය.

(4) එවැනි කිසිම පාවාදීමක් හෝ අන්සතු කිරීමක් ලේඛනයෙහි එසේ සටහන් කරනු ලැබුවාහොත් හැර, තෘතීය පාර්ශ්වකරුවන් සම්බන්ධයෙන් බල නොපැවැත්විය යුතු ය.

පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර පිළිබඳ හෝ පේටන්ට් බලපත්‍ර පිළිබඳ හවුල් හිමිකම

89. පාර්ශ්වකරුවන් අතර යම් පටහැනි එකඟවීමක් නොමැති විටක, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ පේටන්ට් බලපත්‍රයක හෝ හවුල් හිමියන් විසින් වෙන වෙන ම, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය පිළිබඳ තම තමන් සතු අයිතිවාසිකම් පාවාදීම හෝ අන්සතු කිරීම ද පේටන්ට් බලපත්‍රලත් නව නිපැයුම් උපයෝජනයට ලක්කිරීම සඳහා ද, පේටන්ට් බලපත්‍රලත් නව නිපැයුම ඔවුන්ගේ කැමැත්ත නොමැතිව උපයෝජනයට ලක් කර ගන්නා යම් තැනැත්තකුට විරුද්ධව ක්‍රියා කිරීම ද කරනු ලැබිය හැකි අතර, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ඉල්ලා අස්කර ගැනීම, පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම හෝ බලපත්‍ර ගිවිසුමක් අවසන් කිරීම හවුලේ යම්තාක් කරනු ලැබිය හැකි ය.

XVII වන පරිච්ඡේදය

බලපත්‍ර ගිවිසුම

අර්ථ නිරූපණය.

90. මේ කොටසේ කාර්ය සඳහා, බලපත්‍ර ගිවිසුම යන්නෙන් 84 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හා (3) වන උපවගන්තියේ සඳහන් සියලුම ක්‍රියා හෝ යම් ක්‍රියාවක් හෝ කිරීම සඳහා (මෙහි මින් මතු "බලපත්‍රදායී" යනුවෙන් සඳහන් කරනු ලබන) පේටන්ට් බලපත්‍ර හිමියකු විසින් (මෙහි මින් මතු "බලපත්‍රලාභී" යනුවෙන් සඳහන් කරනු ලබන වෙනත් තැනැත්තකුට හෝ ව්‍යවසායකට, බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන්නේ යම් ගිවිසුමක් මත ද ඒ ගිවිසුම අදහස් වේ.

බලපත්‍ර ගිවිසුමේ ආකෘතිය සහ එය සටහන් කිරීම.

91. (1) බලපත්‍ර ගිවිසුම්, ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් විය යුතු ය.

(2) ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලක් මගින් ඉල්ලා සිටින ලද කල්හි, ලේඛනයේ සටහන් කරනු ලැබීමට ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය, ගිවිසුමට අදාළ විස්තර, නියමිත ආකෘතිය වෙත ලද විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේඛනයේ සටහන් කළ යුතු ය :

එසේ වුව ද, එකී ගිවිසුමට අදාළ වන්නා වූ වෙනත් යම් විස්තර හෙළිදරව් කිරීමට හෝ සටහන් කරනු ලැබීමට හෝ පාර්ශ්වකරුවන්ට නියම කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රලාභී සතු අයිතිවාසිකම්.

92. බලපත්‍ර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට–

(අ) කාලය පිළිබඳ සීමාවක් නොමැතිව, පේටන්ට් බලපත්‍රයක් නව නිපැයුම උපයෝගී කර ගැනීම මගින්, 84 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සහ (3) වන උපවගන්තියේ සඳහන් සියලුම ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකාවේ දේශ සීමාව ඇතුළත කිරීමට බලපත්‍රලාභියාට හිමිකම් තිබිය යුතු ය ;

(ආ) බලපත්‍ර ගිවිසුම යටතේ වූ තමාගේ අයිතිවාසිකම් පාවාදීමට හෝ අන්‍යතු කිරීමට හෝ තෘතීය පාර්ශ්වකරුවන්ට අතුරු අවසරදීම් ප්‍රදානය කිරීමට හෝ බලපත්‍රලාභියාට හිමිකම් නොතිබිය යුතු ය.

බලපත්‍රදායිගේ අයිතිවාසිකම්.

93. (1) බලපත්‍ර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට, බලපත්‍රදායි විසින් එකම පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවත් අවසර දීම් ප්‍රදානය කිරීම හෝ 84 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සහ (3) වන උපවගන්තියේ සඳහන් සියලුම ක්‍රියා නැතහොත් යම් ක්‍රියාවක් තමා විසින් ම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) අවසරය පරම අවසරයක් බවට බලපත්‍ර ගිවිසුමේ විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක සහ බලපත්‍රදායී විසින් එකම පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට වැඩිදුර බලපත්‍රදීම් ප්‍රදානය කරනු ලැබීම හෝ 84 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සහ (3) වන උපවගන්තියේ සඳහන් සියලුම ක්‍රියා නැතහොත් යම් ක්‍රියාවක් බලපත්‍රදායී විසින් ම කරනු ලැබීම සඳහා, ඒ ගිවිසුමේ විධිවිධාන සලස්වා නිබේ නම් මිස, බලපත්‍රදායී විසින් තෘතීය පාර්ශ්වකරුවන්ට වැඩිදුර බලපත්‍රදීම් ප්‍රදානය කිරීම හෝ ඒ වගන්තිවල සඳහන් ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතු ය.

බලපත්‍ර ගිවිසුම්වල බලරහිත වගන්ති.

94. පේටන්ට් බලපත්‍රයේ හිමියා වෙත මේ කොටසින් පවරා ඇති අයිතිවාසිකම්වලින් ව්‍යුත්පන්න නොවූ හෝ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නොවන්නා වූ හෝ සීමාකිරීම්, බලපත්‍ර ගිවිසුමක යම් නියමයකින් හෝ කොන්දේසියකින් කාර්මික හෝ වාණිජ ක්ෂේත්‍රයෙහිලා, බලපත්‍රලාභී වෙත පනවනු ලබන තාක් දුරට, ඒ බලපත්‍ර ගිවිසුමේ ඒ වගන්තිය හෝ කොන්දේසිය බලරහිත හා ශූන්‍ය විය යුතු ය :

එසේ වුව ද-

(අ) පේටන්ට් බලපත්‍රලත් නව නිපැයුම උපයෝජනයට ලක් කර ගැනීම පිළිබඳ විෂය පථය, ප්‍රමාණය හෝ කාලය සම්බන්ධයෙන් වූ සීමාකිරීම් හෝ පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම් උපයෝජනයට ලක් කරගනු ලැබිය හැකි භූගෝලීය ප්‍රදේශය පිළිබඳ සීමාකිරීම් හෝ පේටන්ට් බලපත්‍රලත් නව නිපැයුම උපයෝජනයට ලක් කරගනු ලැබිය හැක්කේ යම් නිෂ්පාදිත සම්බන්ධයෙන් ද, ඒ නිෂ්පාදිතවල තත්ත්වය හෝ ප්‍රමාණය පිළිබඳ සීමා කිරීම් ; සහ

(ආ) පේටන්ට් බලපත්‍රයෙහි වලංගුභාවයට හානිකර විය හැකි සියලු ක්‍රියාවලින් වැළකී සිටින ලෙස අවසරලාභී වෙත පනවන ලද බැඳීම්,

එකී සීමාකිරීම්වලට ඇතුළත් වන ලෙස නොසැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සාර්ථක නොවීමේ හෝ පේටන්ට් බලපත්‍රයක් බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵල.

95. බලපත්‍ර ගිවිසුමේ කාලය ඉකුත්වීමට පෙර පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් පිළිබඳව හෝ ඒ ගිවිසුම් සඳහන් වන පේටන්ට් බලපත්‍රය පිළිබඳව හෝ පහත දැක්වෙන යම් සිද්ධියක් එනම් :-

(අ) පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර ගනු ලැබීම ;

(ආ) පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය නිශ්චිත වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබීම ;

(ඇ) පේටන්ට් බලපත්‍රය පවාරණය කරනු ලැබීම ;

(ඈ) පේටන්ට් බලපත්‍රය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබීම ; හෝ

(ඉ) බලපත්‍ර ගිවිසුම පිළිබඳ ලියාපදිංචිය නිර්බල කරනු ලැබීම,

සිදු වූ අවස්ථාවක බලපත්‍ර ගිවිසුම යටතේ බලපත්‍රදායී වෙත තවදුරටත් කිසිම ගෙවීමක් කරන ලෙස බලපත්‍රලාභිට නියම නොකළ යුතු අතර, ඒ වන විට කර ඇති ගෙවීම් ආපසු ලබා ගැනීමට ද බලපත්‍රලාභිට හිමිකම ලැබිය යුතු ය :

එසේ වුව ද, සියලු අවස්ථානුගත කරුණු යටතේ එවැනි යම් ආපසු ගෙවීමක් කිරීම හෝ කොටසක් ආපසු ගෙවීම සාධාරණීය නොවන බව බලපත්‍රදායි විසින් ඔප්පු කරනු ලැබිය හැකි ප්‍රමාණයට සහ, විශේෂයෙන් ම බලපත්‍රලාභීට අවසරය නිසා සිද්ධිදායක ලෙස ලාභයක් ලැබී තිබේ නම්, ඒ ආපසු ගෙවීම කිරීමට අවසරදායීට නියම නොකළ යුතු ය.

බලපත්‍රයක් ගිවිසුමක් ඉකුත්වීම, අවසාන කිරීම හෝ නිර්බලවීම සටහන් කරවීමට.

96. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්,-

(අ) සටහන් කරනු ලැබූ බලපත්‍ර ගිවිසුමක කාලය ඉකුත් වී ඇති බවට හෝ ඒ ගිවිසුම අවසාන කර ඇති බවට හෝ මහු සැහීමට පත් වුවහොත්, ඒ බව ලේඛනයෙහි සටහන් කරන ලෙස එහි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලකින් ඉල්ලා සිටින ලද කල්හි, ඒ බව ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

(ආ) මේ කොටසේ යම් විධිවිධානයක් යටතේ, බලපත්‍ර ගිවිසුමක කාලය ඉකුත්වීම, ඒ ගිවිසුම අවසාන කිරීම හෝ නිර්බලවීම ලේඛනයේ සටහන් කළ යුතු ය.

විදේශයක දී ගෙවීම් කිරීම අවශ්‍ය කරන බලපත්‍රයක් ගිවිසුම්.

97. (1) (අ) විදේශයක දී කාර්යභාග ගෙවීම් කිරීම අවශ්‍ය කරන යම් බලපත්‍ර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක් ; හෝ

(ආ) ඒ බලපත්‍ර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොටගෙන ඒ බලපත්‍ර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම,

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යයි විශ්වාස කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, මහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර ඒ කරුණ පිළිබඳ තීරණයට අදළ වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම්දීමක් අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී බලපත්‍ර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම හෝ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

(3) මෙම වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව පාවාදීමක් සහ අන්‍යතු කිරීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මෙම පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අතුරු බලපත්‍ර සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) 86 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් බලපත්‍රයකට, මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

XVIII වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම සහ පේටන්ට් බලපත්‍රයක බලරහිත බව

පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම.

98. (1) පේටන්ට් බලපත්‍රයක ලියාපදිංචි හිමියා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ලියාපදිංචි හිමියා වෙනුවෙන් අත්සන් තබා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින් ඒ හිමියා විසින් පේටන්ට් බලපත්‍රය පවාරණය කරනු ලැබිය හැකි ය.

(2) පවාරණ කිරීම, පේටන්ට් බලපත්‍රය පිළිබඳ හිමිකම් පෑම් අතුරෙන් එකකට හෝ වැඩි ගණනකට සීමා විය හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ප්‍රකාශය ලැබුණු විට එය ලේඛනයෙහි සටහන් කළ යුතු හෝ එය ලේඛනගත කිරීමට සැලැස්විය යුතු අතර, ඒ සටහන ගැසට් පත්‍රයෙහි පළ කිරීමට ද සැලැස්විය යුතු ය.

(4) එකී ප්‍රකාශය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු දින සිට, ඒ පවාරණය කිරීම බලපැවැත්විය යුතු ය.

(5) පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් වූ බලපත්‍ර ගිවිසුමක් ලේඛනයේ සටහන් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ බලපත්‍ර ගිවිසුමේ පටහැනි විධිවිධානයක් නොමැති විටක, සටහන් කරනු ලැබ ඇති බලපත්‍රලාභී විසින් හෝ අතුරු බලපත්‍රලාභී විසින් හෝ කැමැත්ත දිය යුතු බවට වූ නියමය අනවශ්‍ය බව ප්‍රකාශිතව ම බලපත්‍ර ගිවිසුමේ සඳහන් කර තිබේ නම් හැර, සටහන් කරනු ලැබ ඇති සෑම බලපත්‍රලාභියකු ම විසින් හෝ අතුරු

බලපත්‍රලාභියකු ම විසින් හෝ එකී පවාරණය කිරීමට කැමැත්ත දෙමින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ලැබුණු විට මිය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී පවාරණය කිරීම පිළිගැනීම හෝ යටහන් කිරීම හෝ නොකළ යුතු ය.

පේටන්ට් බලපත්‍රයක බලරහිත බව.

99. (1) නීත්‍යානුකූල සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළුව, යම් නිසි බලධරයකු විසින් හෝ කරනු ලබන සහ පේටන්ට් බලපත්‍ර හිමියා ද යටහන් කරනු ලැබූ සෑම පාවාදීම්ලාභියකු ම, බලපත්‍රලාභියකු හෝ අතුරු බලපත්‍රලාභියකු ම ද පාර්ශ්වකරුවන් ලෙස සඳහන් කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, අධිකරණය විසින් පහත දැක්වෙන එක් හේතුවක් නිසා හෝ ඊට වැඩි හේතු ගණනක් නිසා හෝ පේටන්ට් බලපත්‍රය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය :—

(අ) නව නිපැයුමක් ලෙස පේටන්ට් බලපත්‍රයෙහි හිමිකම් පාන ලද දෙය 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථානුකූලව නව නිපැයුමක් නොවීම, හෝ 62 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 79 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ආරක්ෂාවෙන් බැහැර කරනු ලැබීම හෝ ඒ දෙය 63 වන, 64 වන, 65 වන සහ 66 වන වගන්තිවල සඳහන් නියමයන්ට අනුකූල නොවීම හේතුකොටගෙන පේටන්ට් බලපත්‍ර ලබාගත නොහැකි වීම ; හෝ

(ආ) විස්තරය හෝ හිමිකම්පෑම්, 71 වන වගන්තියේ (3) වන හා (4) වන උපවගන්තිවල සඳහන් නියමයන්ට අනුකූල නොවීම ; හෝ

(ඇ) හිමිකම් පාන ලද නව නිපැයුම් අවබෝධ කර ගැනීම සඳහා සැපයීමට නියමිත චිත්‍ර කිසිවක් ඉදිරිපත් කර නොතිබීම ; හෝ

(ඈ) පේටන්ට් බලපත්‍රයේ අයිතිවාසිකම් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කළ තැනැත්තා නොවන තැනැත්තකුට හිමිවීම :

එසේ වුවද, පේටන්ට් බලපත්‍රය සඳහා අයිතිවාසිකම් තිබෙන තැනැත්තා වෙත පේටන්ට් බලපත්‍රය පාවාදී නොමැති නම් පමණක් මෙය අදාළ වේ.

(2) (අ) (1) වන උපවගන්තියේ විධිවිධාන හිමිකම් පෑම් කිහිපයකට පමණක් හෝ හිමිකම් පෑමක කොටස් කිහිපයකට පමණක් හෝ අදාළ වන අවස්ථාවක, ඒ හිමිකම්පෑම් හෝ හිමිකම් පෑමක ඒ කොටස්, බලරහිත හා ශූන්‍ය බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය ;

(ආ) ප්‍රස්තුත හිමිකම් පෑම අනුරූප ලෙස සීමාවන ආකාරයට හිමිකම් පෑමක කොටසක් බලරහිත බව ප්‍රකාශ කළ යුතු ය;

(3) (අ) පේටන්ට් බලපත්‍ර හිමියා සමග වූ යම් ගිවිසුමක හෝ එකඟවීමක යම් පටහැනි විධිවිධානයක් නොමැති විටක, අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයට පාර්ශ්වකරුවකු කරනු ලැබූ, පාවාදීම්ලාභියකුට, බලපත්‍රලාභියකුට හෝ අතුරු බලපත්‍රලාභියකුට නඩු කටයුතුවලට භවුල්වීමේ හිමිකම තිබිය යුතු ය ;

(ආ) අධිකරණය වෙත කරන ඉල්ලීමක් (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් හේතුව මත වන අවස්ථාවක, පේටන්ට් බලපත්‍රය සඳහා අයිතිවාසිකම ඇතැයි කියන තැනැත්තා වෙත, ඉල්ලුම්කරු විසින් දැනුම්දීමක් කරනු ලැබිය යුතු ය.

බලරහිත වීමේ දිනය හා එහි බලපෑම.

100. (1) පේටන්ට් බලපත්‍රයක් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් බලරහිත බව ප්‍රකාශ කිරීමට අධිකරණය අවසන් තීරණයට එළඹුණු විට, ඒ පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ දින සිට, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ශූන්‍යව හා බලරහිතව පැවති ලෙස සැලකිය යුතු ය.

(2) බලරහිත බවට වූ ප්‍රකාශයක් අවසානාත්මක බවට පත් වූ විට, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඒ බව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, ඔහු එම ප්‍රකාශය ලේඛනයෙහි සටහන් කර, එය ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

V වන කොටස

XIX වන පරිච්ඡේදය

ලකුණු සහ ව්‍යාපාර නාම

අර්ථකථනය.

101. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ කොටසේ කාර්ය සඳහා–

"සහතික ලකුණ" යන්නෙන්, එය යොදාගනු ලබන්නේ යම් භාණ්ඩයක් හෝ සේවාවන් සම්බන්ධව ද එහි මූලාරම්භය, ද්‍රව්‍ය, භාණ්ඩ නිෂ්පාදන විධිය හෝ සේවා ඉටුකිරීමේ ක්‍රමය, එහි තත්ත්වය, නිවැරදිතාව හෝ වෙනත් ආවේණික ලක්ෂණ සහතික කරමින් එම ලකුණේ අයිතිකරු විසින් එම ලකුණ පාවිච්චි කරන භාණ්ඩ හෝ සේවා හා සම්බන්ධව යොදා ගන්නා ලකුණ අදහස් වේ ;

"සාමූහික ලකුණ" යන්නෙන්, එවැන්නක් ලෙස නම් කරනු ලබන්නා වූ ද ලියාපදිංචි හිමියාගේ පාලනය යටතේ ලකුණ පාවිච්චි කරන විවිධ ව්‍යවසායන්ගේ භාණ්ඩවල සම්භවය හෝ වෙන යම් පොදු ආවේණික ලක්ෂණයක් වෙන්කොට දැක්වීමෙහි ලා උපයෝගී වන්නා වූ ද යම් දෘශ්‍යමාන ලාංඡනයක් අදහස් වේ ;

"ව්‍යවසාය" යන්නෙන්, කවර ස්ථානයක හෝ ලියාපදිංචි කරන ලද හෝ සංස්ථාගත කරන ලද සහ කවර හෝ ව්‍යාපාර කටයුත්තක යෙදී සිටින හෝ යෙදීමට අදහස් කරන, සමාගම් හෝ සමුපකාර සමිති හෝ වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් තත්කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ නොලැබූ යම් වෙළෙඳ ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ පුද්ගලයකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් විසින් හෝ සමුපකාර සමිතියක් විසින් හෝ කරනු ලබන වෙනත් කටයුත්තක් අදහස් වනු අතර, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ආණ්ඩුවේ ව්‍යවසායක හෝ යම් රාජ්‍ය සංස්ථාවක යම් ව්‍යාපාරයක් ද ඊට ඇතුළත් වේ ;

"ව්‍යාජ වෙළෙඳ විස්තරය" යන්නෙන් වෙළෙඳ විස්තරය අදාළ වන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් වූ වැදගත් කරුණක් පිළිබඳ ව්‍යාජ හෝ නොමඟ යවන සුළු වෙළෙඳ විස්තරයක් අදහස් වන අතර එකතු කිරීමකින්, මකා දැමීමෙන් හෝ අන්‍යාකාරයකින් වෙළෙඳ විස්තරයක් වෙනස් කිරීම නිසා වැදගත් කරුණක් සම්බන්ධයෙන් ඒ විස්තරය ව්‍යාජ හෝ නොමඟ යවන සුළු බවට පත් කෙරෙන අවස්ථාවක, ඒ වෙනස් කිරීම ද ඊට ඇතුළත් වේ ; තව ද, යම් වෙළෙඳ විස්තරයක් වෙළෙඳ ලකුණක් වීම හෝ වෙළෙඳ ලකුණක් කොටසක් වීම හෝ ඒ වෙළෙඳ විස්තරය මේ කොටසේ අර්ථානුකූලව ව්‍යාජ වෙළෙඳ විස්තරයක් බවට පත්වීම වැළැක්වෙන හේතුවක් නොවිය යුතු ය ;

"භූගෝලීය දර්ශකය" යන්නෙන්, යම් භාණ්ඩයක යම් නිශ්චිත තත්ත්වයකට, කීර්තියකට හෝ වෙනත් ආවේණික ලක්ෂණයකට එහි භූගෝලීය ප්‍රභවය හේතු වන්නා වූ අවස්ථාවක ඒ භාණ්ඩය ඒ යම් රටක දේශසීමා තුළ හෝ ඒ දේශසීමා තුළ වූ යම් පළාතකින් හෝ ප්‍රදේශයකින්, පිහිටි බිමකින් හෝ මූලාරම්භ වන බව හැඳින්වෙන දර්ශකයක් අදහස් වේ ;

"භාණ්ඩ" යන්නෙන්, වෙළඳාමට හෝ නිෂ්පාදනයට විෂය වන හෝ වෙළෙඳ භාණ්ඩ වන හෝ යම් දෙයක් අදහස් වන අතර සේවාවන් ද ඊට ඇතුළත් වේ ;

"ප්‍රභවය පිළිබඳ සංඥාව" යන්නෙන් නිෂ්පාදිතයක් හෝ සේවාවක් එක්තරා රටක හෝ රටවල් සමූහයකට, දිශාභාගයක හෝ ප්‍රදේශයක මූලාරම්භ වූ බවට සංඥාවක් කිරීමට පාවිච්චි කරනු ලබන යම් යෙදුමක් හෝ ලාංඡනයක් අදහස් වේ ;

"ලකුණ" යන්නෙන්, වෙළෙඳ ලකුණක් හෝ සේවා ලකුණක් අදහස් වේ ;

"නම" යන්නට, නමක යම් සංක්ෂිප්තයක් ඇතුළත් වේ ;

"තැනැත්තා, නිෂ්පාදනය කරන්නා, බෙදන්නා හෝ වෙළෙන්දා සහ හිමියා" යන්නට, සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ ;

"සේවා ලකුණ" යන්නෙන්, එක් ව්‍යවසායක සේවාවන්, වෙනත් ව්‍යවසායන්ගේ සේවාවන්ගෙන් වෙන්කර දැක්වීම පිණිස උපයෝගී කරගනු ලබන යම් දෘශ්‍යමාන ලාංඡනයක් අදහස් වේ ;

"වෙළෙඳ විස්තරය" යන්නෙන් –

(අ) භාණ්ඩ කිසිවක සංඛ්‍යාව, ප්‍රමාණය, මිම්ම, ආමානය හෝ බර ; හෝ

(ආ) භාණ්ඩ කිසිවක් සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද ස්ථානය හෝ රට ; හෝ

(ඇ) භාණ්ඩ කිසිවක් සෑදීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ක්‍රමය : හෝ

(ඈ) භාණ්ඩ කිසිවක් සංයුක්ත කරනු ලැබූ ද්‍රව්‍ය ; හෝ

(ඉ) පවත්නා ප්‍රකාශන අයිතියක, ආශ්‍රිත අයිතියක, කාර්මික සැලසුමක හෝ පේටන්ට් බලපත්‍රයක විෂය වූ භාණ්ඩ කිසිවක් හෝ මේ පනත යටතේ ආරක්ෂා කර ඇති වෙනත් කාරණයක් ; හෝ

(ඊ) සේවාවන්ගේ තත්ත්වය, වර්ගය හෝ ස්වභාවය ; හෝ

(උ) වෙළෙඳාමෙහි ලා පොදුවේ භාවිත කෙරෙන හෝ පිළිගත් වර්ගීකරණයක් අනුව භාණ්ඩ කිසිවක තත්ත්ව ප්‍රමිතිය ; හෝ

(ඌ) භාණ්ඩ කිසිවක පරමාර්ථය සඳහා සුදුසුකම, ප්‍රබලතාව, කාර්ය ඉටු කිරීම හෝ ක්‍රියාකාරිත්වය

පිළිබඳව කෙළින් ම හෝ අන්‍යාකාරයකින් කරනු ලබන යම් විස්තරයක්, ප්‍රකාශයක් හෝ වෙනත් සංඥාවක් අදහස් වන අතර වෙළෙඳ චාරිත්‍රය අනුව, ඉහත සඳහන් කරුණුවලින් කිසිවක් පිළිබඳ සංඥාවක් ලෙස පොදුවේ පිළිගනු ලබන යම් රූපයක්, වචනයක් හෝ ලකුණක් භාවිත කිරීම මේ කොටසේ අර්ථානුකූලව වෙළෙඳ විස්තරයක් ලෙස සැලකිය යුතු ය ;

"වෙළඳ ලකුණ" යන්නෙන්, එක් ව්‍යවසායක හාණ්ඩ වෙනත් ව්‍යවසායන්ගේ හාණ්ඩවලින් වෙන් කොට දැක්වීමෙහි ලා උපයෝගී කර ගනු ලබන යම් දෘශ්‍යමාන ලාංඡනයක් අදහස් වේ ; තව ද

"ව්‍යාපාර නාමය" යන්නෙන්, ස්වාභාවික හෝ කෘතිම පුද්ගලයකුගේ ව්‍යවසාය හඳුනා ගැනීමේ නාමය හෝ සංඥා නාමය අදහස් වේ.

XX වන පරිච්ඡේදය

ලකුණුවල ආවේශ්‍යතාව

ලකුණුවල ආවේශ්‍යතාව.

102. (1) මේ කොටසින් පවරනු ලබන ලකුණක පරම අයිතිවාසිකම්, පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, ලියාපදිංචි කිරීමෙන් අත්කරගත යුතු ය.

(2)(අ) විටිමත් ඉල්ලුම් පත්‍රයේ සඳහන් වූ කොන්දේසි ප්‍රථමයෙන් ම සපුරා ඇති තැනැත්තාට ; හෝ

(ආ) තම ඉල්ලුම් පත්‍රය සඳහා ප්‍රථමයෙන් ම විටිමත් ලෙස අත්‍යන්ත ප්‍රමුඛත්වයට හිමිකම් දක්වන තැනැත්තාට,

ලකුණක් ලියාපදිංචි කිරීමට ඉඩ දෙනු ලැබිය හැකි ය :

එසේ වුවද ඒ ලකුණ 103 වන සහ 104 වන වගන්ති යටතේ ආවේශ්‍ය කළ නොහැකි නොවිය යුතු ය.

(3) ලකුණක්, ස්වාභිමත හෝ කාල්පනික සංඥා නාම, නාම, ව්‍යාජ නාම, භූගෝලීය නාම, උද්යෝග පාඨ, උපක්‍රම, ප්‍රලම්භනාවන්, අකුරු, අංක, ලේබල, කවර, විග්න, මුද්‍රණ, මුද්‍රා, සීල්, සලකුණු, ලතාකර්ම, වාටි, ගැට සහ දාර සහ හාණ්ඩවල හෝ බඳුන්වල වර්ණ සහ හැඩ සංයෝග කිරීම් හෝ සංයෝජනය කිරීම් ආදියෙන් සමන්විත විය හැකි ය.

විෂය මූලික හේතු නිසා ආවේශ්‍ය කළ නොහැකි ලකුණු.

103. (1)(අ) හාණ්ඩවල හෝ සේවාවල නෛසර්ගික ස්වභාවය නිසා, හෝ ඒවායේ කාර්මික ක්‍රියාකාරිත්වය නිසා හෝ ඇතිවන හැඩවලින් හෝ ස්වරූපවලින් සමන්විත ලකුණක් ;

(ආ) වෙළෙඳාම කෙරෙන අනරතුර, ප්‍රස්තුත භාණ්ඩවල හෝ සේවාවල වර්ගය, තත්ත්වය, ප්‍රමාණය, අභිප්‍රේත කාර්යය, වටිනාකම, සම්භව ස්ථානය, නිෂ්පාදන හෝ සම්පාදන හෝ සැපයීමේ කාලය දැක්වීමෙහිලා උපයෝගී විය හැකි හුදෙක් ලාංඡනයකින් හෝ සංඥාවකින් සමන්විත ලකුණක් ;

(ඇ) ප්‍රවර්තන භාෂා ව්‍යාපාරය අනුව හෝ නිර්ව්‍යාජ සහ ශ්‍රී ලංකාවේ සම්මත වෙළෙඳ සිරිත් අනුව, ප්‍රස්තුත භාණ්ඩවල හෝ සේවාවල වාරිත්‍රානුකූල සංඥා නාමයක් වී ඇති හුදු ලාංඡනයකින් හෝ සංඥාවකින් සමන්විත ලකුණක් ;

(ඈ) එක් ව්‍යවසායක භාණ්ඩ හෝ සේවා අනෙක් ව්‍යවසායයන්ගේ භාණ්ඩවලින් හෝ සේවාවලින් වෙන් කොට දැක්වීමේ හැකියාව නොමැති ලකුණක් ;

(ඉ) ගර්හනීය සැලසුමකින් සමන්විත වූ හෝ සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි හෝ අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ එම කාරණය යොමු කරනු ලැබිය හැකි යම් අධිකරණයක හෝ මතය අනුව යම් ජන කොට්ඨාසයක ආගමික හෝ වාර්ගික හැඟීම් පැරවිය හැකි හෝ ලකුණක් ;

(ඊ) ප්‍රස්තුත භාණ්ඩවල හෝ සේවාවල ස්වභාවය, ප්‍රභවය, භූගෝලීය දර්ශකය, ඒවායේ නිෂ්පාදන ක්‍රියාවලිය, ඒවායේ ආවේණික ලක්ෂණ නැතහොත් ඒවා අවශ්‍ය කාර්යය සඳහා ඒවායේ සුදුසුකම සම්බන්ධයෙන් වෙළෙඳ අංශ හෝ මහජනයා නොමඟ යැවිය හැකි ලකුණක් ;

(උ) පුද්ගලයකුගේ හෝ ව්‍යවසායක නම විශේෂ හෝ නිශ්චිත ආකාරයකින් නිරූපණය නොකරන ලකුණක් ;

(ඌ) ලකුණේ සාමාන්‍ය අර්ථය අනුව භූගෝලීය නමක් හෝ පෙළපත් නමක් වන ලකුණක් ;

(එ) යම් රාජ්‍යයක හෝ රාජ්‍යයන් අතර වූ යම් අන්තර්ජාතික සංවිධානයක හෝ අන්තර් ජාතික සම්මුතියක් මගින් පිහිටුවන ලද යම් සංවිධානයක හෝ රාජ්‍යයක නිසි බලධරයා විසින් බලය දෙනු ලැබුවහොත් හැර, ඒ රාජ්‍යයේ හෝ ඒ අන්තර් ජාතික සංවිධානයේ යුද්ධෝපකරණ, ධීවර හෝ වෙනත් විග්න, මුල් අකුරු, නම් හෝ සංක්ෂිප්ත නම් නැවත නිපදවන හෝ අනුකරණය කරන ලකුණක් ;

(ඒ) යම් රාජ්‍යයක නිසි බලධරයා විසින් බලය දෙනු ලැබුවහොත් හැර, ඒ රාජ්‍යයේ නිල ලාංඡන හෝ පාරිශුද්ධ මුද්‍රා නැවත නිපදවන හෝ අනුකරණය කරන ලකුණක් ;

(ඔ) ලකුණක්, සාමූහික ලකුණක් හෝ සහතික ලකුණක් පිළිබඳ ලියාපදිංචියෙහි කාලය ඉකුත් වී, ප්‍රස්තුත ලකුණ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනයට පූර්ව අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත එය අලුත් කරනු ලැබ නොමැති අවස්ථාවක හෝ ප්‍රස්තුත ලකුණ සඳහා ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනයට පූර්ව අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත එය අත්හැරීම, ඉවත් කිරීම හෝ බලරහිත කිරීම, ලේඛනයෙහි යටහත් කරනු ලැබ ඇති අවස්ථාවක, මහජනයා නොමග යැවිය හැකි ආකාරයෙන් ඒ ලකුණට, සාමූහික ලකුණට හෝ සහතික ලකුණට සමාන පෙනුම ඇති ලකුණක්;

(ඕ) ශ්‍රී ලංකාවෙහි අලෙවි ගනුදෙනු කිරීම තහනම් කර නිබෙන භාණ්ඩ හෝ සේවා හා සම්බන්ධ ලියාපදිංචි කරවා ගැනීමට ඉල්ලා ඇති ලකුණක් ;

(ක) නියම කරනු ලැබිය හැකි වෙන යම් වචනවලින් හෝ නිර්වචන වලින් සමන්විත ලකුණක්,

ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල විධිවිධාන අදාළ කිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවස්ථානුගත කරුණු සියල්ල ගැනත්, විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවෙහි දී හෝ වෙනත් රටවල දී ලකුණ පාවිච්චි කරනු ලැබ ඇති කාලය ගැනත්, ලකුණ වෙනත් රටවල හෝ වෙළෙඳ අංශවල විශේෂණීය ලකුණක් ලෙස සලකනු ලැබීම ගැනත් සැලකිල්ල දැක්විය යුතු ය.

තෘතීය පාර්ශ්වික අයිතිවාසිකම් නිසා ආවේශ්‍ය කළ නොහැකි ලකුණු.

104. (1) (අ) තුන්වන පාර්ශ්වකරුවකු විසින් විධිමත් ලෙස ගොනු කරන ලද හෝ ලියාපදිංචි කරන ලද හෝ විධිමත් ලෙස ප්‍රමුඛත්වය සඳහා හිමිකම් පා තදනන්තරව ගොනු කරන ලද හෝ ලකුණකට සර්වසම හෝ සමාන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් භාවිතයේ දී මහජනයා නොමග යා හැකි තරමට සමානත්වයක් ඇත්තා වූ ලකුණක්;

(ආ) ලියාපදිංචි නොකරන ලද ලකුණක් සර්වසම හෝ සමාන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවකු විසින් ශ්‍රී ලංකාවෙහි දී කලින් පාවිච්චි කරනු ලැබූ බව ඉල්ලුම්කරු දන්නේ නම් හෝ නොදැන සිටිය නොහැකි වන්නේ නම්, එසේ පාවිච්චි කරන ලද ඒ ලකුණට මහජනයා නොමග යැවිය හැකි ආකාරයෙන් සමාන පෙනුමක් ඇති ලකුණක් ;

(ඇ) ව්‍යාපාර නාමයක් එවකටත් ශ්‍රී ලංකාවේ දී තෘතීය පාර්ශ්වකරුවකු විසින් පාවිච්චි කරනු ලැබූ බව ඉල්ලුම්කරු දන්නේ නම් හෝ නොදැන සිටිය නොහැකි වන්නේ නම්, එසේ පාවිච්චි කරන ලද ඒ වෙළඳ නාමයට මහජනයා නොමග යැවිය හැකි ආකාරයෙන් සමාන පෙනුමක් ඇති ලකුණක් ;

(ඈ) ලකුණක් හෝ වෙළෙඳ නාමයක් තුන්වන පාර්ශ්වකරුවකුගේ සර්වසම හෝ සමාන භාණ්ඩ හෝ සේවා සඳහා ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ ලකුණකට හෝ වෙළෙඳ

නාමයකට හෝ එය නොමඟ යවන සුළු තරම් සමාන වන්නේ නම් හෝ ඒ ලකුණක, වෙළෙඳ නාමයක පරිවර්තනයක් හෝ ශබ්දවන ආකාරයට ලියා දැක්වීමක් හෝ පිටපත් කිරීමක් හෝ ඉන් සංයුක්ත වන්නේ නම් නැතහොත් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කර තිබෙන භාණ්ඩ හා සේවාවලට සර්වසම නොවන හෝ සමාන නොවන භාණ්ඩ හෝ සේවා සඳහා එම ලකුණ හෝ වෙළෙඳ නාමය ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ ලකුණක් හෝ වෙළඳ නාමයක් වන්නේ නම් සහ ලියාපදිංචි කර ඇත්නම් එසේ වුව ද දෙවනුව කී අවස්ථාවේ දී ඒ භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් එසේ එම ලකුණ යොදා ගැනීමෙන් ඒ සුප්‍රසිද්ධ ලකුණෙහි අයිතිකරුගේ අයිතිවාසිකම්වලට හානියක් වීමට ඉඩ ඇති පරිදි ඒ භාණ්ඩ හෝ සේවා සහ එකී සුප්‍රසිද්ධ ලකුණෙහි අයිතිකරු අතර සම්බන්ධයක් හඟවන්නේ නම් ; සහ

(ඉ) වෙනත් තෘතීය පාර්ශ්වික අයිතිවාසිකම් උල්ලංඝනය කරන හෝ අසාධාරණ තරහය වැළැක්වීමට අදාළ XXXII පරිච්ඡේදයේ විධිවිධානවලට පටහැනි ලකුණක් ;

(ඊ) වෙනත් රටක වූ එවැනි ලකුණක හිමිකරු වූ තෘතීය පාර්ශ්වකරුවකුගේ වෙනත් රටක අනුයෝජිතයකු හෝ නියෝජිතයකු විසින්, තම ක්‍රියාව සාධාරණ බව ඔප්පු කරනු ලැබුවහොත් හැර, ඒ අයිතිකරුගේ අවසරය නොමැතිව, ගොනු කරනු ලබන ලකුණක්,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) ලකුණක් සුප්‍රසිද්ධ ලකුණක් ද යන වග තීරණය කිරීමේ දී පහත දැක්වෙන උපමාන සැලකිල්ලට ගත යුතු ය :-

(i) එක් එක් ලකුණ හා සම්බන්ධ විශේෂිත කරුණු හා තත්ත්වයන් ;

(ii) ලකුණු සුප්‍රසිද්ධ බව අනුමත කරගත හැකි කරුණු හෝ තත්ත්වයන්;

(iii) අදාළ මහජන කොට්ඨාසය තුළ ඒ ලකුණ පිළිබඳව ඇති දැනුමේ හෝ පිළිගැනීමේ ප්‍රමාණය ;

(iv) ඒ ලකුණ ප්‍රයෝජනයට ගැනීම බලපැවැත්වෙන කාලසීමාව, ප්‍රමාණය සහ භූගෝලීය ප්‍රදේශය ;

(v) යම් පොළක දී හෝ ප්‍රදර්ශනාගාරයක දී ලකුණ අදාළ භාණ්ඩ හෝ සේවා ප්‍රචාරය කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම සහ ඉදිරිපත් කිරීම ඇතුළුව, එම ලකුණ ප්‍රවර්ධනය කිරීම බලපැවැත්වෙන කාලසීමාව, ප්‍රමාණය සහ භූගෝලීය ප්‍රදේශය ;

(vi) ලකුණ ලියාපදිංචි කිරීමෙන් හෝ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමෙන් ඒ ලකුණ ප්‍රයෝජනයට ගත් බව හෝ පිළිගත් බව පිළිබිඹු වන ප්‍රමාණයට, ලකුණෙහි ලියාපදිංචිය හෝ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම බලපැවැත්වෙන කාලසීමාව සහ භූගෝලීය ප්‍රදේශය ;

(vii) ලකුණ කෙරෙහි පවත්නා අයිතිවාසිකම් සාර්ථකව බලාත්මක කිරීම පිළිබඳව, විශේෂයෙන් ඒ ලකුණ සුප්‍රසිද්ධ ලකුණක් බවට හිමි බලධරයා විසින් පිළිගෙන තිබෙන ප්‍රමාණය පිළිබඳව වාර්තාව;

(viii) ලකුණ හා සම්බන්ධ වන වටිනාකම් ;

(ix) ලකුණක් සුප්‍රසිද්ධ ලකුණක් ද නැද්ද යන වග තීරණය කිරීම සඳහා මේ උපවගන්තියේ නිශ්චය කොට දැක්වෙන උපමාන සුවිස්තීරණ හෝ අනන්‍ය හෝ නොවිය යුතු ය ;

(x) මේ උපවගන්තියේ කාර්ය සඳහා –

(අ) "නිසි බලධරයා" යන්නෙන් ලකුණක් සුප්‍රසිද්ධ ලකුණක් ද යන වග තීරණය කිරීම හෝ සුප්‍රසිද්ධ ලකුණකට සපයනු ලබන ආරක්ෂාව බලාත්මක කිරීම සඳහා නිසි බලය ඇති පරිපාලනමය, අධිකරණමය හෝ අර්ධ අධිකරණමය බලධරයෙක් අදහස් වේ ;

(ආ) "අදාළ මහජන කොට්ඨාසය" යන්නට –

(i) ලකුණ අදාළ වන ආකාරයේ භාණ්ඩ හෝ සේවාවල තථ්‍ය හෝ පාරිභෝගිකයන් බවට පත්වීමට ඉඩ ඇති ජන කොට්ඨාස ;

(ii) ලකුණ අදාළ වන ආකාරයේ භාණ්ඩ හෝ සේවා සැපයුම් බෙදාහැරීමේ මාර්ගවලට සම්බන්ධ තැනැත්තන් ;

(iii) ලකුණ අදාළ වන ආකාරයේ භාණ්ඩ හෝ සේවා පිළිබඳ ගනුදෙනු කටයුතු කරන යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්,

ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තියේ (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල විධිවිධාන අදාළ කිරීමේ දී, එහි සඳහන් තෘතීය පාර්ශ්වකරුවන් විසින්, ඒ ලකුණ ලියාපදිංචි කිරීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිල්ලට ගත යුතු ය.

භාරයක් ලේඛනයේ ඇතුළත් නොකළ යුතු බව.

105. යම් ප්‍රකාශිත, ගම්‍යමාන හෝ අනුමිත භාරයක් පිළිබඳ කිසි දැනුම්දීමක් ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ එවැනි යම් දැනුම් දීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාරගනු ලැබීම නොකළ යුතු ය.

XXI වන පරිච්ඡේදය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු සහ ලියාපදිංචිය පිළිබඳ කාර්ය පරිපාටිය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු.

106. (1) ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘතියෙහි ලා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද එහි දැනත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය :-

(අ) ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලීමක් ;

(ආ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය ඉල්ලුම්කරු වාසය කරන්නේ ශ්‍රී ලංකාවෙන් පිටත නම්, ලිපි හාරදීම සඳහා ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනයක් ;

(ඇ) ලකුණේ නිරූපණයක පිටපත් පහක් ;

(ඈ) නියම කළ හැකි, අන්තර් ජාතික වර්ගීකරණයෙහි අනුරූප පන්තිය හෝ පන්ති පිළිබඳ සංඥාවක් සහිතව, ලකුණු ලියාපදිංචි කරන ලෙස ඉල්ලුම් කරනු ලැබුවේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩවල හෝ සේවා පිළිබඳ පැහැදිලි හා සම්පූර්ණ ලැයිස්තුවක්.

(2) ඉල්ලුම් පත්‍රය අනුයෝජිතයකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් ඒ අනුයෝජිතයා වෙත ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් ඒ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රවුඛත්වය පිළිබඳ අයිතිවාසිකම්.

107. සම්මුති රටක දී කලින් ගොනු කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ඇති ප්‍රවුඛත්වය තමන්ට ලබා ගැනීමට අපේක්ෂා කරන, ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන්නකු විසින් කලින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ දිනයෙහි සිට මාස හයක් ඇතුළත, කලින් වූ ඉල්ලුම් පත්‍රයෙහි දිනය සහ අංකය ද ඉල්ලුම්කරුගේ නම සහ ඔහු විසින් හෝ කලින් අයිතිකරු විසින් හෝ ඒ ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබූ රට ද දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් තම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය. තව ද, ශ්‍රී ලංකාවේ දී පසුව ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයෙහි දින සිට මාස තුනක් වූ කාලසීමාවක් ඇතුළත, කලින් වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද රටෙහි නිසි බලධරයා විසින් නිවැරදි බවට සහතික කරන ලද ඒ කලින් වූ ඉල්ලුම් පත්‍රයෙහි පිටපතක් ඒ ඉල්ලුම්කරන්නා විසින් සැපයිය යුතු ය.

අන්තර්ජාතික ප්‍රදර්ශනයක දී ප්‍රදර්ශනය කරනු ලබන ලකුණක් සඳහා තාවකාලික ආරක්ෂාව.

108. (1) නිල වශයෙන් වූ හෝ නිල වශයෙන් පිළිගනු ලැබූ හෝ අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී, යම් ලකුණක් දරන භාණ්ඩ ප්‍රදර්ශනය කළ හෝ යම් ලකුණක් යටතේ සේවා කිසිවක් ඉටු කළ හෝ තැනැත්තකු විසින් ඒ ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී සහ ඒ ලකුණ ලියාපදිංචි කරන ලෙස ඒ ලකුණ දරන භාණ්ඩ ප්‍රථමවරට එකී ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශනය කළ දින සිට නැතහොත් ඒ ලකුණ යටතේ ප්‍රථමවරට එකී ප්‍රදර්ශනයේ දී සේවා ඉටු කළ දින සිට මාස හයක් ඇතුළත ඉල්ලුම් කරන ලද අවස්ථාවක දී, ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ දරන භාණ්ඩ ප්‍රථමවරට ප්‍රදර්ශනය කළ දිනය හෝ ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ යටතේ ප්‍රථමවරට සේවා ඉටු කළ දිනය, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ දිනය ලෙස සලකන ලෙස ඔහු ඉල්ලා සිටි විට, එසේ සැලකිය යුතු ය.

(2) ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ දරන භාණ්ඩ ප්‍රදර්ශනය කළ බවට හෝ ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ යටතේ සේවා ඉටු කළ බවට හෝ සාක්ෂි ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනයේ දී ඒ භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ඒ ලකුණ ප්‍රථමවරට පාවිච්චි කළ දිනය සඳහන් කර, ඒ ප්‍රදර්ශනයේ සුදුසු බලධරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් මගින් කළ යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් හිමිකම් පාන ලද වෙනත් යම් ප්‍රමුඛත්ව කාලසීමාවකට (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඉල්ලුම් පත්‍ර ගාස්තුව.

109. නියමිත ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවා නිබුණහොත් මිස, ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් භාර නොගත යුතු ය.

ඉල්ලුම් පත්‍රයෙහි ආකෘතිය පිළිබඳ පරීක්ෂණය.

110. (1) ලියාපදිංචි කිරීම සඳහා වූ ලකුණක ඉල්ලුම්කරු 106 වන සහ 109 වන වගන්තිවල සහ 107 වන සහ 108 වන වගන්ති අදාළ වන අවස්ථාවක ඒ වගන්තිවල නියමයන් ද සපුරාලන්නේ දැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කර බැලිය යුතු ය.

(2) ඉල්ලුම්කරු 106 සහ 109 වන වගන්තිවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැර ඇති අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ලකුණ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය :

එසේ වුව ද, ඉල්ලුම් පත්‍රයේ ඇති යම් දෝෂයක් ප්‍රථමයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට දැනුම් දී, ඒ දැන්වීම ලැබී මාස තුනක් ඇතුළත දී ඒ දෝෂය නිදොස් කිරීමට අවස්ථාවක් ඉල්ලුම්කරුට ලබා දිය යුතු ය.

(3) ඉල්ලුම්කරු ඒ දෝෂය නිදොස් කළ දිනය, ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි කිරීම සඳහා ලැබුන දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ඉල්ලුම්කරු 107 වන වගන්තියට හෝ 108 වන වගන්තියට හෝ අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, හිමිකම් පාන ලද ප්‍රමුඛත්ව පිළිබඳ කිසිදු සඳහනක්, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නොකළ යුතු ය.

(5) ඉල්ලුම්කරු 107 වන වගන්තියට සහ 108 වන වගන්තියට අනුකූලව ක්‍රියාකර ඇති අවස්ථාවක, හිමිකම් පාත ලද ප්‍රමුඛත්වය හෝ අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී ඒ ලකුණ පාවිච්චි කරන ලද සහතික කළ දිනය, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සටහන් කළ යුතු ය.

(6) යම් ලකුණක් ලියාපදිංචි කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම තීරණයට හේතු ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

වැඩිදුරටත් පරීක්ෂා කිරීමෙන් පසු ලියාපදිංචි කිරීම හා ලකුණ පළ කිරීම.

111. (1) ඉල්ලුම්කරු 106 වන හා 109 වන වගන්තිවලට අනුකූලව ක්‍රියාකර ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 103 වන සහ 104 වන වගන්තිවල විධිවිධානවලට අදාළව, ලකුණ පරීක්ෂා කළ යුතු ය.

(2) 103 වන වගන්තිය හෝ 104 වන වගන්තිය හෝ යටතේ ලකුණ අවේශ්‍ය කළ නොහැකි අවස්ථාවක දී, ඒ බව, ඒ ලකුණ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු ද ලියවිල්ලකින් සඳහන් කරමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් දැන්වීමෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කරන ලද හේතු සියල්ලම ගැන හෝ ඉන් කිසිවක් ගැන හෝ ඉල්ලුම්කරු අභ්‍යර්ථියට පත් වන අවස්ථාවක දී, ඔහු විසින් එකී ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව තමා දක්වන කරුණු, ඒ දැන්වීමේ දින සිට මාසයක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඒ කරුණු ඉදිරිපත් කළ පසු විභාගයකට පෙනී සිටීමේ අවස්ථාව ලබා දී ඇති බව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ විභාගය පවත්වන දිනය සහ වේලාව ද ඉල්ලුම්කරුට දැනුම් දිය හැකි ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සුදුසු යයි මහු අදහස් කරන පරීක්ෂණයකින් පසුව, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. එසේ නැතහොත් මහු විසින් ඒ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණයෙන් ම හෝ, කොන්දේසිවලට, සංශෝධනවලට හෝ විඛරණ කිරීම්වලට යටත්ව හෝ පාවිච්චි කළ යුතු ආකාරය හෝ ස්ථානය හෝ වෙනත් කරුණක් හෝ පිළිබඳව පැනවීම සුදුසු යයි මහුට හැඟී යා හැකි සීමාකිරීම් කිසිවක් වේ නම් ඒවාට ද යටත්ව, පිළිගනු ලැබිය හැකි ය.

(6) ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක හෝ කොන්දේසිවලට යටත්ව පිළිගනු ලැබූ විටක, එය ප්‍රතික්ෂේප කරන ලද දින සිට හෝ කොන්දේසි සහිතව පිළිගනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම තීරණයට හේතු ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

(7) ලකුණ 103 වන වගන්තිය හෝ 104 වන වගන්තිය හෝ යටතේ ආවේශ්‍ය කළ හැකි යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කරන අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය පළ කිරීම සඳහා නියමිත ගාස්තුව නියමිත කාලසීමාවක් ඇතුළත දී ගෙවන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(8) ඉල්ලුම් පත්‍රය පළ කිරීම සඳහා වූ ගාස්තුව නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ ලකුණ ලියාපදිංචි කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(9) (අ) පළ කිරීම සඳහා වූ ගාස්තුව නියමිත කාලසීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත්, ඉල්ලුම් පත්‍රයෙහි දිනය, ලකුණේ නිරූපණය, ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුවේ යම් භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ හෝ සේවාවලට අනුරූප පන්තිය හෝ පන්ති ද සඳහන් කරමින්, ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය, ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම් ශ්‍රී ලංකාව තුළ මහුට ලියුම්

භාර දිය හැකි තැපැල් ලිපිනයක්, හිමිකම් පාන ලද ප්‍රමුඛත්වයක් තිබේ නම් එය හෝ අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී ඒ ලකුණ පාවිච්චි කරන ලද සහතික කළ දිනය යන මේ කරුණු සඳහන් කරමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රය පළ කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) නියමිත ගාස්තු සම්බන්ධව සහ පළකිරීම සම්බන්ධව (7) වන (8) වන උපවගන්තිවල සහ මෙම වගන්තියේ (අ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද මෙම වගන්තියේ (අ) ඡේදයේ සඳහන් පරිදි වූ ඉල්ලුම් පත්‍රයක් පළ කරන ලෙස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ අභිමතය පරිදි, ඉල්ලුම්කරුට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ හැකි ය. එවැනි ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එම දැන්වීම් දින සිට මාස තුනක කාලයක් ඇතුළත පළකිරීම ඉල්ලුම්කරු විසින් පැහැර හැරියහොත් හෝ නොසලකා හැරියහොත් ඒ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(10) 103 වන හෝ 104 වන වගන්තියේ සඳහන් හේතු එකක් හෝ කීපයක් හෝ නිසා ඒ ලකුණ ආවේශ්‍ය කළ නොහැකි යයි යම් තැනැත්තකු විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ඒ ලකුණ ලියාපදිංචි කිරීම පිළිබඳව නියමිත ආකෘතියේ වූ තම විරෝධය දැක්වෙන දැන්වීමක්, ඒ විරෝධයට හේතු දක්වමින් ඒ හේතු සනාථ කිරීම සඳහා සාක්ෂි ද, නියමිත ගාස්තුව ද සමග, එකී ඉල්ලුම් පත්‍රය පළ කරන ලද දින සිට මාස තුනක් ඇතුළත දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය හැකි ය.

(11) විරෝධය දක්වන දැන්වීම (10) වන උපවගන්තියේ සඳහන් කාල සීමාව තුළ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නොලැබුණ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ලකුණ ලියාපදිංචි කළ යුතු ය.

(12) නියමිත ආකෘතියෙහි වූ විරෝධය දක්වන දැන්වීම නියමිත ගාස්තුව ද සමග, (10) වන උපවගන්තියෙහි සඳහන් කාලසීමාව තුළ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු අවස්ථාවක, ඒ විරෝධයට හේතු දක්වන පිටපතක් අධ්‍යක්ෂ

ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත යවා, ඒ හේතු පිළිබඳ තම නිරීක්ෂණ මහුගේ ඉල්ලුම් පත්‍රය සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ද සමඟ මාස තුනක් ඇතුළත ලියවිල්ලකින් ඉදිරිපත් කරන ලෙස ද ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(13) ඉල්ලුම්කරුගේ නිරීක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු විට, කරුණු විභාග කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලැබුවහොත්, පාර්ශ්වකරුවන්ගේ කරුණු විභාග කිරීමෙන් පසු, ඒ ලකුණු ලියාපදිංචි කළ යුතු ද නොයුතු ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හැකිතාක් ඉක්මණින් තීරණය කළ යුතු ය. ලකුණ ලියාපදිංචි කළ යුතු යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කළහොත්,—

(අ) මහුගේ ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැති විටක දී, අභියාචනය ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලසීමාව ඉකුත් වූ විට ; හෝ

(ආ) තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති විටක දී, අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබූ විට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ලකුණු ඒ අනුව ලියාපදිංචි කළ යුතු ය.

(14) මේ වගන්තිය යටතේ යම් ක්‍රියාවක් කළ යුතුව ඇත්තේ හෝ යම් නාස්තුවක් ගෙවිය යුතුව ඇත්තේ යම් නියමිත කාලසීමාවක් තුළ ද ඒ නියමිත කාල සීමාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යුක්ති සහගත කාලයකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචිය සම්පූර්ණ නොකිරීම.

112. ඉල්ලුම් පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු දින සිට මාස දොළහක් ඇතුළත දී, යම් ලකුණක් ලියාපදිංචි කිරීම, ඉල්ලුම්කරුගේ පැහැර හැරීමක් හේතු කොට ගෙන, සම්පූර්ණ කර නොමැති අවස්ථාවක, සම්පූර්ණ නොකිරීම පිළිබඳ ලියවිල්ලකින් වූ සහ නියමිත ආකෘතියේ වූ දැන්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත යැවීමෙන් පසු, තත් කාර්යය සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ දී එය සම්පූර්ණ කළහොත් හැර, ඒ ඉල්ලුම් පත්‍රය අත්හැර දමනු ලැබුවාක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ලකුණු ලේඛනය සහ සහතික නිකුත් කිරීම.

113. (1) ලකුණු ලේඛනය යනුවෙන් හඳුන්වන ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තබා, පවත්වා ගෙන යා යුතු අතර, සියලුම ලියාපදිංචි ලකුණු සහ ඒ ලකුණුවලට අදාළව සටහන් කළ යුතු යයි මේ කොටසින් බලය දී ඇති හෝ විධාන කර ඇති හෝ කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු, ඒ ලකුණු ලියාපදිංචි කළ අනුපිළිවෙල අනුව, ඒ ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

(2) ලකුණක ලියාපදිංචියට ඒ ලකුණෙහි නිරූපණයක් ද ඇතුළත් විය යුතු අතර, එහි අංකය, ලියාපදිංචි හිමියාගේ නම සහ ලිපිනය ද ලියාපදිංචි හිමියාගේ ලිපිනය ශ්‍රී ලංකාවෙන් පිටත එකක් නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් භාර දිය හැකි තැපැල් ලිපිනයක් ද, ඉල්ලුම් පත්‍රයෙහි දිනය සහ ලියාපදිංචි කළ දිනය ද ප්‍රමුඛත්වයට විටිමත් ලෙස හිමිකම් පා තිබේ නම් ඒ බවට සටහනක් සහ ඒ ප්‍රමුඛත්වයට හිමිකම් පානු ලැබුවේ යම් ඉල්ලුම් පත්‍රයක් පදනම් කොට ගෙන ද ඒ ඉල්ලුම් පත්‍රයෙහි අංකය, දිනය සහ රට ද යම් ලකුණක් අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී පාවිච්චි කළ බවට විටිමත් සහතිකයක් ඉදිරිපත් කර තිබේ නම් ඒ සහතිකයේ අඩංගු කරුණු ද අනුරූප පන්තිය හෝ පන්ති හෝ පිළිබඳ සංඥාවක් ද සමඟ, ඒ ලකුණු ලියාපදිංචි කිරීමට ඉඩ දෙන ලද්දේ යම් භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ සහ සේවා පිළිබඳ ලැයිස්තුවක් ද ඒ ලියාපදිංචියේ සඳහන් කළ යුතු ය.

(3) ලකුණක් ලියාපදිංචි කිරීමෙන් පසු, ඒ ලියාපදිංචිය පිළිබඳ සහතිකයක් ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කළ යුතු අතර, ලියාපදිංචි හිමියා විසින් ඉල්ලා සිටි විටක, අන්තිම වරට සටහන් කර ගෙන ඇති ශ්‍රී ලංකාවේ ඔහුගේ තැපැල් ලිපිනයට වඩා ඔහු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම් ඔහුට ලියුම් භාර දීම සඳහා අන්තිමවරට සටහන් කර ගෙන ඇති ශ්‍රී ලංකාවේ තැපැල් ලිපිනයට හෝ ලියාපදිංචි තැපැලෙන් ඒ සහතිකය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යැවිය යුතු ය.

ලියාපදිංචි ලකුණු පළ කිරීම.

114. සියලුම ලියාපදිංචි ලකුණු, ඒවා ලියාපදිංචි කරන ලද අනුපිළිවෙල අනුව, නියමිත ආකෘතියේ ලා ගැසට් පත්‍රයෙහි පළ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලැස්විය යුතු

අතර, එසේ පළ කරනු ලබන එක් එක් ලකුණ සම්බන්ධයෙන් නියම කරනු ලබන විස්තර පිළිබඳ යොමු සටහනක් ද ඒ පළ කිරීමෙහි ඇතුළත් කළ යුතු ය.

ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික කළ පිටපත්.

115. යම් තැනැත්තකු විසින් ලේඛනය පරීක්ෂා කිරීම ද නියමිත ගාස්තුව ගෙවා, ඒ ලේඛනයේ උධෘතවල සහතික කළ පිටපත් ලබා ගැනීම ද කරනු ලැබිය හැකි ය.

ආශ්‍රිත ලකුණු.

116. එවකටත් ලේඛනයේ ඇතුළත් ඉල්ලුම්කරුගේ ලකුණක් ඉල්ලුම්කරු නොවන වෙනත් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබිණි නම්, නොමහ යාමට හෝ ව්‍යාකුල තත්ත්වයකට පත් වීමට ඉඩ ඇති තරම් ඒ ලකුණකට සමානුරූපී වූ හෝ බොහෝ සෙයින් සමාන වූ ලකුණක් එකම භාණ්ඩ හෝ සේවා සඳහා හෝ එකම විස්තරයෙන් යුත් භාණ්ඩ හෝ සේවා සඳහා ලියාපදිංචි කිරීම ඉල්ලුම් පත්‍රයකින් ඉදිරිපත් කරන ලද අවස්ථාවක ඒ ලකුණ ලියාපදිංචි කිරීම පිළිබඳ කොන්දේසියක් ලෙස, ඒ ලකුණ ආශ්‍රිත ලකුණු වශයෙන් ලේඛනයේ ඇතුළත් කළ යුතු යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

ආශ්‍රිත ලකුණු පාවාදීම සහ පාවිච්චි කිරීම.

117. ආශ්‍රිත ලකුණු වෙන් වෙන් වශයෙන් නොව සම්පූර්ණ සමස්තයක් වශයෙන් පමණක් පාවාදීම හෝ අන්සතු කිරීම හෝ කළ යුතු නමුත් ඒවා වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කර තිබෙන ලකුණු ලෙස අනෙක් සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය :

එසේ වුව ද, ලියාපදිංචි ලකුණක් පාවිච්චි කිරීම මේ කොටසේ විධිවිධාන යටතේ යම් කාර්යයක් සඳහා ඔප්පු කිරීමට අවශ්‍ය වන අවස්ථාවක, ආශ්‍රිත ලියාපදිංචි ලකුණක් පාවිච්චි කිරීම හෝ ලකුණෙහි අනන්‍යතාව කෙරෙහි සාරාත්මකව බලය නොපාන පරිදි කරන ලද එකතු කිරීම් හෝ වෙනස් කිරීම් සහිතව ඒ ලකුණ පාවිච්චි කිරීම ඉහත කී පාවිච්චි කිරීමට සමාන බව පිළිගනු ලැබීම මැනවැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම් සහ එසේ සලකනු ලබන තාක් දුරට ඔහු විසින් එසේ පිළිගනු ලැබිය හැකි ය.

XXII වන පරිච්ඡේදය

ලකුණක ලියාපදිංචිය පවත්නා කාලය

ලියාපදිංචිය පවත්නා කාලය.

118. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, ලකුණක ලියාපදිංචිය, එය ලියාපදිංචි කළ දින සිට අවුරුදු දහයකට පසු, අවසාන විය යුතු ය.

(2) ලකුණක් ලියාපදිංචි කරනු ලබන විට, එය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබුණු දින සිට එය ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර ඒ දිනය මේ කොටසේ කාර්ය සඳහා, ලියාපදිංචි දිනය ලෙස සැලකිය යුතු ය.

අලුත් කිරීම.

119. (1) ලකුණක ලියාපදිංචිය, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, එකක් අවුරුදු දහයක් වූ අනුගාමී කාලසීමා සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

(2) ලකුණක ලියාපදිංචිය අලුත් කිරීම. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ලකුණ නවදුරටත් පරීක්ෂා කරනු ලැබීමට හෝ යම් තැනැත්තකුගේ විරෝධය පැමකට හෝ යටත් නොවිය යුතු ය.

(3) අලුත් කිරීමේ ගාස්තුව ලියාපදිංචිය වලංගු කාලසීමාව අවසාන වන දිනයට පූර්වයෙන් වූ මාස දොළහ ඇතුළත ගෙවිය යුතු ය :

එසේ වුව ද, නියම කරනු ලැබිය හැකි අධිගාස්තුව ගෙවූ විට, එකී කාලසීමාව අවසාන වන දිනයෙන් පසු, මාස හයක් වූ අනුග්‍රහ කාලසීමාවක් ඒ ගාස්තු ගෙවීම සඳහා ඉඩ දෙනු ලැබිය යුතු ය.

(4) ලියාපදිංචිය පිළිබඳ සියලු අලුත් කිරීම්, භාණ්ඩ හෝ සේවා ලැයිස්තුවලින් යම් භාණ්ඩයක් හෝ සේවයක් ඉවත් කර තිබුණහොත් ඒ ඉවත් කිරීම් ද නිශ්චිතව සඳහන් කරමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේඛනයෙහි සටහන් කළයුතු අතර, නියමිත ආකෘතියෙහි ලා එය ගැසට් පත්‍රයේ පළ කිරීමට ද සැලැස්විය යුතු ය.

(5) අලුත් කිරීමේ ගාස්තුව (3) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ දී හෝ දීර්ඝ කරන ලද කාලසීමාව තුළ දී හෝ ගෙවනු නොලැබූ අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ලකුණ ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

ලියාපදිංචි ලකුණක් වෙනස් කිරීම.

120. යම් ලකුණක ලියාපදිංචි හිමිකරු විසින් ඒ ලකුණෙහි අනන්‍යතාවට සාරාත්මකව බල නොපාන යම් ආකාරයකින් ඊට කිසිවක් එකතු කිරීම පිණිස හෝ එය වෙනස් කිරීම පිණිස හෝ අවසර ලබා ගැනීමට නියමිත ආකාරයෙන් සහ නියමිත ගාස්තුව ද සමඟ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය. එවිට අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊට අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ ලකුණ පාවිච්චි කරන ක්‍රමය හෝ ස්ථානය හෝ පිළිබඳව සුදුසු යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කරන නියමයන්ට හා සීමාකිරීම්වලට යටත්ව ඒ අවසරය ඔහු විසින් දෙනු ලැබිය හැකි ය. අවසරය දෙනු ලැබුවහොත් වෙනස් කරන ලද ආකාරයෙන් ඒ ලකුණ නියමිත ආකාරයට පළ කරනු ලැබිය යුතු ය.

XXIII වන පරිච්ඡේදය

ලකුණක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්

ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්.

121. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොවන පරිදි, ලියාපදිංචි ලකුණක් සම්බන්ධයෙන් පහත දැක්වෙන උරිම අයිතිවාසිකම් ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා සතු විය යුතු ය :-

(අ) ලකුණ පාවිච්චි කිරීම ;

(ආ) ලකුණෙහි ලියාපදිංචිය පාවාදීම හෝ අත්සතු කිරීම ;

(ඇ) බලපත්‍ර ගිවිසුම්වලට ඇතුල්වීම.

(2) ලකුණක ලියාපදිංචි හිමියාගේ කැමැත්ත නොමැතිව, තෘතීය පාර්ශ්වකරුවන් විසින් පහත දැක්වෙන ක්‍රියා කරනු ලැබිය නොහැකි ය :-

(අ) ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ හෝ සේවා සඳහා මහජනයා නොමග යාමට ඉඩ ඇති ආකාරයකින්, පෙනුමෙන් ඊට

සමාන ලකුණක් හෝ ලාංඡනයක් පාවිච්චි කිරීම හෝ සමාන භාණ්ඩ හෝ සේවා සම්බන්ධව පාවිච්චි කිරීමෙන් මහජනයා නොමඟ යාමට ඉඩ ඇති වන පරිදි ලකුණක් හෝ ලාංඡනයක් පාවිච්චි කිරීම ; සහ

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව හා ලකුණක් ලියාපදිංචි හිමියාගේ ස්වාර්ථවලට හානිකර විය හැකි තත්වය යටතේ, ඒ ලකුණ හෝ පෙනුමෙන් ඊට සමාන වන ලාංඡනයක් හෝ ව්‍යාපාර නාමයක් වෙනත් කවර හෝ අන්දමකින් පාවිච්චි කිරීම.

(3) යම් ලකුණක් ලියාපදිංචි කිරීමට යෙදුනේ කවර භාණ්ඩ සඳහා ද (එම භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ විකිණීම සඳහා හෝ ශ්‍රී ලංකාවෙන් ආනයනය කිරීම සඳහා අදහස් කරන ලද්දේ වුව ද) ඒ භාණ්ඩ පිළිබඳව හෝ ඒවා සම්බන්ධයෙන් මහජනයා නොමඟ යැවීමට තුඩුදෙන ආකාරයෙන් එම ලකුණට සමාන වූ ලකුණක් හෝ ලාංඡනයක් තුන්වන පාර්ශ්වයන් විසින් (මුද්‍රණය කිරීමෙන්, පින්තාරු කිරීමෙන්, හෝ අන්‍යාකාර මාර්ගයකින්) ශ්‍රී ලංකාව තුළ යොදා ගැනීම හෝ ඇලවීම (2) වන උපවගන්තිය යටතේ තහනම් කරනු ලැබූ ක්‍රියාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ලකුණක් ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද අනන්‍යව ඒ භාණ්ඩ හෝ සේවා සඳහා තැනැත්තකු විසින් ලකුණක් යොදා ගන්නා අවස්ථාවල දී මහජනයා නොමඟ යාමට ඉඩ ඇති බවට අධිකරණය විසින් පූර්වානුමාන කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම් පිළිබඳ සීමාව.

122. තෘතීය පාර්ශ්වකරුවන් විසින් පහත දැක්වෙන ක්‍රියා කරනු ලැබීම වැළැක්වීමේ අයිතිවාසිකම්, ලකුණ ලියාපදිංචි කිරීම හේතුකොටගෙන එහි ලියාපදිංචි හිමියා වෙත නොපැවරේ :–

(අ) ස්වකීය නම්, ලිපිනයන්, ව්‍යාජ නාම හෝ භූගෝලීය නාමයක් හෝ, ස්වකීය භාණ්ඩවල සහ සේවාවල වර්ගය, තත්ත්වය, ප්‍රමාණය, ගමනාන්තය, වටිනාකම, සම්භව ස්ථානය, නිෂ්පාදන හෝ සම්පාදන කාලය සහ භාණ්ඩ සේවාවල සැපයීම යන මේවා පිළිබඳ සැබෑ සංඥා නිර්ව්‍යාජ ලෙස පාවිච්චි කිරීම හුදෙක් හැඳින ගැනීමේ හෝ

තොරතුරු සැපයීමේ හෝ කාර්යවලට සීමා වන තාක් දුරට සහ ඒ භාණ්ඩවල හෝ සේවාවල හෝ මූලාරම්භය පිළිබඳව මහජනයා නොමඟ යැවීමක් නොවන තාක් දුරට, එසේ නිර්ව්‍යාජ ලෙස පාවිච්චි කිරීම ;

(ආ) ඒ ලකුණ යටතේ ශ්‍රී ලංකාවේ දී නීත්‍යානුකූලව සාදන ලද, ආනයනය කරන ලද, වෙළඳාම සඳහා ඉදිරිපත් කරන ලද, විකුණන ලද, පාවිච්චි කරන ලද හෝ රැස් කර තබන ලද භාණ්ඩ කිසිදු වෙනසකට භාජන වී නොමැති නම්, එකී භාණ්ඩ සම්බන්ධයෙන් ඒ ලකුණ පාවිච්චි කිරීම.

XXIV වන පරිච්ඡේදය

ලකුණක් පිළිබඳ ඉල්ලුම් පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පාවාදීම සහ අන්සතු කිරීම

ඉල්ලුම්පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පාවාදීම.

123. (1) යම් ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ගොනු කර ඇත්තේ හෝ ඒ ලකුණ ලියාපදිංචි කර ඇත්තේ හෝ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ හෝ සේවා සියල්ලම හෝ ඉන් කොටසක් හෝ සම්බන්ධයෙන්, එකී ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචිය පාවාදීම හෝ අන්සතු කිරීම ඒ ලකුණ පාවිච්චි කරන ව්‍යවසාය සම්පූර්ණයෙන් ම නැතහොත් කොටසක් වශයෙන් හෝ පැවරීම ගැන නොතකා කරනු ලැබිය හැකි අතර එම පාවාදීම හෝ අන්සතු කිරීම ඊට ගිවිසගත් පාර්ශ්ව විසින් හෝ වෙනුවෙන් අත්සන් තබන ලද ලියවිල්ලක් මගින් විය යුතු ය.

(2) ඒ පාවාදීමේ හෝ අන්සතු කිරීමේ අරමුණ හෝ ප්‍රතිඵලය වනුයේ මහජනයා නොමඟ යැවීම නම්, විශේෂයෙන් ම, ඒ ලකුණ යොදනු ලබන භාණ්ඩ හෝ සේවාවල ස්වභාවය, මූලාරම්භය, නිෂ්පාදන ක්‍රියාවලිය, ආවේණික ලක්ෂණ හෝ ඒ භාණ්ඩ හෝ සේවා අදහස් කර ඇත්තේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයට ඒවායේ ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මහජනයා නොමඟ යැවීම නම්, ඒ පැවරීම හෝ අන්සතු කිරීම නිර්බල විය යුතු ය.

(3) ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ ලකුණක ලියාපදිංචියක්, පාවාදීම හෝ අන්සතු කිරීම හේතුකොට ගෙන ඒ ඉල්ලුම් පත්‍රයට හෝ ලියාපදිංචියට හෝ හිමිකම් ලබන යම් තැනැත්තකු විසින් ඒ පාවාදීම හෝ අන්සතු කිරීම ලේඛනයෙහි සටහන් කරන ලෙස නියමිත ආකාරයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(4) නියමිත ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවනු ලැබුවහොත් හැර එවැනි කිසිම පාවාදීමක් හෝ අන්සතු කිරීමක් ලේඛනයෙහි සටහන් නොකළ යුතු ය.

(5) එවැනි යම් පාවාදීමක් හෝ අන්සතු කිරීමක් තෘතීය පාර්ශ්වකරුවන් විෂයයෙහි බලපවත්වන්නේ යයි ලේඛනයෙහි සටහන් කර තිබේ නම් මිස, ඒ පාවාදීම හෝ අන්සතු කිරීම හෝ තෘතීය පාර්ශ්වකරුවන් විෂයයෙහි බලනොපැවැත්විය යුතු ය.

XXV වන පරිච්ඡේදය

බලපත්‍ර ගිවිසුම්

අර්ථ නිරූපණය.

124. (1) මේ කොටසේ කාර්යය සඳහා, බලපත්‍ර ගිවිසුමක් යන්නෙන්, යම් ලකුණක් ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ හෝ සේවා සියල්ලම හෝ ඉන් කොටසක් හෝ සඳහා ඒ ලකුණ පාවිච්චි කිරීමට ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා ("බලපත්‍රදායී") විසින් වෙනත් යම් තැනැත්තකුට හෝ ව්‍යවසායකට හෝ ("බලපත්‍රලාභී") අවසර දෙන ගිවිසුමක් අදහස් වේ.

(2) බලපත්‍රලාභී විසින් ඒ ලකුණ පාවිච්චි කිරීට, ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා විසින් ඒ ලකුණ පාවිච්චි කිරීම ලෙස සලකනු ලැබිය යුතු ය.

බලපත්‍ර ගිවිසුමක ආකෘතිය සහ එය සටහන් කිරීම.

125. (1) බලපත්‍ර ගිවිසුමක් ලියවිල්ලකින් විය යුතු අතර, ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ එය අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් ඉල්ලීමක් කරන ලද විටක, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු, ඒ ගිවිසුමට අදාළව සටහන් කර ගැනීමට ඒ පාර්ශ්වකරුවන් අපේක්ෂා කරන විස්තර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේඛනයෙහි සටහන් කළ යුතු ය :

එසේ වුව ද, ඒ ගිවිසුමට අදාළ වෙනත් විස්තර කිසිවක් අනාවරණය කිරීමට හෝ සටහන් කිරීමට හෝ ඒ පාර්ශ්වකරුවන්ට නියම නොකළ යුතු ය.

බලපත්‍රලාභී පතු අයිතිවාසිකම්.

126. පහත දැක්වෙන කරුණුවලට පටහැනි විධිවිධාන කිසිවක් බලපත්‍ර ගිවිසුමේ ඇතුළත්ව නොමැති විටක,–

(අ) ඒ ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ සියල්ල හෝ සේවා සියල්ල සම්බන්ධයෙන් ඒ ලකුණ, ලියාපදිංචිය අලුත් කිරීම් ද ඇතුළුව, ඒ ලකුණ ලියාපදිංචිය පවතින මුළු කාලසීමාව ම තුළ ශ්‍රී ලංකාවේ සම්පූර්ණ භූගෝලීය ප්‍රදේශය මුළුල්ලේම පාවිච්චි කිරීමට බලපත්‍රලාභියාට හිමිකම ලැබිය යුතු ය ;

(ආ) බලපත්‍ර ගිවිසුම යටතේ වූ තම අයිතිවාසිකම් තෘතීය පාර්ශ්වකරුවන්ට පාවාදීමට හෝ අන්සතු කිරීමට හෝ අතුරු අවසරදීම්වලට හෝ බලපත්‍රලාභියාට හිමිකම නොලැබිය යුතු ය.

බලපත්‍රදායී පතු අයිතිවාසිකම්.

127. (1) යම් පටහැනි විධිවිධානයක් බලපත්‍ර ගිවිසුමේ ඇතුළත්ව නොමැති විටෙක, ඒ ලකුණම සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවදුරටත් අවසරදීම හෝ තමා විසින් ම ඒ ලකුණ පාවිච්චි කිරීම හෝ බලපත්‍රදායී විසින් කරනු ලැබිය හැකි ය.

(2) අවසරය අනන්‍ය අවසරයක් බවට බලපත්‍ර ගිවිසුමේ විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක, සහ ගිවිසුමේ විධිවිධාන අන්‍යකාරයකින් සලස්වා තිබෙන විටෙක හැර, ඒ ලකුණ සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවදුරටත් අවසරදීම හෝ තමා විසින් ම ඒ ලකුණ පාවිච්චි කිරීම හෝ බලපත්‍රදායී විසින් නොකළ යුතු ය.

බලපත්‍ර ගිවිසුමක් සහ එහායේ ඇතැම් වගන්ති බලරහිත වීම.

128. (1) ලකුණ පාවිච්චි කරනු ලැබිය හැක්කේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩවල හෝ සේවාවල තත්ත්වය බලපත්‍රදායි විසින් කාර්ය සාධක ලෙස පාලනය කරනු ලැබීම සහතික කෙරෙන කොන්දේසි ඇතුළත්ව නොමැති විටක බලපත්‍ර ගිවිසුම බලරහිත හා ශූන්‍ය විය යුතු ය.

(2) ලකුණෙහි ලියාපදිංචි හිමියා වෙත මේ කොටසින් පවරනු ලැබූ අයිතිවාසිකම්වලින් ව්‍යුත්පන්න නොවූ හෝ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නොවන්නා වූ හෝ සීමාකිරීම්, බලපත්‍ර ගිවිසුමක යම් වගන්තියකින් හෝ කොන්දේසියකින් හෝ බලපත්‍රලාභි වෙත පනවනු ලබනතාක් දුරට, ඒ වගන්තිය හෝ කොන්දේසිය බලරහිත හා ශූන්‍ය විය යුතු ය :

එසේ වුව ද, ඉහත සඳහන් සීමාකිරීම්,–

(අ) ලකුණෙහි පාවිච්චි කිරීමේ විෂය පථය, ප්‍රමාණය හෝ බලපවත්නා කාලසීමාව සම්බන්ධයෙන් වූ හෝ ඒ ලකුණ පාවිච්චි කරනු ලබන භූගෝලීය ප්‍රදේශය සම්බන්ධයෙන් වූ හෝ ඒ ලකුණ පාවිච්චි කරනු ලැබිය හැකි භාණ්ඩවල හෝ සේවාවල තත්වය හෝ ප්‍රමාණය සම්බන්ධයෙන් වූ සීමාකිරීම්වලින් ;

(අ1) (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි මඟින් යුක්තිමත් වූ සීමාකිරීම්වලින් ; සහ

(ඇ) ලකුණෙහි ලියාපදිංචිය පිළිබඳ වලංගු භාවයට හානිකර විය හැකි සියලු ක්‍රියාවලින් වැළකී සිටීමට බලපත්‍රලාභී වෙත නියම කර ඇති බැඳීම්වලින්,

සංයුක්ත වන ලෙස නොසැලකිය යුතු ය.

බලපත්‍ර ගිවිසුම් අවලංගු කිරීම.

129. නීත්‍යානුකූල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළු, යම්කිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ ලකුණෙහි ලියාපදිංචි හිමියා සහ

සටහන් කර ඇති සෑම පාවාදීම්ලාභියකු ම, බලපත්‍රලාභියකු ම හෝ අතුරු බලපත්‍රලාභියකු ම පාර්ශ්වකරුවන් වශයෙන් නම් කරනු ලැබිය යුතු, ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට, අධිකරණය විසින්-

(අ) ඒ ලකුණ පාවිච්චි කරනු ලබන්නේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩවල හෝ සේවාවල තත්ත්වය පිළිබඳ කාර්ය සාධක පාලනය බලපත්‍රදායීට අහිමි වී නිබේ නම් ;

(ආ) මහජනයා නොමග යවන හෝ ව්‍යාකුල බවට පත් කෙරෙන හෝ ආකාරයෙන් බලපත්‍රලාභී විසින් ඒ ලකුණ පාවිච්චි කරනු ලැබ තිබේ නම්,

ඒ ගිවිසුම බලරහිත සහ අවලංගු කරනු ලැබිය හැකි ය.

විදේශයක දී ගෙවීම් අවශ්‍ය කරන බලපත්‍ර ගිවිසුම්.

130. (1) (අ) විදේශයක දී රාජ්‍ය භාගය ගෙවීම් කිරීම් අවශ්‍ය කරන යම් බලපත්‍ර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක් ; හෝ

(ආ) ඒ බලපත්‍ර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොට, ඒ බලපත්‍ර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම,

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යැයි විශ්වාස කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර ඒ කරුණ පිළිබඳ තීරණයකට අදාළ වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම් දීමක් අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී බලපත්‍ර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින් අධ්‍යක්ෂ

ජනරාල්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, පාවාදීම හෝ අන්සතු කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මේ පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව අතුරු බලපත්‍රයකට ද අදාළ විය යුතු ය.

ලියාපදිංචිය බලරහිතවීම බලපත්‍ර ගිවිසුම කෙරෙහි බලපාන අන්දම.

131. බලපත්‍ර ගිවිසුමේ කාලසීමාව ඉකුත්වීමට පෙර, ලියාපදිංචිය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කරන ලද අවස්ථාවක ඒ බලපත්‍ර ගිවිසුම යටතේ බලපත්‍රලාභී විසින් බලපත්‍රදායිට යම් ගෙවීමක් කරන ලෙස තවදුරටත් ඔහුට නියම නොකළ යුතු අතර එවකටත් ගෙවා ඇති යම් ගෙවීමක් ආපසු ලබාගැනීමට ද බලපත්‍රලාභීට හිමිකම ලැබිය යුතු ය :

එසේ වුව ද, සියලු අවස්ථානුගත කරුණු යටතේ සහ විශේෂයෙන් ම බලපත්‍රලාභියාට අවසරය අනුව සිද්ධිදායක ලෙස ලාභයක් ලැබී තිබේ නම්, එවැනි යම් ආපසු ගෙවීමක් කිරීම සාධාරණීය නොවන බව බලපත්‍රදායී විසින් ඔප්පු කරනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ ආපසු ගෙවීම් කිරීම බලපත්‍රදායිට නියම නොකළ යුතු අතර එසේ ඔප්පු කළ හැකි ප්‍රමාණයට කොටසක් ආපසු ගෙවීම කරන ලෙස බලපත්‍රදායිට නියම කළ යුතු ය.

බලපත්‍ර ගිවිසුමක් ඉකුත්වීම, අවසාන කිරීම හෝ නිර්බල වීම.

132. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්–

(අ) 125 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සටහන් කරනු ලැබූ බලපත්‍ර ගිවිසුමක කාලය ඉකුත් වී ඇති ඇති බවට හෝ අවසන් කර ඇති බවට ඔහු සෑහීමට පත්වුවහොත්, ඒ බව සටහන් කරන ලෙස එහි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලකින් ඉල්ලා සිටින ලද කල්හි, ඒ බව ලේඛනයෙහි සටහන් කළ යුතු ය;

(ආ) මේ කොටසේ වෙනත් යම් විධිවිධානයක් යටතේ බලපත්‍ර ගිවිසුමක කාලය ඉකුත්වීම, එය අවසාන කිරීම, බලරහිත කිරීම හෝ නිර්බල කිරීම ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

XXVI වන පරිච්ඡේදය

ලකුණක ලියාපදිංචිය අත්හැරීම සහ එහි බලරහිත බව

ලියාපදිංචිය අත්හැරීම.

133. (1) ලකුණක ලියාපදිංචි හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින් ඔහු විසින්, ලියාපදිංචිය සම්පූර්ණයෙන්ම හෝ ඒ ලකුණ ලියාපදිංචි කර තිබෙන්නේ යම් භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩවල හෝ සේවාවල කොටසක් සම්බන්ධයෙන් හෝ අත්හරිනු ලැබිය හැකි ය.

(2) එකී ප්‍රකාශය ලැබුණු කල්හි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ප්‍රකාශය ලේඛනයේ සටහන් කළ යුතු අතර ඒ සටහන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(3) එකී ප්‍රකාශය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබුණු දින සිට, ඒ අත්හැරීම බලපැවැත්විය යුතු ය.

(4) ලකුණක් සම්බන්ධයෙන් වූ බලපත්‍ර ගිවිසුමක් ලේඛනයේ සටහන් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අවසර ගිවිසුමේ පටහැනි විධිවිධානයක් නොමැති විටක, සටහන් කරනු ලැබ ඇති පාවාදීම්ලාභී විසින් හෝ බලපත්‍රලාභී විසින් හෝ අතුරු බලපත්‍රලාභී විසින් හෝ කැමැත්ත දිය යුතු බවට වූ නියමය අනවශ්‍ය බව ප්‍රකාශිතව ම බලපත්‍ර ගිවිසුමේ යදහන් කර තිබේ නම් හැර, සටහන් කරනු ලැබ ඇති සෑම පාවාදීම්ලාභියකු ම විසින් හෝ බලපත්‍රලාභියකු ම විසින් හෝ අතුරු බලපත්‍රලාභියකු ම විසින් හෝ එකී අත්හැරීමට කැමැත්ත දෙමින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ලැබුණු විට මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී අත්හැරීම පිළිගැනීම හෝ සටහන් කිරීම හෝ නොකළ යුතු ය.

ලියාපදිංචිය බලරහිත බව.

134. (1) නීත්‍යානුකූල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළු නිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ ලකුණේ ලියාපදිංචි හිමියා සහ සටහන් කර ඇති සෑම පාවාදීම්ලාභියකු ම, බලපත්‍රලාභියකු ම, හෝ අතුරු බලපත්‍රලාභියකු ම පාර්ශ්වකරුවන් වශයෙන් නම්

කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් අධිකරණය වෙත ලැබුනු විට, ඒ ලකුණ ලියාපදිංචි කිරීම 103 වන සහ 104 වන වගන්තිවල විධිවිධාන යටතේ වළක්වා තිබේ නම්, ඒ ලකුණෙහි ලියාපදිංචිය බලරහිත හා ශූන්‍ය බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අධිකරණය වෙත ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේ දී නොපැවති, බලරහිත කිරීමේ හේතු සැලකිල්ලට නොගත යුතු ය.

(2) ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩවලින් හෝ සේවාවලින් යම් කොටසක් සම්බන්ධයෙන් පමණක් ලියාපදිංචිය බලරහිත කිරීම සඳහා හේතු පවතී නම්, ඒ භාණ්ඩවල හෝ ඒ සේවාවල ඒ කොටස සඳහා පමණක් ලියාපදිංචිය බලරහිත වන බවට ප්‍රකාශයක් කළ යුතු ය.

(3) 104 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් හේතු අතුරින් යම් හේතුවක් පදනම් කොට ගෙන බලරහිත බවට ප්‍රකාශයක් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක්, 113 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

බලරහිත වීමේ දිනය සහ ප්‍රතිඵලය.

125. (1) ලකුණක ලියාපදිංචිය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් බලරහිත බව ප්‍රකාශ කරමින් අධිකරණය විසින් අවසානාත්මක තීරණයක් කරන ලද විටක, ලියාපදිංචියේ දින සිට, අවස්ථාවෝචිත පරිදි, ඒ ලියාපදිංචිය සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් හෝ බලරහිත සහ ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බලරහිත කිරීම පිළිබඳ ප්‍රකාශයක් අවසානාත්මක වූ විට, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කරුණ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ප්‍රකාශය ලේඛනයේ යටහන් කොට, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

XXVII වන පරිච්ඡේදය

ලකුණක් ඉවත් කිරීම

ලකුණක් ඉවත් කිරීම.

136. (1) නීත්‍යානුකූල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ඇතුළු, නිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ ලකුණෙහි ලියාපදිංචි හිමියා සහ සටහන් කර ඇති සෑම පාවාදීම්ලාභියකු ම, බලපත්‍රලාභියකු ම පාර්ශ්වකරුවන් වශයෙන් නම් කරනු ලැබිය යුතු ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට අධිකරණය විසින්,–

(අ) අධිකරණය වෙත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනට පූර්වයෙන් වූ අනුගාමී අවුරුදු පහ ඇතුළත පිළිගත හැකි හේතු නොමැතිව, ලියාපදිංචි හිමියා යම් ලියාපදිංචි ලකුණක් ශ්‍රී ලංකාව තුළ පාවිච්චි කිරීම හෝ අවස්ථාවෝචිත ප්‍රකාර ශ්‍රී ලංකාව තුළ ඒ ලකුණ පාවිච්චි කිරීමට සැලැස්වීම පැහැර හැර තිබේ නම්;

(ආ) ඒ ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ හෝ සේවා එකක හෝ ඊට වැඩි ගණනක වර්ග නාමයක් බවට පත් වන ලෙස සහ වෙළෙඳ අංශවල හා මහජනයාගේ මතය අනුව ඒ වෙළෙඳ ලකුණේ වැදගත්කම අහෝසිවන ලෙස, ඒ ලකුණ පරිණාමනය කිරීමට එහි ලියාපදිංචි හිමියා විසින් සලස්වනු ලැබිණි නම්, පොළඹවනු ලැබිණි නම් හෝ එවැනි පරිණාමනයක් ඔහු විසින් ඉවසා නිහඬව සිටී නම්,

අධිකරණය විසින් ඒ ලියාපදිංචි වූ ලකුණ ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ ලකුණ පාවිච්චි නොකිරීම එහි ලියාපදිංචි හිමියාගේ පාලනයට විෂය නොවන හේතු නිසා සිදු වී තිබේ නම්, අධිකරණය විසින් ඒ බව සැලකිල්ලට ගනු ලැබිය හැකි ය. ලියාපදිංචි හිමියා මුහුණ පා ඇති මුදල් හිහය ඒ ලකුණ පාවිච්චි නොකිරීමට හේතුවක් වශයෙන් අධිකරණය විසින් නොසැලකිය යුතු ය.

(3) යම් ලකුණක්-

(අ) එය ලියාපදිංචි කර තිබෙන්නේ යම් ස්වරූපයක් අනුව ද, ඒ ස්වරූපයේ මූලිකාංග ඒ ලකුණේ විශේෂ ලක්ෂණ වෙනස් නොවන පරිදි වෙනස් කර, එකී ස්වරූපයට වෙනස් ස්වරූපයකින් පාවිච්චි කිරීම, ඒ ලකුණ ඉවත් කිරීමට හේතුවක් නොවිය යුතු ය ;

(ආ) එය ලියාපදිංචි කර තිබෙන්නේ යම් පන්තියකට අයත් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ පන්තියට අයත් භාණ්ඩ හෝ සේවා එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් පාවිච්චි කිරීම, ඒ පන්තියට ම අයත් සෙසු සියලු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ඒ ලකුණ ඉවත් කිරීම වැළැක්වීමට ප්‍රමාණවත් හේතුවක් විය යුතු ය.

ලකුණක් ඉවත් කෙරෙන දිනය සහ ඉවත් කිරීමේ ප්‍රතිඵලය.

137. ලියාපදිංචි කළ යම් ලකුණක් ලේඛනයෙන් ඉවත් කිරීමට අධිකරණය විසින් අවසාන තීරණයක් කරනු ලැබූ අවස්ථාවක,-

(1) අධිකරණය විසින්, ඒ ලකුණ ඉවත් කිරීමට හේතු වූ සිද්ධිවල හා වෙනත් අවස්ථානුගත කරුණුවල දිනය සැලකිල්ලට ගෙන, ඒ ලකුණේ ලියාපදිංචියෙහි ඇති කවර වුව ද නීත්‍යානුකූල බලපැවැත්මක් අවසාන වූ දිනය ලෙස සැලකිය යුතු දිනය නිශ්චය කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණයේ තීරණය ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, ලකුණ ඉවත් කළ යුතු යයි අධිකරණය තීරණය කළහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ ඉවත් කිරීම පිළිබඳ සටහනක් ලේඛනයේ සඳහන් කර අධිකරණයේ තීරණය ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

XXVIII වන පරිච්ඡේදය

සාමූහික ලකුණු

සාමූහික ලකුණු.

138. (1) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව ලකුණු හා සම්බන්ධ විධිවිධාන සාමූහික ලකුණුවලට අදාළ විය යුතු ය..

(2) සාමූහික ලකුණක් හා සම්බන්ධව, 101 වන වගන්තියේ (වෙළෙඳ ලකුණක් හෝ සේවා ලකුණක් හෝ සමන්විත විය හැකි ලාංඡනය) සඳහන් එක් ව්‍යවසායක භාණ්ඩ හෝ සේවා වෙනත් ව්‍යවසායන්ගේ ඒවාවලින් වෙනස් කර හඳුනා ගැනීම, එක් ව්‍යවසායක භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් භාවිත කරන සාමූහික ලකුණක් අනිකුත් ව්‍යවසායන්හි ඒවාවලින් වෙනස් කර හඳුනා ගැනීමක් ලෙස තේරුම් ගත යුතු ය.

(3) 103 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුන ද භාණ්ඩවල හෝ සේවාවල භූගෝලීය ප්‍රභවය නම් කරනු ලැබීම පිණිස, වෙළෙඳාමේ දී ප්‍රයෝජනවත් විය හැකි ලාංඡනයකින් හෝ දැන්වීමකින් සමන්විත වන්නා වූ සාමූහික ලකුණක් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද කාර්මික හෝ වාණිජ කරුණුවල දී අවංක පරිචයට අනුකූලව භාවිත කිරීම, විශේෂයෙන් ම භූගෝලීය නාමය භාවිත කිරීමට හිමිකම ඇති තැනැත්තකු විසින් ඒ ලාංඡනය හෝ දැක්වීම භාවිත කිරීම තහනම් කිරීමට ඒ ලකුණෙන් හිමිකරුට හිමිකම නොලැබිය යුතු ය.

සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම.

139. (1) සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ඒ ලකුණ සාමූහික ලකුණක් ලෙස නම් කොට තිබේ නම් මිස සහ ඒ ලකුණ භාවිත කිරීම පාලනය කෙරෙන නියමිත කොන්දේසිවල පිටපතක් ඉල්ලුම්කරු විසින් යථා පරිදි සහතික කොට ඉල්ලීම සමඟ ගොනු කර තිබේ නම් මිස, භාර නොගත යුතු ය.

(2) සාමූහික ලකුණක් දක්වා ඇති භාණ්ඩවල හෝ සේවාවල පොදු ආවේණික ලක්ෂණ හෝ තත්ත්වය කවරේදැයි යන්න ද ඒ ලකුණ භාවිත කරනු ලැබිය හැකි තැනැත්තා කවුරුන් දැයි යන්න සහ ඒ ලකුණ භාවිත කරනු ලබන්නේ කවර තත්ත්වයන් යටතේ දැයි යන්න ද ලකුණ භාවිත කිරීම පිළිබඳව කාර්ය සාධක පාලනයක් ක්‍රියාත්මක කිරීම සහ ඒ කොන්දේසිවලට පටහැනිව ඒ ලකුණ භාවිත කිරීමට එරෙහිව වූ නිසි දණ්ඩන ද (1) වන උපවගන්තිය යටතේ ලකුණක් පාලනය වන්නා වූ කොන්දේසිවල පැහැදිලි කළ යුතු ය. ඒවායෙහි මේ වගන්තිය යටතේ තවදුරටත් වූ නියමිත නියමයන් අන්තර්ගත විය යුතු ය.

(3) සාමූහික ලකුණක් නාවිත කිරීම පාලනය කෙරෙන කොන්දේසි-

(අ) (2) වන උපවගන්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝග මගින් පනවන ලද වෙනත් නියමයන්ට අනුකූල වන්නේ නම් මිස ; සහ

(ආ) මහජන ප්‍රතිපත්තියට හෝ සදාචාරත්වය පිළිබඳ පිළිගත් මූලධර්මවලට පටහැනි නොවන්නේ නම් මිස,

ලියාපදිංචි නොකළ යුතු ය.

(4) (අ) සාමූහික ලකුණක බලයලත් පාවිච්චි කරන්නා සහ එම ලකුණෙහි ලියාපදිංචි හිමිකරු අතර පවත්නා යම් පටහැනි ගිවිසුමකට යටත්ව, ඔහුගේ සම්බන්ධතා තෙරෙහි බලපාන්නා වූ කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් හිමිකරු අමතා උල්ලංඝනයට නඩු කටයුතු කර ගෙන යන ලෙස ඉල්ලා සිටීමට එම ලකුණෙහි බලයලත් පාවිච්චි කරන්නා ට හිමිකම ඇත්තේ ය.

(ආ) එම හිමිකරු-

(i) එසේ කිරීම ප්‍රතික්ෂේප කළොත් ; හෝ

(ii) ඉල්ලා සිටිනු ලැබ මාස දෙකක් ඇතුළත එසේ කිරීම පැහැර හැරියහොත්,

බලයලත් පාවිච්චි කරන්නා විසින්, ඔහු ලකුණෙහි හිමිකරු වූවාක් සේ, ඔහුගේ නමින් නඩු කටයුතු ගෙන ආ හැකි ය. ලියාපදිංචි හිමිකරු නඩුවෙහි පාර්ශ්වකරුවකු කරනු ලැබිය යුතු ය.

(ඇ) ලියාපදිංචි සාමූහික ලකුණක හිමිකරු විසින් ගෙන එනු ලබන උල්ලංඝනය පිළිබඳ නඩු කටයුත්තක දී, බලයලත් පාවිච්චි කරන්නකුට දරන්නට සිදු වී ඇති හෝ දරන්නට සිදු විය හැකි යම් අලාභ ද අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(5) සාමූහික ලකුණක ලියාපදිංචිය, 136 වන වගන්තියේ නිශ්චය කොට දැක්වෙන හේතුවලට අමතරව පහත දැක්වෙන හේතු මත ද ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය :–

(i) ලකුණෙහි හිමිකරු විසින් එය පාවිච්චි කරනු ලැබ නිබෙන ආකාරය අනුව, ඒ ලකුණට රාජ්‍ය අනුග්‍රහයක් ඇතැයි මහජනයාට අවබෝධ වන සේ හෝ කල්පනා වන පරිදි මහජනයා නොමඟ යැවීමට ඉඩ ඇති කර තිබීම ;

(ii) ඒ ලකුණ භාවිත කිරීම පාලනය වන කොන්දේසි පිළිපැදීම හෝ පිළිපදින බවට වග බලා ගැනීම එහි හිමිකරු විසින් පැහැර හැර තිබීම ; හෝ

(iii) එම කොන්දේසිවල,

(අ) (2) වන උපවගන්තියට සහ මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියමිත වෙනත් යම් කොන්දේසිවලට නවදුරටත් අනුකූල නොවන පරිදි ; හෝ

(ආ) මහජන ප්‍රතිපත්තියට හෝ සදාචාරත්වය පිළිබඳ පිළිගත් මූලධර්මවලට පටහැනි වන පරිදි,

සංශෝධනයක් කර තිබීම.

(6) සාමූහික ලකුණක් 134 වන වගන්තියේ නිශ්චිතව සඳහන් බලරහිත වීමේ හේතූන්ට අමතරව හා 139 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් (2) වන උපවගන්තියේ සහ (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්, එහි ලියාපදිංචිය ශූන්‍ය හා බලරහිත බව ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

සාමූහික ලකුණ ලියාපදිංචි කිරීම සහ පළකිරීම.

140. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ලේඛනයෙහි යම් කොටසක සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම කළ යුතු අතර, ඒ ලකුණ පාවිච්චි කිරීම පාලනය කෙරෙන කොන්දේසිවල පිටපතක් ඒ ලියාපදිංචි කිරීමට අමුණා තැබිය යුතු ය.

(2) සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් 111 වන වගන්තියේ (9) වන උපවගන්තියට අනුකූලව පළ කිරීමේ දී, ඒ ලියාපදිංචි කිරීමට ඇමිණිය යුතු කොන්දේසිවල සම්පිණ්ඩනයක් ද ඒ පළ කිරීමට ඇතුළත් විය යුතු ය.

(3) සාමූහික ලකුණක්, එසේ (1) වන උවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ විට එය ලියාපදිංචි කරන ලද ලකුණක් ලෙස සියලු කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු ය.

(4) ලියාපදිංචි කළ සාමූහික ලකුණක භාවිතය පාලනය කෙරෙන කොන්දේසි, ලේඛනය සම්බන්ධයෙන් වන ආකාරයෙන් ම මහජන පරීක්ෂාව සඳහා විවෘත විය යුතු ය.

සාමූහික ලකුණු භාවිතය පාලනය කෙරෙන කොන්දේසි වෙනස්වීම්.

141. (1) සාමූහික ලකුණක ලියාපදිංචි අයිතිකරුවකු විසින්, සාමූහික ලකුණ භාවිතය පාලනය කෙරෙන කොන්දේසිවලට කරන ලද යම් වෙනස් කිරීම් හෝ සංශෝධන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියමිත ආකාරයෙන් දැනුම් දිය යුතු ය.

(2) ඒ වෙනස් කිරීම් හෝ සංශෝධන පිළිබඳ යම් දැනුම්දීමක්, නියමිත ගාස්තුවක් ගෙවීම මත ලේඛනයෙහි සටහන් කරනු ලැබිය යුතු ය. කොන්දේසිවල කරනු ලබන ඒ වෙනස් කිරීම හෝ සංශෝධනය, ඒවා සටහන් කරනු ලැබ ඇත්තේ නම් පමණක් බලාත්මක විය යුතු ය.

(3) කොන්දේසිවලට කරන ලද සහ (2) වන උපවගන්තිය යටතේ සටහන් කරන ලද ඒ වෙනස් කිරීම් සහ සංශෝධනවල සාරාංශයන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළියෙල කොට ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

XXIX වන පරිච්ඡේදය

සහතික ලකුණු

පහතික ලකුණු.

142. (1) මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව ලකුණුවලට අදාළ විධිවිධාන සහතික ලකුණුවලට අදාළ විය යුතු ය.

(2) සහතික ලකුණක් සම්බන්ධව, 101 වන වගන්තියේ ඇති (වෙළෙඳ ලකුණක හෝ සේවා ලකුණක අන්තර්ගත විය හැකි ලාංඡනයක්) එක් ව්‍යවසායක හාණ්ඩ හෝ සේවා තවත්

ව්‍යවසායවල හාණ්ඩ හෝ සේවාවලින් වෙන් කොට හඳුනාගැනීම යන සඳහන, සහතික කරනු නොලැබූ හාණ්ඩ හා සේවාවලින්, සහතික කරනු ලැබූ හාණ්ඩ හෝ සේවා වෙන්කොට හඳුනාගැනීම පිළිබඳ සඳහනක් ලෙස අර්ථකථනය කළ යුතු ය.

(3) 103 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද හාණ්ඩ සහ සේවාවල භූගෝලීය ප්‍රභවය හඳුනාගැනීමට වෙළඳාමෙහි දී උපකාර විය හැකි ලාංඡනයකින් හෝ සංඥාවකින් සමන්විත සහතික ලකුණක් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය :

එසේ වුවද එවැනි ලාංඡනයක් හෝ සංඥාවක් අවංක පරිචයන්ට අනුකූලව කාර්මික හෝ වාණිජ කාරණාවල දී පාවිච්චි කිරීම, විශේෂයෙන්ම භූගෝලීය නාමයක් පාවිච්චි කිරීමට හිමිකම තිබෙන තැනැත්තකු විසින් එසේ පාවිච්චි කිරීම, තහනම් කිරීමට ඒ ලකුණෙහි අයිතිකරුට හිමිකම නොමැති විය යුතු ය.

(4) සහතික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, ඒ අයදුම්පතෙහි ඒ ලකුණ සහතික ලකුණක් ලෙස නම්කර ඇත්නම් මිස, සහ ඒ ලකුණු භාවිත කිරීම පාලනය වන්නා වූ කොන්දේසිවල ඉල්ලුම්කරු විසින් යථාපරිදි සහතික කළ පිටපතක් ඒ සමග ඇත්නම් මිස, ඒ ඉල්ලුම්පත්‍රයක් ගොනු නොකළ යුතු ය.

(5) ලකුණ පාවිච්චි කිරීමට බලය දෙනු ලැබ සිටින තැනැත්තාගේ නම, ලකුණින් සෑහැතික කරනු ලබන අංග ලක්ෂණ, ලකුණ අයිතිකරු විසින් එම අංග ලක්ෂණ පිරික්සිය හැක්කේ සහ ලකුණ පාවිච්චි කිරීම අධීක්ෂණය කළ හැක්කේ කෙසේ ද යන වග, ලකුණ ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව (ගාස්තුවක් ඇත්නම්) ගෙවිය යුතු ගාස්තු සහ ආරාවුල් නිරාකරණය කිරීමේ කාර්ය පරිපාටිය කොන්දේසිවලින් පෙන්නුම් කළ යුතු ය. ඊට අමතරව මේ වගන්තිය යටතේ නියමිත අවශ්‍යතා ද කොන්දේසිවල ඇතුළත් විය යුතු ය.

(6) (අ) සහතික ලකුණෙහි හිමිකරු, සහතික කරනු ලැබූ වර්ගයේ හාණ්ඩ හා සේවා සැපයීම අයත්වන ව්‍යාපාරයක් කරගෙන යන්නේ නම් ; සහ

(ආ) ඒ ලකුණ ගාවිත කිරීම පාලනය වන කොන්දේසි–

(i) (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වන්නේ නම් සහ එම උපවගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් පනවන ලද නියමයන්ට අනුකූල වන්නේ නම්, මිස ; සහ

(ii) මහජන ප්‍රතිපත්තිවලට හෝ සදාචාරත්වය පිළිබඳ පිළිගත් ප්‍රතිපත්තිවලට පටහැනි නොවන්නේ නම් මිස,

සහතික ලකුණක් ලියාපදිංචි නොකළ යුතු ය.

(7) ලියාපදිංචි සහතික ලකුණක අයිතිකරු විසින් ඉදිරිපත් කරන උල්ලංඝන නඩු කටයුත්තක දී බලයලත් පාවිච්චි කරන්නන් විසින් විඳින ලද හෝ විඳින්නට ඉඩ ඇති පාඩු ද සැලකිල්ලට ගත යුතු අතර, ලකුණෙහි අයිතිකරු විසින් එවැනි බලයලත් පාවිච්චි කරන්නන් වෙනුවෙන් දරා සිටිය යුතු, මුදල්මය ප්‍රතිකර්මයක ප්‍රමාණය සම්බන්ධව ද සුදුසු යයි කල්පනා කරන යම් විධාන අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(8) 136 වන වගන්තියේ, ලකුණක් ඉවත් කිරීම සම්බන්ධයෙන් සලසා තිබෙන විධිවිධානවලින් බාහිරව, සහතික ලකුණක ලියාපදිංචිය ඉවත් කිරීම, පහත දැක්වෙන හේතුවක් මත කරනු ලැබිය හැකි ය :–

(අ) (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන යාම, ලකුණෙහි අයිතිකරු විසින් ආරම්භ කර නිබීම ;

(ආ) ලකුණෙහි අයිතිකරු විසින් එය ගාවිත කර තිබෙන ආකාරය නිසා, එම ලකුණේ ස්වාභාවය හෝ වැදගත්කම සම්බන්ධයෙන් මහජනයා නොමග යැවීමට ඉඩ ඇති බවට පත්කර නිබීම ;

(ඇ) ලකුණෙහි අයිතිකරු, එම ලකුණ ගාවිතය පාලනය වන කොන්දේසි පිළිපැදීමට හෝ පිළිපැදීමට සැලැස්වීම පැහැර හැර නිබීම ;

(ඈ) ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද එම භාණ්ඩ හෝ සේවා පිළිබඳව සහතික කිරීමට එහි අයිතිකරුට තවදුරටත් ශක්නුතාවක් නොතිබීම ;

(ඉ) එම කොන්දේසි –

(i) (5) වන උපවගන්තියේ විධිවිධානවලට සහ නියෝග මගින් පනවන ලද වෙනත් යම් කොන්දේසිවලට තවදුරටත් අනුකූල නොවන පරිදි ;

(ii) මහජන ප්‍රතිපත්තිවලට හෝ පිළිගත් සදාචාරත්වය පිළිබඳ ප්‍රතිපත්තිවලට පටහැනි වන පරිදි,

සංශෝධනයක් කර තිබීම.

(9) 134 වන වගන්තියේ විධිවිධානවලට සලසා තිබෙන ශූන්‍යතාව ඇති කරන හේතුවලට අමතරව, සහතික ලකුණක් (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට පටහැනිව ලියාපදිංචි කර ඇත්නම්, එම ලියාපදිංචිය ශූන්‍ය හා බලරහිත බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(10) (අ) සහතික ලකුණක් ලියාපදිංචි කිරීම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ලේඛනයෙහි කොටසක කළ යුතු අතර, ඒ ලකුණ පාවිච්චි කිරීම කෙරෙහි බලපවත්වන කොන්දේසිවල පිටපතක් එම ලියාපදිංචියට යා කළ යුතු ය.

(ආ) සහතික ලකුණක් සඳහා ඉල්ලුම්පත්‍රයක් පළ කිරීම 111 වන වගන්තියේ (9) වන උපවගන්තියට අනුකූලව විය යුතු ය. එයට ලියාපදිංචි කිරීමේ දී යා කිරීමට ඇති කොන්දේසිවල සාරාංශයක් ද ඇතුළත් විය යුතු ය.

(ඇ) (4) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ සහතික ලකුණක්, ලියාපදිංචි ලකුණක් ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(ඇ) මහජන පරීක්ෂාව සඳහා ලේඛනය විවෘත විය යුතු ආකාරයෙන්ම, සහතික ලකුණක් පාවිච්චි කිරීම කෙරෙහි බලපවත්වන කොන්දේසි ද මහජන පරීක්ෂාව සඳහා විවෘතව තැබිය යුතු ය.

11. (අ) සහතික ලකුණක් පාවිච්චි කිරීම කෙරෙහි බලපවත්වන කොන්දේසිවලට කරන ලද කවර හෝ වෙනස්කිරීම් හෝ සංශෝධන, සහතික ලකුණෙහි අයිතිකරු විසින් අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත නියමිත ආකාරයෙන් දැනුම් දිය යුතු ය ;

(ආ) එවැනි වෙනස්කිරීම් සහ සංශෝධන පිළිබඳව කෙරෙන යම් දැනුම්දීමක්, නියමිත ගාස්තුව ගෙවූ විට ලේඛනයෙහි සටහන් කරනු ලැබිය යුතු ය. කොන්දේසිවල යම් වෙනස් කිරීමක් හෝ සංශෝධනයක් එසේ සටහන් කර ඇත්නම් පමණක් බලාත්මක විය යුතු ය ;

(ඇ) ලේඛනයෙහි එසේ සටහන් කරන ලද වෙනස්කිරීම් හෝ සංශෝධනවල සාරාංශයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

VI වන කොටස

XXX වන පරිච්ඡේදය

ව්‍යාපාර නාම

තහනම් ව්‍යාපාර නාම.

143. යම් නාමයක හෝ නිල නාමයක ස්වභාවය හේතුකොට ගෙන හෝ එයින් ගත හැකි ප්‍රයෝජන හේතුකොට ගෙන, එය සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි නම් හෝ එයින් යම් ජන කොට්ඨාසයක ආගමික හෝ වාර්ගික හැඟීම් පැරවීමට ඉඩ තිබේ නම් හෝ ඒ නාමයෙන් හැඳින්වෙන ව්‍යවසායේ ස්වභාවය පිළිබඳව වෙළෙඳ අංශ හෝ මහජනයා නොමඟ යාමට ඉන් ඉඩ තිබේ නම් ඒ නාමය හෝ නිල නාමය ව්‍යාපාර නාමයක් ලෙස ආවේශ්‍ය කළ නොහැකි විය යුතු ය.

ව්‍යාපාර නාම ආරක්ෂා කිරීම.

144. (1) ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලස්වන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන්වී තිබුණ ද, ඒ නාමය ලියාපදිංචි කිරීමට පෙර වුව ද නැතහොත් ලියාපදිංචි කර නොතිබුණ ද, තෘතීය පාර්ශ්වකරුවන් විසින් කරනු ලබන යම් නීති විරෝධී ක්‍රියාවලින් ඒ නාමය ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(2) තෘතීය පාර්ශ්වකරුවකු විසින් ව්‍යාපාර නාමයක්, වෙළෙඳ ලකුණක්, සේවා ලකුණක් සාමූහික ලකුණක් හෝ සහතික ලකුණක් ලෙස ව්‍යාපාර නාමයක් තදනන්තරව පාවිච්චි කරනු ලැබීම හෝ මහජනයා නොමග යාමට ඉඩ ඇති ආකාරයකින් එවැනි සමාන ව්‍යාපාර නාමයක්, වෙළෙඳ ලකුණක්, සේවා ලකුණක්, සාමූහික ලකුණක් හෝ සහතික ලකුණක් පාවිච්චි කරනු ලැබීම නීති විරෝධී ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 122 වන වගන්තිය ව්‍යාපාර නාමවලට අදාළ විය යුතු ය.

ව්‍යාපාර නාම පාවාදීම සහ අන්සතු කිරීම.

145. (1) ව්‍යාපාර නාමයකින් හැඳින්වෙන ව්‍යවසාය හෝ ඒ ව්‍යවසායේ කොටසක් පාවාදීම හෝ අන්සතු කිරීම සමග ඒ ව්‍යාපාර නාමය පාවාදීම හෝ අන්සතු කිරීම ද කරනු ලැබිය නැති ය.

(2) 123 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ව්‍යාපාර නාමයන්ට අදාළ විය යුතු ය.

VII වන කොටස

XXXI වන පරිච්ඡේදය

සංයුක්ත පරිපථයක් සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ

ආරක්ෂාව පිණිස වූ අයිතිය.

146. (1) පිරිසැලසුම් නිර්මාණ අරක්ෂා කිරීමට ඇති අයිතිය පිරිසැලසුම් නිර්මාණයේ නිර්මාණකරුට හිමිවිය යුතු ය. පිරිසැලසුම් නිර්මාණයක් පුද්ගලයන් කිහිපදෙනෙක් එක්ව නිර්මාණය කරනු ලැබ ඇති අවස්ථාවක, එකී නිර්මාණය ආරක්ෂා කිරීමට ඇති අයිතිය සම්බන්ධයෙන් ඒ තැනැත්තන් සම අයිතිකරුවන් විය යුතු ය.

(2) සේවා ගිවිසුමක් ඉටු කිරීමේ දී හෝ යම් කාර්යයක් කිරීමේ දී සාදනු ලැබූ හෝ නිර්මාණය කරනු ලැබූ පිරිසැලසුම් නිර්මාණයක් ආරක්ෂා කිරීමට ඇති අයිතිය, ඒ සේවා ගිවිසුමේ හෝ ඒ කාර්යය කිරීම සඳහා වූ ගිවිසුමේ නියමයන්වල අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇත්නම් මිස, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවායෝජකයාට හෝ ඒ කාර්ය ඉටුකිරීමට භාරදුන් තැනැත්තාට හිමිවිය යුතු ය.

මූල් බව.

147. (1) මූල් නිර්මාණයක් වූ ඕනෑම පිරිසැලසුම් නිර්මාණයකට මේ පනත යටතේ සපයනු ලබන ආරක්ෂාව අදාළ වන්නේ ය. මේ වගන්තියේ කාර්යය සඳහා යම් පිරිසැලසුම් නිර්මාණයක් –

(අ) වෙනත් පිරිසැලසුම් නිර්මාණයක හෝ එහි සැලකිය යුතු යම් කොටසක හුදු ප්‍රතිනිෂ්පාදනයක් ලෙසින් නිෂ්පාදනය කරනු ලැබ නොමැත්තේ නම් ; සහ

(ආ) නිර්මාණකරුවකුගේ බුද්ධිමය වෑයමක ප්‍රතිඵලයක් වන අතර ඒ පිරිසැලසුම් නිර්මාණය කරන අවස්ථාවේ දී, එය, පිරිසැලසුම් නිර්මාණකරුවන් හා සංයුක්ත පරිපථ නිෂ්පාදකයන් අතර ප්‍රචලිත නොවන්නේ නම්,

එකී පිරිසැලසුම් නිර්මාණය මූල් නිර්මාණයක් වන්නේ ය.

(2) යම් පිරිසැලසුම් නිර්මාණයක්, පිරිසැලසුම් නිර්මාණකරුවන් හෝ සංයුක්ත පරිපථ නිෂ්පාදනයන් අතර ප්‍රචලිත අංගයන් සහ අන්තර් සම්බන්ධතාවල සංයෝගයක් වන අවස්ථාවක, එවැනි පිරිසැලසුම් නිර්මාණයක් ආරක්ෂා කරනු ලැබිය යුත්තේ එකී සංයෝගය සම්පූර්ණයෙන් ගත් කල (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි සමග එකහවන්නේ නම් පමණි.

ආරක්ෂාවේ විෂයපථය පෘථුලභාවය.

148. (1) මේ කොටස යටතේ පිරිසැලසුම් නිර්මාණයකට සපයනු ලබන ආරක්ෂාව, ඒ පිරිසැලසුම් නිර්මාණය යම් භාණ්ඩයක කොටසක් ලෙස ඇතුළත් කිරීමේ ලා හේතුකාරක වූ සංයුක්ත පරිපථය මත රඳා නොපැවතිය යුත්තේ ය. (2) වන

උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පිරිසැලසුම් නිර්මාණයක අයිතිය දරන්නාට පහත දැක්වෙන ක්‍රියාකාරකම් කිරීමට නැතහොත් වෙනත් තැනැත්තකුට එසේ කිරීමට බලය පැවරීමට පරම අයිතිවාසිකම තිබිය යුත්තේ ය :—

(i) 147 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් කරනු ලැබ ඇති මුල් භාවයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ යම් කොටසක් ප්‍රති නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවක් හැර, ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණයක් සංයුක්ත පරිපථයකට ඇතුළත් කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් පූර්ණ ලෙස හෝ එහි කොටසක් වශයෙන් ප්‍රතිනිෂ්පාදනය කිරීම ;

(ii) ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණයක් හෝ ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණය අන්තර්ගත කළ සංයුක්ත පරිපථයක් හෝ යම් සංයුක්ත පරිපථයක නීතිවිරෝධී ලෙස ප්‍රතිනිෂ්පාදනය කරනු ලැබූ පිරිසැලසුම් නිර්මාණයක් අඩංගු නොවන්නේ ද ඒ තාක් දුරට එවැනි සංයුක්ත පරිපථයක් අන්තර්ගත කළ භාණ්ඩයක් ආනයනය කිරීම, විකිණීම සඳහා අර්පණය කිරීම, විකිණීම හෝ වාණිජ පරමාර්ථ සඳහා අන්‍යාකාරයකින් බෙදාහැරීම.

(2) පිරිසැලසුම් නිර්මාණයක් සඳහා මේ කොටස යටතේ සලසා ඇති ආරක්ෂාවේ ප්‍රමාණය පහත සඳහන් දේ දක්වා ව්‍යාප්ත නොවිය යුත්තේ ය,

එනම් –

(i) හුදු ඇගයීමේ කාර්යයක, විශ්ලේෂණ කාර්යයක, පර්යේෂණ කාර්යයක හෝ ලාභ ඉපැයීමක් නොවන්නා වූ ඉගැන්වීමේ හෝ අධ්‍යාපන කාර්යයක් සඳහා ම පමණක් ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණ ප්‍රතිනිෂ්පාදනය කිරීම ;

(ii) (i) වන ඡේදයේ දක්වා ඇති එකී විශ්ලේෂණ, ඇගයීම් හෝ පර්යේෂණ පාදක කොට ගෙන නිර්මාණය කරනු ලැබූ පිරිසැලසුම් නිර්මාණයක්, 147 වන

වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල අර්ථානුකූලව ඒ නයින්ම මුල් නිර්මාණයක් වන අවස්ථාවක හෝ ඒ පිරිසැලසුම් නිර්මාණය සම්බන්ධයෙන් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා හෝ පිරිසැලසුම් නිර්මාණයක් සංයුක්ත පරිපථයක ඇතුළත් කිරීම ;

(iii) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ දක්වා ඇති යම් කාර්යයක්, ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණයක් සම්බන්ධයෙන් කිරීම හෝ එවැනි පිරිසැලසුම් නිර්මාණයක්, එහි අයිතිවාසිකම දරන්නා විසින් හෝ ඔහුගේ අනුමැතිය ඇතිව වෙළෙඳපොලකට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක එකී පිරිසැලසුම් නිර්මාණය ඇතුළත්ව ඇති යම් සංයුක්ත පරිපථයක් සම්බන්ධයෙන් කිරීම ; හෝ

(iv) (1) වන උපවගන්තියේ (ii) වන ඡේදයෙහි සඳහන් කරනු ලැබූ යම් කාර්යයක් නීත්‍යානුකූල නොවන අයුරින් ප්‍රතිනිෂ්පාදිත පිරිසැලසුම් නිර්මාණයක් ඇතුළත් සංයුක්ත පරිපථයක් සම්බන්ධයෙන් හෝ, ඒ සංයුක්ත පරිපථයට ඇතුළත් කරන ලද යම් කොටසක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ඒ කාර්ය පිළිබඳ දැනුවත් කමක් නොමැතිව එය ඉටු කරන හෝ නියම කරන අවස්ථාවක දී හා සංයුත්ත පරිපථයක් ලබාගැනීමේ දී හෝ ඒ සංයුක්ත පරිපථයට කොටසක් ඇතුළත් කිරීමේ දී එය නීත්‍යානුකූල නොවන ප්‍රතිනිෂ්පාදිත පිරිසැලසුමක ඇතුළත් කරනු ලැබ ඇති බව දැනගැනීමට සාධාරණ පදනමක් නොමැතිවිට,

මේ කොටසින් සපයනු ලැබූ ආරක්ෂාව ව්‍යාප්ත නොකළ යුතු ය :

එසේ වුවද, මේ ඡේදය යටතේ යම් ක්‍රියාවක් ඉටු කරන හෝ කිරීම සඳහා නියම කරන තැනැත්තකුට පිරිසැලසුම් නිර්මාණය නීත්‍යානුකූල නොවන ප්‍රතිනිෂ්පාදනයක් ලෙස දක්වනු ලැබ ඇති අවස්ථාවක ඒ තැනැත්තා විසින්, දැනට ලහ තිබෙන හෝ ඔහුට

එසේ දන්වනු ලැබීමට පෙර ඇණවුම්කළ ප්‍රමාණය සම්බන්ධයෙන් පමණක්, යම් ක්‍රියාවක් ඉටු කිරීම හෝ නියම කිරීම කළහැකි අතර, ඒ පිරිසැලසුම් නිර්මාණය සම්බන්ධයෙන් බැඳීම්වලින් තොර වූ බලපත්‍රයක් යටතේ ගෙවනු ලැබිය හැකි සාධාරණ රාජ්‍යභාගයකට සමාන මුදල් ප්‍රමාණයක් අයිතිය දරන්නාට ගෙවීමට යටත් විය යුතු ය ;

(v) මේ පනත ආරම්භවීමට පෙරාතුව අවුරුදු දෙකකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර වාණිජමය ලෙස ප්‍රයෝජනයට ගැනීමකට වූ යම් පිරිසැලසුම් නිර්මාණයකට මේ කොටස යටතේ ආරක්ෂාව නොලැබිය යුත්තේ ය.

ආරක්ෂාවේ ආරම්භය සහ කාලය

149. (1) මේ පනත යටතේ පිරිසැලසුම් නිර්මාණයක ආරක්ෂාව –

(i) 150 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත අයිතිය දරන්නා විසින් ආරක්ෂාව පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති විටක, අයිතිය දරන්නා විසින් හෝ ඔහුගේ කැමැත්ත ඇතිව ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර පිරිසැලසුම් නිර්මාණයේ ප්‍රථම වාණිජ උකහා ගැනීම කළ දින ; හෝ

(ii) ඉහත කී පිරිසැලසුම් නිර්මාණය ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර වාණිජ උකහා ගැනීමකට භාජන වී නොමැති විටක, එහි පිරිසැලසුම් නිර්මාණය ලියාපදිංචි කිරීම සඳහා එහි අයිතිය දරන්නා විසින් ඉදිරිපත් කොට ඇති ඉල්ලීම ගොනු කිරීම සඳහා ලබා දී ඇති දින,

ආරම්භ විය යුත්තේ ය.

(2) මේ කොටස යටතේ පිරිසැලසුම් නිර්මාණයකට සැලසෙන ආරක්ෂාව, ඒ ආරක්ෂාව ආරම්භ වන දිනයේ සිට දහවන ලිත් වර්ෂය අවසානයේ දී අවසන් වන්නේ ය.

ඉල්ලීම පිළිබඳ නියමයන්.

150. (1) පිරිසැලසුම් නිර්මාණයක් ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම්පත නියමිත ආකෘති පත්‍රයකින් විය යුතු අතර, නියමිත ගාස්තුව සමග කාර්යාලයෙහි ගොනු කළ යුතු ය. එකිනෙකට වෙනස් වූ පිරිසැලසුම් නිර්මාණ සම්බන්ධයෙන් වෙන් වශයෙන් ඉල්ලීම් ගොනු කරනු ලැබිය යුතු ය.

(2) යම් පිරිසැලසුම් නිර්මාණයක් වාණිජමය උකහා ගැනීමකට භාජන කරනු ලැබ නොමැත්තේ නම්, ඒ පිරිසැලසුම් නිර්මාණය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යම් තැනැත්තකුට හැකියාව තිබෙන අතර, ඒ පිරිසැලසුම් නිර්මාණය ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැර වාණිජ උකහා ගැනීමකට භාජනය කරනු ලැබ ඇත්නම්, ඒ උකහා ගැනීම සිදු වූ දින සිට අවුරුදු දෙකක කාලයක් ඉකුත් වීමට පෙරාතුව එය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ඉල්ලුම් පත්‍රයෙහි –

(අ) පිරිසැලසුම් නිර්මාණය, පිරිසැලසුම් නිර්මාණ ලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් හා ඒ පිළිබඳව සංක්ෂිප්ත සහ ලුහුඬු විස්තරයක් අඩංගු විය යුතු ය ;

(ආ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය, ජාතිය සහ ඔහු ශ්‍රී ලංකාවෙන් බැහැර පදිංචිව සිටී නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් ලැබීම සඳහා භාවිත කරන තැපැල් ලිපිනය ද සඳහන් කළ යුතු ය ;

(ඇ) සංයුක්ත පරිපථයකින් ඉටුකිරීමට බලාපොරොත්තු වන විද්‍යුත් කාර්යය විස්තර කරන තොරතුරු සමග පිරිසැලසුම් නිර්මාණයේ රූප සටහනේ පිටපතක් ඇතුළත් කළ යුතු ය. එසේ වුව ද ඒ ඉදිරිපත් කරනු ලබන පිරිසැලසුම් නිර්මාණයේ කොටස් පිරිසැලසුම් නිර්මාණය හඳුනාගැනීමට ප්‍රමාණවත් යයි හැඟී යන්නේ නම් ඒ සංයුක්ත පරිපථයේ ආකාරයට හෝ නිෂ්පාදනයට අදාළ පිටපතේ හෝ රූප සටහනේ යම් කොටස් ඉල්ලුම් පත්‍රයෙන් අත්හැර දැමිය හැකි ය ;

(ඈ) පිරිසැලසුම් නිර්මාණය වාණිජ උකහා ගැනීමකට භාජන වූයේ ද නැද්ද යන්න සහ එසේ වී නම් එහි ප්‍රථම වාණිජ උකහා ගැනීම සිදු කළ දිනය ද සඳහන් කළ යුතු ය ;

(ඉ) 146 වන වගන්තිය යටතේ වූ ආරක්ෂාව සැලසීම පිළිබඳ අයිතිය තහවුරු කිරීමේ තොරතුරු සැපයිය යුතු ය ;

(ඊ) පිරිසැලසුම් නිර්මාණයේ මුල් භාවය පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය ;

(උ) අනුයෝජිතයකු මාර්ගයෙන් ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී ඉල්ලුම්කරු විසින් අනුයෝජිතයා වෙත බලය පවරනු ලැබූ ඇටෝර්නි බලපත්‍රයක් ඇතුළත් කළ යුතු ය.

(4) (අ) මේ වගන්තියේ (3) වන උපවගන්තියෙහි දක්වා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බව ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු අතර, ඒ දැනුම් දීමේ දින සිට මාස දෙකක කාලයක් ඇතුළත ඉල්ලීමේ දෝෂී භාවය නිවැරදි කරන ලෙස ඔහුට නියම කළ යුතු ය ;

(ආ) ඉල්ලුම්කරු මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් කරනු ලැබූ නියමයන්ට අනුකූලව ක්‍රියාකරන අවස්ථාවක දී, ඒ ඉල්ලීම ගොනු කිරීමේ දිනය ඒ ඉල්ලීම ලැබුණු දිනය ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, එවැනි ඉල්ලුම් පත්‍රයක පිරිසැලසුම් නිර්මාණය ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ ලිඛිත විස්තරයක් සහ ඉල්ලුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි ආකාරයේ තොරතුරු ද අඩංගු විය යුතු අතර පිරිසැලසුම් නිර්මාණයේ රූප සටහන්වල පිටපතක් ද ඒ සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ඇ) මුල් ඉල්ලුම් පත්‍රය සමග පිරිසැලසුම් නිර්මාණයේ රූප සටහන් ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වුවද, (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ කාලය තුළ පිරිසැලසුම් නිර්මාණය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම නිවැරදි කරන අවස්ථාවක දී, ඒ නිවැරදි කිරීම් ලැබුන දිනය, ඉල්ලුම් පත්‍රය ගොනු කරනු ලැබූ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමේ දිනය ලිඛිත සංදේශනයක් මගින් තහවුරු කළ යුතු ය ;

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙනු ලැබීමෙන් පසුවත්, (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ කාලය ඇතුළත ඉල්ලීම නිවැරදි කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක දී, ඒ ඉල්ලුම්පත ගොනු කරනු ලැබ නොමැති ලෙස සලකනු ලැබිය යුතු ය.

පිරිසැලසුම් නිර්මාණයක් ලේඛනයෙහි ලියාපදිංචි කිරීම.

151. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිරිසැලසුම් නිර්මාණ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත් භාරගනු ලැබ ඇත්තේ යම් ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණ සම්බන්ධයෙන් ද මේ එක් එක් ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණ එකී ලේඛනයෙහි ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීමට සැලස්වීම කළ යුතු ය.

(2) යම් ඉල්ලුම් පත්‍රයක් 150 වන වගන්තියේ නියමයන්ට අනුකූල වන අවස්ථාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පිරිසැලසුම් නිර්මාණයේ මුල් බව, එකී නිර්මාණයේ ආරක්ෂාව සඳහා ඉල්ලුම්කරුට ඇති අයිතිය, හෝ ඉල්ලීමේ සඳහන් කරුණුවල නිරවද්‍යතාවය පිළිබඳව පරීක්ෂණයක් නොපවත්වා පිරිසැලසුම් නිර්මාණයක් පිරිසැලසුම් නිර්මාණ ලේඛනයේ ලියාපදිංචි කළ යුතු ය.

(3) පිරිසැලසුම් නිර්මාණ ලේඛනයක, පිරිසැලසුම් නිර්මාණයේ අංකය, නාමය, ගොනු කරනු ලැබූ දිනය සහ 150 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයේ සඳහන් කොට ඇති අවස්ථාවක දී පිරිසැලසුම් නිර්මාණය ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර වාණිජමය ලෙස ප්‍රථමවරට ප්‍රයෝජනයට ගැනීමකට

භාජනය කරනු ලැබූ දිනය මෙන්ම අයිතිය දරන්නාගේ නම සහ ලිපිනය ද, පාවා දීමකට, පැවරීමකට, බලපත්‍ර, ගිවිසුමකට අදාළ නොරතුරු සහ අනෙකුත් නියමිත නොරතුරු ද ඇතුළත් කළ යුතු ය.

(4) යම් නැනැත්තකුහට පිරිසැලසුම් නිර්මාණ ලේඛනයක් පිරික්සිය හැකි අතර නියමිත ගාස්තු ගෙවීමකට යටත්ව එයින් පිටපත් ලබා ගත හැකි ය.

(5) පිරිසැලසුම් නිර්මාණයක් පිළිබඳ වූ සෑම ලියාපදිංචි කිරීමක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

පවරා ගැනීමේ සහ ලේඛනය නිවැරදි කරවා ගැනීමේ අයිතිය.

152. (1) යම් පිරිසැලසුම් නිර්මාණයක අත්‍යවශ්‍ය අංග වෙනත් නැනැත්තකුගේ පිරිසැලසුම් නිර්මාණයකින්, ඒ වෙනත් නැනැත්තාගේ ලිඛිත කැමැත්ත නොමැතිව ලබාගෙන ඇති අවස්ථාවක පිරිසැලසුම් නිර්මාණයේ ලියාපදිංචිය පිළිබඳ ඉල්ලීම තම නමට හරවා දෙන ලෙස ඉල්ලා එම ඉල්ලීම ඔප්පු කිරීමට අවශ්‍ය අදාළ සියලු කාරණා ද සමඟ සහ නියමිත ගාස්තුව ද සමග ලියවිල්ලක් මඟින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටීමට ඒ දෙවනුව සඳහන් කරනු ලැබූ නැනැත්තාට හැකියාව ඇත්තේ ය. දැනටමත් ඉල්ලීම ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්, දෙවනුව සඳහන් කරනු ලබූ නැනැත්තා විසින් ඒ ලියාපදිංචි කිරීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට අවුරුද්දක් ඇතුළත, තමාගේ හිමිකම කියාපෑම ඔප්පු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය සියලු කරුණු ඇතුළත් කොට නියමිත ගාස්තුව ද සමඟින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් ඒ ලියාපදිංචි කිරීම තමා නමට පවරා දෙන මෙන් සහ ඒ අනුව ලේඛනයේ ඇතුළත් සටහන නිවැරදි කරන මෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) එවැනි ඉල්ලීමක් ලැබුණු විගස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එහි පිටපතක් සහිතව අවස්ථාවෝචිත පරිදි පිරිසැලසුම් නිර්මාණය ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම් කරනු ලැබූ ඉල්ලුම්කරුට හෝ අයිතිය දරන්නාට දැන්වීමක් යැවිය යුතු අතර ප්‍රශ්නයට භාජනව ඇති පිරිසැලසුම් නිර්මාණයට තමාට ඇති හිමිකම ඔප්පු කිරීම සඳහා තම සන්තකයේ යම් කරුණු ඇත්නම් එකී කරුණු ද නියමිත ගාස්තුව ද සමඟ ඉහත කී දැන්වීමෙහි දින සිට මාස දෙකක කාලයක් ඇතුළත තමා වෙත හරස්

ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම දැන්වීම මගින් ඉල්ලා සිටිය යුතු ය. ඉල්ලුම්කරු හෝ ලියාපදිංචි අයිතිය දරන්නා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හරස් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියම කර ඇති පරිදි යම් තොරතුරක්, එහි (2) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ කාලය තුළ දී සැපයීමට ඉල්ලුම්කරු හෝ ලියාපදිංචි අයිතිය දරන්නා අසමත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙවනුව සඳහන් කරනු ලැබූ තැනැත්තාගේ ඉල්ලීමට ඉඩ දිය යුතු අතර ලේඛනයේ සටහන ඒ අනුව නිවැරදි කළ යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන යලසා ඇති පරිදි ඉල්ලුම්කරු හෝ අයිතිය දරන්නා විසින් හරස් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පාර්ශ්වයන් දෙකටම සවන් දීමෙන් පසු සහ ඒ කාරණාවේ වැදගත් කරුණු සැලකිල්ලට ගෙන තම තීරණයට එළඹිය යුතු අතර, ස්වකීය තීරණය පාර්ශ්වයන්ට දැනුම් දිය යුතු ය.

(5) ඉල්ලීමක් ගොනු කිරීමෙන් පසු, ආරක්ෂාව පිළිබඳ අයිතිය හිමි තැනැත්තා විසින් ඒ ඉල්ලීම ගොනු කිරීම සම්බන්ධයෙන් තම කැමැත්ත දී ඇති අවස්ථාවක, යියලු කාරණා සම්බන්ධයෙන් ඒ කැමැත්ත ඒ ඉල්ලීම ගොනු කිරීමේ දිනයේ සිට බලපැවැත්විය යුතු යයි සලකනු ලැබිය යුතු ය.

පිළිකුම් සහ ගිවිසුම් බලපත්‍ර වෙනස් කිරීම්.

153. (1) ආරක්ෂිත පිරිසැලසුම් නිර්මාණයක්, පාවා දීම හෝ අන්සතු කරනු ලැබිය හැකි අතර, ඒ පාවා දීම හෝ අන්සතු කිරීම ගිවිසුමේ පාර්ශ්වයන් විසින් හෝ පාර්ශ්වයන් වෙනුවෙන් අත්සන් කරනු ලැබූ ලියවිල්ලකින් විය යුතු ය.

(2) පිරිසැලසුම් නිර්මාණයක පාවාදෙන්නා හෝ අන්සතුකරන්නා වෙනුවෙන් ලියා අත්සන් කරනු ලැබූ ලිඛිත ඉල්ලීමක් මත, සහ නියමිත ගාස්තු ගෙවීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ හිමිකම වෙනස් කිරීම පිළිබඳ තොරතුරු, ලේඛනයේ සටහන් කළ යුතු අතර ඒ වෙනස් කිරීම ප්‍රසිද්ධ කළ යුතු ය. ඒ වෙනස් කිරීම් එසේ සටහන් කරන තෙක් තුන්වන පාර්ශ්වයකට එරෙහිව බල නොපැවැත්විය යුතු ය.

(3) පිරිසැලසුම් නිර්මාණයක අයිතිය දරන්නා විසින් 148 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් ක්‍රියාවක් හෝ ඒ සියලු ක්‍රියා සිදුවීම සඳහා වෙනත් තැනැත්තකුට හෝ ව්‍යවසායකට බලය පවරමින් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය. ඒ ගිවිසුම් බලපත්‍රය ලිඛිත විය යුතු අතර, ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරනු ලැබිය යුතු ය. පිරිසැලසුම් නිර්මාණය ලියාපදිංචි කිරීමෙන් පසු ඒ ගිවිසුම් බලපත්‍රය නියමිත ගාස්තු සමඟ, එකී ගිවිසුම් බලපත්‍රයේ පැවැත්ම ලේඛනයේ ඇතුළත් කළයුතු හෝ ඇතුළත් කිරීමට සැලැස්විය යුතු ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය. ගිවිසුම් බලපත්‍රයක් එසේ ලේඛනයෙහි ඇතුළත් කරනු ලබන තෙක් තුන්වන පාර්ශ්වයකට එරෙහිව බල නොපැවැත්විය යුතු ය.

පිරිසැලසුම් නිර්මාණයක ලියාපදිංචිය අවලංගු කිරීම.

154. (1) 151 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ පිරිසැලසුම් නිර්මාණයක් සම්බන්ධයෙන්, සම්බන්ධයක් දක්වන යම් තැනැත්තකු හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු අදළ බලධරයකු හට පහත සඳහන් සාධක මත ඒ ලියාපදිංචි කිරීම අවලංගු කර ගැනීම සඳහා අධිකරණයේ ඉල්ලීමක් ගොනු කළ හැකි වන්නේ ය :—

(අ) ඒ පිරිසැලසුම් නිර්මාණය 147 වන වගන්තිය යටතේ ආරක්ෂිත එකක් නොවීම ;

(ආ) අයිතිය දරන්නාට 146 වන වගන්තිය යටතේ ආරක්ෂාව නිමි නොවීම ;

(ඇ) පිරිසැලසුම් නිර්මාණයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ගොනු කිරීමට පෙර ඒ පිරිසැලසුම් නිර්මාණය ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර වාණිජමය ලෙස ප්‍රයෝජනයට ගැනීමකට භාජනව තිබීම සහ 148 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි හා 150 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි දක්වා ඇති වලංගු කාලය තුළ ඉල්ලුම් පත්‍රය ගොනුකර නොතිබීම.

(2) පිරිසැලසුම් නිර්මාණයක කොටසක් අවලංගු කරවා ගැනීම සඳහා වූ සාධක සාක්ෂාත් කරගත් විටක, පිරිසැලසුම් නිර්මාණයේ ඒ අනුරූප කොටසට අදාළ ලියාපදිංචිය පමණක් අවලංගු කරනු ලැබිය යුතු ය.

(3) සම්බන්ධයක් දක්වන පාර්ශ්වයක් විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු යම් බලධරයකු විසින්, පිරිසැලසුම් නිර්මාණයක ලියාපදිංචි හිමිකරු සහ ලේඛනගත සියලුම පාවාදීම්ලාභීන්, බලපත්‍රලාභීන්, හෝ අනු බලපත්‍රලාභීන් ද පාර්ශ්වකරුවන් කොට අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලුම් පත්‍රයක් මත, එවැනි ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම හෝ එහි කොටසක් අවලංගු කිරීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කළ හැක.

(4) පිරිසැලසුම් නිර්මාණයක හෝ එහි කොටසක ලියාපදිංචියේ යම් අවලංගු කිරීමක් අවස්ථාවෝචිත පරිදි පිරිසැලසුම් නිර්මාණයේ හෝ එහි කොටසේ ලියාපදිංචිය ශූන්‍ය හා බලරහිත වන අයුරින් බලාත්මක විය යුතු අතර, ඒ පිරිසැලසුම් නිර්මාණයේ ආරක්ෂාව ආරම්භවන දින සිට එලෙස බලාත්මක විය යුතු ය.

(5) අධිකරණය විසින් එහි තීරණය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ තීරණය ලේඛනගත කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කළ යුතු ය.

අනුයෝජිතයකු මඟින් නියෝජනය කිරීම.

155. ඉල්ලුම්කරුවකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති අවස්ථාවක දී, පනතේ 175 වන වගන්තිය යටතේ ලියාපදිංචි අනුයෝජිතයකු මඟින් ඉල්ලුම්කරු නියෝජනය කරනු ලැබිය යුතු ය.

උල්ලංඝනය කිරීම.

156. (1) 148 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් කරනු ලබන යම් ක්‍රියාවකින් උල්ලංඝනය සමන්විත වන්නේ ය.

(2) (අ) මේ පනතේ 148 වන වගන්තිය යටතේ පිරිසැලසුම් නිර්මාණයක් සඳහා සලසනු ලබන ආරක්ෂාවේ අයිතිය උල්ලංඝනය කරමින් පිරිසැලසුම් නිර්මාණයක් කර ඇති බවට හේතු ඇතිව යම් අයිතිය දරන්නකු විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම් උල්ලංඝනයක් හෝ ආසන්න උල්ලංඝනයක් වැළැක්වීම සඳහා එම අයිතිය දරන්නාට ; හෝ

(ආ) එකී උල්ලංඝනය පිළිබඳව බලපත්‍රලාභියා විසින් දැනුවත් කොට තිබිය දී, අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අයිතිය දරන්නා අපොහොසත්වන හෝ නොසැලකිළිමත්වන අවස්ථාවක බලපත්‍රලාභියා විසින් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, බලපත්‍රලාභියාට,

අධිකරණය විසින් ඉන්ජංෂන් තහනමක් ප්‍රදානය කිරීම, අලාභ ප්‍රදානය කිරීම හෝ සුදුසු අන් ප්‍රතිකර්මයක් ප්‍රදානය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් සහ අයිතිය දරන්නාට හෝ බලපත්‍රලාභියාට ලබා ගත හැකි ප්‍රතිකර්ම සම්බන්ධව, මෙම පනතේ XXXV වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) පිරිසැලසුම් නිර්මාණයන් ලියාපදිංචි කිරීම පිණිස වූ ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගොනු කරනු ලැබීමෙන් පසුව පමණක් (2) වන උපවගන්තිය යටතේ වූ යම් ක්‍රියාවක් ආරම්භ කරනු ලැබිය හැකි ය.

වැරදි.

157. දැනුවත්ව හෝ චේතනාන්විතව 148 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ හයමසකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එහි දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. සිදු කරනු ලැබූ වරද සම්බන්ධයෙන් හෝ දෙවනවරට තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඉහත කී අවස්ථාවක දී, එම දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම, දෙගුණයක් කරනු ලැබිය හැකි ය. වරද සිදු කිරීම සඳහා නැතහොත් වරද සිදුකිරීමේ දී භාවිත කරනු ලැබ ඇති පිරිසැලසුම් නිර්මාණ, සංයුක්ත පරිපථ, උපාංග හෝ යම් ද්‍රව්‍යයක් හෝ උපකරණයක් තහනමට ගැනීම, රාජසන්නක කිරීම සහ විනාශ කිරීම සඳහා අධිකරණය විසින් අතිරේක ආඥාවක් කරනු ලැබිය හැකි ය.

158. රේගු ආඥාපනතේ 125අ සහ 125ආ, මෙම පනතේ 163 සිට 174 වන, 177 වන, 180 වන, 187 වන, 191 වන, 195 සිට 204 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සංයුක්ත පරිපථ පිරිසැලසුම් නිර්මාණවලට හා සංයුක්ත පරිපථ පිරිසැලසුම් නිර්මාණ සම්බන්ධයෙන් අදාළ කරගත යුතු ය. සංයුක්ත පරිපථ පිරිසැලසුම් නිර්මාණ සඳහා පනත අදාළ කර ගැනීම.

159. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ කොටසෙහි– අර්ථ නිරූපණය.

"සංයුක්ත පරිපථ" යන්නෙන්, යටත් පිරිසෙයින් ක්‍රියාකාරී එක් මූලිකාංගයක් හෝ ඇති නිෂ්පාදිතයේ මූලිකාංග සහ අන්තර් සම්බන්ධතා සමහරක් හෝ සියල්ල ද්‍රව්‍ය කොටසක් තුළ හෝ ඒ මත බන්ධනය කිරීමට නොහැකි අයුරින් සකස් කිරීමට යෙදුනා වූ සහ විද්‍යුත් කර්තව්‍යයක් ඉටු කිරීම පිණිස අදහස් කරනු ලැබුවා වූ යම් නිමි ස්වරූපයේ හෝ අන්තර් ස්වරූපයේ නිෂ්පාදනයක් අදහස් වේ ;

"පිරිසැලසුම් නිර්මාණය" යන්න, භූමි හෝ ප්‍රදේශ විස්තරය යන්න සමග සාමාන්‍යාර්ථ වන අතර, එම පදයෙන් යටත් පිරිසෙයින් එක් මූලිකාංගයක් ක්‍රියාකාරී මූලිකාංගයක් වූ මූලිකාංගයන්ගෙන් සහ සංයුක්ත පරිපථයක හෝ සියලු අන්තර් සම්බන්ධතාවල කවර ආකාරයෙන් හෝ ප්‍රකාශිත ත්‍රිමාණ ප්‍රකාශනයක් හෝ නිෂ්පාදනය සඳහා අදහස් කරනු ලැබූ සංයුක්ත පරිපථයක් සඳහා සකස් කරන ලද එවැනි ත්‍රිමාණ ප්‍රකාශනයක් හෝ අදහස් වේ ;

"අයිතිය දරන්නා" යන්නෙන්, 146 වන වගන්තියේ සඳහන් ආරක්ෂාවේ අර්ථලාභියා ලෙස සැලකිය යුතු, ස්වාභාවික පුද්ගලයකු හෝ නෛතික භාවයක් අදහස් වේ ;

VIII වන කොටස

XXXII වන පරිච්ඡේදය

අසාධාරණ තරගය සහ හෙළිදරව් නොකළ තොරතුරු

අසාධාරණ තරගය සහ හෙළිදරව් නොකළ තොරතුරු.

160. (1) (අ) කාර්මික හෝ වාණිජ කටයුතු කරගෙන යාමේ දී, අවංක පරිවයන්ට පටහැනිව සිදු කෙරෙන හෝ යෙදෙන යම් ක්‍රියාවකින් හෝ පරිවයකින් අසාධාරණ තරගකාරී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය ;

(ආ) මේ වගන්තියේ විධිවිධාන, නව නිපැයුම්, කාර්මික සැලසුම්, ලකුණු, වෙළෙඳ නාම, ශාස්ත්‍රීය, විද්‍යාත්මක හා කලාත්මක කෘති සහ වෙනත් බුද්ධිමය දේපළ ආරක්ෂා කෙරෙන මෙම පනතේ විධිවිධානවලට ස්වායත්තව හා ඒවාට අමතර වශයෙන් අදාළ විය යුතු ය ;

(2) (අ) කාර්මික හෝ වාණිජ කටයුතු කරගෙන යාමේ දී, වෙනත් තැනැත්තකුගේ ව්‍යවසායන් සම්බන්ධයෙන් හෝ එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විශේෂයෙන් ම ඒ ව්‍යවසාය විසින් ඉදිරිපත් කරන නිෂ්පාදන හෝ සේවාවන් සම්බන්ධයෙන් ව්‍යාකුල තත්ත්වයක් ඇති කරවන හෝ ඇති කරවීමට ඉඩ ඇති යම් ක්‍රියාවකින් හෝ පරිවයකින් අසාධාරණ තරගකාරී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය ;

(ආ) ව්‍යාකුලත්වය, විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සිදුවනු ලැබිය හැකි ය :—

(i) ලකුණක් ලියාපදිංචි කළ වුව ද ලියාපදිංචි නොකළ වුව ද ;

(ii) වෙළෙඳ නාමයක් ;

(iii) ලකුණක් හෝ වෙළෙඳ නාමයක් නොවන ව්‍යාපාර හැඳින්වීමේ සංකේතයක් ;

(iv) නිෂ්පාදනයක පෙනුම ;

(v) නිෂ්පාදන හෝ සේවා ඉදිරිපත් කිරීම ;

(vi) කීර්තිමත් තැනැත්තකු හෝ හොඳින් ප්‍රකට කල්පිත චරිතයක්

(3) (අ) කාර්මික හෝ වාණිජ කටයුතු කරගෙන යාමේ දී, වෙනත් තැනැත්තකුගේ ව්‍යවසායක කීර්ති නාමයට හෝ ප්‍රසිද්ධියට හානිකර වන හෝ හානිකර වීමට ඉඩ තිබෙන පරිදි සිදුකරන හෝ යෙදෙන ක්‍රියාවකින් හෝ පරිවයකින්, ඒ ක්‍රියාවෙන් හෝ පරිවයෙන් ඇත්තවශයෙන් ම ව්‍යාකූලත්වයක් සිදුවන්නේ ද නැද්ද යන වග නොසලකා, අසාධාරණ තරගකාරී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය ;

(ආ) වෙනත් තැනැත්තකුගේ කීර්ති නාමයට හෝ ප්‍රසිද්ධියට හානි කිරීම, විශේෂයෙන් ම,-

(i) ලකුණක්, ලියාපදිංචි කළ වුව ද, ලියාපදිංචි නොකළ වුව ද ;

(ii) වෙළෙඳ නාමයක් ;

(iii) ලකුණක් හෝ වෙළෙඳ නාමයක් නොවන ව්‍යාපාර හැඳින්වීමේ සංකේතයක් ;

(iv) නිෂ්පාදනයේ පෙනුම ;

(v) නිෂ්පාදන හෝ සේවා ඉදිරිපත් කිරීමක් ;

(vi) කීර්තිමත් තැනැත්තකු හෝ හොඳින් ප්‍රකට කල්පිත චරිතයකින් හා ;

සම්බන්ධිත කීර්ති නාමය හෝ ප්‍රසිද්ධිය බාලකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවිය හැකි ය ;

(ඇ) මේ විධිවිධානවල කාර්ය සඳහා, "කීර්ති නාමය හෝ ප්‍රසිද්ධිය බාලකිරීම" යන්නෙන්, ලකුණක, වෙළෙඳ නාමයක හෝ ව්‍යාපාර හැඳින්වීමේ

වෙනත් සංකේතයක, නිෂ්පාදනයක පෙනුම හෝ නිෂ්පාදන හෝ සේවා ක්‍රියාත්මක කිරීමක හෝ කිරීමිත් තැනැත්තකු හෝ හොඳින් ප්‍රකට කල්පිත චරිතයක විශේෂණීය ස්වරූපය හෝ ප්‍රචාරක වටිනාකම හීන කිරීම අදහස් වේ.

(4) (අ) කාර්මික හෝ වාණිජ කටයුතුවල දී යම් ව්‍යවසායක් සම්බන්ධයෙන් හෝ එහි කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් ම ඒ ව්‍යවසාය විසින් ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදන හෝ සේවා සම්බන්ධයෙන්, මහජනයා නොමඟ යවන හෝ නොමඟ යැවීමට ඉඩ ඇති යම් ක්‍රියාවකින් හෝ ව්‍යවහාරයකින් අසාධාරණ තරහකාරී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය.

(ආ) නොමඟ යැවීමක්, ප්‍රචාරක හෝ ප්‍රවර්ධන කටයුතුවලින් උද්ගත විය හැකි අතර විශේෂයෙන් ම –

(i) නිෂ්පාදනයක නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව ;

(ii) යම් නිශ්චිත කාර්යයක් සඳහා නිෂ්පාදනයක හෝ සේවාවල යෝග්‍යතාව පිළිබඳව ;

(iii) නිෂ්පාදනවල හෝ සේවාවල තත්ත්වය හෝ ප්‍රමාණය හෝ වෙනත් ආවේණික ලක්ෂණ පිළිබඳව ;

(iv) නිෂ්පාදන හෝ සේවාවල භූගෝලීය හඳුනාගැනීමේ ලක්ෂණ පිළිබඳව ;

(v) නිෂ්පාදන හෝ සේවා ඉදිරිපත් කිරීමට හෝ සැපයීමට අදාළ කොන්දේසි පිළිබඳව ;

(vi) නිෂ්පාදන හෝ සේවාවල මිල හෝ එම මිල ගණනය කරන ආකාරය පිළිබඳව,

සිදුවිය හැකි ය.

(5) (අ) කාර්මික හෝ වාණිජ කටයුතුවල දී, වෙනත් තැනැත්තකුගේ ව්‍යවසායක් හෝ එහි කටයුතු, විශේෂයෙන් ම ඒ ව්‍යවසායෙන් ඉදිරිපත් කෙරෙන නිෂ්පාදන හෝ සේවා අපකීර්තියට පත් කිරීමට ඉඩ ඇති, යම් අසත්‍ය හෝ යුක්තිසහගත නොවන චෝදනාවකින්, අසාධාරණ තරගකාරී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය ;

(ආ) අපකීර්තියට පත් කිරීමක්, ප්‍රචාරක හෝ ප්‍රවර්ධන කටයුත්තකින් උද්ගත විය හැකි අතර විශේෂයෙන් –

(i) නිෂ්පාදනයක නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව;

(ii) යම් නිශ්චිත කාර්යයක් සඳහා නිෂ්පාදනයක හෝ සේවාවක යෝග්‍යතාව පිළිබඳව ;

(iii) නිෂ්පාදන හෝ සේවාවල තත්ත්වය හෝ ප්‍රමාණය හෝ වෙනත් ආවේනික ලක්ෂණ පිළිබඳව ;

(iv) නිෂ්පාදනයක හෝ සේවා ඉදිරිපත් කිරීමට හෝ සැපයීමට අදාළ කොන්දේසි පිළිබඳව ;

(v) නිෂ්පාදන හෝ සේවාවල මිල හෝ එම මිල ගණනය කරන ආකාරය පිළිබඳව,

සිදු විය හැකි ය.

(6) (අ) යම් හෙළිදරව් නොකළ තොරතුරුවල පාලනය නීත්‍යනුකූලව දරන (මෙහි මින් මතු "අයිතිවාසිකම් දරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තාගේ කැමැත්ත නොලබා එම තොරතුරු වෙනත් අයවලුන් වෙත හෙළිදරව් කිරීමේ, වෙනත් අයවලුන් විසින් අත්කර ගැනීමේ හෝ ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලය ගෙන දෙන,

කාර්මික හෝ වාණිජ කටයුතුවල දී අවංක වාණිජ ව්‍යවහාරයන්ට පටහැනි ආකාරයකින් කෙරෙන යම් ක්‍රියාවකින් හෝ ව්‍යවහාරයකින් අසාධාරණ තරඟකාරී ක්‍රියාවක් සංයුක්ත වන්නේ ය ;

(ආ) අයිතිවාසිකම් දරන්නාගේ කැමැත්ත නොලබා හෙළිදරව් නොකළ තොරතුරු වෙනත් තැනැත්තන් විසින්, හෙළිදරව් කිරීම, අත්කර ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම විශේෂයෙන් ම –

(i) කාර්මික හෝ වාණිජ වරප්‍රසාද කටයුතුවල ;

(ii) ගිවිසුම් කඩ කිරීමේ ;

(iii) විශ්වාසය කඩ කිරීමේ ;

(iv) (i) සිට (iii) දක්වා ඡේදවල සඳහන් කවර හෝ ක්‍රියාවක් කිරීමට පෙළඹවීමේ ;

(v) අත්කර ගැනීමෙහි ලා (i) සිට (iv) දක්වා ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් ඇතුළත්ව තිබුණු බව දැන සිටි හෝ දැන නොසිටීමට තරම් දැඩි ලෙස නොසැලකිලිමත්වන, හෙළිදරව් නොකළ තොරතුරු තුන්වන පාර්ශ්වයක් විසින් අත්කර ගැනීමේ,

ප්‍රතිඵල වශයෙන් විය හැකි ය ;

(ඇ) යම් තොරතුරක්,–

(i) සමස්ථයක් වශයෙන් හෝ නිශ්චිත වින්‍යාසය අනුව සහ එහි සංස්ථාපන එකලස්වීම අනුව, ප්‍රශ්නයට අදාළ ආකාරයේ තොරතුරු සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් කටයුතු කරන පිරිස් අතර පොදුවේ දැනුවත්ව නොපවතින හෝ පහසුවෙන් ලබාගත නොහැකි නම් ;

(ii) රහසිගත නිසා තථ්‍ය හෝ විභව්‍ය වාණිජ අගයක් තිබේ නම් ; සහ

(iii) අවස්ථාගත තත්ත්වය යටතේ රහසිගතව තබා ගැනීම සඳහා එහි අයිතිවාසිකම් දරන්නා විසින් සාධාරණ පියවර ගනු ලැබීමට යටත් නම්,

එය මෙම පනතේ කාර්ය සඳහා "හෙළිදරව් නොකළ තොරතුරක්" ලෙස සැලකිය යුතු ය ;

(ඈ) කාර්මික හෝ වාණිජ කටයුතුවල දී-

(i) උත්පාදනය සඳහා යෑහෙන ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වන්නා වූ ද නව රසායනික අස්ථිත්වයක් යොදාගනු ලබන ඖෂධීය හෝ කෘෂිකාර්මික හෝ රසායනික නිෂ්පාදන අළෙවිය සඳහා අනුමතිය ලබාගැනීමේ කාර්යය සඳහා අදළ බලධරයකු වෙත ඉදිරිපත් කර තිබෙන්නා වූ ද රහසිගත පරීක්ෂණයක් හෝ වෙනත් දත්ත, අසාධාරණ ලෙස වාණිජ ප්‍රයෝජනයට ගැනීමකින් සමන්විත වන හෝ එසේ ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලය ඇතිවන හෝ යම් ක්‍රියාවක් හෝ ව්‍යවහාරයක් ; හෝ

(ii) මහජනයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි හැර, හෝ අදාළ දත්ත, අසාධාරණ වාණිජ ප්‍රයෝජනයකට ගනු ලැබීමෙන් ආරක්ෂා කර ඇති බවට වගබලා ගැනීම පිණිස පියවර ගෙන ඇත්නම් හිස, එවැනි දත්ත හෙළිදරව් කරන යම් ක්‍රියාවක්,

අසාධාරණ තරගකාරී ක්‍රියාවක් ලෙස සැලකෙන්නේ ය :

(ඉ) මේ පනතේ කාර්ය සඳහා හෙළිදරව් කරනු නොලැබූ තොරතුරු යන්නට-

(i) හාණ්ඩ තැනීම හෝ සේවා සැපයීම හා සම්බන්ධ තාක්ෂණික තොරතුරු ; හෝ

(ii) ව්‍යවසායක් තුළ ප්‍රයෝජනයට ගැනීම පිණිස ව්‍යවසායක් විසින් වැඩිදියුණු කර තිබෙන අභ්‍යන්තර තොරතුරු ද ඇතුළත් වන ව්‍යාපාරික තොරතුරු,

ඇතුළත් වේ. මේ වගන්තියෙන්, "ව්‍යවසාය" යන්නට පනතේ 101 වන වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(7) මේ කොටසේ සඳහන් යම් ක්‍රියාවකින් හෝ ව්‍යවහාරයකින් අනෂ්ඨියට පත් යම් තැනැත්තකු හෝ ව්‍යවසායක් හෝ නිපදවන්නන්ගේ සංගමයක් නිෂ්පාදකයන් හෝ වෙළෙඳුන් විසින්, එම ක්‍රියාව හෝ ව්‍යවහාරය කරගෙන යාම තහනම් කිරීම සඳහා සහ එම ක්‍රියාවේ හෝ ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබුවා වූ පාඩු සඳහා අලාභ ලබාගැනීම සඳහාත් අධිකරණයෙහි නඩු කටයුතු පවරනු ලැබිය හැකි අතර උල්ලංඝනය සම්බන්ධයෙන් මෙම පනතේ XXXV වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නඩු කටයුතුවලට අදාළ විය යුතු ය.

(8) (අ) හෙළිදරව් නොකළ තොරතුරු හිතාමතා සහ බලය පවරනු ලැබීමකින් තොරව හෙළිදරව් කරන යම් පුද්ගලයෙක් මේ පනත යටතේ, වරදකට වරදකරුවකු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වන නඩු විභාගයකින් පසු වරදකරුවීමේ දී රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීම් කාලයකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

(ආ) මේ පනතේ XXXVIII වන කොටසේ විධිවිධාන මෙම උපවගන්තියේ වරද සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(9) (6) වන උපවගන්තියේ විධිවිධානවලින් පැවරී ඇති අයිතිවාසිකම්, යම් පොදු නීති අයිතිවාසිකම්වලට අමතරව විය යුතු අතර, එම අයිතිවාසිකම්වල හීලෙන කිරීමක් වශයෙන් නොවිය යුතු ය.

IX වන කොටස

XXXIII වන පරිච්ඡේදය

භූගෝලීය දර්ශකය

භූගෝලීය දර්ශකය සඳහා ආරක්ෂාව.

161. (1) (i) කෘෂි නිෂ්පාදනයක්, ආහාරයක්, වයින් හෝ ස්ප්‍රිතු ඇතුළු ප්‍රස්තුත භාණ්ඩ එහි තථ්‍ය සම්භව ස්ථානය නොවන වෙනත් භූගෝලීය ප්‍රදේශයක සම්භවයක් සහිත බව පෙන්නුම් කරන හෝ අදහස් වන හා එම භාණ්ඩයේ භූගෝලීය සම්භවය සම්බන්ධයෙන් මහජනයා නොමග යවන සුළු ආකාරයෙන් ඒ භාණ්ඩයේ නාමයෙහි හෝ එය ඉදිරිපත් කරන ආකාරයෙහි යම් උපක්‍රමයක් යෙදීම වැළැක්වීම ;

(ii) 160 වන වගන්තියේ අර්ථානුකූලව අසාධාරණ තරගකාරී ක්‍රියාවක් සංයුක්ත වන යම් භූගෝලීය දර්ශකයක භාවිතයක් වැළැක්වීම ;

(iii) ප්‍රස්තුත භූගෝලීය දර්ශකයෙන් පෙන්නුම් කරන ස්ථානයේ සම්භවය නොමැති කෘෂි නිෂ්පාදන, ආහාර, වයින් හෝ ස්ප්‍රිතු ඇතුළු භාණ්ඩ හැඳින්වීම සඳහා භූගෝලීය දර්ශකයක් භාවිත කිරීම හෝ භාණ්ඩවල සත්‍ය සම්භවය සඳහන්ව තිබෙන අවස්ථාවක වුව ද, නැතහොත් භූගෝලීය දර්ශකය පරිවර්තනයෙහි ලා යොදා ඇති හෝ වර්ගය, මෝස්තරය, පන්නය හෝ අනුකරණය දැක්වෙන යෙදුමක් සමග යොදා ඇති අවස්ථාවක වුව ද, ප්‍රස්තුත භූගෝලීය දර්ශකයෙන් පෙන්නුම් කරන ස්ථානයෙහි සම්භවය නොමැති භාණ්ඩ බවට හඳුන්වා දෙන භූගෝලීය දර්ශකයක් භාවිත කිරීම වැළැක්වීම,

ලීට සම්බන්ධතාවක් තිබෙන කවර හෝ පාර්ශ්වයකට හිමිකම් තිබිය යුතු ය.

(2) 103, 160 සහ 161 වන වගන්ති යටතේ භූගෝලීය දර්ශකවලට සළසා තිබෙන ආරක්ෂාව, වචනාර්ථය අනුව, භාණ්ඩයක සම්භව රට, දිශාභාගය හෝ ප්‍රදේශය සම්බන්ධයෙන් සත්‍ය වුවත්, ඒ භාණ්ඩ වෙනත් රටක සම්භවයක් සහිත බව සාවද්‍ය ලෙස මහජනයා වෙත නියෝජනය කරන භූගෝලීය දර්ශකයට එරෙහිව අදාළ විය යුතු ය.

(3) කෘෂි නිෂ්පාදන, ආහාර, වයින් හෝ ස්ප්‍රිතු ඇතුළු භාණ්ඩ සඳහා වන සන්ධිධාර්ථ භූගෝලීය දර්ශකයක් සම්බන්ධයෙන් වන විට, ඒ එක් එක් දර්ශකය සඳහා, මේ වගන්තියේ (2) වැ, උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව ආරක්ෂාව සැලසිය යුතු ය. එවැනි දර්ශක සමගාමීව පාවිච්චි කිරීමට අවසරලත් අවස්ථාවල දී අදාළ නිෂ්පාදකයන්ට සාධාරණීය සැලකිල්ලක් ලැබෙන බවට වගබලා ගැනීමේ අවශ්‍යතාව සහ සාවද්‍ය හෝ මුලාවිය හැකි දර්ශකවලින් පාරිභෝගිකයන් ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, ප්‍රශ්නයට අදාළ එම සන්ධිධාර්ථ දර්ශක එකිනෙකින් වෙන් කොට හඳුනාගනු ලබන්නේ කවර ප්‍රායෝගික කොන්දේසි යටතේ ද යන වග අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ප්‍රායෝගික කොන්දේසි මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ සඳහන් එවැනි යම් පාවිච්චියක් වැළැක්වීම සඳහා ඉන්ජන්ෂන් තහනමක් සහ යෝග්‍ය යයි සැලකෙන වෙනත් යම් සහනයක් ප්‍රදානය කිරීමට අධිකරණයට බලය හා අධිකරණ බලය තිබිය යුතු අතර, ඒ නඩු කටයුතුවලට, මෙම පනතේ XXXV පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා, භූගෝලීය දර්ශක යන්නෙහි 101 වන වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

X වන කොටස

XXXIV වන පරිච්ඡේදය

උපදේශක කොමිෂන් සභාවේ සංයුතිය සහ බලතල

උපදේශක කොමිෂන් සභාවට කරනු ලබන පත්කිරීම් යනාදිය.

162. (1) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ අසාධාරණ වෙළෙඳ තරග හා බුද්ධිමය දේපළ විෂයයේ වෙනත් යම් විෂය ක්ෂේත්‍රයක් යන මේවා සම්බන්ධයෙන් වූ නීතියට අදාළ වන යම් කරුණක් අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබූ විට, ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයාට

උපදෙස් දීම සඳහා (මෙහි මින් මතු "උපදේශක කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් අමාත්‍යවරයා විසින් සංස්ථාපනය කරනු ලැබිය හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපිත උපදේශක කොමිෂන් සභාව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) නීතිය පිළිබඳව, වාණිජ්‍ය පිළිබඳව හෝ ආශ්‍රිත ක්ෂේත්‍රවල දක්ෂතාව පෙන්නුම් කොට ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පස්දෙනකුට නොඅඩු සහ දස දෙනකුට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් (මේ ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු මෙහි මින් මතු "පත් කළ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ) ; සහ

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් පත් වන සාමාජිකයකු වන අතර, ඔහු උපදේශක කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කළ යුතු ය ;

(3) (අ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, උපදේශක කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකුගේ නිල කාලය වර්ෂ තුනක් විය යුතු ය :

එසේ වුව ද, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් පහ කරනු ලැබීමෙන් හෝ වෙනත් ආකාරයකින් ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් ධුරය දැරිය යුත්තේ ඔහු අනුප්‍රාප්ත වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරි වී ඇති ධුර කාලය සඳහා පමණකි ;

(ආ) කාලය ඉකුත්වීම නිසා ධුරය හිස් කරන කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයෙකුට නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබෙන්නේ ය.

(4) (අ) උපදේශක කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතා අස්වීම පිළිබඳ දන්වනු ලබන ලිපියක් මඟින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබූ දින සිට බලාත්මක වේ ;

(ආ) පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් හේතු දක්වා කවර වුව ද අවස්ථාවක දී ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) පත් කළ යම් සාමාජිකයකුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට, ඒ සාමාජිකයා රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවට සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) උපදේශක කොමිෂන් සභාවේ පත් කළ සාමාජිකයන් අතුරින් කෙනකු උපදේශක කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් (මෙහි මින් මතු "සභාපති" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය ;

(ආ) රෝගාතුරවීම, ඕනෑම දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට ගෙන තම ධුරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය ;

(ඇ) අමාත්‍යවරයා විසින් හේතු දක්වා කවර අවස්ථාවක දී වුව ද සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය ;

(ඈ) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිඛිත ලිපියකින් ස්වකීය සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දිනයක සිට බල පවත්වන්නේ ය ;

(ඉ) ඉහත (ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය විය යුත්තේ උපදේශක කොමිෂන් සභාවේ මහුගේ සාමාජිකත්වයේ නිල කාලය ය.

(6) මේ කොටස යටතේ උපදේශක කොමිෂන් සභාවේ කාර්ය ඉටු කර ගෙන යෑම සඳහා ඊට සහාය දීමට අවශ්‍ය වන නිලධාරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(7) මුදල් විෂයය හාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පාරිශ්‍රමික උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(8) පහත සඳහන් කාර්ය උපදේශක කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලැබිය යුතු ය :–

(අ) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, අසාධාරණ තරග සහ බුද්ධිමය දේපළ පිළිබඳ කුමන හෝ කරුණකට අදාළව අමාත්‍යවරයා විසින් කලින් කල උපදේශක කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පරීක්ෂා කොට අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම ;

(ආ) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, අසාධාරණ තරග සහ බුද්ධිමය දේපළ පිළිබඳ කුමන හෝ කරුණකට සම්බන්ධ සහ අදාළ නීතිය කලින් කල සමාලෝචනය කොට, ඒ නීතිය වෙනස් කිරීම, විකරණය කිරීම හෝ ඊට යමක් එකතු කිරීම සම්බන්ධයෙන් වූ යෝජනා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම :

(ඇ) ඉහත (අ) හෝ (ආ) යන ඡේදවල සඳහන් වාර්තා හෝ යෝජනා ඉදිරිපත් කිරීමේ දී, අවශ්‍ය යයි උපදේශක කොමිෂන් සභාව අදහස් කරන්නේ නම්, වෙළෙඳ මණ්ඩලවල, වෘත්තීය සංවිධානවල, අදාළ ආයතනවල, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සහ මහජනයාගේ අදහස් විමසා ඒවා සැලකිල්ලට ගැනීම.

(9) උපදේශක කොමිෂන් සභාවේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් ලිඛිතව උපදේශක කොමිෂන් සභාව වෙත දෙනු ලැබිය හැකි අතර, එවැනි විධාන උපදේශක කොමිෂන් සභාව විසින් බලාත්මක කළ යුතු ය.

XI වන කොටස

XXXV වන පරිච්ඡේදය

අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ අධිකරණය වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරියේ පැවැත්වෙන කටයුතු සහ අධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතු

ලේඛනයේ වැරදි හරිගැස්සීම් පහ ලේඛනය නිවැරදි කිරීම.

163. (1) යම් කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක හෝ ලකුණක හෝ මේ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් ලියාපදිංචියක, ලියාපදිංචි හිමියා විසින් හෝ වෙනුවෙන් නියමිත ආකාරයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්-

(අ) යම් කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක, ලකුණක හෝ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් ලියාපදිංචියක, ලියාපදිංචි හිමියාගේ නමෙහි, ලිපිනයෙහි හෝ විස්තරයෙහි ; හෝ

(ආ) කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් හෝ වෙනත් යම් නියමිත ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් වූ වෙනත් යම් විස්තරයක් පිළිබඳව,

යම් වරදක් හරිගැස්සීම හෝ වෙනස් කිරීමක් ඇතුළත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට නානීයක් නොමැතිව –

(අ) යම් සටහනක් ලේඛනයෙහි ඇතුළත් නොකිරීමෙන් හෝ එහි ඇතුළත් කිරීම පැහැර හැරීමෙන් හෝ ප්‍රමාණවත් හේතු නොමැතිව යම් ලේඛනයක කරන ලද සටහනකින් හෝ යම් ලේඛනයක වැරදි ආකාරයෙන් පවතින යම් සටහනකින් හෝ යම් ලේඛනයක යම් සටහනක ඇති වරදකින් හෝ දෝෂයකින් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නියමිත ආකාරයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට එවැනි සටහනක් කිරීම හෝ ඉවත් කිරීම හෝ වෙනස් කිරීම සඳහා අධිකරණය සුදුසු යයි සලකන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය ;

(ආ) යම් ලේඛනයක් නිවැරදි කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය යම් ප්‍රශ්නයක් මේ වගන්තිය යටතේ වූ යම් කටයුත්තක දී අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි ය ;

(ඇ) යම් ලියාපදිංචි කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක හෝ මෙම පනත යටතේ වෙනත් යම් ලියාපදිංචි කිරීමක්, පාවාදීමක් හෝ අන්සතු කිරීමක් පිළිබඳ යම් වංචාවක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ම මේ වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ වූ නඩු කටයුත්තක දී ඉල්ලා ඇති සහනයට යම් ලේඛනයක වැරදි හරිගැස්සීම, එය වෙනස් කිරීම හෝ නිවැරදි කිරීම ඇතුළත් වන අවස්ථාවක පෙනී සිටීමට සහ කරුණු කියා පෑමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට අයිතිවාසිකම ඇති අතර, එසේ පෙනී සිටින ලෙස අධිකරණය විසින් විධාන කළහොත් ඔහු පෙනී සිටිය යුතු ය. අධිකරණය අන්‍යාකාර විධානයක් කළහොත් මිස, අධිකරණයේ පෙනී සිට කරුණු කියා පෑම වෙනුවට ප්‍රශ්නයට විෂය වී ඇති කාරණය සම්බන්ධයෙන් තමා ඉදිරියේ පැවැත් වූ කටයුතු පිළිබඳව හෝ තමා විසින් දෙන ලද ඒ කාරණාවට බලපාන යම් තීරණයකට හේතු පිළිබඳව

හෝ එවැනි කාරණාවල දී කාර්යාලයේ අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගය පිළිබඳව හෝ ඒ ප්‍රශ්නයට අදාළ වෙනත් යම් කරුණු පිළිබඳව හෝ සුදුසු යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කරන්නා වූ ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තමා දන්නා වූ ද විස්තර දැක්වෙන, තමා විසින් අත්සන් කරන ලද ලිඛිත ප්‍රකාශයක් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ ප්‍රකාශය ඒ නඩු කටයුත්තේ සාක්ෂිවල කොටසක් ලෙස සැලකිය යුතු ය.

(4) යම් ලේඛනයක වැරදි හරිගැස්සීමේ, එය වෙනස් කිරීමේ හෝ නිවැරදි කිරීමේ ප්‍රශ්නයක් පිළිබඳව අධිකරණය විසින් කටයුතු කිරීමේ දී ප්‍රශ්නයට විෂය වී ඇති සටහන පිළිබඳව හෝ කරන ලෙස ඉල්ලා සිටින වැරදි හරිගැස්සීම, වෙනස් කිරීම හෝ නිවැරදි කිරීම පිළිබඳව හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා කර ඇති තීරණ සමාලෝචනය කිරීමට ඒ අධිකරණයට බලය තිබිය යුතු ය.

යම් ලේඛනයක පළුදු වූ වෙළුම්වල පිටපත් ගැනීමට සහ ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරු පිළියෙල කොට ඇතුළත් කිරීම.

164. (1) මේ පනත යටතේ තබාගෙන ඇති යම් වෙළුමක් ප්‍රතිසංස්කරණය කළ නොහැකි වන තරම් පළුදු වී ඇතැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක දී වුව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් එහි පිටපතක් සෑදීමට සලස්වා, එය සත්‍ය පිටපතක් ලෙස සහතික කිරීමට සැලැස්විය යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද යම් පිටපතකින්, ඒ පිටපතේ මුල් වෙළුම ප්‍රතියෝජනය වන අතර ඒ පිටපතින් ප්‍රතියෝජනය කෙරෙන වෙළුමේ ඇති නෛතික බලය හා බලපෑම ම ඒ පිටපතට ඇතැයි සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිටපතක් සාදවන ලද සෑම පළුදු වූ වෙළුමක් ම අවශ්‍ය විය හැකි යම් ආශ්‍රිත කටයුත්තක් සඳහා සාධාරණ ලෙස පරිරක්ෂණය කළ හැකි තාක් කල්, පරිරක්ෂණය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලැස්විය යුතු ය.

(4) යම් වෙළඳමක යම් පත්ඉරුවක් නැති වී, එය සොයාගත නොහැකි බවට පත් වී හෝ එසේ වූ යම් පත්ඉරුවක් නිත්‍ය වශයෙන් ම විකෘති වී ඇති බවට හෝ එහි වූ සටහන් හෝ ඒ සටහන්වලින් සැලකිය යුතු කොටසක් කියවිය නොහැකි වන සේ මැකී හෝ පළුදු වී ඇති බවට, නීති විමර්ශනයකින් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක වුව ද, ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුවක් පිළියෙල කිරීමට ඔහු විසින් සැලැස්විය යුතු ය.

(5) පහත දැක්වෙන කරුණු සඳහා සැලැස්වෙන නියමිත විධිවිධානවලට අනුකූලව මිස, කිසිම පත්ඉරුවක්, (4) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, ප්‍රතිසංස්කරණය නොකළ යුතු ය :–

(අ) නැති වූ හෝ විකෘති වූ හෝ පළුදු වූ පත්ඉරුවෙහි මුලින් අඩංගුව තිබූ කරුණු නිශ්චය කොට දැනගැනීමෙහි ලා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආවේශ්‍ය කළ යුතු හා උපයෝගී කරගත යුතු සාක්ෂි ;

(ආ) ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුවක් පිළියෙල කිරීම පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිවේදනය නිකුත් කිරීම ;

(ඇ) ප්‍රතිසංස්කරණය කරමින් සිටින පත්ඉරුවේ අඩංගු කරුණු කිසිවක් බලපෑ හැකි යම් තැනැත්තකු විසින් විරුද්ධත්වය ප්‍රකාශ කිරීම ; සහ

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි යම් විරුද්ධත්වයක් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම.

(6) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් පත්ඉරුවක් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අවස්ථාවක, ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුව සත්‍ය පත්ඉරුවක් බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමිත ආකාරයෙන් සහතික කොට ඉන් ඉක්බිතිව, අවස්ථාවෝචිත පරිදි, ලේඛනයෙහි උචිත වෙළඳමෙහි නැති වූ පත්ඉරුව කලින් තිබූ ස්ථානයෙහි හෝ විකෘති වූ හෝ පළුදු වූ පත්ඉරුව තිබූ ස්ථානයෙහි හෝ මේ වගන්තියේ විධිවිධාන යටතේ පිළියෙල කරන ලද වෙළඳමක පිටපතක් හෝ එය අන්තර්ගත කිරීමට

සැලැස්විය යුතු ය. තව ද ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුව එසේ සැබෑ පත්ඉරුවක් බවට සහතික කොට, අන්තර්ගත කරනු ලැබූ කල්හි, ඒ පත්ඉරුවෙන් ප්‍රතියෝජිත පත්ඉරුවේ ඇති නෛතික බලය හා බලපෑම ම ඒ පත්ඉරුවට තිබෙන බව සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(7) මේ පනතේ විධිවිධාන යටතේ තබාගන්නා ලද ලේඛනයක වූ යම් සටහනක හෝ නිකුත් කරන ලද යම් සහතිකයක හෝ තිබී හමුවිය හැකි යම් ලිපි දෝෂයක් හෝ අත්හැරීමක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය යයි සලකන පරීක්ෂණයකින් පසුව ඔහු විසින් නිවැරදි කරනු ලැබිය හැකි අතර තත්කාර්ය සඳහා එසේ වූ යම් සහතිකයක් ආපසු ගෙන්වා, ඒ සංශෝධනය කරනු ලැබිය හැකි ය ; නැතහොත් ඒ වෙනුවට අලුතෙන් සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂවරයාගේ සහතික සාක්ෂි විය යුතු බව.

165. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යෙදීමට හෝ කිරීමට බලය පැවරෙන යම් සටහනක්, කරුණක් හෝ දෙයක් පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කරන ලදැයි හැඟෙන සහතිකයක්, ඒ සටහන යෙදූ බවට හා එහි අඩංගු කරුණු පිළිබඳව ද ඒ කරුණු නැතහොත් දෙය කළ හෝ නොකළ බවට ද බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

සහතික කරන ලද පිටපත් සාක්ෂි විය යුතු බව.

166. මේ පනත යටතේ තත්කාලයෙහි ලිපිගොනු කොට හෝ තබා ගෙන හෝ ඇති යම් ලියවිල්ලක, ලේඛනයක හෝ වෙනත් පොතක මුද්‍රිත, යාන්ත්‍රිකව පිළියෙල කළ, යතුරුලිඛිත හෝ ලිඛිත සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කරනු ලැබූ පිටපත් හෝ උධෘත තවදුරටත් ඔප්පු කිරීමක් හෝ මුල් පිටපත් ඉදිරිපත් කිරීමක් නොමැතිව, ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණවල දී ද සියලු නඩු කටයුතු වල දී ද සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ යුතු ය.

සාක්ෂි දීමේ ක්‍රමය.

167. (1) මේ පනත යටතේ අධිකරණය ඉදිරියේ පැවැත්වෙන යම් නඩු කටයුත්තක දී, පටහැනි විධාන දී නොමැති විටෙක, දිවුරුම් පත්‍රයක් මගින් සාක්ෂි දිය යුතු ය. එසේ වුවද දිවුරුම් පත්‍රයක් මගින් සාක්ෂි ගැනීම වෙනුවට හෝ ඊට අතිරේකව, හෝ වාචික සාක්ෂි ගැනීම සුදුසු යයි අධිකරණයට හෝ හැඟෙන යම් අවස්ථාවක, අධිකරණය විසින් හෝ එසේ කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරියේ පවතින විමර්ශනයක දී සාක්ෂි දීම පිළිබඳ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) පැමිණීමට සාක්ෂිකරුවන්ට බල කිරීම සඳහා, ලේඛන ඉදිරිපත් කරන ලෙස බලකිරීම සඳහා, තමන් ඉදිරිපිට සාක්ෂි දෙනු ලබන සියලුම තැනැත්තන් දිවුරවීම සඳහා, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ පත් කරන ලද කොමිෂන් සභාවක් වෙත පැවරෙන බලතල, සාක්ෂිවලින් යම් කොටසක් සම්මුඛව ගනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කිරීම.

168. මේ පනත මගින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යම් අභිමතානුසාරී බලයක් හෝ වෙනත් බලයක් හෝ පැවරී ඇති අවස්ථාවක (කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් දෙන ලෙස නියමිත කාලය ඇතුළත විටිමත් ලෙස ඉල්ලා සිටියහොත්) කරුණු ඉදිරිපත් කිරීමට කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක්, ලකුණක් හෝ පනතේ විධිවිධාන යලසා තිබෙන වෙනත් යම් කාරණයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්කරුට හෝ ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ හෝ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් කාරණයක් ලියාපදිංචිය සඳහා ඉල්ලුම්කරුට හෝ ලියපදිංචි හිමියාට අවස්ථාවක් නොදී, ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බලය ඒ ඉල්ලුම්කරුට හෝ ඒ හිමියාට හානිකර ලෙස බලපාන අන්දමින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නීතිපතිගේ උපදෙස් ලබාගත හැකිය.

169. මේ පනතේ විධිවිධාන කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වන යම් සැකයක් හෝ ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටිය හැකි ය.

උල්ලංඝනය සහ ප්‍රතිකර්ම.

170. (1) මේ පනත මගින් සහ ඒ යටතේ පිළිගත් කවර හෝ අයිතිවාසිකමක් ප්‍රදානය කරනු ලැබූ තැනැත්තකු විසින්, ඔහුගේ අයිතිවාසිකම් යම් තැනැත්තකු උල්ලංඝනය කිරීමේ තර්ජනයක් පවතින බව හෝ උල්ලංඝනය කර තිබෙන බව, නැතහොත් මේ පනත යටතේ ප්‍රදානය කළ අයිතියක් උල්ලංඝනය වීමට ඉඩ තිබෙන ක්‍රියාවන්හි යෙදෙමින් සිටින බව ඔප්පු කරනු ලැබුවිහොත්, ඒ යම් තැනැත්තකු විසින් ඒ උල්ලංඝනය ආරම්භ

කිරීම හෝ එය කරගෙන යාම නැතහොත් එවැනි ක්‍රියාවන්හි යෙදීම වළක්වන ඉන්ජංෂන් තහනමක් අධිකරණය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, යුක්ති සහගත හා යෝග්‍ය බව අධිකරණයට පෙනී යන අලාභ ගෙවන ලෙස සහ වෙනත් යම් සහන ලබාදෙන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය. අලාභ දීමේ තීන්දුව සමග ඉන්ජංෂන් තහනම ද දෙනු ලැබිය හැකි අතර, ඉල්ලුම්කරුට අලාභ ලබාගැනීමට හිමිකම තිබීමේ හේතුව මත පමණක්, ඉන්ජංෂන් තහනම දීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක හෝ ලකුණක හෝ අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ වෙනත් යම් ලියාපදිංචියක් හෝ ඒ ලියාපදිංචියක යම් කොටසක් හෝ ශූන්‍ය හා බලරහිත බවට ප්‍රකාශයට පත් කරන ලෙස විත්තිකරු විසින් (1) වන උපවගන්තියේ සඳහන් නඩු කටයුත්තක දී අධිකරණයෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, එසේ වූ විට, එවැනි ලියාපදිංචි කිරීම්වල නිෂ්ප්‍රභතාව සම්බන්ධ වගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු ය.

(3) (අ) (i) උල්ලංඝනය හේතුවෙන් අයිතිවාසිකම් හිමියාට දරන්නට සිදු වී ඇති අලාභ වෙනුවෙන් මෙන්ම ලබාගත යුතු ලාභ අයකර ගැනීම ඇතුළුව වන්දි සැලසීම පිණිස ප්‍රමාණවත් අලාභ, අයිතිවාසිකම් හිමියා වෙත ගෙවන ලෙස, උල්ලංඝනකරුට ආඥා කිරීමට අධිකරණයට බලය ඇත්තේ ය ;

(ii) උල්ලංඝනීය භාණ්ඩ, වාණිජ ක්‍රියාමාර්ගවලින් බාහිරව බැහැර කරන ලෙස හෝ කිසිම ආකාරයක වන්දි ගෙවීමකින් තොරව විනාශ කරන ලෙස, ආඥා කිරීමට ද අධිකරණයට බලය ඇත්තේ ය ;

(iii) නිමිකම්පෑම තහවුරු කිරීම සඳහා පාර්ශ්වකරුවකු විසින් සාධාරණව ලබාගත හැකි සාක්ෂි ඉදිරිපත් කර ඇත්තා වූ ද ඒ හිමිකම්පෑම තහවුරු කිරීමට අදාළ සාක්ෂි, ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයේ පාලනයෙහි පවත්නා බව පාර්ශ්වකරු විසින් නිශ්චිතව සඳහන් කරන්නා වූ ද අවස්ථාවක, ඒ හිමිකම්පෑම තහවුරු කිරීම සඳහා අදාළ හා ප්‍රතිවිරුද්ධ

පාර්ශ්වයේ පාලනයේ පවත්නා සාක්ෂි, රහස්‍ය තොරතුරු ආරක්ෂා කරනු ලැබීමට යටත්ව, ඉදිරිපත් කරන ලෙස, ආඥා කිරීමට අධිකරණයට බලය ඇත්තේ ය ;

(ආ) උල්ලංඝනීය භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා ප්‍රයෝජනයට ගත්නා ද්‍රව්‍ය හා මෙවලම් සම්බන්ධයෙන් ද (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(4) එවැනි අඥා කිරීමේ දී, උල්ලංඝනයේ බැරෑරුම්කම, ආඥා කරන ලද ප්‍රතිකර්ම මෙන්ම තුන්වන පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතා ද අතර සමතුලිතතාව සැලකිල්ලට ගත යුතු ය. ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ සම්බන්ධයෙන් වන විට, අතිවිශේෂ අවස්ථාවල දී හැර, හුදෙක් නීති විරෝධීව යොදා තිබෙන වෙළෙඳ ලකුණු ඉවත් කිරීම පමණක්, එම භාණ්ඩ, වාණිජ ක්‍රියාමාර්ග ඔස්සේ මුදාහැරීම සඳහා ප්‍රමාණවත් නොවිය යුතු ය.

(5) උල්ලංඝනයේ බරපතලකමට සමානුපාතික නොවන්නේ නම් මිස, උල්ලංඝනීය භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේ සහ බෙදාහැරීමේ නිරත තැනැත්තන් කවුරුන්ද යන වග සහ ඔවුන්ගේ බෙදාහැරීමේ මාර්ග, අයිතිවාසිකම් හිමිකරුට දන්වන ලෙස අධිකරණය විසින්, උල්ලංඝනකරුට ආඥා කරනු ලැබිය හැකි ය.

(6) උචිත අවස්ථාවල දී විශේෂයෙන් ම යම් ප්‍රමාදයක් නිසා අයිතිවාසිකම් හිමිකරුට අප්‍රතිකාර්ය හානියක් සිදුවීමට ඉඩ ඇති විට හෝ සාක්ෂි විනාශ කරනු ලැබිය හැකි බවට, නිරූපණීය අවදානමක් පවත්නා විට ඒකපාක්ෂිකව අතුරු ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආඥා කිරීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

(7) අතුරු ඒකපාක්ෂික ක්‍රියාමාර්ග ආඥා කරනු ලැබ ඇති අවස්ථාවක, එය බලපාන්නා වූ පාර්ශ්වයන්ට දැනුම්දීමක් කළ යුතු අතර, එම ආඥා කර තිබෙන අතුරු ක්‍රියාමාර්ග විකරණය කළ යුතු හෝ ප්‍රත්‍යාදිෂ්ට කළ යුතු ද යන්න සම්බන්ධයෙන් කරුණු කියා පෑමට ඔවුන්ට හිමිකම තිබිය යුතු ය.

(8) අතුරු ක්‍රියා මාර්ග විකරණය කරනු ලැබ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ, හෝ ආරක්ෂිත අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වී නොමැති බව ඉන් පසුව දැන ගන්නට ලැබුණු අවස්ථාවක, එසේ සිදු වී තිබෙන හානිය සඳහා යෝග්‍ය වන්දියක් ගෙවන ලෙස චිත්තිකරුගේ ඉල්ලීම පිට, ඉල්ලුම්කරුට අඳා කිරීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

(9) අධිකරණය විසින්, චිත්තිකරු ආරක්ෂා කිරීම පිණිස සහ මේ වගන්තියේ ඉහත විධිවිධානයන්හි සඳහන් අතුරු ක්‍රියාමාර්ග අයථා ලෙස යොදාගැනීම වැළැක්වීම පිණිස, ඇප හෝ ප්‍රමාණවත් ආරක්ෂණයක් සපයන ලෙස ඉල්ලුම්කරුට ආඥා කරනු ලැබිය හැකි ය.

(10) මේ පනත යටතේ අයිතිවාසිකම් ආරක්ෂා කර ඇති අයිතිකරුවකු වන්දි ප්‍රදානය කිරීම පිළිබඳව මෙම පනතේ සලසා ඇති විධිවිධාන නොතකා, අධිකරණය විසින් යුක්ති සහගත යයි සලකනු ලබන රුපියල් පණස් දහසකට නොඅඩු හා රුපියල් මිලියනයකට නොවැඩි ව්‍යවස්ථාපිත වන්දියක්, උල්ලංඝනීය නඩුවකින් ලබාගැනීම සඳහා අවසාන නඩු තීන්දුවට පෙර, ඔප්පු කරන ලද වන්දියක් වෙනුවට තෝරා ගනු ලැබිය හැකි ය.

(11) සද්භාවයෙන් සහ මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, කවර හෝ නිලධරයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබිය නොහැකි විය යුතු ය.

උල්ලංඝනය පිළිබඳව අවසරලාභී විසින් හෝ අවසරලාභීගේ ඉල්ලීම පිට හෝ පවරනු ලබන නඩු කටයුතු.

171. කාර්මික සැලැස්මක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් හෝ මේ පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් කාර්ය සම්බන්ධයෙන් වූ බලපත්‍ර ගිවිසුමක පටහැනි විධිවිධාන කිසිවක් නොමැති විට, බලපත්‍රලාභී විසින්–

(අ) 170 වන වගන්තියේ සඳහන් තර්ජිත උල්ලංඝනය, උල්ලංඝනය හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් ඉන්ජංෂන් තහනමක් නිකුත් කරන ලෙස ඉල්ලන මෙන් කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ, ලකුණේ හෝ මේ පනත යටතේ වෙනත් යම් කරුණක් ලියාපදිංචි හිමියාගෙන් ඉල්ලා සිටිය හැකි ය :

එසේ වුවද, තර්ජිත උල්ලංඝනය, උල්ලංඝනය හෝ උල්ලංඝනයට අදළව සිදු කෙරෙන ක්‍රියා, බලපත්‍රලාභී විසින් පෙන්වා දී, ඔහු මෙම පනත යටතේ අපේක්ෂා කරන සහනය ද නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(ආ) එකී ඉල්ලීම ලැබී මාස තුනක් ඇතුළත ඉන්ජංෂන් තහනමක් ඉල්ලුම් කිරීම එකී කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ, ලකුණේ හෝ මෙම පනත යටතේ වෙනත් යම් කාරණයක හිමියා ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත්, ඒ හිමියාට දැනුම් දී, තමාගේ ම නමින් ඉන්ජංෂන් තහනමක් නිකුත් කරන ලෙස ඉල්ලුම් කළ හැකි අතර ඒ හිමියාට ද ඒ නඩු කටයුත්තට සම්බන්ධ විය හැකි ය :

එසේ වුව ද, අනල්ප අලාභ සිදුවීම වළක්වාලනු පිණිස වහා ක්‍රියා කිරීම අවශ්‍ය බව බලපත්‍රලාභී විසින් ඔප්පු කරනු ලැබුවහොත්, බලපත්‍රලාභීගේ ඉල්ලීම පරිදි, (ආ) වන වගන්තියේ නිශ්චිතව සඳහන් මාස තුනක කාලසීමාව ඉකුත්වීමට පෙර වුව ද, අධිකරණය විසින් ඉන්ජංෂන් තහනමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

උල්ලංඝනය නොකිරීම පිළිබඳ ප්‍රකාශය.

172. (1) යම් කාර්මික සැලසුමකට, පේටන්ට් බලපත්‍රයකට හෝ ලකුණක හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් නීත්‍යනුකූල සම්බන්ධතාවක් පෙන්වන යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද සහ අවස්ථාවෝචිත පරිදි, ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ ලකුණේ හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති කාරණයේ ලියාපදිංචි හිමියා ද පාර්ශ්වකරුවකු කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, තර්ජිත ක්‍රියා කිරීමෙන් හෝ යම් නිශ්චිත ක්‍රියාවක් කිරීමෙන් එකී කාර්මික සැලසුම, පේටන්ට් බලපත්‍රය, ලකුණ හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති කාරණයක් විෂයයෙහි තර්ජිත උල්ලංඝනයක් හෝ උල්ලංඝනයක් සංයුක්ත නොවන බව අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) එකී ඉල්ලුම් පත්‍රය පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ ලකුණේ හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් කාරණයක ලියාපදිංචි

හිමියා සමඟ ඇති කර ගන්නා ලද යම් එකඟවීමක පටහැනි විධිවිධාන කිසිවක් නොමැති නම්, ඒ පාවාදීම්ලාභියාට හෝ බලපත්‍රලාභියාට හෝ ඒ නඩු කටයුත්තට සම්බන්ධ වීමට හිමිකම තිබිය යුතු ය.

(3) උල්ලංඝනය නොකිරීම පිළිබඳ ප්‍රකාශයක් සඳහා වූ නඩු කටයුතු, යම් කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක, ලකුණක හෝ මෙම පනතේ විධිවිධාන යටතේ ඇති කාරණයක ලියාපදිංචිය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කිරීම සඳහා වූ නඩු කටයුතු හා සමගාමීව පවරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, උල්ලංඝනය නොකිරීම පිළිබඳ ප්‍රකාශයක් සඳහා වූ නඩු කටයුත්තක ප්‍රස්තුත කරුණු, ඒ වනවිටත් උල්ලංඝනය පිළිබඳ නඩු කටයුත්තක විෂය වී ඇති කරුණු නොවිය යුතු ය.

(4) මේ පනත යටතේ ඉන්ජංෂන් තහනමක් සඳහා අධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයකට ම 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ විය යුතු ය.

අභියාචන. **173.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ යම් විධිවිධානයක් යටතේ කරන ලද යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණයේ දින සිට මාස හයක් ඇතුළත, ඒ තීරණයට, විරුද්ධව අධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) ඒ තැනැත්තා විසින් අධිකරණය වෙත අභියාචනය කරනු ලබන්නේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණයේ සහතික කළ පිටපතක් සහ බුද්ධිමය දේපළ කාර්යාලයේ ලිපිගොනුවෙන් ලබාගත් සියලු අදාළ ලේඛන හා දිවුරුම් පත්‍ර සමඟ, අභියාචන පෙත්සමක් මඟින් අභියාචනය ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. අභියාචන පෙත්සමේ සහ ඒ සමඟ ඉදිරිපත් කරන ලේඛන හා දිවුරුම් පත්‍රවල පිටපත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ අභියාචන පෙත්සමේ නම් කර තිබෙන සියලු වගඋත්තරකරුවන් වෙත භාර කළ යුතු ය. එසේ භාර දුන් බව සනාථ කරන සාක්ෂි, අභියාචන පෙත්සම සමඟ අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය. වගඋත්තරකරුවන් විසින් ඔවුන්ගේ විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, අධිකරණය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් මුල් ලිපිගොණුව කැඳවනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරියේ ඒ වනවිටත් දී තිබෙන සාක්ෂිවලට අතිරේකව හෝ පරිපූරක වශයෙන්, දිවුරුම් පත්‍ර හා ලේඛන ස්වරූපයේ අලුත් සාක්ෂි ආවේශ්‍ය කරගත හැකි ය.

(4) එවැනි යම් අභියාවනයක දී අධිකරණය විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම නැතහොත් අවශ්‍ය විය හැකි පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන නිකුත් කිරීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැඩිදුර විභාගයක් පවත්වන ලෙස නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) අධිකරණය විසින්, (4) වන උපවගන්තිය යටතේ ස්වකීය අධිකරණ බලය ක්‍රියාවේ යෙදීමේ දී කරන ලද යම් ආඥාවකින් සෑහීමට පත් නොවූ එහි පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු විසින්, ඒ ආඥාවට විරුද්ධව සිද්ධිමය හෝ නීතිය සම්බන්ධ යම් දෝෂයක් නිවැරදි කර ගැනීම පිණිස, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය පළමුව ඉල්ලා ලබාගෙන, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාවනයක් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරන සෑම අභියාවනයක් ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාවනය කිරීම සඳහා විශේෂ අවසර ඉල්ලීමට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ රීති වලින් නියමිත කාර්ය පරිපාටියට හැකිතාක් දුරට අනුකූල වන පරිදි කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට පැවැත්වෙන කටයුතු පිළිබඳ හා අධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතු පිළිබඳ ගාස්තු.

174. (1) මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට පැවැත්වෙන සියලුම කටයුතුවල දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාධාරණ යයි සැලකිය හැකි ගාස්තු යම් පාර්ශ්වකරුවකුට ප්‍රදානය කිරීමේ හා කවර පාර්ශ්වකරුවන් විසින් කවර පාර්ශ්වකරුවන්ට ඒ ගාස්තු ගෙවිය යුතු දැයි නියම කිරීමේ බලය මහු සතුව නිබිය යුතු ය ; තව ද ඒ නියමය අධිකරණයේ ගොනුකොට තැබිය හැකි අතර එතැන් පටන් ඒ නියමය අධිකරණයේ නියමයක් වූ විටක මෙන් බලාත්මක කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ අධිකරණයක් ඉදිරිපිට පැවැත්වෙන යම් නඩු කටයුතුවල දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගාස්තු ගෙවන ලෙස ආඥා නොකළ යුතු ය :

එසේ වුවද අධිකරණයේ අභිමතය පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවන ගාස්තු ගෙවන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.

XXXVI වන පරිච්ඡේදය

ලියාපදිංචි අනුයෝජිතයෝ

ලියාපදිංචි අනුයෝජිතයෝ.

175. (1) මෙම පනතේ සඳහන් අනුයෝජිතයා යන්නෙන්, මෙම පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ ලියාපදිංචි කළ අනුයෝජිතයෙක් අදහස් වේ.

(2) මෙම පනත යටතේ අනුයෝජිතයකු ලෙස ක්‍රියා කිරීමට හැකියාවක් ඇත්තේ සහ අනුයෝජිතයකු ලෙස ක්‍රියා කිරීමට නියි බලය ඇත්තේ මෙම පනතේ ලියාපදිංචි අනුයෝජිතයකුට පමණකි.

(3) යම් තැනැත්තෙක්–

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් සහ සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ වාසිකයකු වන්නේ නම් ; සහ

(ආ) (i) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වන්නේ නම් ; හෝ

(ii) නියමිත සුදුසුකම් දරන්නා වූ තැනැත්තකු වන්නේ නම්, සහ නියමිත ගාස්තුව ගෙවනු ලබන්නේ නම් ; සහ

(ඇ) නියමිත ගාස්තුව ගෙවනු ලබන්නේ නම් ;

ඒ තැනැත්තා අනුයෝජිතයකු ලෙස ඇතුළත් කරගෙන ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාගත ආයතනයක් හෝ ව්‍යාපාර ආයතනයක් විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ සංස්ථාවේ සියලු අධ්‍යක්ෂවරයන් හෝ ව්‍යාපාර ආයතනයේ සියලු හවුල්කරුවන් ලියාපදිංචි අනුයෝජිතයන් වන්නේ නම්, අනුයෝජිතයකු ලෙස කටයුතු කරනු ලැබිය හැකි ය.

(5) මෙම පනත යටතේ අනුයෝජිතයකුගේ ලියාපදිංචිය අවුරුදු තුනක කාලසීමාවක් සඳහා වලංගු වන අතර, නියමිත ගාස්තුවක් ගෙවීම මත අනුක්‍රමික අවුරුදු තුනක කාලයක් සඳහා අලුත් කරනු ලැබිය යුතු ය. එසේ වුව ද නියම කරනු ලැබිය හැකි අධිභාරයක් ගෙවීම මත, ලියාපදිංචිය අලුත් කිරීම සඳහා මාස හයක සහන කාලසීමාවක් දෙනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, යථාපරිදි පත් කරන ලද යම් අනුයෝජිතයකු විසින් මේ පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා, මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි වී නොමැතිවීම් නොතකා, තම සේවාදායකයන් නියෝජනය කරනු ලැබිය හැකි ය.

(7) මෙම පනතේ සඳහන් ඇටෝර්නි බලය යන්නෙන්, යථාපරිදි හෝ ලියා අත්සන් කරන ලද ඇටෝර්නි බලයක් හෝ ප්‍රධානියා විසින් යථාපරිදි අත්සන් තබන ලද අධිකාර බලය පැවරීමේ ලිපියක් හෝ අදහස් වන්නේ ය.

XXXVII වන පරිච්ඡේදය

අරමුදල

අරමුදල.

176. (1) මේ පනතේ කාර්ය සඳහා වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා විධාන කළ හැකි ආකාරයකින් පවත්වාගෙන යා යුතු අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කර ගනු ලබන සෑම ගාස්තුවකින් ම හෝ අයකිරීමකින් ම තුනෙන් දෙකොටසක් අරමුදලට ගෙවිය යුතු ය.

(3) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි, ඉටු කිරීමෙහි හා කිරීමෙහි ලා දරන ලද යම් වියදමක් පියවීම පිණිස අවශ්‍ය සියලුම මුදල් හා (1) වන උපවගන්තියේ සඳහන් අරමුදලින් ගෙවීමට මේ පනත මගින් හෝ ඒ යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් හෝ ඒ යටතේ හෝ නියම කර තිබෙන සියලුම මුදල් ඒ අරමුදලින් ගෙවිය යුතු ය.

(4) මේ පනත යටතේ නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින් ම හා අයකිරීමකින් ම (2) වන උපවගන්තියේ අරමුදලට ගෙවන මුදලින් ශේෂ වන තුනෙන් එක් කොටස ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(5) වෙළෙඳ ලකුණ භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් එක් එක් ලිත් වර්ෂය අවසාන වීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පිළියෙල කිරීම ද, එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් අරමුදල පිළිබඳව පූර්ණවූත්, උචිතවූත් ගිණුමක් පවත්වාගෙන යෑමට සැලැස්වීම ද කළ යුතු ය.

(6) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගණන් විගණනය කළ යුතු ය.

(7) අරමුදලේ ගිණුම් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

XXXVIII වන පරිච්ඡේදය

වැරදි සහ දණ්ඩන

යම් ලේඛනයක සටහන් වංක ලෙස වෙනස් කිරීම.

177. මේ පනත යටතේ තබා ඇති යම් ලේඛනයක, අසත්‍ය සටහනක් කරන හෝ කිරීමට සලස්වන හෝ එවැනි යම් ලේඛනයක වූ සටහනක පිටපතක් බවට ව්‍යාජ ලෙස හැඟවෙන යම් ලියවිල්ලක් කරන හෝ කිරීමට සලස්වන හෝ ඒ සටහන හෝ ලියවිල්ල අසත්‍ය බව දැනුවත්ව ඒ ලියවිල්ල සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන හෝ භාර දෙන හෝ ඉදිරිපත් කිරීමට හෝ භාර දීමට

යලස්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීම.

178. (1) මේ පනතේ II වන කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම්වලින් යම් අයිතිවාසිකමක් ඕනෑකමින්ම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද, දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ II වන කොටසේ විධිවිධාන උල්ලඝනය කරමින් සාදන ලද බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු ඇතිව, එවැනි පිටපත් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන්නා වූ හෝ විකිණීම, කුලියට දීම හෝ වෙළෙඳ කාර්යයක් සඳහා තමා සන්තකයේ තබා ගන්නා යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. තව ද දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන පරිගණක වැඩසටහනක් තමා සන්තකයේ තිබෙන බව හෝ තමාට ඒ වැඩසටහනකට ප්‍රවේශය තිබෙන බව දැනුවත්ව හෝ එසේ විශ්වාස කිරීමට හේතු ඇතිව ඒ වැඩසටහනක් චේතනාන්විතව වාණිජ ප්‍රතිලාභය පිණිස ප්‍රයෝජනයට ගන්නා වූ යම් තැනැත්තෙක්

වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) වරද කළේ යයි කියනු ලබන තැනැත්තා වරදකරු කරනු ලැබුව ද, නොලැබුව ද කෘතිවල උල්ලංඝනීය පිටපත් ලෙස මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන සහ ඒ තැනැත්තාගේ සන්තකයේ තිබෙන සියලු පිටපත් සහිත උල්ලංඝනය කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලු උපකරණ හෝ උල්ලංඝනීය පිටපත් සෑදීමේ කාර්යය සඳහා වූ තහඩු ලෙස මහෙස්ත්‍රාතවරයාට පෙනී යන සහ ඒ තැනැත්තා සන්තකයේ තිබෙන සියලු තහඩු විනාශ කරන ලෙස හෝ අයිතිවාසිකම් හිමියාට දෙන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා සුදුසු යයි අදහස් කරන ආකාරයකින් ඒ පිළිබඳව ක්‍රියා කරන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

කාර්මික සැලසුම් උල්ලංඝනය කිරීම.

179. කාර්මික සැලසුමක යම් ලියාපදිංචි හිමියකුගේ, පාවාදීම්ලාභියකුගේ හෝ බලපත්‍රලාභියකුගේ අයිතිවාසිකම් ඕනෑකමින්ම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

කාර්මික සැලසුම පිළිබඳව අසත්‍ය කරුණු දැක්වීම.

180. (1) (අ) ලියාපදිංචි කාර්මික සැලසුමක් නොවන කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කාර්මික සැලසුමක් බවට ;

(ආ) යම් නිෂ්පාදිත සම්බන්ධයෙන් ලියාපදිංචි නොකරන ලද ලියාපදිංචි කාර්මික සැලසුමක් ඒ නිෂ්පාදිතය සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුමක් බවට ; හෝ

(ඇ) ලේඛනයේ සටහන් කරන ලද සීමාකිරීම් සැලකිල්ලට ගත් කල, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීමෙන් ඒ කාර්මික සැලසුම පාවිච්චි කිරීමේ පරම අයිතිවාසිකම නොලැබෙන යම් අවස්ථාවල දී එය පාවිච්චි කිරීමේ දී ඒ පරම අයිතිවාසිකම ඒ ලියාපදිංචි කිරීමෙන් ලැබෙන බවට,

කාර්මික හෝ වාණිජ කාර්ය සඳහා, කරුණු දක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් "ලියාපදිංචි" යන වචනය හෝ ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කර ඇති බව ප්‍රකාශ කෙරෙන හෝ හඟවන යම් වචනයක් හෝ වචන භාවිත කළහොත්, ඒ පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කර ඇති බවට ඔහු කරුණු දක්වන බව සැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර උල්ලංඝනය කිරීම.

181. යම් පේටන්ට් බලපත්‍රයක ලියාපදිංචි අයිතිකරුගේ, පාවිච්චිලාභියකුගේ හෝ බලපත්‍රලාභියකුගේ අයිතිවාසිකම් චේතනාන්විතව උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. දෙවැනිවරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විටක ඒ දඩය හෝ බන්ධනාගාරගත කරනු ලබන කාලය හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

පේටන්ට් බලපත්‍ර සම්බන්ධයෙන් සාවද්‍ය නියෝජනය.

182. (1) කාර්මික හෝ වාණිජ කාර්ය සඳහා –

(අ) ලියාපදිංචි පේටන්ට් බලපත්‍රයක් නොවන පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන්, එය ලියාපදිංචි බලපත්‍රයක් බවට නියෝජනය කරන ;

(ආ) පේටන්ට් බලපත්‍රයක ලියාපදිංචිය යම් නිෂ්පාදිතයක් හෝ ක්‍රියාවලියක් සම්බන්ධයෙන් කර නොමැතිව තිබිය දී ඒ ලියාපදිංචි පේටන්ට් බලපත්‍රය ඒ නිෂ්පාදිතය හෝ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ලියාපදිංචි කර තිබෙන බවට නියෝජනය කරන ;

(ඇ) පේටන්ට් බලපත්‍රයක් ලියාපදිංචි කිරීමේ දී ලේඛනයෙහි සටහන් කර තිබෙන සීමාකිරීම් සැලකිල්ලට ගන්නා විට, යම් අවස්ථාගත තත්ත්වයක දී එය පාවිච්චි කිරීමේ පරම අයිතිවාසිකමක් ඊට නොලැබෙන විටක, ඒ පරම අයිතිවාසිකමක් එහි ලියාපදිංචියෙන් එයට ලැබෙන බවට නියෝජනයක් කරන,

යම් තැනැත්තෙක් වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් පේටන්ට් බලපත්‍රයක් හෝ සම්බන්ධව, "ලියාපදිංචි" යන වචනය යොදා ඇත්නම් හෝ ඒ පේටන්ට් බලපත්‍රය සඳහා ලියාපදිංචි කිරීම ලබාගෙන තිබෙන බව ප්‍රකාශවන හෝ ව්‍යංජිතවන යම් වචනයක් හෝ වචන යොදා ඇත්නම්, ඒ තැනැත්තා, පේටන්ට් බලපත්‍රයක් ලියාපදිංචි වී ඇති බව නියෝජනය කරන සේ සැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු නීති විරෝධ ලෙස අනාවරණය කිරීම.

183. ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවා නියුක්තියේ යෙදී සිටින හෝ සිටි යම් තැනැත්තකු විසින්, ඒ කාර්යාලයේ හෝ ඔහුගේ සේවා නියුක්ති කාලය අතරතුර, පේටන්ට් බලපත්‍රවලට හෝ ඊට සම්බන්ධ කාරණාවලට අදාළව ඔහු ලබාගත් යම් තොරතුරක්, ඒ තොරතුරු ලබාගැනීමට හිමිකම් නොමැති හෝ බලය ලැබී නොමැති යම් තැනැත්තකුට දැන්වුවහොත් හෝ ඒ

තොරතුරු මහජනයාට අනාවරණය කළහොත්, හෝ ඒ තොරතුරු වෙනත් යම් නීති විරෝධී ප්‍රයෝජනයකට යෙදවුවහොත්, ඔහු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පත් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ලකුණු උල්ලංඝනය කිරීම.

184. ලකුණක යම් ලියාපදිංචි හිමියකුගේ, පාවාදීම්ලාභියකුගේ හෝ බලපත්‍රලාභියකුගේ අයිතිවාසිකම් ඕනෑකමින්ම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පත් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද, දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

වෙළෙඳ ලකුණු පිළිබඳව අසත්‍ය කරුණු දැක්වීම.

185. (1) (අ) ලියාපදිංචි ලකුණක් නොවන ලකුණක් සම්බන්ධයෙන්, ඒ ලකුණ ලියාපදිංචි ලකුණක් බවට ;

(ආ) යම් හාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි නොකරන ලද ලියාපදිංචි ලකුණක් ඒ හාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද ලකුණක් බවට ; හෝ

(ඇ) ලේඛනයේ සටහන් කරන ලද සීමාකිරීම් සැලකිල්ලට ගත් කල, ලකුණ පාවිච්චි කිරීමෙන් ඒ ලකුණ පාවිච්චි කිරීමේ පරම අයිතිවාසිකම නොලැබෙන යම් අවස්ථාවල දී, එය පාවිච්චි කිරීමේ පරම අයිතිවාසිකම ඒ ලියාපදිංචි කිරීමෙන් ලැබෙන බවට,

කාර්මික හෝ වාණිජ කාර්යයක් සඳහා, කරුණු දක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට,

රුපියල් පන් ලක්ෂයක් නොඉක්මන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ලකුණක් සම්බන්ධයෙන් "ලියාපදිංචි" යන වචනය හෝ ඒ ලකුණ ලියාපදිංචි කර ඇති බව ප්‍රකාශ කෙරෙන හෝ හඟවන යම් වචනයක් හෝ වචන භාවිත කළහොත් ඒ ලකුණ ලියාපදිංචි කර ඇති බවට ඔහු කරුණු දක්වන බව පැලකිය යුතු ය.

ලකුණු හා වෙළෙඳ විස්තර පිළිබඳ වෙනත් වැරදි.

186. (1) (අ) යම් ලකුණක් කුට ලෙස සාදන ; හෝ

(ආ) නොමඟ යැවීමට ඉඩ ඇති තරම් ලියාපදිංචි ලකුණකට සමාන පෙනුමක් තිබෙන යම් ලකුණක් හෝ ලකුණු භාණ්ඩවලට ව්‍යාජ ලෙස යොදන ; හෝ

(ඇ) ලකුණක් කුට ලෙස සෑදීමේ කාර්යය සඳහා හෝ ලකුණක් කුට ලෙස සෑදීම පිණිස උපයෝගී කර ගැනීමේ කාර්යය සඳහා යම් ඩයි වර්ගයක්, මුද්‍රාවක්, අච්චුවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් සාදන ; හෝ

(ඈ) යම් ව්‍යාජ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට යොදන ;

(ඉ) ලකුණක් කුට ලෙස සෑදීමේ කාර්යය සඳහා යම් ඩයි වර්ගයක්, මුද්‍රාවක්, අච්චුවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් විකුණා හෝ හම සන්හකයෙහි තබාගන්නා ; හෝ

(ඊ) මේ උපවගන්තියේ ඉහත සඳහන් දේවල් අතුරින් යමක් කිරීමට සලස්වන,

යම් තැනැත්තෙක්, වංචා කිරීමේ චේතනාවෙන් තමා ක්‍රියා නොකළ බව ඔප්පු කළහොත් හැර, මේ කොටසේ විධිවිධානවලට යටත්ව, වරදක් කරන්නේ ය.

(2) අවස්ථාවෝචිත පරිදි, යම් කුට ලකුණක් හෝ ව්‍යාජ වෙළෙඳ විස්තරයක් යොදන ලද හෝ නොමඟ යැවීමට ඉඩ ඇති තරම් ලියාපදිංචි ලකුණකට සමාන පෙනුමක් තිබෙන යම් ලකුණක් ව්‍යාජ ලෙස යොදන ලද යම් භාණ්ඩ හෝ දේපළ විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තබන හෝ විකිණීම සඳහා තම සන්තකයේ තබාගෙන සිටින හෝ යම් වෙළෙඳ හෝ නිෂ්පාදන කාර්යයක් සඳහා විකුණන, ප්‍රදර්ශනය කර තබන හෝ තමා සන්තකයේ තබා ගෙන සිටින යම් තැනැත්තකු විසින් –

(අ) කරන ලදැයි කියනු ලබන වරද කරනු ලැබූ වේලාවේ දී ලකුණේ හෝ වෙළෙඳ විස්තරයේ නිර්ව්‍යාජභාවය ගැන සැක කිරීමට තරම් කිසි හේතුවක්, වරදක් කිරීම වැළැක්වීම පිණිස සියලු සාධාරණ පූර්වෝපායයක් යෙදීම නිසා තමාට නොතිබුණු බව ; සහ

(ආ) තමා ඒ භාණ්ඩ හෝ දේවල් ලබාගත්තේ යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් තමා විසින් සපයනු ලැබිය හැකිව තිබූ සියලු තොරතුරු චෝදක විසින් හෝ වෙනුවෙන් කරන ලද ඉල්ලීමක් අනුව සැපයූ බව ; හෝ

(ඇ) වෙනත් කරුණු අනුව තමා නිර්දෝෂී ලෙස ක්‍රියා කර ඇති බව,

ඔප්පු කරනු ලැබුවහොත් හැර, මහු වරදක් කරන්නේ ය.

(3) ශ්‍රී ලංකා දේශසීමාවලින් පිටත නිෂ්පාදනය කරනු ලැබූ සහ සාමාන්‍යයෙන් දිග ප්‍රමාණය අනුව හෝ කැලි වශයෙන් හෝ විකුණනු ලබන යම් කැලි භාණ්ඩ ආනයනය කරන යම් තැනත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ දේශසීමා ඇතුළත හෝ දේශසීමාවලින් පිටත හෝ සාදනු ලැබූ සහ සාමාන්‍යයෙන් ඉහත කී පරිදි විකුණනු ලබන සහ එක් එක් කැල්ලේ නියම දිග ප්‍රමාණය අනුව, එකී දිග ප්‍රමාණය සම්මත මීටරවලින් හෝ සම්මත මීටරවලින් සහ ඒ මීටරයක භාගයකින් ඒ එක් එක් කැල්ලේ ප්‍රකටව පෙනෙන ලෙස ඉංග්‍රීසි ඉලක්කම්වලින් මුද්‍රණය කරනු ලැබ නොමැති යම් කැලි භාණ්ඩ හෝ විකුණන හෝ විකිණීම

සඳහා ප්‍රදර්ශනය කර තබන හෝ විකිණීම සඳහා තම සන්තකයේ තබා ගෙන සිටින හෝ යම් වෙළෙඳ හෝ නිෂ්පාදන කාර්යයන් සඳහා විකුණන, ප්‍රදර්ශනය කර තබන හෝ තම සන්තකයේ තබා ගෙන සිටින යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය :

එසේ වුව ද, ශ්‍රී ලංකා දේශසීමා ඇතුළත දී දැනේ ශ්‍රමයෙන් පමණක් සාදනු ලබන යම් කෑලි භාණ්ඩවලට මේ උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වරදක් කළ යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. තව ද, දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

(5) වරද කළැයි කියනු ලබන තැනැත්තා වරදකරු කරනු ලැබුව ද නොලැබුව ද, වරද කර ඇත්තේ හෝ කළ හැකිව තිබුණේ යම් බඩු බාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ උපයෝගී කොටගෙන ද ඒ බඩුබාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ වරද කර ඇත්තේ හෝ කළ හැකිව තිබුණේ යම් බඩුබාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ සම්බන්ධයෙන් ද ඒ බඩුබාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ විනාශ කරන ලෙස හෝ රාජ්‍ය සන්තක බව ප්‍රකාශ කරන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි අදහස් කරන ආකාරයකින් ඒ පිළිබඳව ක්‍රියා කරන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

සංස්ථා විසින් කරනු ලබන වැරදි.

187. මේ පනත යටතේ වරදක් සංස්ථාවක් විසින් කරනු ලැබ ඇති අවස්ථාවක, වරද කරනු ලැබූ වේලාවේ දී සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරිවරයකු, ලේකම්වරයකු වූ හෝ සංස්ථාවේ වෙනත් එවැනි නිලධරයකු වූ ඒ වරද තමාගේ කැමැත්ත

හෝ අපයහායකත්වය නොමැතිව සිදු කර ඇති බව ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා විසින් ක්‍රියා කළ යුතුව තිබූ ක්‍රියා නිසි අතලස්භාවයෙන් යුතුව තමා කළ බවත් ඔහු ඔප්පු කළහොත් හැර, ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

188. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, 101 වන වගන්තියේ ඇතුළත් අර්ථකථනය මේ කොටසේ කාර්ය සඳහා අදාළ විය යුතු ය.

ව්‍යාජ නම් හෝ මුල් අකුරු.

189. (1) භාණ්ඩවලට ව්‍යාජ වෙළෙඳ විස්තරයක් යෙදීම සම්බන්ධයෙන් වූ හෝ ව්‍යාජ වෙළෙඳ විස්තරයක් යොදනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් වූ හෝ මේ කොටසේ විටිවිධාන –

(අ) යම් භාණ්ඩ ඇත්ත වශයෙන්ම යම් තැනැත්තකු විසින් සාදන ලද දේ හෝ වෙළෙඳ බඩු වුව ද, ඒවා වෙනත් තැනැත්තකු විසින් සාදන ලද දේ හෝ ඔහුගේ වෙළෙඳ බඩු බව තැනැත්තන්ට විශ්වාස කිරීමට ඉඩ ඇති පරිදි ලියාපදිංචි ලකුණක් ඇතුළත් වන හෝ නොවන යම් ඉලක්කම්, වචන හෝ ලකුණු හෝ ඒවායේ පිළියෙල කිරීමක්, සංයෝජනයක් හෝ සංයෝගයක් ඒ භාණ්ඩවලට යෙදීම පිළිබඳව ව්‍යාප්ත විය යුතු ය ;

(ආ) යම් තැනැත්තකුගේ ව්‍යාජ නමක් හෝ මුල් අකුරු යම් භාණ්ඩවලට යෙදීම පිළිබඳව ද තැනැත්තකුගේ ව්‍යාජ නමක් හෝ මුල් අකුරු වෙළෙඳ විස්තරයක ආකාරයෙන් යොදන ලද භාණ්ඩවලට ද ව්‍යාප්ත විය යුතු ය.

(2) තව ද, මේ කොටසේ කාර්ය සඳහා, "ව්‍යාජ නමක් හෝ මුල් අකුරු" යන යෙදුමෙන්, යම් භාණ්ඩවලට යොදන ලද,–

(i) ලකුණක් හෝ ලකුණක කොටසක් නොවන ; සහ

(ii) එකම විස්තරයකට අයත් භාණ්ඩ සම්බන්ධයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නා වූ ද, ස්වකීය නම් හෝ මුල් අකුරු භාවිත කිරීමට බලය පවරා නැත්තා වූ ද

තැනැත්තෑගේ නමට හෝ මුල් අකුරුවලට සමාන හෝ ඒ නමෙහි හෝ මුල් අකුරුවල ව්‍යාජ අනුකරණයක් වන ; සහ

(iii) අඟත තැනැත්තකුගේ හෝ ඒ භාණ්ඩ සම්බන්ධයෙන් නිර්ව්‍යාජ ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන නොයන යම් තැනැත්තකුගේ හෝ යම් නමක් හෝ මුල් අකුරු වන,

යම් තැනැත්තකුගේ යම් නමක් හෝ මුල් අකුරු අදහස් වේ.

(3) යම් වෙළෙඳ විස්තරයක් යොදනු ලැබූ යම් භාණ්ඩවල ඇති නියම මීටර් ගණනට හෝ සම්මත මීටර් ගණනට වැඩි මීටර් හෝ සම්මත මීටර් ගණනක් ඒ භාණ්ඩවල අඩංගුව ඇති බව ඒ වෙළෙඳ විස්තරයෙන් දක්වන හෝ හඟවන විට එය ව්‍යාජ වෙළෙඳ විස්තරයක් වන්නේ ය.

කූට ලකුණු සැදීම.

190. (අ) යම් ලකුණක හිමියාගේ අනුමතය නොමැතිව, ඒ ලකුණු සාදන හෝ නොමඟ යැවීමට ඉඩ ඇති තරම් ඒ ලකුණට සමාන පෙනුමක් ඇති ලකුණක් සාදන ; හෝ

(ආ) යම් නිර්ව්‍යාජ ලකුණක් අමුතු කිරීමෙන්, යමක් එකතු කිරීමෙන්, මැකීමෙන් හෝ අන්‍යාකාරයකින් එය වංක ලෙස වෙනස් කරන,

තැනැත්තකු ලකුණක් කූට ලෙස සෑදූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේ සාදන ලද හෝ වංක ලෙස වෙනස් කරන ලද යම් ලකුණක් කූට ලකුණක් ලෙස මේ කොටසේ සඳහන් කරනු ලැබේ :

එසේ වුව ද, ලකුණක් කූට ලෙස සෑදීම සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමක දී, හිමියාගේ අනුමතය ලබා ගත් බව ඔප්පු කිරීම වුදිතයා විසින් කළ යුතු ය.

191. (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ ; අසත්‍ය ප්‍රකාශ වරදක් වීම.

(ආ) 'ලංකා තේ' සහ ලංකා කුරුඳු යන්න ඇතුළත්ව භූගෝලීය දර්ශක සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් කරන්නා වූ,

යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

192. (1) (අ) යම් වෙළෙඳ ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට ම යොදන ; හෝ ලකුණු සහ විස්තර යෙදීම.

(ආ) භාණ්ඩ විකිණීමේ දී හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තැබීමේ දී නැතහොත් විකිණීම, වෙළෙඳාම හෝ සැදීම පිළිබඳ යම් කාර්යයක් සඳහා තම සන්තකයෙහි තබා ගැනීමේ දී, ඒ භාණ්ඩ බහාලනු ලැබ තිබූ හෝ ඒවා සමඟ වූ යම් ආවරණයකට, ලේබලයකට, බීරළුවකට හෝ වෙනත් දෙයකට යම් ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් යොදන ; හෝ

(ඇ) විකුණනු ලබන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තබන හෝ විකිණීම, වෙළෙඳාම හෝ සැදීම පිළිබඳ යම් කාර්යයක් සඳහා තම සන්තකයෙහි ඇති භාණ්ඩ, ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් යොදනු ලැබූ යම් ආවරණයක්, ලේබලයක්, බීරළුවක් හෝ වෙනත් දෙයක් තුළ තබන, ඊට ඇතුළත් කරන හෝ ඒ සමඟ අමුණන ; හෝ

(ඈ) යම් ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් පාවිච්චි කරනු ලබන්නේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ ඒ ලකුණෙන්

හෝ වෙළෙඳ විස්තරයෙන් දක්වන බව හෝ විස්තර කරන බව විශ්වාස කිරීමට ඉඩ ඇති යම් ආකාරයකින් ඒ ලකුණ හෝ වෙළෙඳ විස්තරය පාවිච්චි කරන,

යම් නැනැත්තකු ඒ ලකුණ හෝ වෙළෙඳ විස්තරය ඒ භාණ්ඩවලට යොදා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 'ආවරණය' යන යෙදුමට යම් ආවරණයක්, පීප්පයක්, බෝතලයක්, භාජනයක්, පෙට්ටියක්, වැස්මක්, කෝෂයක්, කොපුවක්, රාමුවක් හෝ දවටනයක් ඇතුළත් වන අතර 'ලේබලය' යන යෙදුමට යම් පටියක් හෝ සිට්ටුවක් ඇතුළත් වේ.

(3) ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට හෝ යම් ආවරණයකට, ලේබලයකට, බීරළුවකට හෝ වෙනත් දෙයකට ගොතා, ඔබ්බවා, මුද්‍රා තබා, ඇණ ගසා හෝ වෙනත් ආකාරයකින් නිර්මාණය කොට හෝ අමුණා හෝ සවිකොට තිබුණ ද, ඒ ලකුණ හෝ වෙළෙඳ විස්තරය ඊට යොදා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ලකුණක හිමියාගේ අනුමතය නොමැතිව ඒ ලකුණ හෝ නොමග යැවීමට ඉඩ ඇති තරම් ඒ ලකුණට සමාන පෙනුමක් ඇති යම් ලකුණක් හෝ යොදන තැනැත්තකු භාණ්ඩවලට ලකුණක් ව්‍යාජ ලෙස යෙදූ ලෙස සලකනු ලැබිය යුතු අතර, භාණ්ඩවලට ලකුණක් ව්‍යාජ ලෙස යෙදීම සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමක දී, හිමියාගේ අනුමතය ලබාගත් බව ඔප්පු කිරීම චුදිතයා විසින් කළ යුතු ය.

සාමාන්‍ය කටයුතුවල නියුක්ත ඇතැම් තැනැත්තන් නිදහස් කිරීම.

193. ලකුණක් කුට ලෙස යෑදීමේ කාර්යය සඳහා හෝ කුට ලෙස යෑදීම පිණිස උපයෝගී කර ගැනීමේ කාර්යය සඳහා යම් ඩයි වර්ගයක්, මුද්‍රාවක්, අච්චුවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් හෝ නොමග යැවීමට ඉඩ ඇති තරම් ලකුණකට සමාන පෙනුමක් ඇති, යම් ලකුණක් භාණ්ඩවලට ව්‍යාජ ලෙස යොදන ලද බවට හෝ යම් ව්‍යාජ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට

යොදන ලද බවට හෝ මේ වගන්තියේ සඳහන් දේවලින් යමක් කිරීමට සලස්වන ලද බවට තැනැත්තකුට චෝදනා නගනු ලැබ ඇති අවස්ථාවක,-

(අ) ලකුණු සෑදීම සඳහා හෝ ලකුණු සෑදීමේ දී පාවිච්චි කිරීම සඳහා ඩයි වර්ග, මුද්‍රා, අච්චු, යන්ත්‍ර හෝ වෙනත් උපකරණ සෑදීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි, භාණ්ඩවල ලකුණු හෝ විස්තර යෙදීම පිණිස තම සාමාන්‍ය කටයුතු වශයෙන් වෙනත් තැනැත්තන් වෙනුවෙන් තමා සේවයේ නියුක්තව සිටින බව හා චෝදනාවට විෂය වූ කාරණයෙහි දී තමා ශ්‍රී ලංකාවෙහි වාසික යම් තැනැත්තකු විසින් තමා එසේ සේවයේ නියුක්ත කරනු ලැබූ බව හා ඒ භාණ්ඩ විකිණීම මත රඳා පවත්නා ලාභ හෝ කොමිස් මුදල් ලැබීමේ අපේක්ෂාවෙන් ඒ භාණ්ඩ විෂයයෙහි තමාට සම්බන්ධතාවක් නොමැති බව ; සහ

(ආ) චෝදිත වරද කිරීම වැළැක්වීම පිණිස තමා සාධාරණ පූර්වෝපායයන් යෙදූ බව ; හෝ

(ඇ) කරන ලදැයි කියනු ලබන වරද කරනු ලැබූ වේලාවේ දී ලකුණේ හෝ වෙළෙඳ විස්තරයේ නීර්ව්‍යාජත්වය ගැන සැක කිරීමට තමාට කිසිම හේතුවක් නොතිබුණු බව ; සහ

(ඈ) ලකුණ හෝ වෙළෙඳ විස්තරය යොදන ලද්දේ යම් තැනැත්තකු වෙනුවෙන් ද, ඒ තැනැත්තා සම්බන්ධයෙන් තමා විසින් සපයනු ලැබිය හැකිව තිබූ සියලුම තොරතුරු තමා චෝදකට සැපයූ බව,

ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඔහු චෝදනාවෙන් නිදහස් කළ යුතු ය. එහෙත් ඔහු ඉහත කී විත්තිවාචකයේ පිහිට පතන බව චෝදක වෙත විධිමත් ලෙස දැනුම් දී නිබුණහොත් හැර චෝදක විසින් දරන ලද වියදම් ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

ලකුණ උත්තරවාදයක විස්තර කළ යුතු ආකාරය.

194. යම් ලකුණක් හෝ කුට ලෙස සාදන ලද ලකුණක් ගැන සඳහන් කරනු ලැබීමට අදහස් කෙරෙන යම් අධිචෝදනාවක, චෝදනාවක, නඩු කටයුත්තක හෝ ලේඛනයක වැඩි විස්තරයක් හා යම් පිටපතක් හෝ ප්‍රතිකෘතියක් ඇතුළත් නොකර ඒ ලකුණ හෝ කුට ලෙස සාදන ලද ලකුණ, ලකුණක් හෝ කුට ලෙස සාදන ලද ලකුණක් ලෙස එහි සඳහන් කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

සාක්ෂි පිළිබඳ රීති.

195. මේ කොටස යටතේ කරන ලද චරදක් සඳහා වූ යම් නඩු පැවරීමක දී-

(අ) චුදිතයා ද සුදුසු යයි චුදිතයා අදහස් කරන්නේ නම්, අවස්ථාචෝචිත පරිදි, ඔහුගේ භාර්යාව හෝ ඇගේ සැමියා සාක්ෂිකරුවකු ලෙස කැඳවනු ලැබිය හැකි අතර එසේ කැඳවනු ලැබුවහොත් වෙනත් යම් සාක්ෂිකරුවකු මෙන් ම, දිවුරවා චුදිතයාගෙන් සහ අවස්ථාචෝචිත පරිදි, ස්වාම්පුරුෂයාගෙන් හෝ භාර්යාවගෙන් ප්‍රශ්න කළයුතු අතර හරස් ප්‍රශ්න ඇසීම සහ නැවත ප්‍රශ්න ඇසීම ද කරනු ලැබිය හැකි ය ;

(ආ) ආනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් වූ විටක, භාණ්ඩ නැවිගත කළ වරාය හෙළි කරන සාක්ෂි, භාණ්ඩ සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද ස්ථානය හෝ රට හෙළි කෙරෙන සාක්ෂි ලෙස මුල් බැල්මට සැලකිය යුතු ය.

අපසහායකයන්ට දඩුවම් කිරීම.

196. ශ්‍රී ලංකාව ඇතුළත දී කරනු ලැබුවහොත් මේ කොටස යටතේ චරදක් වන යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී කිරීමට ශ්‍රී ලංකාව තුළ සිට අනුබල දෙන යම් තැනැත්තකු ඒ චරද කළ ලෙස සලකනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාව තුළ ඔහු වෙසෙන කවර හෝ දිස්ත්‍රික්කයක දී හෝ ස්ථානයක දී ඒ චරද කරනු ලැබූ විටක මෙන් ඒ දිස්ත්‍රික්කයේ දී හෝ ස්ථානයේ දී ඔහුට විරුද්ධ ව අධිචෝදනා කිරීමට, නඩු පැවරීමට, නඩු විභාගයක් පැවැත්වීමට හා චරදකරු කිරීමට ඔහු යටත් විය යුතු ය.

මෙම වගන්තියේ කාර්ය සඳහා "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 101 වන වගන්තියේ දී ඇති අර්ථයම ඇත්තේ ය.

සෝදිසි වරෙන්තු.

197. (1) (අ) මේ කොටස යටතේ වූ වරදක් පිළිබඳව ලැබුණු තොරතුරක් අනුව, මහෙස්ත්‍රාත්වරයකු විසින්, ඒ තොරතුර මගින් චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාට තමන් ඉදිරියේ පෙනී සිට ඊට උත්තර දෙන ලෙස නියම කෙරෙන සිතාසියක් හෝ ඒ තැනැත්තා එසේ පෙනී සිටීම පැහැර හරින ලද අවස්ථාවක ඒ තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කළ හැකි ය ;

(ආ) ඒ වරද කිරීමට උපයෝගී කරගනු ලැබූ භාණ්ඩ හෝ දේ හෝ ඒ වරද කරනු ලැබුවේ යම් භාණ්ඩ හෝ දේ සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ හෝ දේ ඒ තොරතුරු අනුව චෝදනා නගනු ලැබූ තැනැත්තාගේ යම් නිවසක හෝ ස්ථානයක තිබෙන බව තැතහොත් යම් තැනක මහුගේ සන්තකයේ හෝ මහුගේ පාලනයට යටත්ව තිබෙන බව සැක කිරීමට සාධාරණ හේතුවක් තිබෙන බවට දිවුරුම් පිට සපයන ලද තොරතුරකින් එකී මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් තම අත්සනින් යුතුව වරෙන්තුවක් නිකුත් කළ හැකි ය ;

(ඇ) යම් පොලිස් නිලධරයකු විසින් හෝ වරෙන්තුවේ සඳහන් හෝ තම් කොට ඇති වෙනත් තැනැත්තකු විසින් හෝ දිවා කාලයෙහි යම් සාධාරණ වේලාවක ඒ නිවසට, ස්ථානයට හෝ තැනට ඇතුළු වී ඒ භාණ්ඩ හෝ දේ සොයා ගෙන ඒවා තහනමට ගෙන ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය. තව ද එවැනි යම් වරෙන්තුවක් යටතේ තහනමට ගත් භාණ්ඩ හෝ දේ කිසිවක් මේ කොටස යටතේ රාජ්‍ය සන්තක කිරීමට යටත් වේ ද, නොවේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒවා මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) භාණ්ඩ හෝ දේ කිසිවක හිමියා වරදකරු කරනු ලැබූ විටක, මේ කොටස යටතේ රාජ්‍ය සන්තක කිරීමට යටත්වන ඒ භාණ්ඩවල හෝ

දේවල හිමියා කවරකුදැයි දැන නොසිටි නම් හෝ ඔහු සොයා ගත නොහැකි නම්, හුදෙක් ඒ රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා තොරතුරු සැපයිය හැකි ය; නැතහොත් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ය. දැන්වීමෙහි සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී පටහැනි හේතු දැක්වුවහොත් හැර, ඒ භාණ්ඩ හෝ දේ රාජ්‍ය සන්තක කරනු ලැබීමට පටහැනි හේතු දක්වන්නා ලෙස නියම කරමින් මහෙස්ත්‍රාත්වරයා විසින් දැන්වීමක් පළ කිරීමට සැලැස්විය හැකි ය ;

(ආ) ඒ වේලාවේ දී සහ ඒ ස්ථානයේ දී, හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙන යම් නැනැත්තකු විසින් හෝ භාණ්ඩ හෝ දේ විෂයයෙහි සම්බන්ධතාවක් ඇති වෙන යම් නැනැත්තකු විසින් හෝ ප්‍රමාණවත් පටහැනි හේතු දක්වනු ලැබුවහොත් හැර, ඒ භාණ්ඩ හෝ දේ හෝ ඉන් කිසිවක් රාජ්‍ය සන්තක කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ හැකි අතර එවැනි සෑම ආඥාවක් ම අභියාචනයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ හෝ මේ කොටසේ වෙනත් යම් විධිවිධාන යටතේ රාජ්‍ය සන්තක කරන ලද භාණ්ඩ හෝ දේ විනාශ කරනු ලැබිය නැකි ය ; නැතහොත් ඒවා රාජ්‍ය සන්තක කිරීමට නියෝගකළ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ආකාරයකින් බැහැර කරනු ලැබිය හැකි ය. (සියලු ලකුණු හා වෙළෙඳ විස්තර මකා දැමීමෙන් පසු) ඒ භාණ්ඩ එසේ බැහැර කිරීමෙන් ලබාගන්නා මුදලින්, ඒ භාණ්ඩ පිළිබඳව කටයුතු කිරීමේ දී යම් නිර්දෝෂී පාර්ශ්වකරුවකුට සිදු වී ඇති පාඩුවක් වෙනුවෙන් ඒ පාර්ශ්වකරුට මහෙස්ත්‍රාත්වරයා විසින් කවර හෝ ප්‍රදානයක් කළ හැකි ය.

චිත්තියේ සහ පැමිණිල්ලේ නඩු ගාස්තු.

198. මේ කොටස යටතේ වූ යම් නඩු පැවරීමක දී පිළිවෙලින් වුදිතයා විසින් හා පැමිණිලිකරු විසින් සපයන ලද තොරතුරුවලටත්, වුදිතයාගේ සහ පැමිණිලිකරුගේ පැවැත්මටත් අධිකරණය විසින් සැලකිල්ල දක්වා, පැමිණිලිකරු විසින් වුදිතයාට

නැතහොත් වුදිතයා විසින් පැමිණිලිකරුට ගාස්තු ගෙවිය යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකි අන෴ එසේ ප්‍රදානය කරනු ලබන ඒ මුදල දඩයක් වූ විටක මෙන් අයකරගත හැකි විය යුතු ය.

ව්‍යාජ විස්තර පිළිබඳ විධිවිධාන ඇතැම් අවස්ථාවල දී අදාළ නොවීම.

199. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භයේ දී විශේෂ පන්තියක හාණ්ඩවල හෝ විශේෂ ක්‍රමයකින් සාදනු ලබන හාණ්ඩවල ද විශේෂ නිශ්චිත පන්තිය හෝ ඒ විශේෂ සෑදීමේ ක්‍රමය දැක්වීම පිණිස වෙළෙඳ විස්තරයක් ඒ හාණ්ඩවලට නීත්‍යානුකූලවත් සාමාන්‍ය ලෙසත් යොදනු ලබන අවස්ථාවක, ඒ වෙළෙඳ විස්තරය එසේ යොදනු ලැබූ විට, මේ කොටසේ ව්‍යාජ වෙළෙඳ විස්තරවලට අදාළ විධිවිධාන ඊට අදාළ නොවිය යුතු ය :

එසේ වුව ද, ඒ වෙළෙඳ විස්තරයට ස්ථානයක හෝ රටක නම ඇතුළත් වූ ද, එය යොදන ලද හාණ්ඩ ඇත්ත වශයෙන් සෑදූ හෝ නිෂ්පාදනය කළ ස්ථානය හෝ රට පිළිබඳව නොමග යැවීමක් කළ හැකි වූ ද, ඇත්ත වශයෙන් ඒ ස්ථානයෙහි හෝ රටෙහි හාණ්ඩ සෑදීම හෝ නිෂ්පාදනය කිරීම නොකරන ලද්දා වූ ද අවස්ථාවක, ඒ ස්ථානයෙහි හෝ රටෙහි නමට පෙරාතුව ම හෝ ඉක්බිතිව ම ඇත්ත වශයෙන් හාණ්ඩ සෑදූ හෝ නිෂ්පාදනය කළ ස්ථානයෙහි හෝ රටෙහි නම, අනෙක් රටේ නමක් සමඟ ඒ වෙළෙඳ විස්තරය ලෙස ම ප්‍රකට ව පෙනෙන ආකාරයකින්, ඒ හාණ්ඩ එහි සෑදූ හෝ නිෂ්පාදනය කළ බවට ප්‍රකාශයක් ද සහිතව වෙළෙඳ විස්තරයට එකතු කරනු ලැබුවහොත් හැර, මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

ආරක්ෂා කිරීම.

200. (1) මේ කොටසේ විධිවිධාන නිසා නොවේ නම්, යම් තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කළ හැකි වන යම් නඩුවකින්, සිවිල් නඩුවකින් හෝ වෙනත් නඩු කටයුත්තකින්, ඒ තැනැත්තා මේ කොටසේ විධිවිධාන නිසා නිදහස් නොවිය යුතු ය.

(2) යම් නඩුවක දී සම්පූර්ණ අනාවරණයක් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ යම් ප්‍රශ්නයකට හෝ ප්‍රශ්නාවලියකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමට මේ කොටසේ අන්තර්ගත කිසිවකින් කිසි තැනැත්තකුට හිමිකම් නොලැබෙන නමුත්, මේ කොටස යටතේ

වෙනත් යම් වරදක් සම්බන්ධ නඩු පැවරීමක දී ඒ අනාවරණය හෝ පිළිතුර ඒ තැනැත්තාට එරෙහිව සාක්ෂියක් ලෙස ආවේශ්‍ය කරගත නොහැකි විය යුතු ය.

(3) චෝදකයකු විසින් හෝ වෙනුවෙන් ඉල්ලා සිටි විටක, යම් ස්වාමියකුගේ ශ්‍රී ලංකාවේ වාසික සේවකයකු ඒ ස්වාමියාගේ උපදෙස් පරිදි නිර්ව්‍යාජ ලෙස ක්‍රියා කරන ස්වාමියා විසින් සේවකයා සම්බන්ධයෙන් හෙළිදරව් කරන තොරතුරු නිසා ඒ ස්වාමියාගේ ශ්‍රී ලංකාවේ වාසික සේවකයා සිවිල් නෝ අපරාධ නඩුවකට යටත් වන බවට, මේ කොටසේ අන්තර්ගත කිසිවක් අර්ථ කථනය නොකළ යුතු ය.

සංඥේය සහ ඇපදිය හැකි වැරදි.

201. මේ කොටස යටතේ වූ සියලු වැරදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථකථනය කර ඇති පරිදි "සංඥේය" සහ "ඇප දිය හැකි" යන පදවල අර්ථානුකූලව "සංඥේය" සහ "ඇප දිය හැකි" වැරදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. අපරාධ නඩුවිධාන සංග්‍රහයේ විධිවිධාන, මේ පරිච්ඡේදය යටතේ සිදු කරන යම් වරදක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නඩු පැවරීමේ සීමාව.

202. මේ පනත යටතේ වරදක් කිරීමෙන් පසු අවුරුදු තුනක කාලයක් ඉකුත්වීම හෝ පැමිණිකරු විසින් එය අනාවරණය කරගත් තැන් සිට අවුරුදු දෙකක් ඉකුත්වීම යන මේ දෙකින් පළමුව ඉකුත් වන කාලයෙන් පසු ඒ වරද සම්බන්ධයෙන් කිසි නඩු පැවරීමක් ආරම්භ නොකළ යුතු ය.

ලකුණු යෙදූ භාණ්ඩ විකිණීමේ දී ව්‍යාජිත ප්‍රතිඥා භාරය.

203. ලකුණක් හෝ දේශීය භාණ්ඩයක් අදාළ කර තිබෙන යම් භාණ්ඩ විකිණීමේ දී හෝ විකිණීම සඳහා වූ ගිවිසුමක දී ඒ ලකුණ මේ කොටසේ අර්ථානුකූල නිර්ව්‍යාජ ලකුණක් බවට සහ එය ව්‍යාජ ලෙස සැදූ ලකුණක් හෝ සාවද්‍යව යොදන ලද ලකුණක් නොවන බවට හෝ වෙළෙඳ විස්තරය සාවද්‍ය වෙළෙඳ විස්තරයක් නොවන බවට විකුණුම්කරු සහතික වන බව, ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වය විකුණුම්කරු විසින් හෝ වෙනුවෙන් අත්සන් තබන ලද ලියවිල්ලකින් ප්‍රකාශ කර විකිණීම කරන හෝ විකිණීමේ ගිවිසුම ඇති කර ගන්නා වේලාවේ දී භාර දෙනු ලැබ ගැනුම්කරු විසින් එය පිළිගෙන ඇත්නම් මිස, සලකනු ලැබිය යුතු ය.

XXXIX වන පරිච්ඡේදය

නියෝග

නියෝග.

204. (1) මේ පනතේ විධිවිධාන හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා ද නියම කළ යුතු යයි විශේෂයෙන්, මේ පනත යටතේ නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග පාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරෙන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ එයින් කිසිවක් සම්බන්ධයෙන් නියෝග පාදනු ලැබිය හැකි ය :–

(අ) ලියාපදිංචි කිරීමේ ක්‍රියා පිළිවෙල ;

(ආ) ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා හාණ්ඩ සහ සේවා වර්ගීකරණය ;

(ඇ) ලියාපදිංචි කිරීම සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ;

(ඈ) මේ පනතේ කළයුතු සඳහා සාධිත කළ යුතු ආකෘති පත්‍ර ;

(ඉ) ඒ අයිතිවාසිකම් හිමිකරුවන් වෙනුවෙන් II වන තොටසේ නිශ්චය කොට දැක්වෙන අයිතිවාසිකම් පරිපාලනය සඳහා විධිවිධාන පිහිටුවීම සහ ඒ විධිවිධාන විසින් වැඩ කර ගෙන යා යුත්තේ යම් කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි ;

(ඊ) මෙම පනතේ XXXVI පරිච්ඡේදයේ නිශ්චය කරනාට දැක්වෙන, අනුයෝජිතයන් ඇතුළත් කර ගැනීම, ලියාපදිංචි කිරීම, අවලංගු කිරීම, ඉවත් කිරීම සහ ඒ අනුයෝජිතයන් සම්බන්ධයෙන් මේ පනතේ නිශ්චිතව සඳහන් වෙනත් යම් කාරණා ;

(උ) ශ්‍රී ලංකාවේ දී පේටන්ට් සහයෝගිතා ගිවිසුමේ පරිපාලනය ;

(ඌ) මෙම පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විධානය හෝ පාලනය යටතට පැවරී ඇති සියලු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර ඒ පළ කිරීමේ දිනයෙහි සිට හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කළ හැකි පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, හැකිතාක් ඉක්මණින් එය අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ අවලංගු කරන ලද සේ සැලකිය යුත්තේ යම් දිනයක සිට ද, ඒ දිනය දැක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

XL වන පරිච්ඡේදය

1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය

1996 අංක 10 දරන පනත සංශෝධනය කිරීම.

205. 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත, –

(1) ඒ පනතේ පළමුවන උපලේඛනයේ 3 වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :–

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයෙහි, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ පැවැත්වීමට නියමිත සියලු නඩු කටයුතු."

(2) ඒ පනතේ දෙවන උපලේඛනයේ 2 වන අයිතමය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

XLI වන පරිච්ඡේදය

රේගු ආඥාපනත සංශෝධනය

රේගු ආඥාපනතේ 101 වන වගන්තියේ සංශෝධනය කිරීම.

206. රේගු ආඥාපනතේ 101 වන වගන්තිය, එහි (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(ඉඉ)ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ හෝ ප්‍රකාශන අයිතිය කඩකළ භාණ්ඩ හෝ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන වෙනත් යම් භාණ්ඩ ආනයනය සහ අපනයනය තහනම් කිරීම සඳහා".

රේගු ආඥාපනතේ අදාළ විධිවිධාන සංශෝධනය කිරීම.

207. මෙහි මින්මතු "ආඥාපනත" යනුවෙන් හඳුන්වන රේගු ආඥාපනත, ඒ ආඥාපනතේ XIII කොටසේ, 125 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන නව වගන්ති ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ :-

"තහනම් භාණ්ඩ රේගු ආඥාපනතේ (ආ) උපලේඛනයට ඇතුළත් කිරීම.

125ඇ. (1) ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ හෝ ප්‍රකාශන කඩ කළ භාණ්ඩ හෝ 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන (මෙහි මින් මතු "පනත" යනුවෙන් හඳුන්වනු ලබන) උල්ලංඝනය වන වෙනත් භාණ්ඩ ආනයනය කිරීම තහනම් විය යුතු අතර, ඒ භාණ්ඩ රේගු ආඥාපනතේ 43 වන වගන්තියේ යදහන් ආනයනය තහනම් කර තිබෙන භාණ්ඩ ලෙස රේගු ආඥාපනතේ ආ උපලේඛනයේ ඇතුළත් වුවාක් සේ, ආනයනය තහනම් කර තිබෙන භාණ්ඩ අතරට ඇතුළත් කළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් භාණ්ඩ අපනයනය කිරීම තහනම් කළ යුතු අතර ඒ භාණ්ඩ රේගු ආඥා පනතේ 41 වන වගන්තියේ සඳහන් අපනයනය තහනම් කර තිබෙන භාණ්ඩ ලෙස රේගු ආඥාපනතේ "ඇ" උපලේඛනයේ ඇතුළත් වුවාක් සේ අපනයනය තහනම් කර තිබෙන භාණ්ඩ අතරට ඇතුළත් කළ යුතු ය.

(3) වෙනත් යම් නීතියක පටහැනිව කවර විධිවිධානයක් තිබුණ ද මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් තහනම් භාණ්ඩ, වාණිජ මාර්ගවලින් බාහිරව බැහැර කරනු ලැබිය යුතු අතර, එසේ බැහැර කිරීමෙන් පනත යටතේ ආරක්ෂිත අයිතිවාසිකම් හිමිකරුවකුගේ යම් සම්බන්ධතාවකට එයින් හානියක් වන්නේ නම්, එම භාණ්ඩ විනාශ කරනු ලැබිය යුතු ය.

(4) ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ යන්නෙන්, ඒ භාණ්ඩ සඳහා වලංගු ආකාරයෙන් ලියාපදිංචි කර තිබෙන වෙළෙඳ ලකුණක් බලය දීමකින් තොරව යොදා ඇත්තා වූ සහ ඒ වෙළෙඳ ලකුණ ඒ භාණ්ඩ සඳහා වලංගු ආකාරයෙන් ලියාපදිංචි කර තිබෙන වෙළෙඳ ලකුණකට සර්වසම වන්නා වූ හෝ එහි අත්‍යවශ්‍ය අංගවලින් ඒ වෙළෙඳ ලකුණෙන් වෙන්කොට හඳුනාගත හැක්කේ වූ ද එම්හින් මෙම පනතේ පිළිගෙන තිබෙන වෙළෙඳ ලකුණක අයිතිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නා වූ ද ඕනෑම භාණ්ඩයක්, ඇසුරුම් ද ඇතුළත්ව අදහස් වේ.

(5) ප්‍රකාශන අයිතිය කඩ කර තිබෙන භාණ්ඩ යන්නෙන්, ප්‍රකාශන අයිතියේ හිමිකරුගේ හෝ නිෂ්පාදනය කරනු ලැබූ රටෙහි ප්‍රකාශන අයිතිය දරන්නා විසින් යථා පරිදි බලය පවරන ලද නැනැත්තාගේ හෝ කැමැත්ත නොලබා සාදන ලද පිටපතක් වන සහ එම පිටපත සෑදීම පනතේ පරිදි ප්‍රකාශන අයිතියක් හෝ ඒ හා සම්බන්ධ අයිතිවාසිකමක් හෝ උල්ලංඝනය කිරීමක් වන භාණ්ඩයකින් සෘජුවම හෝ වක්‍රව සාදන ලද පිටපතක් යන යම් භාණ්ඩියක් අදහස් වේ.

රේගු බලධාරීන් විසින් භාණ්ඩ අත්හිටුවීම.

125ආ. (1) ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ හෝ ප්‍රකාශන අයිතිය කඩ කළ භාණ්ඩ හෝ මේ පනත යටතේ අයිතිවාසිකම් හිමියකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන වෙනත් භාණ්ඩ හෝ ආනයනය සිදුවීමට ඉඩ තිබෙන බව විශ්වාස කිරීමට වලංගු හේතු ඇති අයිතිවාසිකම් හිමියකු විසින්, ඒ භාණ්ඩ

නිදහසේ බෙදා හැරීම සඳහා මුදා හැරීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවන ලෙස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම අයිතිවාසිකම් හිමි අයිතිකරුවෙක්ම පනත යටතේ ඒ අයිතිවාසිකම් හිමියාගේ අයිතිය උල්ලංඝනය වීම පිළිබඳව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන මුල් බැල්මට පෙනෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු අතර, රේගු නිලධරයන්ට එම භාණ්ඩ පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි එම භාණ්ඩවල ප්‍රමාණවත් සවිස්තර විස්තරයක් සැපයිය යුතු ය.

(3) (අ) මෙය අනිසි ලෙස යොදා ගැනීම වැළැක්වීම පිණිස සහ විත්තිකරු ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ඇප හෝ ඒ සමාන සහතික වීමක් සපයන ලෙස ඉල්ලුම්කරුට නියම කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත්තේ ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලුම් පත්‍රයක් අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා ඕනෑම භාණ්ඩයක් නිදහස් සංසරණය සඳහා මුදහැරීම අත්හිටුවන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඒ අත්හිටුවීම සම්බන්ධයෙන් ආනයනකරුට සහ ඉල්ලුම්කරුට වහාම දැනුම් දීමට සැලැස්විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, අත්හිටුවීම පිළිබඳව ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලැබීමෙන් පසුව වැඩ කරන දවස් දහයක් නොඉක්මවන කාලසීමාවක් ඇතුළත, (3) වන උපවගන්තිය යටතේ භාණ්ඩ මුදාහැරීම් අත්හිටුවීම පිළිබඳ නීති කෘත්‍ය අධිකරණයේ ආරම්භ කර ඇති බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වනු නොලැබුවහොත්, ආනයනය සහ අපනයනය සඳහා වන වෙනත් සියලු කොන්දේසිවලට අනුව ක්‍රියාකර ඇත්නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භාණ්ඩ මුදවා හැරීමට සැලැස්විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව, භාණ්ඩ නිදහසේ සංසරණය සඳහා මුදහැරීම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවනු ලැබ ඇති සහ අධිකරණය විසින් නිසි අවස්ථානුරූප සහනයක් ප්‍රදානය කිරීමකින් තොරව, (4) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඉකුත් වී ඇත්නම් සහ ආනයනය සඳහා අදාළ වෙනත් සියලු කොන්දේසිවලට අනුව ක්‍රියාකර ඇත්නම්, එම භාණ්ඩ මුදහරිනු ලැබීමට, එම භාණ්ඩ අයිතිකරුට, ආනයනකරුට හෝ අනුප්‍රේෂණලාභියාට හිමිකම් තිබිය යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද භාණ්ඩ මුදහැරීම, අත්හිටුවීම, අධිකරණයේ ආඥාවකට අනුකූලව කරනු ලැබ හෝ පවත්වා ගෙන යනු ලැබ තිබෙන අවස්ථාවක, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 170 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(7) භාණ්ඩ අයුතු ලෙස රඳවා තබා ගැනීමෙන් හෝ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ප්‍රකාර මුදාහරින ලද භාණ්ඩ රඳවා තබා ගැනීමෙන් ආනයනකරුට, අනුප්‍රේෂණලාභියාට සහ අයිතිකරුට සිදුවන හානිය වෙනුවෙන් ඔවුන්ට නිසි වන්දියක් ගෙවන ලෙස ඉල්ලුම්කරුට ආඥා කිරීමට, අධිකරණයට බලය තිබිය යුතු ය.

(8) රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීමට හානියක් නොමැතිව, රේගු බලධාරින් විසින් රඳවා තබාගන්නා භාණ්ඩ, අයිතිවාසිකම් හිමියාගේ හිමිකම්පෑම තහවුරු කිරීම පිණිස පරීක්ෂා කරවා ගැනීමට අයිතිවාසිකම් හිමියාට ප්‍රමාණවත් අවස්ථාවන් ලබාදීමට අධිකරණයට බලය තිබිය යුතු ය. ආනයනකරුට ද එවැනි යම් භාණ්ඩ පරීක්ෂා කරවා ගැනීම සඳහා ඒ හා සමාන අවස්ථාවක් දීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

(9) අයිතිවාසිකම් හිමියාට සහ විත්තිකරුට විවෘතව තිබෙන ක්‍රියා කිරීමේ වෙනත් අයිතිවාසිකම්වලට හානියක් නොමැතිව උල්ලංඝනීය භාණ්ඩ විනාශ කරන ලෙස හෝ බැහැර කරන ලෙස, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 170 වන වගන්තියේ දැක්වෙන විධිවිධානවලට අනුකූලව ආඥා කිරීමට අධිකරණයට බලය ඇත්තේ ය. ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ සම්බන්ධයෙන්, සුවිශේෂ අවස්ථාගත තත්ත්වයක දී හැර, අධිකරණය විසින් එම උල්ලංඝනීය භාණ්ඩ සම්බන්ධ නොවන්නා වූ තත්ත්වයකින් ප්‍රති-අපනයනය කිරීමට අවසර දීම හෝ ඒවා වෙනත් රේගු කාර්ය පටිපාටියකට පාත්‍ර කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(10) මගියකුගේ පෞද්ගලික ගමන්බඩු සමඟ තිබෙන හෝ කුඩා ප්‍රමාණවලින් එවන, වාණිජමය ස්වභාවයක නොවන කුඩා භාණ්ඩ තොගවලට, 125අ සහ 125ආ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(11) "ව්‍යාජ වෙළෙඳ ලකුණු යෙදූ භාණ්ඩ" සහ "ප්‍රකාශන අයිතිය කඩ කළ භාණ්ඩ" යන යෙදුම්වලට 125අ වන වගන්තියෙන් දී ඇති අර්ථකථනය මේ වගන්තියට අදාළ විය යුතු ය.

XLII වන පරිච්ඡේදය

ඉවත්කිරීම් සහ ඉතිරිකිරීම්

ඉවත්කිරීම් සහ ඉතිරිකිරීම්.

208. (1) මෙහි මින් මතු "නීති සංග්‍රහය' යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) නීති සංග්‍රහය ඉවත් කරනු ලැබුව ද, ඒ නීති සංග්‍රහය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය තවදුරටත් පවතින සහ නීති සංග්‍රහය යටතේ පත් කරන ලද නිලධාරයන්, තවදුරටත් සේවයේ නියුක්ත වන අතර පිළිවෙලින් මේ පනත යටතේ පිහිටුවන ලද හා පත්කරන ලද ලෙස සැලකිය යුතු ය.

(3) නීති සංග්‍රහය ඉවත් කරනු ලැබුව ද එය යටතේ සාදන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පැවති නියෝග, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදන ලද ලෙස සැලකිය යුතු අතර, ඒ නියෝග, මේ පනත යටතේ සාදන නියෝග මගින් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(4) නීති සංග්‍රහය ඉවත් කරනු ලැබුව ද,

(අ) ඒ නීති සංග්‍රහය යටතේ සාදන ලද මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම දින කාර්මික පැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනටමත් ඉදිරිපත් කරන ලද සහ නොනිමිව පවතින සෑම ඉල්ලුම් පත්‍රයක් ම පිළිවෙලින් මේ පනතේ III වන, IV වන සහ V වන කොටස් යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලෙස සැලකිය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන යටතේ, කටයුතු කළ යුතු ය.

(ආ) ඉවත් කරනු ලබන නීති සංග්‍රහය පනත ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන යම් ජාත්‍යන්තර සම්මුතියක් බලපවත්වන යම් රටක ක්‍රියාත්මක නීති යටතේ හෝ ආරක්ෂා කළ යුතු වන කෘතියේ රහදැක්වීමේ ශාබ්දික පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ හෝ විකාශනයේ නීති සංග්‍රහය පනත යටතේ හෝ මුල් රටෙහි නීතිය යටතේ හෝ ඊට පූර්වයෙන් ප්‍රදානය කරන ලද ආරක්ෂිත කාලසීමාව ඉකුත් වී නොමැති තාක් දුරට මේ පනතේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන ඉවත් කරනු ලබන නීති සංග්‍රහය පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ ප්‍රදානය කරන ලද යම් අයිතිවාසිකමක්, දඩුවම් පැමිණවීමේ කාර්යය සඳහා හැර අන් සියලු කාර්ය සඳහා මේ පනතින් ප්‍රදානය කරන ලද ලෙස වලංගු හා බලසහිතව තවදුරටත් පවතිනු ලැබේ.

(ඇ) ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු සහ අසාධාරණ තරගය පිළිබඳව දැනටමත් පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන

දිනයට පෙරාතුව ම දිනයේ දී නොනිමිව පවතින සෑම නඩුවක්, නඩු කටයුත්තක් හෝ වෙනත් කාරණයක් මේ පනතේ විධිවිධාන යටතේ පවරනු ලැබූ ලෙස සලකා මේ පනතේ විධිවිධාන යටතේ ඒ පිළිබඳව තවදුරටත් කටයුතු කරගෙන යා යුතු ය.

(ඇ) නීති සංග්‍රහය යටතේ කරන ලද ආඥාවක් හෝ නියමයක්, නිකුත් කරන ලද ගාස්තු වක්‍රයක් හෝ සහතික, දෙන ලද දැන්වීමක්, තීරණයක්, නිශ්චය කිරීමක්, විධානයක් හෝ අනුමතයක් හෝ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් හෝ කරන ලද දෙයක් කෙරෙහි, මේ පනතේ III වන, IV වන, V වන හා VI වන කොටස්වල අන්තර්ගත කිසිවක බලපෑමක් නොමැති විය යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින්නේ නම්, ඒ සෑම ආඥාවක්, නියමයක්, ගාස්තු වක්‍රයක්, සහතිකයක්, දැන්වීමක්, තීරණයක්, නිශ්චය කිරීමක්, විධානයක්, අනුමතයක්, ඉල්ලීමක් හෝ දෙයක් ම මේ පනතේ විධිවිධාන යටතේ කරන ලද, නිකුත් කරන ලද, දෙන ලද, ඉදිරිපත් කරන ලද ලෙස සැලකිය යුතු හා බලාත්මකව පැවතිය යුතු අතර, මේ පනත යටතේ කරනු ලැබිය හැකිව, නිකුත් කරනු ලැබිය හැකිව, දෙනු ලැබිය හැකිව, ඉදිරිපත් කරනු ලැබිය හැකිව තිබුණු තාක් දුරට, මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ කරන ලද, නිකුත් කරන ලද, දෙන ලද, ඉදිරිපත් කරන ලද ලෙස සියලු කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ඉ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙර දිනයේ දී පැවති සියලු කොන්ත්‍රාත්, බදු ගිවිසුම් හා ගිවිසුම් මේ පනතේ විධිවිධාන යටතේ කාර්යාලය විසින් හෝ සමග හෝ සඳහා හෝ ඇති කර ගන්නා ලද හෝ ඇතුළත් වන ලද කොන්ත්‍රාත්, බදු ගිවිසුම් හෝ ගිවිසුම් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(ඊ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම දිනයේ දී පැවති, කාර්යාලයේ සියලු සම්බන්ධතා, අයිතිවාසිකම්, බැඳීම්, ණය සහ බැරකම්, මේ පනතේ

විධිවිධාන යටතේ බලපැවැත්වෙන කාර්යාලයේ සම්බන්ධතා, අයිතිවාසිකම්, බැඳීම්, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

සැලසුම් සඳහා ආරක්ෂාව.

209. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම දින නීති සංග්‍රහය යටතේ පවත්වාගෙන යන ලද සැලසුම් ලේඛනයෙහි හෝ ඊට පූර්ව යම් නීතියක් යටතේ පවත්වාගෙන යන ලදුව සැලසුම් ලේඛනයට ඒකාබද්ධ කරන ලද හා එහි කොටසක් සංයුක්ත වන බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ යම් ලේඛනයක, සැලසුමක් පිළිබඳව තිබෙන මුල් සටහනක වලංගුභාවය, මේ පනතේ III වන කොටස යටතේ ලියාපදිංචි කර ඇත්තාක් සේ සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය. ඒ සෑම සැලසුමක් ම එහි මුල් දිනය එසේ ම තබාගත යුතු ය.

පේටන්ට් බලපත්‍ර සඳහා ආරක්ෂාව.

210. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම, නීති සංග්‍රහය යටතේ පවත්වාගෙන යන ලද පේටන්ට් බලපත්‍ර ලේඛනයෙහි හෝ ඊට පූර්ව යම් නීතියක් යටතේ පවත්වාගෙන යන ලදුව ලේඛනයට ඒකාබද්ධ කරන ලද හා එහි කොටසක් සංයුක්ත වන බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ යම් ලේඛනයක, පේටන්ට් බලපත්‍ර පිළිබඳව තිබෙන මුල් සටහනක වලංගුභාවය, මේ පනතේ IV වන කොටස යටතේ ලියාපදිංචි කර ඇත්තාක් සේ සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය. ඒ සෑම පේටන්ට් බලපත්‍රයක් ම එහි මුල් දිනය එසේ ම තබාගත යුතු ය.

ලකුණු සඳහා ආරක්ෂාව.

211. (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුවම, වූ දිනයේ දී පවත්වාගෙන යන ලද ලකුණු ලේඛනයෙහි හෝ ඊට පූර්ව යම් නීතියක් යටතේ පවත්වාගෙන යන ලදුව, ලකුණු ලේඛනයට ඒකාබද්ධ කරන ලද හා එහි කොටසක් සංයුක්ත වන බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ යම් ලේඛනයක, ලකුණක් පිළිබඳව තිබෙන මුල් සටහනක වලංගුභාවය, මේ පනතේ V වන කොටස යටතේ ලියාපදිංචි කර ඇත්තාක් සේ සියලු කාර්ය සඳහා සැලකිය යුතු අතර, ඒ සෑම ලකුණක් ම, එහි මුල් දිනය එසේ ම තබාගත යුතු ය.

(ආ) නීති සංග්‍රහය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පසු ලේඛනයෙහි සටහන් කර තිබුණු හා ඒ නීති සංග්‍රහය යටතේ ලියාපදිංචි ලකුණක්

වූ කිසි ලකුණක් එය ලියාපදිංචි කරනු ලැබූ දිනයේ බලපැවැත්වූ නීතිය යටතේ ලියාපදිංචි කළ නොහැකිව සිටීමේ හේතුව මත ලේඛනයෙන් ඉවත් නොකළ යුතු ය.

(ඇ) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම ලේඛනයෙහි සටහන් කර තිබුණු සහ V වන කොටස යටතේ ලියාපදිංචි කළ හැකි ලකුණක්, එය ලියාපදිංචි කරනු ලැබූ දිනයේ බලපැවැත්වූ නීතිය අනුව ලියාපදිංචි කළ නොහැකිව තිබීමේ හේතුව මත, ලේඛනයෙන් ඉවත් නොකළ යුතු ය.

(ඈ) V වන කොටසේ අන්තර්ගත කිසිවකින් –

(i) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම ලේඛනයෙහි වලංගුව සටහන්ව පැවති ලකුණක මුල් ලියාපදිංචිය බලරහිත නොවිය යුතු ය ;

(ii) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනට පෙර කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් කරන ලද අවස්ථාවේ දී යම් තැනැත්තකු යටත් විය හැකිව නොතිබුණු කිසි බැඳීමකට යටත් නොකළ යුතු ය.

XLIII වන පරිච්ඡේදය

අර්ථ නිරූපණය

212. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නීති සංග්‍රහයෙහි – අර්ථ නිරූපණය.

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, මුදල් නීති පනත (422 පරිච්ඡේදය) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ ;

"සම්මුති රට" යන්නෙන්, කාර්මික දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ පැරිස් සම්මුතියට එකඟත්වය ප්‍රකාශ කොට හෝ එය අනුමත කොට ඇති හෝ මින් මතු එකඟත්වය ප්‍රකාශ කළ හැකි හෝ අනුමත කළ

හැකි යම් රටක් මෙන්ම "ලෝක වෙළෙඳ සවිංධානයේ" සියලු සාමාජිකයන් හෝ මින් මතු ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජිකයන් බවට පත් වන රාජ්‍ය අදහස් වන අතර, ඊට යම් රටක් හා ශ්‍රී ලංකාව අතර කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු හා මේ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් සහ ඒවා ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය අයිතිවාසිකම් හා බැඳීම් ඇති කෙරෙන යම් ගිවිසුමකට, සම්මුතියකට හෝ වැඩපිළිවෙලකට ශ්‍රී ලංකාව හා ඒ රටක් ඇතුළත් වී ඇද්ද නැතහොත් මින් මතු ඇතුළත් වන්නේ ද ඒ රටක් ද මීට ඇතුළත් වේ ;

"සම්මුතිය" යන්නෙන්, කාර්මික දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ පැරිස් සම්මුතිය, ලෝක වෙළෙඳ සංවිධානය, හෝ කාර්මික සැලසුම් පේටන්ට් බලපත්‍ර හා ලකුණු ද මේ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් කාරණා ද සම්බන්ධයෙන් හා ඒවා ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය අයිතිවාසිකම් හා බැඳීම් ශ්‍රී ලංකාව හා වෙනත් රටක් අතර ඇති කරන, ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන, වෙනත් යම් ජාත්‍යන්තර හෝ ප්‍රාදේශී සම්මුතියක්, ගිවිසුමක් හෝ වැඩ පිළිවෙලක් අදහස් වේ ;

"අධිකරණය" යන්නෙන්, නඩුවක විත්තිකාර පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවන් පදිංචිව සිටින්නේ හෝ නඩු නිමිත්ත උද්ගත වී ඇත්තේ හෝ බලාත්මක කරවා ගැනීමට ඉල්ලා සිටින ගිවිසුමට ඇතුළත් වන ලද්දේ හෝ යම් පළාතක් ඇතුළත ඒ පළාත්, සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබ ඇත්තා වූ ද, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියට අනුකූලව ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් සිවිල් අධිකරණ බලය පවරනු ලැබ ඇත්තා වූ ද මහාධිකරණ අදහස් වන අතර, යම් පළාතක් සඳහා එසේ මහාධිකරණයක් පිහිටුවනු ලැබ නොමැති හෝ එසේ සිවිල් අධිකරණ බලය පවරනු ලැබ නොමැති අවස්ථාවක, බප්‍පාහිර පළාත සඳහා පිහිටුවනු ලැබ ඇති මහාධිකරණය අදහස් වේ ;

"ට්‍රාන්ස්ජෙනික්" යන්නෙන් ස්වාභාවික තත්ත්වයන් යටතේ ස්වකීය වර්ගීය ජීවී විශේෂය ඉසින් අත්කරගත නොහැකි එහෙත් එහි ජානමය සංයුතියට සෘජු මිනිස් මැදිහත් වීමක් කරණකොට ගෙන එකතු වූ අංග ලක්ෂණ පෙන්නුම් කරන ජීවියෙක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

214. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.